

# ළමයින්ගේ පන්ති සඳහා ඉගැන්වීම 1 වැනි ශ්‍රේණිය



රූහි ආයතනය





තුන්වන පොත

# ළමයින්ගේ පන්ති සඳහා ඉගැන්වීම
## 1 වැනි ශ්‍රේණිය

රුහි ආයතනය

ග්‍රන්ථමාලාවෙහි අඩංගු පොත්:

රූහි ආයතනය විසින් නිර්මාණය කරන ලද ග්‍රන්ථමාලාවේ වර්තමාන ග්‍රන්ථ නාමයන් පහතින් දැක්වේ. තරුණයින්ගේ සහ වැඩිහිටියන්ගේ තම සමාජයන්ට සේවය කිරීමේ හැකියාව ක්‍රමානුකූලව වර්ධනය කිරීමේ උත්සාහයේ ප්‍රධාන අනුක්‍රමික පාඨමාලාවක් ලෙස මෙම පොත් භාවිතා කිරීමට බලාපොරොත්තු වේ. රූහි ආයතනය විසින් බහායි ළමා පන්ති ගුරුවරුන් පුහුණු කිරිම සඳහාවූ පාඨමාලා කට්ටලයක් තුන්වන පොත මගින් විහිදී යන පරිදි සකස් කර ඇති අතරම කණිටු යෞවන කණ්ඩායම් සජීවීකාරකයින් නඟාසිටුවීම සඳහා පස්වන පොත මඟින් තවත් පොත් කට්ටලවක් සකස් කර ඇත. මෙම කොටස් දෙක පහත ලැයිස්තුවේ දක්වා ඇත. ක්ෂෙත්‍රයේ අත්දැකීම් ප්‍රගතියට පත්වනවාත් සමඟම මෙම ලැයිස්තුවෙහි වෙනස්කම් සිදුවන බව සඳහන් කළ යුතු අතරම, සංවර්ධනය වෙමින් පවතින විෂයමාලා මූලිකාංග පුළුල්ව යෙදවිය හැකි මට්ටමට ළඟාවූ විට තවත් ග්‍රන්ථ නාමයන් මෙයට එකතුවිය හැක.

| | |
|---|---|
| පළමු පොත | ආත්මයේ ජීවිතය පිළිබඳ සිතාබැලීම |
| දෙවන පොත | සේවය සඳහා නැඟී සිටීම |
| තුන්වන පොත | ළමා පන්ති සඳහා ඉගැන්වීම, පළමු ශ්‍රේණිය<br>ළමා පන්ති සඳහා ඉගැන්වීම, දෙවන ශ්‍රේණිය (අනු පාඨමාලා)<br>ළමා පන්ති සඳහා ඉගැන්වීම, තුන්වන ශ්‍රේණිය (අනු පාඨමාලා)<br>ළමා පන්ති සඳහා ඉගැන්වීම, හතරවන ශ්‍රේණිය (අනු පාඨමාලා) |
| හතරවන පොත | ද්විත්ව ප්‍රකාශවීම් |
| පස්වන පොත | කණිටු යෞවනයින්ගේ බලයන් මුදාහැරීම<br>මූලික පෙළඹවීම*:* 5 වැනි පොතෙහි පළමු අනුපාඨමාලාව<br>වක්‍රය පුළුල් කිරීම*:* 5 වැනි පොතෙහි දෙවැනි අනුපාඨමාලාව |
| හයවන පොත | ධර්මය ඉගැන්වීම |
| හත්වන පොත | සේවා මාර්ගයෙහි එකට ගමන් කිරීම |
| අටවන පොත | බහාඋල්ලා තුමාගේ ගිවිසුම |
| නවවන පොත | ඓතිහාසික දෘෂ්ටිකෝණයක් අත්පත්කර ගැනීම |
| දහවන පොත | උද්දීප්ත සමාජයක් ගොඩනැගීම |
| එකළොස්වන පොත | භෞතික වත්කම |
| දොළොස්වන පොත | පවුල සහ සමාජය |
| දහතුන්වන පොත | සමාජ ක්‍රියාකාරකම්හි නිරතවීම |
| දාහතර වන පොත | සමාජ කතිකාවන් සඳහා සහභාගිවීම |

ප්‍රකාශන හිමිකම: රූහී ආයතනය, කොළොම්බියාව 2018, 2023
සංස්කරණය 2023 December 2.2.1.PE සංස්කරණය

ආරම්භ කෘතිය Enseñar clases para niños, primer grado ලෙස ස්පාඤ්ඤ භාෂාවෙන් මුද්‍රණය කරඇත
ප්‍රකාශන හිමිකම: රූහී ආයතනය, කොළොම්බියාව © 1987, 1996, 2021
ISBN 978-958-52941-7-2

රූහි ආයතනය
කලී, කොළොම්බියාව
විද්‍යුත් තැපැල: instituto@ruhi.org
Website: www.ruhi.org

# අන්තර්ගතයන්

උපදේශකවරුන් සඳහාවූ  අදහස් කිහිපයක්......................................................V

අධ්‍යාපනය පිළිබඳ බහායි මූලධර්මයන්..........................................................1

1 වැනි ශ්‍රේණියේ ළමා පන්ති සඳහා වූ පාඩම් ..................................................35

## උපදේශකවරුන් සඳහාවූ අදහස් කිහිපයක්

ගමෙහි සහ අසල්වැසි ප්‍රදේශයන්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා වූ නිරන්තර පන්ති පවත්වමින්, ඉගැන්වීමේ ඉතා උසස් යහපත් ක්‍රියාවක් සිදුකිරීමේ කාර්යයභාරය භාරගන්නා සංඛ්‍යාත්මකව වර්ධනයවන තනිපුද්ගලන්ගේ හැකියාවන් ගොඩනැගීම අරමුණු කරගත් ඒකකයන් ද්විත්වයකින් මෙම පොත සකස් වී ඇත. රූහි ආයතනයේ අනුක්‍රමික පඨමාලාවන්ගේ තෙවැනි පොතවන මෙය, හැදෑරීමට කැමැති අය වෙත සේවා මාර්ගයේ විශේෂිත මර්ගයක් විවෘත කරනු ලබන පළමුවැන්නද වේ. එසේ කිරීමට කැමති අය විසින්, ප්‍රධාන අනුක්‍රමික පාඨමාලාවට අනුරේඛීය වන මාර්ගය ඔස්සේ, සෑම එකක්ම ඔහුගේ හෝ ඇයගේ තත්වයට ගැළපෙන පියවරන්ගෙන් ළමයින්ට ඉගැන්වීම සඳහා වූ අනුපාඨමාලාවන් ගණනාවක් අධ්‍යනයන කරනු ලබයි.

මෙම පොත ඉගෙනගැනීමට මහපෙන්වීමේදී, උපදේශකවරයා විසින් ඉහත වූ දර්ශනය මනසේ තබාගත යුත්තේ, සහභාගිවන්නන්ගෙන් ප්‍රතිශතයක් පමණක් මෙම උත්සාහය සඳහා කැපවීමට තෝරා ගනු ලබන බවට වූ අවබෝධයෙනි. එහි ආසන්න අරමුණින් ඔබ්බට ගොස්, මෙම පොත විසින්, දැනට ස්ථිරව සේවා මාර්ගයේ යෙදී සිටින සෑම තනිපුද්ගලයෙකුටම ඔහුගේ හෝ ඇයගේ ගමෙහි හෝ අසල්වැසි ප්‍රදේශයේ යෞවනයින් වෙත දිගහැරෙන අධ්‍යාපනික වැඩසටහන හැඩගැසවීම සඳහා වූ සංකල්පයන් සහ අදහස් සමහරක් සමඟ වඩාත් පුළුල්ව හුරුපුරුදු කිරීමට සේවය සපයනු ලබයි. මේ අවස්ථාවේදී, ළමයින්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනය පෝෂණය කිරීමේ වගකීම සහ සමාජයේ සිටින වැඩිහිටි සාමාජිකයින් ඔවුන් සමඟ සිදු කර අන්තර් ක්‍රියාවන් තුල ප්‍රදර්ශනය කළ යුතු ගුණාංගයන්, ආකල්පයන් සහ චර්යාවන් යන ද්විත්වයම පිළිබඳ සමාජයේ දැනුවත්භාවය ඉහළ නැංවීමට මෙය දායකවනු ඇතැයි බලාපොරොත්තු වේ.

ඔවුන් රූහි 2 වැනි පොතෙහි දෙවැනි ඒකකය අධ්‍යනය කිරීමෙන්, භෞතික, මානුෂීය සහ ආධ්‍යාත්මික යන තෙවැදෑරුම් අධ්‍යාපන ක්‍රමය පිළිබඳ අබ්දුල් බහාතුමාගේ ප්‍රකාශය පිළිබඳ සහභාගිවන්නන් දැනටමත් දැනු සිටිනු ඇත. ආධ්‍යාත්මික ස්වභාවයේ සහ උසස් ස්වභාවයේ ආධාරයෙන් තනිපුද්ගලයාගේ සංවර්ධනය සඳහා ඉහත සඳහන් කළ අධ්‍යාපන ක්‍රමයන් තවදුරටත් අවබෝධ කරගැනීමට අවස්ථාවක් මෙහිදී ලබාදෙනු ඇත. බහායි ධර්මය තුල ගැබ්වී ඇති ළමුන් සඳහාවූ ආධ්‍යාත්මික අධ්‍යාපන, සමහර ආගමික උපදේශයන් හා සම්බන්ධව පනවන ලබන ආකල්පමය විශ්වාසයන්වලින් වෙනස්වන බව මූලික වශයෙන් පැහැදිලි විය යුතුය. ඒ වෙනුවට එමඟින් අරමුණු කරනු ලබන්නේ දැනුම සඳහාවූ ආදරය, ඉගෙනගැනීම සඳහාවූ ආකල්පය සහ යථාර්ථය විමර්ශනය කිරීමට නිරන්තර ආශාවක් ඇති කිරීමයි.

තරුණයින්ගේ අධ්‍යාපනය තුලදී, ආගමික ශික්ෂාපද පසෙකට දැමිය නොහැකි අතර එසේ කිරීම දිව්‍යමය සත්‍යයන් වෙත ඔවුන්ට ඇති ප්‍රවේශයන් සහ ඔවුන්ගේ අදහස් සහ ක්‍රියාවන් පාලනය සඳහා පැමිණි මූලධර්මයන්වන ආධ්‍යාත්මික මූලධර්මයන් ප්‍රතික්ෂේප කිරීමක් වනු බවද පිළිගැනීමද ඊහා සමානව වැදගත්වේ. නිදහස් තේරීමක් පිළිබඳ කතා කරමින්, තරුණයින්ට ඔවුන්ගේම ප්‍රමිතීන් අත්පත් කරගැනීමට සහ සමාජයන් සමඟ අන්තර්ක්‍රියාවලීන් තුලින් පුළුල් දෘෂ්ටියක් ලබාගැනීමට ඔවුන්ටම අවකාශය ලබාදීම සුදුසු යැයි යන්නට සහාය දෙන අය, දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික බලවතුන් ආක්‍රමණශීලි ලෙස ඔවුන්ගේම අවශ්‍යතා ඉටුවන විශ්වාස සහ හැසිරීම් රාටාවන් ප්‍රවර්ධනය කරන ආකාරය පිළිබඳ අගය කරනු ලබන බව නොපෙනේ. නමුත්, එය එසේ නොවුනත්, තනිපුද්ගලයාගේ ආධ්‍යාත්මික ස්වභාවය පෝෂණය කරනු ලබන අධ්‍යාපනයක් නොමැතිව අනාගත පරම්පරාවක් විසින් වඩාහොඳ ලෝකයක් ගොඩනඟනු ඇතැයි උපකල්පනය කිරීමට කිසිදු හේතුවක් නොමැත. දිව්‍යමය මඟපෙන්වීමෙන් බෙලහීන වූ මනුෂ්‍ය වර්ගයාට, අවුල්, අයුක්තිය සහ වේදාවන්වලට වඩා වැඩි යමක් කළ නොහැක.

එසේම, බහායි ඉගැන්වීම් අනුව, මෙම පොත සහ මෙයින් සකස් වූ අනුශාඛාවන් අවුරුදු හයක ළමා අධ්‍යාපන වැඩසටහන මත කේන්ද්‍රීයව සකසා ඇත. එසේනම්, මෙම වැඩසටහනේදී සැලසුම්කර ඇත්තේ, විශේෂයෙන්ම සියළුම ශ්‍රේණි තුලවූ අනුක්‍රමික පාඨමාලාවන්වලදී, සියළුම පසුබිම්වල තරුණයින්ට එයට සහභාගිවීමට මාර්ය විවෘතවන පරිදිය. චරිතය ශෝධනය කිරීමේ උත්සාහයට දායකවීමක් ලෙස වයස අවුරුදු 5-6 අතරවූ ළමුන්ගේ ආධ්‍යාත්මික ගුණාංග සංවර්ධනය සඳහා 1 වැනි ශ්‍රේණිය සඳහා වන පාඩම් සකස්කර ඇත. පෙර වසරේ අධ්‍යනය කරන ලද අභ්‍යන්තර ගුණාංග විසින් ලබාදෙන පුරුදු සහ හැසිරීම් රටාවන් පෝෂණය කිරීම මත 2 වැනි ශ්‍රේණියේ මෙම පාඩම් ගොඩනැගී ඇති අතර උදාහරණයක් ලෙස- යාඥා කිරීමේ පුරුද්ද තුලින්, කැපී පෙනෙන ලෙස ප්‍රකාශ්‍යට පත්වන අභ්‍යන්තර තත්වයක් වන්නේ දෙවියන්වහන්සේට ළංවීමට ඇති ආශාවයි. ඊළඟ ශ්‍රේණිය යොමුවන්නේ දැනුම නැමැති ප්‍රශ්නය වෙතයි. විශේෂයෙන්ම, තනිපුද්ගලයෙකු සවිඥානකව තමන්ගේ ආධ්‍යාත්මික දියුණුව සඳහා කටයුතු කිරීමට නම්, දෙවියන්වහන්සේගේ දැනුම ගලාඑන මූලාශ්‍රය සමඟ සම්බන්ධ විය යුතුය. මෙදවස දෙවියන්වහන්සේගේ

ද්විත්ව ප්‍රකාශවීම්වල ජීවිත හා කේන්ද්‍රීයවන තේමාවන් මෙන්ම, එතුමන්ලාට පෙර පහළවූ ප්‍රකාශවීම් පිළිබඳවද මෙම ශ්‍රේණියේ පාඩම්වලදී සාකච්ඡා කරනු ලබයි. අවසාන ශ්‍රේණියේ ළමයින්ට, අබ්දුල් බහාතුමාගේ පැහැදිලි කිරීම්හි සහ ආදර්ශයමත් මහපෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් බහා'උ'ල්ලා තුමාගේ අනාවරණය පිළිබඳ ඔවුන්ගේ දැන්ම වර්ධනය කරගැනීමට අවස්ථාවක් සලසයි. ළමයින් ඔවුන්ගේ ජීවිතයේ ඉදිරියට ගමන් කිරීමේදී සහ ඔවුන්ගේ අදහස් සහ ක්‍රියාවන් බහා'උ'ල්ලා තුමාගේ ඉගැන්වීම් සමඟ පෙළගස්සා ගැනීම සඳහා එතුමාගේ ලේඛණ සහ ප්‍රකාශයන් වෙත යොමුවීමේ පුරුද්ද ශක්තිමත් කිරීම මෙයින් බලාපොරොත්තු වේ. ළමයින් වයස අවුරුදු 11හෝ 12 වයස් සීමාව වනවිට එම තරුණයින්, කණිටු යෞවනයින් ආධ්‍යාත්මිකව සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා සූදානම්වන අතර, එහිදී ඔවුන්ට බහායි ළමා පන්තිවල ලැබූ අධ්‍යාපනය දිගටම පවත්වාගෙන යෑමද ඇතුළත්ව ඔවුන්ගේ නැඟී එන සවිඥානකත්වය තවදුරටත් පුළුල් කළ හැකි සජීවිකාරකවරයෙකු සමඟ පෙළපොත් පාඨමාලාවක් අධ්‍යනය කරනු ඇත. බලාපොරොත්තු සහගත ළමා පන්ති ගුරුවරුන්, බහායිවරුන් නොවන දෙමාපියන් තමන්ගේ පුතුන් සහ දූවරුන් මෙවැනි පන්තිවලට යැවීමේ අවස්ථාව සාදරයෙන් පිළිගන්නා බවත්, ඔවුන්ගේ මෘදු මොළොක් හදවතට සහ මනසට ආධ්‍යාත්මික අධ්‍යාපනයේ බලපෑම දැකීමෙන් නිසැකයෙන්ම ප්‍රීතියට පත්වන බවට සෑම විශ්වාසයක්ම තබාගත යුතුය.

ඉහත සඳහන් කල පරිදි, 1 වැනි ශ්‍රේණියේ පන්තිවල අවධානය යොමුකර ඇත්තේ චරිත ශෝධනය කෙරෙහිය. එසේනම්, මෙම සන්දර්භ තුළදී, "බහායි අධ්‍යාපනයේ සමහර මූලධර්මයන්" යන පළමු ඒකකයේදී ධර්මයේ ලේඛණ තුලවූ අධ්‍යාපනය සඳහාවූ ගැඹුරු ඇඟවුම් ලබාදෙන ඇතැම් මූලික සංකල්පයන් විමර්ශනය කරනු ලබයි. මෙම සාකච්ඡාව සඳහා ඒකකයේ මුල් භාගය වෙන්කොට ඇති අතර, ඉතිරි කොටස පාඩම් පවත්වාගෙන යෑමේදී යොමුවිය හැක්කේ කුමන ප්‍රවේශයන් වෙතද සහ ගුරුවරුන් සහ දෙමාපියන් අතර සම්බන්ධය කෙරෙහි යොමුවී ඇත.

මෙම ඒකකයේදී සාකච්ඡා කරනු ලබන සංකල්පයන්ගෙන් ඒකක් වන්නේ, මනුෂ්‍ය භාවය "මිණිය නොහැකි වටිනාකමකින් යුත් මාණික්‍යන්ගෙන් පිරි ආකරයක්" ය යන බහා'උ'ල්ලා තුමාගේ ප්‍රකාශය තුළින් හඳුනාගන්නා මානව ශක්‍යතාවය ගවේශණය කරයි. මෙම ප්‍රකාශය තුලින් ලබාදෙන ක්ෂණික ඇඟවුම් දෙකක් වන, සිසුන් තොරතුරු වලින් පුරාවා ගැනීමට බලා සිටින භාජනයන් ලෙස සලකන ආධ්‍යාපනික් ප්‍රවේශයන් පසෙකට දැමිය යුතු බවත් සහ ළමයින්ට නිසි පෝෂණයක් නොලැබීමෙන් ඔවුන්ගේ අභ්‍යන්තර පැවැත්ම තුල සැඟවී ඇති බොහෝ මාණික්‍යයන් ප්‍රකාශ කිරීමට ඔවුන්ට නොහැකි බවත් යන්න කෙරෙහි මෙනෙහි කරන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටී.

සෑම පුද්ගලයෙකුම දායාද කර ඇති මාණික්‍යයන් අතර, "ආධ්‍යාත්මික ගුණාංග" යනු උදාර සහ අවංක චරිතයක් ඒ මත ගොඩනැගිය හැකි ස්ථිර ව්‍යුහයක් ලෙස මෙම ඒකකය විසින් යෝජනා කරනු ලබයි. පුරුදු සහ ආකල්පයන් මෙන්ම හැකියාවන් සහ කුසලතාවයන් ඇතුළු සියළුම ආකාරයේ ප්‍රශංසනීය ගුණාංගයන් සඳහා පොදු භාවිතයක් වන "ගුණධර්ම" යන්නෙහි වෙනමවූ කාණ්ඩයක් ඇතුළත්වන බව සියළුම සහභාගිවන්නන් අත්‍යාවශ්‍යයෙන්ම ග්‍රහණය කරගත යුතු අදහසකි. 6 සහ 7 වැනි කොටස්වලදී මෙම ප්‍රකාශනයේ සමහරක් ඇඟවීම් කිහිපයක් සලකා බලයි. කණ්ඩායමේ සමාජිකයින් විසින් ඔවුන් සාකච්ඡා කරන, ආධ්‍යාත්මික ගුණාංග නමැති මනුෂ්‍ය ආත්මයේ අධ්‍යනේන්ද්‍රිය විසින් අප දෙවියන්වහන්සේ වෙත අපගේ සදාකාලික ගමනට උදව් සහ උපකාර කිරීමට මේ ලෝකය තුලදී සංවර්ධනය කරගත යුතු බව ඔවුන් විසින් අධ්‍යනය කල රූහි පළමු පෙතෙහි තුන්වන ඒකකයේදී ඔවුන් ඉගෙනගත් දෑ සමඟ සම්බන්ධ කිරීමට උපදේශකවරයාට සහතික විය හැක. ආධ්‍යාත්මික ගුණාංග පෝෂණය කිරීමේදී දෙවියන්වහන්සේට ඇති ආදරය සහ උන්වහන්සේ පිළිබඳ දැනුම අත්හල නොහැකි කරුණකි. 1 වැනි ශ්‍රේණියේ මෙම කොටස් දෙක තුලින් වූ අදහස් මඟින්, වෙලාවට වැඩකිරීම සහ සත්‍යවාදී බව එකම වර්ගයේ ගුණාංගයක් ලෙස සලකණු ලබන ගුණධර්ම පිළිබඳ පාඨමාලාවක් ලෙස සඳහන් නොකරන බව සහභාගිවන්නන් අවබෝධ කරගැනීම වැදගත් වේ. තවද, ගුරුවරුන් විසින් මෙම විශිෂ්ටතාවය වටහාගන්නාවිට, හැසිරීම වෙනස් කිරීම තුලින් යහපත් චරිතයක් ගොඩනැගීය හැකියයි බැලීමේ මූලික ප්‍රවණතාවය මඟ හැරෙනු ඇත.

ඇත්තවශයෙන්ම, පාඩම්වල විශේෂයෙන්ම පෝෂණය කිරීමට උත්සාහ කරන යාඥාව, උධෘත පාඨයන් කටපාඩම් කිරීම සහ කතාන්දරයන් වැනි මූලික අංගයන්වන ආධ්‍යාත්මික ගුණාංගවලට ඒවාට ආවේණික වූ ගතිකත්වයන් ඇත. සහභාගිවන්නන්ට ඔවුන්ගේ 1 සහ 2 වැනි පොත අධ්‍යනයෙන් පසු මෙම අංගයන්ගේ ස්වභාවය පිළිබඳ දැනටමත් යම් අවබෝධයක් ඇති අතර, 8 වැනි කොටස තුලදී උත්සාහ කරනු ලබන්නේ ළමයින්ට ඉගැන්වීමේ කාර්යය පිළිබඳ ඔවුන් ඉගෙන ගත්දෑහී තවත් දිගුවක් සඳහා උපකාර කිරීමයි. එසේ කිරීමේදී, තරුණයින් තුළ ආධයාත්මික ගුණාංග වර්ධනය කිරීම සඳහා මෙම පාඩම්වලදී ඔවුන්ව

දෙවියන්වහන්සේගේ වචනයන් ක්ෂණිකව සම්බන්ධ කරන බවත් සහ මානව පරමාදර්ශයෙන් උසස්තම ප්‍රතිමූර්තිය වන අබ්දුල් බහාතුමාගේ කතාන්දරයන්ගෙන් පෙළඹවීමක් ඇති කරන බවත් ඔවුන් හඳුනාගත යුතුය.

12 වැනි කොටසේදී ආමන්ත්‍රණය කරනු ලබන දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බිය මෙම ඒකකයේදී ගවේෂණය කරනු ලබන තවත් එක් සංකල්පයක් වේ. බහායි ලේඛයන්ට අනුව මානව පැවැත්මේ අධ්‍යාපනය තුළදී එය "ප්‍රමුඛ සාධකය" එයයි. මෙම බිය දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ආදරය වෙන් කළ නොහැකි බව සහභාගිවන්නන් අවබෝධ කරගැනීම ඉතාමත් වැදගත්වන අතර, මක්නිසාද යත්, අප ආදරය කරන තැනැත්තා සතුටු කිරීමේ ආශාව නිසා සහ උන්වහන්සේගේ ප්‍රේමය අප වෙත ළඟාවීමේ වරප්‍රසාදයෙන් අප වළක්වන ඕනෑම ක්‍රියාවකින් අප වැළකී සිටීම තුලින් මෙම බිය ඇතිවන හෙයිනි. මෙම ආදරය නොමැතිවිට, අශෝභන හැසිරීම්වලින් ඉවත්වීමට අපව පොළඹවන බිය තදබල ලෙස කෝපවූ දෙවිකෙනෙක්ගේ දැඩි දඬුවම් කෙරෙහි ඇතිවන තවත් ආකාරයක බියකි. මෙය ළමයින්ගේ මනසට ඇතුළත්විය යුතු රූපයක් නොවේ. අධ්‍යාපන ක්‍රියාවලිය තුලදී දෙවියන්වහන්සේට ඇති ආදරය සහ දෙවියන්වහන්සේට ඇති බිය අතර සම්බධතාවය අභිලාෂකාමී ගුරුවරුන් විසින් හොඳින් ග්‍රහණය කරගත යුත අතරම, පන්තිය තුලදී මෙම විෂය විස්තරාත්මකව මතු කරන විෂයක් නොවන බව ඔවුන් හඳුනාගත යුතුය. ඒ වෙනුවට ඔවුන් තමන්ගේ සිසුන්ගේ හදවත් තුල දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ගිනිදැල් දැල්වීමට ඉගෙනගත යුතු අතරම, උන්වහන්සේගේ අසීමිත ආදරය තුලින් මනුෂ්‍ය වර්ගයා නිර්මාණය කළ උන්වහන්සේ කිසිවිටකත් අපව ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම නොනවත්වන බවටවූ අනිවාර්යය සහතිකය අවබෝධ කරගැනීමට ඔවුන්ට උපකාර කළ යුතුය. අවසාන විශ්ලේෂණයේදී, උනවහන්සේගේ අලංකාරයට ඇති ආදරය නිසා උන්වහන්සේගේ යහපත් සන්තුෂටියට විරුද්ධව කටයුතු කිරීමෙන් ඔවුන්ව අධෛර්මයත් කරනු ඇත.

අවසානයේදී, ආධ්‍යාත්මික අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් ආධ්‍යාත්මික ගුණාංග අත්පත් කරගැනීමම ත්‍යාගයක් ලෙස සහ නුසුදුසු චරිතයක් සතුවීම විශාල දඬුවමක් ලෙසත් ළමයින් විසින් සැලකිය යුතු බවත් ඉහත සඳහන් කල සංකල්පයන් සහ අදහස් පිළිබඳ සාකච්ඡා කිරීමේදී සහභාගිවන්නනන්ට අවබෝධ කරගැනීමට මඟ සැලසිය යුතුය. එසේනම්, සහභාගිවන්නන්ට මෙ සියල්ල, කේන්ද්‍රීය අරමුණක් ලෙස නොවී එහෙත් චරිතයන් ශෝධනය කිරීමට ආධාරකයක් වෙමින් තරුණයින්ගේ හැසිරීම් වෙනස් කරනු ලබන්නක් බවට වූ නිසි දෘෂ්ටියකින් බැලීමට හැකිවිය යුතුය. මේ අනුව ළමයින්ගේ ආකර්ෂණීය හැසිරීම් ධෛර්යමත් කිරීමට සහ අශෝභන හැසිරීම් රටාවන් අධෛර්මත් කිරීමට, ළමුන් සමඟ සිදුකරන අන්තර් ක්‍රියවන්හීදී සුදුසු මාර්ගයන් ඔවුන්ට සොයාගත හැකි අතර ඒවායින් සමහරක් 13 වැනි කොටසේ සඳහන් වේ. නිදහස සහ විනය සම්බන්ධ අනෙකුත් සංකල්පයන්ද මෙම කොටස තුල කෙටියෙන් සාකච්ඡා කර ඇත. ළමයින්ගේ අධ්‍යාපනය තුළදී දැඩි දඬුවම් ලබාදීමට කොහෙත්ම අවකාශයක් නොමැති වුවත්, ඔවුන්ට අවශ්‍ය පරිදි කටයුතු කිරීමට පූර්ණ නිදහස ලබාදීමත් ඔවුන්ගේ ආධ්‍යාත්මික දියුණුවට එකහා සමානව හානි කරයි.

මෙම ඒකකය මීළඟට, ප්‍රීතිමත් ඉගෙනුම් වාතාවරණයක් නිර්මාණය කරන අතරතුරම පන්තිය තුල පිළිවෙල සහ විනය පත්වාගෙන යනු ලබන්නේ කෙසේදැයි යන ප්‍රශ්නය වෙත යොමු වේ. සහභාගිවන්නන් බොහෝ දෙනෙකුට ළමයින්ට ඉගැන්වීම පිළිබඳ පෙර අත්දැකීම් නොමැති හෙයින් ඔවුන්ගේ සැලකිල්ලට යොමුවිය යුතු මූලික අදහස් කිහිපයක් මෙහි දක්වා ඇති බව උපදේශකවරයා විසින් මතක තබා ගත යුතුය. ඔවුන් විසින් සිදු කරනු ලබන සේවා ක්‍රියාකාරකම් සහ සමාලෝචන අත්දැකීමේ ආලෝකයෙන් ලබාගත් අදහස් සමඟ අදාළ කොටස් දෙස ආපසු හැරී බැලීමට ඔවුන් කැමති වනවා ඇත.

පාඩමේ සඳහන් කර ඇති ක්‍රියාකාරකම් සඳහා ළමුන් යොමුකරගැනීමට අනුගමනය කළ හැකි ප්‍රවේශයන් සමහරක් පිළිබඳව සහභාගිවන්නන් විසින් පරික්ෂා කිරීම කෙරෙහි යොමුවිය හැක. යාඥා කිරීම, උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීම, කතාන්දරයන් වැනි ඉහතින් උද්දීපනය කර ඇති මූලික අංගයන්වලට අමතරව ගීත, ක්‍රීඩා සහ වර්ණ ගැන්වීම ආදී ක්‍රියාකාරකම්ද ඇතුළත් වේ. ඔවුන්ට ඇති ප්‍රවේශ මාර්ගයන් විශ්ලේෂණය කිරීමේදී, පවිත්‍රත්වයේ ආධ්‍යාත්මික ගුණාංගය පිළිබඳවූ පළමු පාඩම සමාලෝචනය සඳහා සහභාගිවන්නන්ට යොමුවිය හැක.

අවසානයේදී, 26 වැනි කොටසේදී, ඔහුගේ හෝ ඇයගේ පන්තියේ සිටින ළමයින්ගේ දෙමාපියන් සහ ගුරුවරුන් අතර දිගහැරෙන සාකච්ඡාවන්ගේ ස්වභාවය පිළිබඳ සලකා ලබනු ලබයි. සහභාගිවන්නන් රූහි 2 වැනි පොතේ දැනටමත් අධ්‍යනය කරඇති මෙහා සම්බන්ධ දෑ මත මෙන්ම ඔවුන්ගේ ගමෙහි හෝ අසල්වැසි ප්‍රදේශයන්ගේ පවත්වන මෙම පන්තිවලට සහභාගිවන ළමයින් සමඟ නිවෙස් සංචාරයේ යෙදෙන වර්ධනය වන මිතුරන්ගේ න්‍යෂ්ටිය සමඟ ඔවුන් ලබාන්නාවූ ඕනෑම අත්දැකීමක් මත මෙය ගොඩනගා ඇත.

දෙමාපියන් සමඟ ඔවුන්ගේ සංවාදයන් සඳහා සූදානම්වීම සඳහා මෙහි පළමු ඒකකයේ සපයා ඇති සංකල්පයන් නැවත පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අභ්‍යාසයන් සිදුකිරීමට සහභාගිවන්නන්ට ප්‍රමාණවත් කාලයක් ලබාදීමට උපදේශකවරයා කටයුතු කළ යුතුය. මෙම අභ්‍යාසය, කණ්ඩායමේ සමාජිකයින්ට සාකච්ඡා කරනු ලබන බොහෝ සංකල්පයන් සහ අදහස් ඔවුන්ගේ සිත්තුල ශක්තිමත් කරනු ලබන මාධ්‍යක් ලෙස සේවය කරයි.

මෙහි 2 වැනි ඒකකයේ අන්තර්ගත “පළමු ශ්‍රේණියේ ළමා පන්ති සඳහා පාඩම්” යන්න කොටස් දෙකකින් සමන්විතවන අතර, මෙම ශ්‍රේණිය සඳහා සෑම එකක්ම ආධ්‍යාත්මික ගුණාංග සංවර්ධනය කරගැනීම වටා ව්‍යුහගත වූ පාඩම් 24 ක් යෝජනා කර ඇති අතර, එහි මූලික පාඩම් ගුරුවරුන්ට මෙම පාඩම්වල අන්තර්ගතයන් වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා නිර්මාණය කර ඇත. මූලික කොටස්වලදී එක්වරකට පාඩම් හතරක් බැගින් ගෙන, සහභාගිවන්නන් පෙර ඒකකයේ පළමුවෙන්ම පවිත්‍රත්වය පිළිබඳ විශ්ලේෂණය කළ ආකාරයටම සෑම මූලික අංගයක් පිළිබඳව ඔවුන්ට සමාලෝචනය කිරීමට මඟපෙන්වයි.

සෑම පාඩමකම මූලික අංගය බවට පත්ව ඇත්තේ බහායි ලේඛණයන්ගේ උපුටා ගැනීමකි. එය ළමයින්ට උපුටා ගන්නා ලද පාඨය හඳුන්වාදීම සඳහා ගුරුවරුන්ට භාවිතා කිරීමට දිරිමත් කරන ප්‍රකාශයකින් යුක්ත වේ. කෙටියෙන් වුවද, මෙහිදී සාකච්ඡා කරනු ලබන ආධ්‍යාත්මික ගුණාංග තුල විදහා දක්වන ගතිකත්වයන් පිළිබඳ චිත්‍රයක් ළමයින්ගේ මනස තුලින් නිර්මාණයවීමට උපකාරීවන ලේඛණයන්ගෙන් අඳින ලද රූප සහ වචනයන් කාණ්ඩයක් මෙම ප්‍රකාශය තුල යොදවා ඇත. ආරම්භක සටහන් ස්වාභාවික ආකාරයෙන් ඉදිරිපත් කිරීමට සහ මෙම ගතිකත්වයන් පිළිබඳ අන්තර්දෘෂ්ටීන් වර්ධනය කරගැනීමට සිසුන්ට උපකාර කිරීමට ගුරුවරයෙකු ඇති හැකියාව අත්දැකීම් තුළින් සහ මෙම පාඩම් තුළදී සාකච්ඡා කරන ලද ආධ්‍යාත්මික ගුණාංග පිළිබඳ නිතර මෙනෙහි කිරීම තුළින් වර්ධනය වේ. මෙම අන්තර්දෘෂ්ටිය තුළදී, ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයේදී සහ ඉගැන්වීමේ උත්සාහයන් තුළ යන දෙංශය තුළදී සෑම ගුණාංගයකම වැදගත්කම පිළිබඳ මූලික සමාලෝචනයක් සිදු කරන ලෙස මුල් කොටස්වලදී සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටින අතර මෙම අරමුණ සඳහා සෑම එකකටම අදාළ උද්ධෘත පාඨයන්ගෙන් උපුටා ගන්නා ලද කුඩා කොටසක් ඇතුළත් කර ඇත.

එවැනි සමාලෝචනය නියැලිමෙන් පසු, ඔවුන් සලකා බලන ලද ගුණාංගයන් විහිදා දක්වන කතාන්දරයන් විමසා බැලීම සහභාගිවන්නන් විසින් ඊළඟට සිදු කරයි. මෙමගින් බොහෝ දුරට අබ්දුල් බහාතුමාගේ ජීවිතයෙන් උපුටා ගෙන මනුෂ්‍ය ආත්මයේ ගුණාංග ලෙස ආධ්‍යාත්මික ගුණාංගයන්ගේ අසීමිත ප්‍රකාශවීම් පිළිබඳ ක්ෂණික දර්ශයන් ළමුන් වෙත ලබා උත්සාහ කරනු ලබයි. මෙහිදී, එක් එක් කතාන්දරයන් සඳහා ප්‍රශ්න කිහිපයක් ලබාදී ඇත්තේ එමඟින් සිදුවීම් අනුපිළිවෙලින් ඔබ්බට ආධ්‍යාත්මික ගුණාංගයන් ගවේෂණයකර බැලීමට ගුරුවරුන්ට උපකාරවීම සඳහාය. විශේෂයෙන්ම අබ්දුල් බහාතුමාගේ කතාන්දරයන් සැලකීමේදී, එහි කථාංගයන් තුල ප්‍රශ්න සකස්කර ඇත්තේ උපරිම පරිපූර්ණත්වයෙන් එතුමා ආධ්‍යාත්මික ගුණාගය ප්‍රදර්ශනය කර ඇත්තේ කෙසේද යන්න ගුරුවරුන්ට අවධාරණය කිරීමට සහ ක්ෂණික මෙන්ම එතුමාණන්ගේ ක්‍රියාවන්ගේ සැබෑ විශේෂත්වය දැකීමේ අවධානයෙන් ළමයින් වෙනතකට යොමු කරන මතුපිටින් පෙනෙන සහසම්බන්ධතාවය කෙරෙහි අවධානය යොමුවීම වැළැක්වීම සහතික කරනු සඳහාය.

මේ ආකාරයෙන් එක් එක් කාණ්ඩයන් ලෙස පාඩම් හතරක් සහභාගිවන්නන් විශ්ලේෂණය කිරීමෙන් පසු, පළමු ඒකකයේ සාකච්ඡා කරන ඇති ප්‍රවේශයන් භාවිතා කරමින් ඔවුන් අතරම විවිධ අංග පුහුණුවීම සඳහා කාලය ගත කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිමු. ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි වැදගත්කම අධිතක්සේරු කළ නොහැක. කණ්ඩායමේ සාමාජිකයින් ගුරුවරුන් ලෙස ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීමට දරන උත්සාහයන් සඳහා උපකාර කිරීමේ බොහෝ දේ දැන් උපදේශකවරයා මත පැවරී ඇත. මේ සම්බන්ධයේදී, පාඩම් හතරේ කොටස්වලට බෙදා අධ්‍යනය කිරීමට සංවිධානය කිරීම මඟින් නම්‍යශීලිබවක් ලබාගැනීමට ඉඩ සලස්වන අතර, අවශ්‍යතාවය මත ළමා පන්ති සඳහාවූ ආයතනික සම්බන්ධීකාරකවරුන් සමඟ සාකච්ඡා කර වඩාත් හොඳින් ඉදිරියට ගෙනයෑමට අවශ්‍ය උපදෙස් මෙහිදී උපදේශකවරයාට ලබාදිය හැක. සේවා ක්‍රියාකාරකමක් ලෙස මෙය ආරම්භ කිරීමට පෙර සහභාගිවන්නන්ට එහි අඩංගු ප්‍රායෝගික ක්‍රියාකාරකම්ද ඇතුළුව සම්පූර්ණ ඒකකය අධ්‍යන කිරීමට අවස්ථාව තිබිය හැක. මෙවැනි අවස්ථාවකදී, පන්තියක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවන අය ඔවුන්ගේ 3 වැනි පොත අධ්‍යනය අවසානයෙන් පසු ඔවුන්ගේම පන්තියක් ආරම්භ කිරීමෙන් හෝ වෙනත් ගුරුවරයෙකුගේ පන්තියක සමහර ක්‍රියාකාරකම්වලට උපකාර කිරීමෙන් ක්‍රමාණුකූලව අත්දැකීම් ලබාගැනීමට හැකිවේ. කෙසේ වෙතත් වෙනත් තත්වයන් යටතේදී, ලබාදී ඇති පාඩම් කට්ටල හතරෙන් එකක් හෝ දෙකක් අධ්‍යනයකර ප්‍රායෝගිකව සම්පූර්ණ කිරීමෙන් පසු ඉගැන්වීම පිළිබඳ මේහා සමාන අත්දැකීම් ලබාගැනීමට පටන් ගැනීමට ඵලදායකවිය හැක.

සුදුසු කාල අන්තරයන් තුලදී සහභාගිවන්නන් ලබාගත් අත්දැකීම් සමඟ තවත් පාඩම් හතරක් අධ්‍යනය කිරීමට සහ ප්‍රායෝගික පුහුණුව සඳහා සහභාගිවන්න්න නැවත එක්කර ගැනීමද උපදේශකවරයාට සිදුකළ හැක.

මූලික කොටස්වලදී පාඩම් හතරක කාණ්ඩයන් ලෙස සංවිධානය කර තිබුණද ඒවා එකිනෙක තුල සාකච්ඡා කරනු ලබන ආධ්‍යාත්මික ගුණාංග අතර විශේෂ ආකාරකයේ සම්බන්ධතාවයක් මෙහිදී පෙන්නුම් නොකරන බව මෙහිදී සඳහන් කළ යුතුය.

එවැනි පෙළගැසීම් නොතකිමින්, ගුරුවරුන් පාඩම් පිළිබඳ මනා හුරුපුරුදු බවකින් සහ සෑම පන්ති කාලපරිච්ඡේදයක් සඳහාම ඉතා හොඳින් සූදානම්වීම ඉතාමත් වැදගත්වේ. ගුරුවරුන් විසින් කෙළින්ම පොත තුලින් කියවීමට වඩා, යාඥා සහ උද්ධෘත පාඨයන් ගායනා කිරීමට මෙන්ම පාඩම සඳහා වූ උද්ධෘත පාඨය හඳුන්වාදීම මතකයෙන් කළ හැකිනම් සහ කතාන්දරය පැවසීමට හොඳින් පුරුදුවී සිටීනම් එවැනි ළමා පන්ති වඩාත් සාර්ථක වනු ඇත. මෙවැනි ආකාරයේ පෙර පුහුණුවකට අමතරව, ක්‍රීඩා සහ වර්ණ ගැන්වීමේ කඩදාසි සහ පාටකූරු වැනි සමහර අවශ්‍යතාවයන්වලින් හාහිරව ද්‍රව්‍ය සහ බාහිර සම්පත් අවශ්‍ය වන්නේ ඉතා සුළු වශයෙනි. දෙවැනි ඒකකයේ ඇති වර්ණ ගැන්වීමේ කඩදාසි ඡායා පිටපත් කිරීම හෝ වෙනත් කඩදාසි ඒමත තබා ඇද ගැනීමෙන් හෝ ප්‍රතිනිෂ්පාදනය කළ හැක. මීට අමතරව රුහී ආයතනයේ වෙබ් අඩවිය තුලින් මේවා මුද්‍රණය සඳහා බාගත හැකිය. මීට අමතරව 1 වැනි ශ්‍රේණිය සඳහා වූ ගීතද මෙම වෙබ් අඩවිය තුල ඇති අතර එය ගුරුවරුන් හට පන්තියට සූදානම්වීම සඳහා පමණක් නොව ළමුන්ට ගායනා කිරීමට පුහුණුවීම සඳහාද භාවිතා කළ හැක. තම සමාජයන් තුල තරුණයින් සඳහා පන්ති ආරම්භ කරන අය ඔවුන්ගේ උත්සාහයන් වෙනුවෙන් වෙන්වූ සටහන් පොතක් පවත්වාගෙන යෑමට දිරිමත් කරන අතර, එමඟින් ඔවුන්ට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබාගත හැකි අතර සූදානම්වීමේ සහ සමාලෝචනයේ රටාව ශක්තිමත් වනු ඇත.

1 වැනි ශ්‍රේණිය සඳහා ඇති පාඩම් විසි හතර සාමාන්‍ය තත්වයක් යටතේදී එක් පාඩමක් එක් පන්තිවාරයක් තුලදී අවසන් කළ හැකිවන ලෙස බවට වූ සහතිකයෙන් නිර්මාණය කර ඇතිබව මෙහිදී පැහැදිලි කිරීම අගනා බවයි. පාඩමක අංගයන් කාල පරිච්ඡේදයන් දෙකක් අතර බෙදී යන ලෙස සැකසීම ක්‍රියාකාරකම් අනවශ්‍ය ලෙස දිගු කිරීමේ ප්‍රවණතාවයකට දායකවේ. කෙසේ වෙතත්, ඉතාමත් වැදගත් වන්නේ සෑම මට්ටමකම තීව්‍රතාවය සහ ක්‍රියාකාරකම් අතර රිද්මක් ස්ථාපිතවීම තුලින් ඉගෙනගැනීමේ ක්‍රියාවලියක සඵලතාවය අඩපණවීමට නොදී සෑම එකක්ම ආධ්‍යාත්මික ගුණාංගයක් වටා භ්‍රමණයවීමේ අවශ්‍යතාවයයි.

අවසාන වශයෙන්, අධ්‍යාපන ක්‍රියාවලියේදී ගුරුවරයා සහ ශිෂ්‍යයින් අතර ඇති සම්බන්ධ පිළිබඳ වචන කිහිපයක් පැවසිය යුතු අතර මේ තේමාව සම්බන්ධව පළමු ඒකකයේ 9 සහ 10 වැනි කොටස්වල සඳහන්වන නමුත් සම්පූර්ණ පොත පුරාම ඇඟවීම් සිදු කරයි. පළමු ශ්‍රේණිය අධ්‍යනයේදී පැහැදිලි කරන සියළුම ආධ්‍යාත්මික ගුණාංග ළමුන් අතර ඇති කිරීම සඳහා සෑම ගුරුවරයෙකුම ඔහුගේ හෝ ඇයගේ උපරිම උත්සාහය දැරිය යුතුබව පැහැදිලිය. මේ තුලදී, දෙවියන්වහන්සේගේ ප්‍රේමයම පරාවර්ථනය කරනු ලබන ආකාරයේ ප්‍රේමයක් තරම් වෙනත් කිසිවක් වැදගත් නොවේ. මෙම ආදරය - පන්තියට කළින් ඒ සඳහාවන සූදානම්වීම මත, සෑම එකක්ම ආරම්භයේදී කරනු ලබන යාඥාවන් තුළ, ශිෂ්‍යයින් සමඟවූ අන්තර්ක්‍රියාවන් සමඟ යොදන භාෂාව මෙන්ම සිසුන් විසින් ලබන දිරිගැන්වීම තුල සහ ඔවුන් ලබන දියුණුව පිළිබඳ ප්‍රශංසා කිරීම ආදී ගුරුවරයා විසින් නිර්මාණය කරනු ලබන වටපිටාවන්වලදී හැඟී යනු ඇත.



# අධ්‍යාපන පිළිබඳ බහායි මූලධර්ම කිහිපයක්

## අරමුණ

අධ්‍යාපනය සම්බන්ධව බහායි ලේඛනවල සඳහන් සමහර මූලධර්ම සහ සංකල්පයන් ගවේෂනය කිරීම සහ ළමුන් ආධ්‍යාත්මිකව පෝෂණ කරනු ලබන පන්තිවල ඔවුන් සම්බන්ධ කරගන්නා ආකාරය පිළිබඳ සමාලෝචනය කිරීම.

## 1 වැනි කොටස

සේවයේ ඉතා ප්‍රශංසනීය ක්‍රියාකාරකමක් වන ළමයින්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා බහායි පන්තිවල ඉගැන්වීම ඔබට හඳුන්වාදෙන මෙම පොත රුහි ආයතනයේ තුන්වැනි පොතයි. මෙම පොත අධ්‍යනයෙන් සහ එහි සේවා ක්‍රියාකාරකමෙන් පසු මෙම සේවා ක්‍රියාකාරකම සඳහා ඔබගේ කාලය සහ ශ්‍රමය වැය කිරීමට ඔබ තීරණය කරන්නේ නම්, අවුරුදු හයක අධ්‍යාපන වැඩසටහනක පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත්වන තරුණ කණ්ඩායමක් සඳහා ඔබගේ සමාජය තුල සතිපතා පැවැත්වෙන පන්තියක් ආරම්භ කිරීමට ඔබට හැකිවනු ඇත. ඔබ විසින් පන්ති පවත්වන අතර තුරදී ප්‍රධාන අනුක්‍රමික පාඨමාලාව තුලවූ පොත් තුලින් ඔබටද නියතවශයෙන් ඉදිරියට යෑමට හැකිවනු ඇත.

ඔබ ගමන් කරන සේවා මාර්ගයේ දරුවන්ට ඉගැන්වීම යනු සේවා ක්‍රියාකාරකම් කිහිපයක් අතරින් එකක් පමණි. ඔබ එම ක්‍රියාකාරකමෙහි නිරත නොවීමට තීරණය කළත් මෙම පාඨමාලාව හැදෑරීම ඔබට වටිනු ඇත. ඔබගේ ගමෙහි, නගරයෙහි හෝ අසල්වැසි ප්‍රදේශයේ සමාජය ගොඩනැංවීමේ ක්‍රියාකාරකමට දායකවීමේදී, කුඩා ළමුන් සමඟ බොහෝ අවස්ථාවලදී අන්තර් සම්බන්ධතාවන්ට යොමුවන අතර ඔබ විසින් මෙම අධ්‍යන තුලින් ලබාගන්නා තීක්ෂණ බුද්ධිය ඔබට යොමු කිරීමට හැකිවනු ඇත. විශ්ව අධිකරණ මණ්ඩලය විසින් දරුවන් පිළිබඳ වූ පහත ප්‍රකාශය සමාලෝචන කිරීමට මොහොතක් ගත කරන්න.

> **“ළමුන් තුල අනාගතය පිළිබඳ පොරොන්දුව සහ සහතිකය ඇති හෙයින් සමාජයක් සතුවිය හැකි වටිනාම වස්තුවක් වනනේ දරුවන්ය. වැඩිහිටියන්ගෙන් සමන්විත ප්‍රජාව විසින් ළමයින් සම්බන්ධයෙන් කරන ලද හෝ කිරීමට අපොහොසත්වූ දෑ මඟින් බොහෝ දුරට හැඩගස්වන ලද අනාගත සමාජයේ ගතිලක්ෂණයන්ගේ බීජ දරා සිටින්නේ ඔවුන් විසිනි. කිසිදු සමාජයකට ඒවා දුර්විපාක නොලබා නොසලකා හැරිය නොහැකි විශ්වාසයකි. සියල්ල වැළඳගන්නා අකාරයේ ළමුන් කෙරෙහි වූ ආදරය, ඔවුන්ට සලක ආකාරය, ඔවුන් කෙරෙහි දක්වන අවධානයේ ගුණාත්මක බව, ඔවුන් කෙරෙහි වැඩිහිටියන්ගේ හැසිරීමේ ස්වභාවය යනාදී මේ සියල්ල අත්‍යාවශ්‍ය ආකල්පයන්ගේ වැදගත් අංගයන් අතර වේ.”[1]**

පොතෙහි දෙවැනි ඒකකයේ ඉදිරිපත් කර ඇති පළමු ශ්‍රේණිය සඳහා වූ පාඩම් සරලය. සෑම එකක්ම ආධ්‍යාත්මික ගුණාංගයක් වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ක්‍රියාකාරකම් සමූහයකින් සමන්විත වේ. යාඥාවන් සහ උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීම, කතාන්දරයන් වෙත සවන්දීම සහ ඉගැන්වීම් පැහැදිලි කිරීම, චිත්‍ර ඇඳීම සහ පාට කිරීම, ගායනා කිරීම සහ සෙල්ලම් කිරීමට දරුවන් දිරිමත් කරනු ලැබේ. මෙම පාඩම් සිදු කිරීමට අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ විශාල දැනුමක් අවශ්‍ය නොවේ. ඔබට ගුරුවරයෙකු ලෙස විධිමත් පුහුණුවක් තිබේද යන්න නොසලකා, සතියෙන් සතිය ඵලදායි ලෙස ළමා පන්තියක් පවත්වාගෙන යෑමට මෙම පාඨමාලාව විසින් ඔබව සූදානම් කරනු ඇත. තුන්වැනි පොතෙහි විහිදී යනු අනුපාඨමාලාවන් ඔබ විසින් අධ්‍යනය කිරීම සහ ලබාගන්නා අත්දැකීම් සමඟ අධ්‍යාපනයේ මූලික කරුණු රාශියක් පිළිබඳ ඔබට සිතීමට අවස්ථාව ලැබෙණු ඇත. ආරම්භයේදී බොහෝවිට ඔබ විසින් පාඩම් සැලසුම්වලට සමීපව පවත්ගෙන යෑම අනුගමනය කරන නමුත් ඔබ විසින් විස්තාරණය කරනු ලබන අමතර අන්තර්ගතයන් සමඟ එය පොහොසත් කිරීමට ඔබට හැකිවනු ඇත.

## 2 වැනි කොටස

ගුරුවරයෙකු විසින් ඉටු කරනු ලබන කාර්යය අගය කිරීමට අපට උපකාරී වන බහා‘උ’ල්ලා තුමාගේ සහ අබ්දුල් බහාතුමාගේ පහත සඳහන් වචනයන් පිළිබඳ සමාලෝචන කරමු. ඉගැන්වීමේදී ඔබට එය මතකයට ගෙන ඒමට හැකිවන පරිදි ඒවා කටපාඩම් කිරීමට ඔබ කැමති වනු ඇත.

> “ප්‍රධානය කරන්නාවූත්, සර්ව ආදරණීයවූත් දෙවියන්වහන්සේගේ මාර්ගය දෙසට මිනිසුන්ට මඟ පෙන්වන සහ දරුවන් පුහුණු කිරීමට නැඟී සිටින ගුරුවරුන් ආශිර්වාද ලද්දෝ වෙති.”[2]

> “මනුෂ්‍යයෙකුට සර්ව බලධාරී දෙවියන්වහන්සේ වෙනුවෙන් කළ හැකි සියළුම සේවාවන් අතරින් ශ්‍රේෂ්ඨතම සේවාව වන්නේ දරුවන්ගේ අධ්‍යාපනය සහ පුහුණු කිරීමයි.”[3]

**"දිව්‍යමය ග්‍රන්ථවල පැහැදිලිව දක්වා ඇති පරිදි, ළමුන්ට ඉගැන්වීම යනු අත්හළ නොහැකි සහ අනිවාර්යය කාරණයකි. වන්දනාමාන කිරීම හා සමාන වන මෙම කාර්යය සිදු කිරීමට නැඟීසිටි දින සිට ගුරුවරුන් ස්වාමී වූ දෙවියන්වහන්සේගේ සේවකයින් ලෙස සඳහන් වේ. එම නිසා ඔබ විසින් ඔබගේ ආධ්‍යාත්මික දරුවන්ට ඔබ අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන් සැම ආශ්වාසක් පාසාම කෘතවේදීත්වය පිරිනැමිය යුතුය."**[4]

1. ඔබ විසින් මෙම වචනයන් පිළිබඳ සමාලෝචන කරන අතර පහත සඳහන් වාක්‍යයන්ගේ හිස්තැන් පුරවන්න.

 a. ප්‍රධාන කරන්නාවූත්, සර්ව ආදරණීයවූත් දෙවියන්වහන්සේගේ ____________ දෙසට මිනිසුන් ____________ සහ දරුවන්ට ____________ නැඟී සිටින ____________ ____________ ____________වෙති.

 b. මනුෂ්‍යයෙකුට සර්ව බලධාරී දෙවියන්වහන්සේ වෙනුවෙන් කළ හැකි සියළුම ____________ අතරින් ____________ සේවාව වන්නේ දරුවන්ගේ ____________ සහ ____________ කිරීමයි.

 c. දිව්‍යමය ග්‍රන්ථවල පැහැදිලිව දක්වා ඇති පරිදි, ළමුන්ට ඉගැන්වීම යනු ____________ සහ ____________ කාරණයකි. ____________ හා ____________ වන මෙම කාර්යය සිදු කිරීමට ____________ දින සිට ____________ ස්වාමී වූ දෙවියන්වහන්සේගේ ____________ ලෙස සඳහන් වේ. එම නිසා ඔබ විසින් ____________ ____________ ලබාදීම වෙනුවෙන් සැම ආශ්වාසක් පාසාම ____________ පිරිනැමිය යුතුය.

2. මේ දක්වා අප විසින් ඉගෙන ගන්නා ලද දේ මත පහත වාක්‍යයන්ගෙන් සත්‍ය ප්‍රකාශ තෝරන්න

 ______දෙමාපියන්, ගුරුවරුන් සහ සමාජය යන සියළු දෙනා අතර ළමයින්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනයේ වගකීම බෙදී යනු ඇත.

 ______සැම සමාජයක්ම ළමයින්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා පන්ති ආරම්භ කිරීම අනිවාර්යය වේ.

 ______ළමයින්ට ඉගැන්වීම වන්දනා මාන කිරීම හා සමාන වේ.

 ______ළමයින් පාසලට යන බැවින් සමාජයන්ට ළමුන් සඳහා ආධ්‍යාත්මික පන්ති පිහිටුවීමේ අවශ්‍යතාවයක් නොමැත.

 ______ළමා පන්ති ගුරුවරුන් විසින් ආධ්‍යාත්මික පුතුන් සහ දූවරුන් නගා සිටුවයි.

## 3 වැනි කොටස

ධර්මයේ ලේඛණ බොහොමයක් තුල අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධව සඳහන් වේ. ඒවායින් බොහෝමයක් අප මෙම පාඨමාලාව තුලදී සහ මෙයින් විහිදී යනු අනුපාඨමාලාවන් තුලදී අධ්‍යනය කරමු. ආරම්භයක් ලෙස බහා'උ'ල්ලා තුමාගේ පහත සඳහන් ලේඛනය කියවමු.

**"මනුෂ්‍යයා මිළ කල නොහැකි වටිනාකමකින් යුතු මාණික්‍යයන්ගෙන් පිරි ආකරයක් ලෙස සලකන්න. එහි වස්තූන් අනාවරණය කර මනුෂ්‍ය වර්ගයාට ප්‍රයෝජන ලබාගත හැකි කල හැක්කේ අධ්‍යාපනයට පමණි."**[5]

පහත වාක්‍ය සම්පූර්ණ කිරීමෙන් ඔබට මෙම ප්‍රකාශයේ ගැඹුරු අර්ථය සමාලෝචන කිරීමට සහ ඔබ දැනටමත් එසේකර නොමැති නම් එය මතකයේ තබා ගැනීමට උපකාරී වනු ඇත.

a. මනුෂ්‍ය වර්ගයා ______________________ නොහැකි මාණික්‍යයන්ගෙන් පිරි ________________ ආකරයක් ලෙස සලක්න්න.

b. එහි වස්තූන් ________________ කර මනුෂ්‍ය වර්ගයාට ________________ ලබාගත හැකි කල හැක්කේ ______________________ පමණි.

## 4 වැනි කොටස

ඉහත උපුටා දැක්වීම පිළිබඳ අප තවදුරටත් සලකා බලමු. බහා'උ'ල්ලා තුමා විසින් සඳහන් කරන ලද මැණික් අතර ආදරය, සත්‍යවාදීබව, යුක්තිය, ත්‍යාගශීලී බව, ස්ථිරසාර බව සහ අවංකකම වැනි ගුණාංග අපට ඇතුළත් කළ හැකිද? ස්වභාව ධර්මයේ ඇති අභිරහස් සොයාගැනීමට ඇති බලය, අලංකාරවත් කලා කෘති බිහිකිරීමට, උතුම් සහ උසස් සිතුවිලි ප්‍රකාශ කිරීමට ආදි මිනිස් මනසේ බලය පිළිබඳ කුමක් කිව හැකිද? ඔබ විසින් උගන්වන ළමුන්ට මෙම ගුණාංග සියලල්ම අත්පත් කරගැනීමේ හැකියාව ඇත. ඔබට අදහස් කිහිපයක් සඳහන් කළ හැකිද? මේ අතරින් කිසිවක් නිවැරදි අධ්‍යාපනයක් නොමැතිව සංවර්ධනය කරගත හැකිද? මෙම ප්‍රශ්න පිළිබඳ සමාලෝචනය කිරීමේදී, පළමු පොතෙහි සඳහන් කර ඇති ලාම්පුවකට ආලෝකය ලබාදීමේ හැකියාව ඇති නමුත් එය සිදු කිරීමට නම් එය දැල්විය යුතුයි යන ප්‍රකාශය මතක තබාගන්න.

## 5 වැනි කොටස

අපගේ හැකියාවන් සංවර්ධනය කරගැනීමට සඳහා, අප සියලු දෙනාම අපගේ ජීවිතයේ අවසානය දක්වා දිග හැරෙන අධ්‍යාපන ක්‍රියාවලියක විවිධ අවධීන් හරහා යා යුතුය. අප නිවසේදී, පාසැලේදී, රැකියා කරන ස්ථානයේදී සහ සමාජය තුළදී අධ්‍යාපනය ලබයි. මෙහෙදී අප අපෙන්ම අසාගත යුතු ප්‍රශ්නයක් වන්නේ, ජීවිත කාලය පුරාවටම දිවෙන අධ්‍යාපන ක්‍රියාවලියක් විෂයාංගයක් ලෙස විශේෂයෙන්ම පළමු ශ්‍රේණියේ බහායි ළමා පන්තිවල අවධානය යොමුවිය යුතුතේ කුමක් සඳහාද? මේ සඳහා පිළිතුරු සෙවීමේදී අපට අබ්දුල් බහාතුමාගේ ඇතැම් උපදේශයන් ප්‍රයෝජනවත් වනු ඇත.

> **"පළමු වැදගත්කම ලෙස යහපත් චරිතය පිළිබඳ ප්‍රශ්නය ඔබ විසින් සලකා බැලිය යුතුය. සෑම පියෙකු සහ මවක් වෙත පැවරෙන වගකීමක් වන්නේ දීර්ඝ කාලයක් තිස්සේ තම දරුවන්ට උපදෙස් ලබාදී සදාකාලික ගෞරවයට මඟ සලස්වන දේ වෙත ඔවුන්ට මඟ පෙන්වීමයි."[6]**

> **"පොත්පත් ඉගෙනගැනීමට වඩා සදාචාරය සහ යහපත් හැසිරීමට පිළිබඳ පුහුණු ඉතා වැදගත් වේ. විද්‍යාවන් සහ කලාවන් පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති අශිෂ්ට, අපිරිසිදු, නරක ස්වභාවයෙන්**

**යුත් දරුවෙකුට වඩා අඥාන වුවත් පිරිසිදු, ප්‍රියමනාප, යහපත් චරිතයකින් යුත්, හොඳින් හැසිරෙන දරුවෙකු වඩා සුදුසුය. මෙයට හේතුව වන්නේ, නූගත් වුවත් හොඳින් හැසිරෙන දරුවෙකු අන් අයට ප්‍රයෝජනවත් වන අතරම, උගත් වුවත් නරත හැසිරීමෙන් සහ නරක ස්වභාවයෙන් යුත් දරුවෙකු දූෂිත හා අන් අයට හානිදායක වන බැවිනි. කෙසේ වෙතත්, දරුවෙක් උගත් සහ යහපත් යන දෙංශයෙන්ම පුහුණු කළහොත් එහි ප්‍රතිඵලය අලෝකයේත් ආලෝකය වේ.''[7]**

**''කාලය ඉදිරියට යත්ම, සදාචාරය එහි අන්තයටම පිරිහී යනු ඇත. මේ ලෝකයේත් මීළඟ ලෝකයෙත් දරුවන්ට සතුට සොයා ගතහැකි වන ලෙස ඔවුන් බහායි ක්‍රමයට අනුව ඇති දැඩි කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒසේ නොවුවහොත්, ආධ්‍යාත්මික හැසිරීම මත මනුෂ්‍ය වර්ගයාගේ සතුට පදනම්වී ඇති නිසා සංවේගයන් සහ කරදර ඔවුන් වටා නිරන්තරව පවතිනු ඇත.''[8]**

මෙවැනි පරිච්ඡේදයන් මඟින් රුහි ආයතනය ළමයින්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා වන එහි වැඩසටහන්වල පළමු ශ්‍රේණියේ ගතිලක්ෂණයන් ප්‍රතිශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදි. අප විසින් මෙම අරමුණ ගවේෂණය කිරීමට පෙර, ''යහපත් චරිතය'' යනුවෙන් ඔබ අවබෝධ කරගන්නේ කුමක්ද යන්න ඔබගේ කණ්ඩායම තුල සාකච්ඡා කර පහත ලබාදී ඇති අවකාශය තුල ඔබගේ නිගමනයන් කිහිපයක් ලිවීමට ඔබ කැමති වනවා ඇත.

## 6 වැනි කොටස

''ගුණ ධර්ම'' යනු යහපත් චරිතය පිළිබඳවූ ඔබ විසින් සිතන්නට පටන්ගන්නවාත් සමඟ ඔබගේ මනස නැඟෙන සංකල්පය වේ. ශිෂ්‍යයින් තුල කාණ්ඩ වශයෙන් හෝ එක එක වශයෙන් ගුණධර්ම සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන වටිනා වැඩසටහන් රාශියක් ලෝකය පුරා ඇත. මෙම වැඩසටහන් මඟින් ''ගුණ ධර්ම'' යන යෙදුම භාවිතා කරනු ලබන්නේ පුළුල් පරාසයක් තුල විහිදී ගිය ප්‍රශංසනීය මානව ගුණාංගය විස්තර කිරීම සඳහාය. කලට වේලාට වැඩකිරීම ආදිය ඒ අතරවේ. දුෂ්කරතාවයන් ඇති අය කෙරෙහි දක්වන අනුකම්පාව වැනි වෙනත් ආකල්පයන්ද වේ. තවත් සමහරක් පැහැදිලිව කතා කිරීමේ හැකියාව වැනි නිපුණතා සහ හැකියාවන් පිළිබඳ සඳහන් කරයි. නමුත් අනෙකුත් සියළුම ගුණ ධර්ම වලින් වෙන්වී පවතින ''ආධ්‍යාත්මික ගුණාංග'' ලෙස අප හඳුන්වන එක් ගුණ ධර්මයක් වන අතර එය උදාහරණ ලෙස සත්‍යවාදී බව, ත්‍යාගශීලී බව, නිහතමානි බව, ආදරය දැක්විය හැක. පළමු ශ්‍රේණිය තුලදී මිනිස් ආත්මයේ මෙම මූලික ගුණාංග වර්ධනය කිරීම කෙරෙහි ඔබේ අවධානය යොමු කිරීමට උත්සාහ කරන ලෙස ඔබගෙන් ඉල්ලා සිටී. ඔබ දරුවන් සමඟ සිදු කරන අන්තර් ක්‍රියාවන්වලදී වෙනත් ගුණ ධර්ම නොසලකා හරින බවත් මෙයින් අදහස් නොවේ. මෙහිදී සිදුවන්නේ දෙවියන්වහන්සේ වෙත ආත්මයේ සදාකාලික ගමනට අත්‍යාවශ්‍ය වන ගුණාංග කෙරෙහි ඔබ උගන්වන පාඩම්වල මූලික වශයෙන් සැලකීමක් දැක්වීම පමණි. මෙහි සඳහන් වන වෙනසෙහි ස්වභාවය තේරුම් ගැනීම සඳහා කලට වේලාවට වැඩකිරීම ගුණ ධර්මයක් ලෙස සලකන්න. කලට වේලාවට වැඩකරන අයෙක් නපුරු සහ කුරිරු විය හැක. කෙසේ වෙතත්, කුරිරු සහ පහත් ස්වභාවය යනු සත්‍යාවාදී බව සහ අවංකකම, ආදරය සහ යුක්තිය, ත්‍යාගශීලී බව සහ ක්ෂමාවදීම ආදී ස්වර්ගීය ගුණාංග අත්පත් කරගත් අයෙකුගේ ලක්ෂණයන් විය නොහැක. එවැනි පුද්ගලයෙකු කලට වේලාවට වැඩකිරීම ඇත්ත වශයෙන්ම ඉතාමත් යෝග්‍ය වේ.

මේ ජීවිත කාලය තුලදී ආත්මය විසින් අත්පත් කරගත යුතු ගුණාංග පිළිබඳ අදහස් කිහිපයක් රුහි පළමු පොතේ තුන්වන ඒකකය තුලදී ඔබට ලබාදී ඇත. ඔබට එම ඒකකය වෙත ආපසු ගොස් අදාළ කොටස් නැවත සමාලෝචන කිරීම මෙහිදී ඔබට සුදුසු වනු ඇත. ඔබ එහිදී ඉගෙන ගත්දෑ සම්බන්ධයෙන් කුඩා කල සිටම ආධ්‍යාත්මික ගුණාංග වර්ධනය කිරීමේ වැදත්කම පිළිබඳ ඔබට කුමක් සිතිය හැකිද. ඔබගේ සමාලෝචන ලියා දැක්වීම සඳහා පහත අවකාශය ලබාදී ඇත.

## 7 වැනි කොටස

ප්‍රශංසනීය චරිතයක් පිළිබිඹු කිරීමට ළමයින්ට උපකාර කිරීමේදී, ගුණ ධර්ම අනිවාර්යයෙන්ම ක්‍රියාවට නැංවිය යුතු බැවින් ඔබ ඔවුන්ගේ හැසිරීම පිළිබඳ ස්වාභාවිකවම සැලකිලිමත් වනු ඇත. ගුරුවරයෙකු ලෙස ඔබ විවිධ ආකාරවලින් යහපත් හැසිරීම් ශක්තිමත් කරනු ඇත. ප්‍රශංසා කිරීම, දිරිගැන්වීම, අනුශාසනා කිරීම,පැහැදිලි කිරීම, ත්‍යාගයන් යනා දී මේ සෑම කරුණක්ම ඔබ විසින් කුඩා තරුණ පිරිසකගේ ප්‍රගතිය අනුගමනය කිරීමට නැවත නැවතත් භාවිතා කරනු ඇත. සමහර අවස්ථාවලදී, ඔබගේ මෘදු අප්‍රසාදය ප්‍රකාශ කිරීම් දරුවෙක් හෝ තවත් අයෙක් විසින් ප්‍රදර්ශන කරන ලද නුසුදුසු හැසිරීමක් අධෛර්යමත් කිරීමට මාධ්‍යක් ලෙස ක්‍රියා කළ හැකි අතර එය ඔබේ පන්තියේ සිසුන් සමඟ ආදරය සහ සෙනෙහෙස පිළිබඳ ගැඹුරු බැඳීම් ඇති කරගැනීමෙන් පසුව කළ හැක. ඔබ ඔබේ සිසුන් සමඟ සිදු කරන අන්තර් ක්‍රියාවන් හා සම්බන්ධ ගැටළු කිහිපයක් අප පසු කොටස්වලදී ගවේෂණය කරමු. අපගේ වර්තමාන සාකච්ඡාවේ අරමුණ සඳහා අප එක් උදාහරණයක් සලකා බලමු. ඔබ දරුවන් සමඟ සිදු කරන අන්තර් ක්‍රියාවන්වලදී, බෙදාහදා ගන්නා ආකල්පය සහ ඒහා සම්බන්ධවන පුරුද්ද ශක්තිමත් කිරීමට උත්සාහ කරන බව නිසැකය. ඔබට කිව හැකි සහ කළ හැකි සමහරක් දේවල් මොනවාද? මේ සම්බන්ධව කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න.

දැන් පහත ප්‍රශ්නය පිළිබඳ සමාලෝචන කරන්න: සර්ව ත්‍යාගශීලී, නිර්ලෝභි දෙවියන්වහන්සේගේ ගුණාංගයක් ප්‍රදර්ශනය කිරීමක් සේ ත්‍යාගශීලීත්වයේ ආධ්‍යාත්මික ගුණය ප්‍රකාශවීමක් සිදු නොවන අවස්ථාවන්වලදී  හැසිරීමේ අංගයන් බෙදාහදා ගැනීම නොනැසී පවතීද? පිළිතර, ඇත්ත වශයෙන්ම, හැසිරීම් වෙනස් කිරීම සඳසා එයට වූ අවකාශයන් පවතින අතර සැබෑ ඉලක්කය විය යුත්තේ දෙවියන්වහන්සේ පිළිබඳ දැනුමෙන් සහ දෙවියන්වහන්සේට ඇති ආදරයෙන් යුතුව මිනිස් ආත්මයේ හැකියාවන වන ආධ්‍යාත්මික ගුණාංග වර්ධනය කිරීමයි. අබ්දුල් බහාතුමා අපට මෙසේ අවවාද කර ඇත.

> **“ඔබට දරුවන්ට මෙන් ලියා දක්වන්නේ; ආරම්භයේ සිටම ළමයින්ට දිව්‍යමය අධ්‍යාපනය ලැබිය යුතු අතර, නිරන්තරව ඔවුන්ට දෙවියන්වහන්සේ සිහිකිරීම නොකඩවා මතක්කර දිය යුතුය. දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඔවුන්ගේ මව්වරුන්ගේ කිරි සමඟ මුසුවී ඔවුන්ගේ ඉතා අභ්‍යන්තර පුරා පැතිරේවා.”**[9]

> **“ළදරුවියේ සිටම, දරුවන්ට ඔවුන්ට ආලෝකයේ කිරණ විහිදි හැකි, ආධ්‍යාත්මිකත්වය තුල වර්ධනයවීමටත්, ප්‍රඥාවෙන් සහ උගත්කමින් පිරීයැමටත් සහ දේව දූතයින්ගේ චරිත ලක්ෂණයන් ලබාගත හැකිවන පරිදි ඔවුන් දෙවියන්වහන්සේගේ ආදරයේ පයෝධරයන්ගෙන් පෝෂණය කළ යුතු අතර, උන්වහන්සේගේ දැනුමෙහි වැළඳගැනීම තුල පෝෂණය කළ යුතුය.”**[10]

> **“දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ ඔබේ ප්‍රශ්නය සම්බන්ධවයි; ඔවුන් දෙවියන්වහන්සේ වෙතය මුහුණ යොමු කරනු පිණිසත්, ඔවුන්ගේ මාර්ගය යහපත් හැසිරීමේ නීතිවලට අනුකූල වියහැකි වන ලෙස සහ ඔවුන්ගේ චරිතය කිසිවකට නොදෙවෙනි වන ලෙසත්, මනුෂ්‍ය වර්ගයාගේ සියළුම ප්‍රශංසනීය ගුණාංග සහ වරප්‍රසාදයන් ඔවුන්ගේම කරගත හැකිවන පරිදි ඔවුන්ව දෙවියන්වහන්සේගේ ආදරයේ පයෝධරයන්ගෙන් පෝෂණය කිරීම සහ ඔවුන් ආත්මීය දේවල් වෙතට යොමු කිරීම ඔබ මත පැවරී ඇත.”**[11]

මේ අතරින් එක් උද්ධෘත පාඨයක් හෝ කටපාඩම් කරගැනීමට ඔබ කැමති වනවා ඇත.

## 8 වැනි කොටස

සාමාන්‍යයෙන් අවුරුදු පහක හෝ හයක වයසේ සිටින පළමු ශ්‍රේණියේ දරුවන්ට ඔබ උගන්වන පාඩම්, අප මේ දක්වා ගවේෂණය කළ අදහස් මනසේ තබාගෙන විස්තර කර ඇත. මූලික ඒකකය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් දෙවන ඒකකය වෙත යොමුවී එහි පාඩම් දෙකක් හෝ තුනක් කියවීම මේ අවස්ථාවේදී ඔබට ප්‍රයෝජනවත් වනු ඇත. ඔබ පාඩම් විසි හතරම විස්තරාත්මකව විශ්ලේෂණය කිරීමට අවස්ථාවක් පසුව හිමිවනු ඇත. දැනට, පහත සඳහන් කර ඇති පරිදි, පෙර කොටස්වල සාකච්ඡාවට අනුව ඒවායේ විවිධ අංග ගැන සිතා බැලීමට ඔබටව ධෛර්යමත් කර සිටිමු.

ඔබ විසින් සහ පන්තියේ සමහර ළමයින් විසින් යාඥා ගායනයෙන් අනතුරුව සෑම පන්තියක්ම ආරම්භ වේ. ඉන් අනතුරුව, ඔබගේ සහාය ඇතිව තරුණ ළමයින්ට යාඥාවක් කටපාඩම් කිරීම සඳසා කාලය වෙන් කළ හැක. "දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ පයෝධරයන් මත පෝෂණය කළ යුතු" ළමයින්ගේ සංවර්ධණය සඳහා යාඥාව ඉතා අත්‍යාවශ්‍ය වේ. "ළමයින් යනු තරුණ පැළැටි හා සමාන වන අතර, ඔවුන්ට යාඥාවන් ඉගැන්වීම යනු, ඔවුන් මත වර්ෂාව ඇදහැලෙන්නට සැලැසවීමත්, ඔවුන්ගේ මෘදු මොළොක් බව සහ නැවුම් බව ශක්තිමත් කිරීම සහ දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ස්ථිරසාරභාවයේ මඳපවන් ඔවුන් හරහා හමා ගොස් ඔවුන්ව ප්‍රීතියෙන් පිනායෑමට සැලැස්වීම වැනිය." යනුවෙන් අබ්දුල් බහාතුමා පවසා ඇත. ළමයින්ගේ යහපත් චරිතය ගොඩනැඟීමේ සමස්ත අරමුණට පන්තියේ මෙම අංගය දායකවන්නේ කෙසේදැයි ඕනෑකමින් සිතා බැලීම සඳහා මොහොතක් ගතකරන්න. ඔබගේ අදහස් වාක්‍ය කිහිපයක් තුලින් පැහැදිලි කිරීමට උත්සාහ කරන්න. පළමු පොතෙන් උපුටා ගන්නා ලද පහත දක්වා ඇති පරිච්ඡේදයන් ඒ සඳහා ඔබට උපකාරි විය හැක.

> **"ශ්‍රේෂ්ඨතම ලබාගැනීම හෙවත් මිහිරිතම තත්වය අනෙකත් නොව දෙවියන්වහන්සේ සමඟ සංවාදයේ යෙදීමයි. එය ආධ්‍යාත්මිකත්වය ඇති කරන අතර සිහි කල්පනාව සහ දිව්‍යමය හැඟීම් ඇති කරවා රාජධානියේ නව ආකර්ෂණයන් ජනිත කර උසස් බුද්ධියේ නැඹුරුතාවයන් ඇති කරවයි."[12]**
>
> **"මාගේ සේවකය' ඔබට ලැබී ඇති දෙවියන්වහන්සේගේ පද්‍යයන් උන්වහන්සේට ඉතා සමීප අයවළුන් විසින් ගායනා කර ඇති පරිදි ඔබගේ ස්වර මාධූර්යයේ මිහිරියාවෙන්, ඔබගේම ආත්මය ප්‍රබෝධමත්වී අනෙකුත් අයගේ හෘදයන් ආකර්ෂණය කරගනු වස් හඬනඟා ගයන්න."[13]**
>
> **"ආත්මයට බලපෑමක් තිබේ. යාඥාවෙන් ආධ්‍යාත්මික ප්‍රතිඵල ලැබේ."[14]**
>
> **"දෙවියන්වහන්සේට යාඥා කිරීමත්, එතුමන්ගේ ආධාර ඉල්ලා සිටීමත් සේවකයෙකුට යෝග්‍ය වන අතර, එතුමාණන්ගෙන් අයැද සිටීම, බැගෑපත්ව ආයාචනා කර ආධාර පැතීමත් යෙදේ. දාසත්වයේ තත්වය එබඳුවන අතර, අධිපතියාණන් තමන්වහන්සේගේ අභිලාෂයට සහ පරිසමාප්ත ප්‍රඥාවට ගෝචරවන කුමක් හෝ නියම කරනු ඇත."[15]**

සෑම පාඩමකම තේමාව ළමයින් විසින් කටපාඩම් කරගනු ඇතැයි අපේක්ෂා කරන ශුද්ධවූ ලියවිල්ලකින් උපුටා ගන්නා ලද උද්ධෘත පාඨයක් වටා ගෙතී ඇත. අවබෝධ කරගැනීම යනු ආධ්‍යාත්මික ගුණාංගයන්ගේ සංවර්ධනයට ඉතාමත් අත්‍යාවශ්‍ය බව අවිකල්පයෙන්ම ඔප්පු වී ඇති හෙයින් එහි අර්ථයේ මූලික අවබෝධය ලබාගැනීමට ඔවුන්ට උපකාර කිරීමට ඔබගේ උපරිමයෙන් කරන ලෙස ඔබගෙන් ඉල්ලා සිටිමු. දෙවියන්වහන්සේගේ වචනයේ උපකාරයෙන් තොරව ඔබ අපේක්ෂා කරන ගුණාංග කිසියම් අර්ථවත් ආකාරයකින් පෝෂණය කළ හැකිද යන්න මෙහිදී ඔබ විසින් සලකා බැලිය යුතු ප්‍රශ්නයකි. තවද, ඔබගේ සිතුවිලි සකස් කරගැනීම සඳහා ක්‍රමානුකූල පාඨමාලාවන්ගේ මුල් පොත් වන 2 වැනි පොතෙහි පළමු ඒකකයේ දෙවියන්වහන්සේගේ වචනයේ බලය වැනි කොටස්වල සාමාලෝචනයන් ඔබගේ මතකයට නඟාගන්න.

මෙම ගැටළුව විසඳීම සඳහා බොහෝවිට ඔබ කටපාඩමින් මතක ඇති පහත දක්වා ඇති ඡේදය විශේෂයෙන් ඔබට උපකාරී වන්නේ කෙසේද?

**"දෙවියන්වහන්සේගේ වචන යනු මිනිසුන්ගේ හදවත් තුල සිටුවා ඇති නොමේරූ පැළයක් හා සමාන වේ. එහි අතුපරත ස්වර්ගයට හා ඉන් ඔබ්බටත් විහිදී යනු පරිදි සහ එහි මුල් ඉතා තදින් ස්ථිරව ස්ථාපනය වන පරිදි එය ශුද්ධ වූ වචනයන්ගෙන්, පවිත්‍රත්වයේ සහ ප්‍රඥාවේ ජීව දායක ජලයෙන් එහි වර්ධනය පෝෂණය කිරීම ඔබට පැවරී ඇති වගකීමක් ලෙස සලකන්න."**[16]

පාඩම්වල ඇති තවත් අංගයක් වන්නේ ළමයින් සඳහා විස්තර කරන ලද කතාන්දරයන්ය. මෙම බොහෝ කතාන්දරයන් උපුටාගෙන ඇත්තේ, තම පියාණන්ගේ ඉගැන්වීම්වල පරිපූර්ණ ආදර්ශකයාණන්ද, ඔබ විසින් පෝෂණය කිරීමට බලාපොරොත්තු වන ගුණාංගයන්ගෙන් මූර්තිමත් වූ අබ්දුල් බහාතුමාගේ ජීවිත කතාවෙනි. දෙවැනි පොතෙහි තුන්වන ඒකකය පිළිබඳ ඔබගේ අධ්‍යනයෙන් පසු, අබ්දුල් බහාතුමා වන තැනැත්තාණන් තුලවූ මනුෂ්‍යත්වය මත අද්විතීය වරප්‍රසාදය පිළිබඳ ඔබ දැනටමත් දන්නවා ඇත. දරුවන් උන්වහන්සේගේ ජීවිතය ගැන ඉගෙන ගන්නා කතාන්දරයන් ඔවුන්ගේ චරිතය සංවර්ධනය කිරීමේදී විශේෂ කාර්යයභාරයක් ඉටු කරන අතර, දරුවන් කෙරෙහි වූ උන්වහන්සේගේ සුවිශේෂී ආදරය පිළිබඳ ඔවුන්ට නැවත නැවතත් මතක් කළ යුතුය. අබ්දුල් බහාතුමා සමඟ ඔවුන්ගේ බැඳීම ශක්තිමත් වනවිට, ඔවුන් එතුමාණන්ගේ ආදර්ශය අනුගමනය කිරීමට උත්සාහ කරනවිට, ඔවුන් විසින් එතුමාණන්ගේ හදවකට ප්‍රීතිය ගෙනදෙන බව ඔබට ඔවුනට සහතික විය හැක.

ගීත ගායනා කිරීම පන්තියේ තවත් එක් අංගයක් වන අතර එය දරුවන්ගේ හදවත් සහ ආත්මයන් ප්‍රීතියෙන් පුරවයි. අබ්දුල් බහාතුමා මෙසේ පවසා ඇත.

**"සංගීත කලාව දිව්‍යමය සහ ඵලදායි එකක් වේ. එය ආත්මයේ සහ ජීවයේ ආහාරය වේ. සංගීතයේ බලයෙන් සහ චමත්කාරයෙන් මනුෂ්‍යයාගේ ආධ්‍යාත්මය උසස් කරනු ඇත. ළමයින්ගේ හදවත් පවිත්‍ර සහ ස්වර මාධූර්යයන් ඔවුන් විශාල බලපෑමක් ඇති කරන හෙයින් දරුවන්ගේ හදවත් තුල පුදුමාකාර පෙළඹවීමක් සහ බලපෑමක් ඇති කරයි."**[17]

දරුවන් ඉතා කුඩා කාලයේ සිටම ලස්සනට ගීත ගායනා කිරීමට ඉගෙන ගැනීම වැදගත් වන්නේ ඇයිදැයි ඔබගේ කණ්ඩායම සමඟ සාකච්ඡා කරන්න.

පන්තිය තුල සිදු කරන තවත් අංග දෙකක් වන්නේ ක්‍රීඩා කිරීම සහ වර්ණ ගැන්වීමයි. මෙම ක්‍රීඩාවන් ස්වාභාවිකවම සහයෝගිතාවයෙන් සිදු කරන අතර ඇතැම් ආකර්ෂණීය ආකල්පයන් සහ පුරුදු සංවර්ධනය සඳහා දායකවීම මෙයින් අදහස් කරයි. වර්ණ ගැන්වීම සඳහා ලබාදී ඇති කඩදාසි අදාළ පාඩම හා සම්බන්ධ ආධ්‍යාත්මික ගුණාංගය කෙරෙහි අවධානය යොමු කර ඇත. වර්ණ ගැන්වීම තුලින් ළමයින්ගේ වර්ධනය සිදුවන මෙම අවධියේදී ඔවුන්ට අවශ්‍ය ඉතා වැදගත් දක්ෂතාවයන් සහ හැකියාවන් ශක්තිමත් කරයි. ළමයින්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනය සඳහා තිබිය යුතුම ලක්ෂණය වන ප්‍රීතියේ වාතාවරණය නිර්මාණය කිරීමට මෙම ක්‍රියාකාරකම් දෙක මඟින් සිදුවේ. ආධ්‍යාත්මික ගුණාංග සංවර්ධනය සඳහා ප්‍රීතිදායක පරිසරයක් කෙතරම් අත්‍යාවශ්‍ය දැයි යන්න පිළිබඳ වචන කිහිපයක් පැවසීමට ඔබ කැමති වනවා ඇත.

## 9 වැනි කොටස

පසුගිය කොටස් කිහිපය තුල ඔබ විසින් පළමු ශ්‍රේණියේ පාඩම්වල අරමුණු පිළිබඳ යම්කිසි තීක්ෂණ බුද්ධියක් ලබන්නට ඇති අතර චරිතය ශෝධනය කිරීමට සෑම අංගයක්ම දායකවන්නේ කෙසේදැයි දකින්නට ඇත. ඔබ විසින් උගන්වන්නට යන තරුණයින් සමඟ ඔබගේ සම්බන්ධතාවයේ ස්වභාවය කෙසේවිය යුතුදැයි අප දැන් කෙටියෙන් විමසා බලමු.

ප්‍රථම සහ ප්‍රධාන වන්නේ ඔබ විසින් ඔබගේ ශිෂ්‍යයින්ට දක්වන ප්‍රේමයේ හැඟීම වන අතර එය සෑම පසුබිමකම ළමයින් තදින් වැළඳගන්නා සුළු, දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ පිළිබිඹුවක් වැනි ප්‍රේමයකි. ගුරුවරයෙක් විසින් ඉගෙන ගැනීමට උත්සාහ කරන්නේ මෙම ආදරය සෑම දරුවෙකුටම ළඟාවන ආකාරයෙන් ප්‍රකාශ කරන්නේ කෙසේද යන්නයි.

සර්ව බලධාරීන්වහන්සේගේ හස්තයෙන් සෑම ළමයෙකුගේම යථාර්ථයන් තුල තැන්පත් කරඇති මිළ කළ නොහැකි වටිනාකමින් යුත් මාණික්‍යන් සොයා ගැනීමට පහසු වන්නේ පවිත්‍ර සහ අනිසි අනුග්‍රහයන්ගෙන් තොරව ඔබගේ ශිෂ්‍යයින් වෙත ඇති ඔබගේ ආදරය මඟිනි. සෑම ශිෂ්‍යයෙකුම දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් නිර්මාණය කර ඇති උතුම් අයෙකු ලෙස ඔබට දකින්නට හැකි අතර මෙම සත්‍ය බහා'උ'ල්ලා තුමාගේ පහත වචනයන්ගෙන් සනාථ කරයි.

> **"මාගේ අනාදිමත් පැවැත්ම තුලවූ ආවරණය සහ මාගේ සාරයේ පෞරාණික සදාකාලිකාලිකත්වය තුල, ඔබට ඇති මාගේ ප්‍රේමය මා දන්නා හෙයින් මා විසින් ඔබව නිර්මාණය කර මාගේ රූපය ඔබ මත කැටයම් කොට මාගේ අලංකාරය ඔබට අනාවරණය කළෙමි."**[18]

> **"බලයේ හස්තය මඟින් මම ඔබ තැනූ අතර ශක්තියේ ඇඟිලිවලින් මම ඔබව නිර්මාණය කර මාගේ ආලෝකයේ සාරය මම විසින් ඔබ තුල ස්ථාපනය කළෙමි."**[19]

> **"ඔබ මාගේ ප්‍රදීපය වන අතරම ඔබ තුල ඇත්තේ මාගේ ආලෝකයයි. ඔබ එතුළින් ඔබගේ දීප්තිය ලබාගෙන මා හැර අන්කිසිවෙක් නොසොයන්න. මා විසින් ඔබ පොහොසත්ව මවා ඇති අතර ත්‍යාගශීලී ලෙස ඔබ මත මාගේ අනුග්‍රහයන් වස්සවා ඇත."**[20]

ඇත්ත වශයෙන්ම, එවැනි ආදරයක් නියත වශයෙන්ම පරීක්ෂාවට භාජනය වන බව ඔබ විසින් අවබෝධ කරගත යුතුය. ඔබ විසින් ඉගැන්වීමේ යෙදී සිටියදී ඔබගේ සිසුන් තුල නුසුදුසු චරිත ලක්ෂණයන් දැකීමට ඔබට සිදුවේ. එවැනි අවස්ථාවන්වලදී ඇතැම් ළමයින් හික්මවිය නොහැකියයි යන වැරදි සහගත මතයන් ඔබ ප්‍රතික්ෂේප කිරීම අත්‍යාවශ්‍ය වේ. සෑම ළමයෙකුටම දෙවියන්වහන්සේගේ ප්‍රකාශවීම් තුළින් සහ උන්වහන්සේලාගේ ඉගැන්වීම්වලට අවනතවීම තුලින් ඔවුන්ට දෙවියන්වහන්සේ දැනගැනීමේ හැකියාව ඇති බව බහායි ළමා පන්ති ගුරුවරුයෙකු ලෙස කිසිදු සැකයක් තබා නොගත යුතුය. සෑම ළමයෙකුටම ආධ්‍යාත්මිකව ප්‍රගතියට පත්වීමේ හැකියාව ඇත. ඔබගේ පන්තියේ සිටින සෑම තරුණයෙකුම උතුම් ලෙස නිර්මාණය කර ඇති අතර ඔබගේ සහයෝගය ඇතිව මෙම උදාරත්වය විහිදා දැක්විය හැක.

ළමයින් ගැන සඳහන් කිරීමේදී ආදරණීය ගුරුතුමාණන් විසින් භාවිතා කරන ලද වාක්‍ය ඛණ්ඩයන් ඔබගේ මතකයට නංවාගැනීම ඔවුන්ගේ ආධ්‍යාත්මික සාරය දෙවියන්වහන්සේගේ නිර්මාණයක් ලෙස වඩාත් හොඳින් දැකීමට ඔබට උපකාර වනු ඇත. එවැනි තෝරාගන්නා ලද වාක්‍ය ඛණ්ඩයන් කිහිපයක් පහත දක්වා ඇති අතර ඒවා කියවා ඔබ විසින් උගන්වන්නට යන වටිනා ජීවයන් පිළිබඳ ඔබගේ හැඳින ගැනීම හැඩගස්වා ගත යුතු ආකාරය සමාලෝචනය කරන්න.

– මොවුන් ආදරණීය දරුවන් වේ.
– මොවුන් දක්ෂ, දීප්තිමත් දරුවයන් වේ.
– මොවුන් රාජධානියේ අලංකාර දරුවන් වේ.
– මොවුන් ඔබවහන්සේගේ මඟපෙන්වීමේ මාර්ගයෙන් උපකාර ලැබූ ළපටි පැළැටි වේ.
– අභා රාජධානියේ ළපටි පැළැටි වේ.
– ඔබවහන්සේගේ පළතුරු උද්‍යානයේ පැළ වේ.
– දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ උද්‍යානයේ මෘදු බීජ පැළ වේ.
– දෙවියන්වහන්සේගේ දැනුමෙහි තණ භූමියේ නැවුම් පැලැටි වේ.
– ඔබවහන්සේගේ දිව්‍යමය වසන්තය තුල පිපෙන ළපටි පැළැටි වේ.
– ඔබවහන්සේගේ උද්‍යානයේ රෝස මල් වේ.
– ඔබවහන්සේගේ මඟපෙන්වීමේ උද්‍යානයේ රෝස මල් වෙති.
– ඔබවහන්සේගේ තණපිටියෙහි මල් වෙති.
– ජීවන වෘක්ෂයේ අතුශාඛාවන් වෙති.
– ඔබවහන්සේගේ දැනුමෙහි උද්‍යානය තුල වර්ධනය වන ශාඛාවන් වෙති.
– ඔබවහන්සේගේ වරප්‍රසාදයන්ගේ අරඹ තුල දළුලන ශාඛාවන් වෙති.
– ගැල්වීමේ මද්‍යයේ කුරුල්ලන් වෙති.
– ආශීර්වාදලත් පරිපූර්ණත්වයේ ඇඟිලිවලින් දැල්වූ ඉටිපන්දම් වෙති.
– ඔබවහන්සේගේ බලයේ ඇඟිලිවලින් නිර්මාණයවූවන් වෙති.
– ඔබවහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයේ ආශ්චර්යමත් සලකුණු වෙති.
– අබ්දුල් බහාතුමාගේ ආදරණීයයන් වෙති.

## 10 වැනි කොටස

ආදරයට අමතරව, පළමු ශ්‍රේණියේ සාකච්ඡා කරනු ලබන අනෙකුත් සියළුම ආධ්‍යාත්මික ගුණාංග මගින් ඔබේ සිසුන් සමඟ ඔබ පෝෂණය කරන සම්බන්ධතාවයන් චරිතවත් කරයි. පන්තියේ දරුවන් සමඟ කරන අන්තර් ක්‍රියාවන්වලදී පමණක් නොව ඔබ ඔබගේ ජීවිතයේ සෑම අවස්ථාවකදී මෙම ගුණාංගයන් වඩ වඩාත් ප්‍රකාශ කිරීමට ඔබ උත්සාහ කරන බවට කිසිදු සැකයක් නොමැත. බහා'උ'ල්ලා තුමා අපට මෙසේ උපදෙස් දී ඇත.

**"අහෝ මිනිසුනි, ඔබලා අනෙකුත් අයට හොඳ උපදේශයන් දෙන නමුත් එය තමා විසින්ම අනුගමනය කිරීමට අමතක කරන අයගෙන් කෙනෙකු නොවීමට ප්‍රවේශම් වන්න."**[21]

පාඩම්වල සාකච්ඡා කරනු ලබන එක් එක් ආධ්‍යාත්මික ගුණාංගයන්ගේ අර්ථය සහ ගම්‍යාර්ථයන් පිළිබඳ වර්ධනය වන ඇගයීමක් ලබා ගැනීම ළමා පන්ති ගුරුවරුන්ට විශේෂයෙන් වැදගත් වන අතර, එවැනි ඇගයීමක් ඔවුන්ගේ රැකවරණය යටතේ මෘදු ළපටි පැළෑටි පුහුණු කිරීමට සහ පෝෂණය කිරීමේ ඔවුන්ගේ උත්සාහයන්ට උපකාරී වනු ඇත. උදාහරණයක් ලෙස පළමු පාඩම පවිත්‍රත්වය කෙරෙහි අවධානය යොමු කර ඇති බව ඔබ විසින් සටහන් කරගෙන ඇත. චරිතය පිළිබඳ ප්‍රශ්නය අදාළ පන්තිය ආරම්භ කිරීමට හදවතේ පවිත්‍රත්වය නමැති ගුණාංගය පිළිබඳ ගවේෂණය කිරීම සුදුසු බව පැහැදිලි වේ. බහා'උ'ල්ලා තුමා විසින් අපට මතක් කරදී ඇත්තේ උන්වහන්සේ විසින් අපට නියම කර ඇති පරිදි "පෘථිවියේ සහ "ස්වර්ගයේ ඇති සියල්ල" අතරින් උන්වහන්සේගේ අලංකාරයේ සහ මහිමයේ වාසස්ථානය සඳහා උන්වහන්සේ තෝරාගෙන ඇත්තේ "මනුෂ්‍ය හදවත" බවයි. කෙනෙකුගේ හදවතේ කැඩපත් පිරිසිදු කිරීමෙන් මනුෂ්‍යයෙකුගේ ආත්මය අලංකාර කළ යුතු අනෙකුත් සියළු ගුණාංග පිළිඹිබු කිරීමට හැකි වේ.

මෙම ශ්‍රේණියේ සාකච්ඡා කරනු ලබන ආධ්‍යාත්මික ගුණාංගය ගැන ගුරුවරුන්ට සිතා බැලීමට උපකාරීවීම සඳහා දෙවන ඒකකයට සෑම ඒකකයකට අදාළ වන උද්ධෘත පාඨයන් කිහිපයක් ඇතුළත් කර ඇත. දැනට පහත දක්වා ඇති පවිත්‍රතාවය පිළිබඳ උද්ධෘත පාඨය කියවන ලෙස ඔබව දිරිමත් කරනු ලැබේ. ඉන් පසුව, පොදුවේ මනුෂ්‍ය වර්ගයාගේ සහ විශේෂයෙන්ම ළමයින්ට ඉගැන්වීම සඳහා ඉදිරිපත් වන අයගේ ජීවිතය තුල මෙම ගුණාංගයේ වැදගත්කම පිළිබඳ ඔබගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න. ඔබගේ අදහස් සමහරක් පහත ලබාදී ඇති අවකාශය තුල ලිවීමෙන් පසු මෙහි දක්වා ඇති උද්ධෘත පාඨයන්ගෙන් එකක් හෝ කටපාඩම් කරගැනීමට ඔබ බලාපොරොත්තු වනවා ඇත.

**"මාගේ සහෝදරවරුනි! පිරිසිදු හදවත කැඩපතක් වැනිය; සත්‍යයේ සූර්යයාට සහ සදාකාලික උදෑසන අරුණෝදයට එතුළ බැබළිය හැකි පරිදි දෙවියන්වහන්සේ හැර අන්සියල්ලෙන් සහ ආදරයේ ඔපදැමීමෙන් එය පිරිසිදු කරන්න."**[22]

**"එම්බා සත්ව පුත්‍රය! ඔබගේ හදවත මාගේ නිවසයි; මගේ ආගමනය සඳහා එය පවිත්‍ර කරන්න. ඔබගේ ආත්මය මාගේ අනාවරණයේ තත්වයයි; මාගේ ප්‍රකාශනය සඳහා එය පිරිසිදු කරන්න"**[23]

**"මනුෂ්‍යයාගේ හදවත පවිත්‍ර හා පිරිසිදු වන තරමට එය දෙවියන්වහන්සේ වෙත ළඟා වන අතරම යථාර්ථයේ සූර්යයාගේ අලෝකය එතුළ අනාවරණය වේ."**[24]

**"මනුෂ්‍ය පැවැත්මේ ප්‍රමුඛස්ථානය විය යුත්තේ පවිත්‍රත්වයට වන අතර නැවුම්බව, පිරිසිදුකම සහ ආත්මයේ ස්වාධීනත්වය ඉන්පසුව සිදුවේ. පළමුව දියපහරක පතුළ පිරිසිදු කළ යුතු අතර ඉන්පසුව මිහිරි ගංගා ජලය එතුලට යොමු කළ හැක."**[25]

## 11 වන කොටස

දැන් ඔබ තරුණ ළමයින්ගේ ගුරුවරයෙකු ලෙස, ළමයින්ට ඔවුන්ගේ පෙළඹවීම්, දෙවියන්වහන්සේගේ ප්‍රකාශනය වන බහා'උ'ල්ලා තුමා තුළින් අනාවරණය කරන ලද දෙවියන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූල කරගැනීම ශක්තිමත් කරන්නේ සහ උන්වහන්සේ විසින් පවසන අපගේ ආත්මයන් සරසවන ගුණාංග සංවර්ධනය කරගැනීමට උපකාර කරන්නේ කෙසේදැයි ඔබගෙන්ම විමසා බැලිය යුතුය. මෙම ප්‍රශ්නයට ඔබගේ පිළිතුර සොයා බලන අතරතුර බහා'උ'ල්ලා තුමාගේ පහත ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචන කරන්න.

**"මාගේ සර්වබලධාරී මහිමයේ ස්වර්ගයේ සිට, මාගේ බලයේ ජීහ්වය විසින් මාගේ නිර්මාණයන්ට මෙම වචනයන් ප්‍රකාශ කරන්නෙමි. 'මාගේ අලංකාරයට ඇති ආදරය නිසා මාගේ විධානයන් පිළිපදින්න.' කිසිදු දිවකින් විස්තර කළ නොහැකි තරම් මහිමයේ සුවඳ විලවුන්වලින් පිරී පවතින උන්වහන්සේගේ උසස්තම ආදරණීයයන්ගේ මෙම වචනවලින් දිව්‍යමය සුහන්ධය ආග්‍රහණය කරන ආදරවන්තයා වාසන්වන්ත වේ. "[26]**

**"ඔබගේ කාන්තිමත් හදවත් තුල දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ගිනිදැල් දීප්තිමත්ව ඇවිළීමට ඉඩ හරින්න. එය දිව්‍යමය මහපෙන්වීමේ තෙල් වලින් පෝෂණය කර එය ඔබගේ ස්ථිරභාවයේ ආවරණයන් තුල ආරක්ෂා කරන්න. දුෂ්ටත්වයේ අනර්ථකාරි කෙඳිරීම්වලින් එහි ආලෝකය නිවාදැමීමට නොහැකි වන පරිදි එය දෙවියන්වහන්සේ හැර අන් සියල්ලෙන්ම වෙන්කර විශ්වාසයේ ගෝලය තුල ආරක්ෂා කරන්න."[27]**

**"එම්බා සත්වා පුත්‍රය! මාගේ ප්‍රේමය මාගේ බලකොටුවයි; එයට ඇතුළුවන තැනැත්තා ආරක්ෂිත හා සුරක්ෂිත වන අතර එයින් ඉවතට යන තැනැත්තා මංමුලාවී විනාශ වී යනු ඇත. "[28]**

1. පෙර දැක්වූ උද්ධෘත පාඨයන්ගේ වචනයන් යොදා පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

   I. අප විසින් දෙවියන්වහන්සේගේ විධානයන් පිළිපැදිය යුත්තේ උන්වහන්සේගේ ____________________ ඇති ආදරය නිසය.

   II. අපගේ ________________________ හදවත් තුල දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ________________ ________________ ඇවිළීමට ඉඩ හරින්න.

   III. අප දෙවියන්වහන්සේගේ _______________ ගිනිදැල් දිව්‍යමය _________________ ________________________ වලින් පෝෂණය කළ යුතුය.

   IV. එය අපගේ _____________________ _______________________ තුල ආරක්ෂා කරන්න.

   V. ____________________ අන් සියල්ලෙන් ____________ ____________ ගෝලය තුල අප දෙවියන්වහන්සේගේ ____________ ගිනිදැල් ______________ කළ යුතුය.

   VI. අප විසින් දෙවියන්වහන්සේගේ විධානයන් පිළිපැදිය යුත්තේ උන්වහන්සේගේ ________________ ඇති ආදරය නිසාය. අපගේ __________________ හදවත් තුල දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ____________ ____________ ඇවිළීමට ඉඩ හරින්න. අප මෙය _________________ මහපෙන්වීමේ තෙල් වලින් පෝෂණය කළ යුතුය. අප එය අපගේ _____________ ආවරණයන් තුල ආරක්ෂා කළ යුතුය. අප විසින් එය අපගේ ______________________ ගෝලය තුල සහ දෙවියන්වහන්සේ හැර අන්සියල්ලෙන ________________________ කළ යුතුය. අප දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ගිනිදැල් පෝෂණය කළ යුතු අතර, දුෂ්ටත්වයේ අනර්ථකාරි කෙඳිරීම්වලින් එහි _____________ නිවාදැමීමට නොහැකි වන පරිදි ආරක්ෂා කර රැකබලා ගතයුතුය. දෙවියන්වහන්සේගේ ________________ බලකොටුවට ඇතුළුවන කවුරුන්වුවත් ආරක්ෂිත හා ___________

## 12 වන කොටස

ඔබ විසින් යෞවනයින් සමඟ කාලය ගතකරන අතරතුර, ඔවුන්ගේ කාන්තිමත් හදවත් තුල 'දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ගිනිදැල්' මෙලවීමට සහ උන්වහන්සේගේ ආශිර්වාදයන් මෙන්ම උන්වහන්සේගේ වචනයන් තුළ වර්ධනයවීමට හැකිවීමේ ප්‍රීතිය පිළිබඳවත් ඔවුන්ට අවබෝධ කරදීමට ඔබ විසින් උත්සාහ කළ යුතුය. ඇත්ත වශයෙන්ම, දෙවියන්වහන්සේ කෙරෙහි ඇති අපගේ ආදරය සහ උන්වහන්සේගේ වරප්‍රසාදයන් ලැබීමට ඇති දැඩි ආශාවත් සමඟ කිසියම් හෝ හේතුවක් මත උන්වහන්සේගේ ප්‍රේමය අප වෙත ළඟා නොවනු ඇතැයි යන බියද පැමිණිය හැක. අපගේ වැරදි ක්‍රියාවන් උන්වහන්සේගේ ආශිර්වාදයන් අප වෙත ළඟාවීමෙන් වළක්වන ලෙස ක්‍රියා කළහොත් කුමක් සිදුවේද? අපගේ පැවැත්මේ බලත්ම හේතුව වන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය වන අතර මොහොතකට හෝ එය අපට අහිමි වුවහොත් අපගේ ජීවිත විනාශවී යනු ඇත. අප දෙවියන්වහන්සේට අකීකරු වුවහොත් උන්වහන්සේගේ ප්‍රේමය අප වෙත නොලැබෙනු ඇතැයි යන මෙම බිය, අපව ඍජු මාර්ගයේ තබාගෙන, අපව මමත්වයෙන් සහ ඊර්ෂ්‍යාවෙන්, කැදරකමින්, නිෂ්ඵල සිතුවිලිවලින් සහ දූෂිත ආශාවන්ගේ පෙළඹවීම්වලින් ආරක්ෂාකරයි.

ළමයින්ගේ හදවත් තුල දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ආදරයේ බීජ වැපිරීමට ඔබ දරන උත්සාහයේදී, දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බිය පිළිබඳවද සිතා බැලිය යුතු වන්නේ මේ ද්විත්වයම එකිනෙකින් වෙන් කළ නොහැකි බැවිනි. අබ්දුල් බහා තුමා අපට මෙසේ අනුශාසනා කර ඇත.

> **"මෙම දිව්‍යමය අනුශාසනාවන් සමඟ ළමයින් පුහුණු කරන්න. දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බිය ඔවුන් තුලින් ප්‍රකාශයට පත්වී දෙවියන්වහන්සේගේ වරප්‍රසාදයන් කෙරෙහි විශ්වාසයක් ඇති වන පරිදි කුඩා කාලයේ සිටම දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඔවුන්ගේ හදවත් තුලට කාවැද්දවීමට සලස්වන්න. ඔවුන්ට මානුෂීය අසම්පූර්ණතාවයන්ගෙන් නිදහස්වීමටත් මනුෂ්‍ය හදවත්හී සැඟව ඇති දිව්‍යමය පරිපූර්ණතාවයන් අත්පත් කරගැනීමටත් උගන්වන්න."[29]**

දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බිය ළමයින් සමඟ ඍජුව සාකච්ඡා කළ හැකි සංකල්පයන් නොවන බවට සැලකීම වැදගත් වේ. ඔවුන් සමඟ ඉදිරියට ගෙනයා යුතුවන්නේ දෙවියන්වහන්සේ කෙරෙහි වූ ආදරය සහ එතුලින් උන්වහන්සේගේ වරප්‍රසාද සහ දීමනාවන් කෙරෙහි වූ ඔවුන්ගේ දැඩි විශ්වාසය සහ බලාපොරොත්තුවේ ප්‍රතිරූපයයි. ඔබ ඔවුන් තුල දෙවියන්වහන්සේගේ ප්‍රේමය පෝෂණය කිරීමට උත්සාහ කරනවිට, ඔබට හඳුන්වාදිය හැකි එක් මතයක් වන්නේ ඇතැම් වචන හා ක්‍රියාවන් දෙවියන්වහන්සේ සතුටට පත්කරන අතර සමහරක් එසේ නොකරන බවයි. ඔවුන් දෙවියන්වහන්සේට ආදරය කරන නිසා ඔවුන් උන්වහන්සේව සතුට කිරීමට කැමැති විය හැකි බව ඔබට නිරන්තරව ඔවුන්ට මතක් කරදිය හැක. උදාහරණයක් ලෙස, කාරුණික දිවක් ඔවුන් සතුවීම සහ එකිනෙකාට ආදරය දැක්වීම දෙවියන්වහන්සේ සතුටු කරන ක්‍රියාවන් බවත්, අකාරුණික වචන භාවිතය සහ අනෙක් අය රිදවීමෙන් උන්වහන්සේ අසතුටට පත්වන බව ඔවුන්ට පැවසිය හැක.

ඔබගේ සමාලෝචනය සඳහා උද්ධෘත පාඨයන් කිහිපයක් පහත දක්වා ඇත.

> **"සියළුම තත්වයන් යටතේ, මිනිසුන්ගේ අභිවෘද්ධියට හේතුවන්නේ කුමක්දැයි සියළු දෙනාටම දැනගත හැකිවන පරිදි සහ උපරිම උත්සාහයෙන්, වඩාත් උතුම් ස්ථානය වෙත සහ මහිමයේ උච්චස්ථානය වෙත ඔවුන්වම යොමුවීම සඳහා ඔවුන්ට ආධ්‍යාත්මික චරිත ලක්ෂණයන් සහ යහපත් ක්‍රියාවන් පෙන්වීමට හේතුවන කුමන හෝ දෙයකට මිනිසුන් කැඳවීම ඔබට පැවරී ඇති වගකීමකි. සදාකාලිකවම දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බිය උන්වහන්සේගේ නිර්මාණයන්ගේ අධ්‍යාපනයේ ප්‍රමුඛ සාධකය වී ඇත. එය වෙතට ළඟාවීම ඔවුන්ට සතුටුදායක ලෙස සිදුකල හැක."[30]**

> **"මෙම අනාවරණය තුල එය ජයග්‍රහණය කළ හැකි සත්කාරකයින් වන්නේ ප්‍රශංසනීය ක්‍රියාවන්ගේ සහ යහපත් චරිතයන්ගේ සත්කාරකයින්ය. සදාකාලිකවම මෙම සත්කාරකයින්ගේ නායකයා සහ අණදෙන්නා වන්නේ සියළු දේම ආවරණය කරමින් සහ සියළුදේම අභිබවා ආධිපත්‍ය පතුරවා ඇති දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බියයි."[31]**

> **"දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බිය, දෙවියන්වහන්සේගේ සේවකයින්ට ප්‍රේම කිරීමෙන් උන්වහන්සේට ප්‍රේම කිරීම, මෘදු බව, ඉවසීම සහ තැන්පත් බව පවත්වාගෙන යෑම, අවංක, අවනත, කාරුණික සහ අනුකම්පාසහගත බවක් ඇතිකර ගැනීම, අධිෂ්ඨානය සහ ධෛර්ය, විශ්වාසනීය සහ ශක්තිමත් බවක් ඇතිකර ගැනීම, උත්සාහය සහ වෙහෙසවීම, ද්වේෂ සහගත නොවන න්‍යාලශීලී සහ පක්ෂපාතිබවක් ඇතිකර ගැනීම, උද්‍යෝගිමත් සහ ගෞරවනීය හැඟීමක් ඇතිකර ගැනීම, උසස් මනසක් සහ මහත්මාභාවයක් ඇතිකර ගැනීම, අනෙකුත් අයගේ අයිතිවාසිකම් පිළිබඳ සැලකිලිමත්වීම පරිපූර්ණත්වයේ අනෙකුත් ගුණාංගයන් වෙති."[32]**

මෙම කොටසේ සහ පෙර කොටස්වල ඇති පරිච්ඡේදයන්ගෙන් ලබාගත් අවබෝධය තුළින්, දෙවියන්වහන්සේගේ ප්‍රේමය සහ දෙවියන්වහන්සේ කෙරෙහි ඇති බිය සහ ප්‍රශංසනීය චරිතයක් සංවර්ධනය කරගැනීම සඳහා එම ද්විත්වයේ අන්තර් ක්‍රියාකාරීත්වයේ ගතිකත්වය පිළිබඳ පරිච්ඡේදයක් හෝ දෙකක් ලියා දක්වන්න.

## 13 වන කොටස

පෙර කොටස්වල අපගේ සාකච්ඡාවෙන් පැහැදිලි විය යුතු පිරිදි, ආධ්‍යාත්මික අධ්‍යාපනය සුන්දරත්යට ඇති ආකර්ෂණය කිරීමේ බලය මත ඇදී යන අතර ආධ්‍යාත්මික ගුණාංග සංවර්ධනය කිරීමට අරමුණු කරගැනීමේදී, යහපත් චරිතයක සුන්දරත්වය, ශුද්ධ වූ වචනයන් තුලවූ සුන්දරත්වය, ආදර්ශමත් කල්ක්‍රියාවේ සුන්දරත්වය, උදාර සිතුවිලිවල සුන්දරත්වය, සහ වඩාත්ම වැදගත් ලෙස සර්ව තේජස්වියාණන්ගේ සුන්දරත්වය කෙරෙහි ආකර්ෂණය යනාදි සත්‍ය සුන්දරත්වයන් කෙරෙහි ළමයින්ගේ හදවත් නිසි ලෙස යොමු කළ යුතුය. අවසානයේදී, දෙවියන්වහන්සේගේ නීතිවලට අවනතවීම උන්වහන්සේගේ සුන්දරත්වයට ඇති ආදරය තුළින් පැනනගී. මේ අනුව, ළමයින් හැදී වැඩෙන්නේ ආධ්‍යාත්මික ගුණාංග අත්පත් කරගැනීමම යනු ශ්‍රේෂ්ඨතම ත්‍යාගයක් සහ නුසුදුසු චරිතයක් හිමිකර ගැනීම ශ්‍රේෂ්ඨතම දඬුවමක් ලෙස දකිමිනි. අබ්දුල් බහාතුමා මෙසේ පවසයි.

> **"වැරදි ක්‍රියාවන්ගේ මූලය වන්නේ අවිඥානකම වන බැවින් ප්‍රත්‍යක්ෂඥානය සහ දැනුමෙහි මෙවලම් තදින් අල්ලා ගත යුතුය. යහපත් චරිතවත්බව ඉගැන්විය යුතුය. මනුෂ්‍යත්වයේ පාසල තුල, සියලු දෙනාට ආත්මයේ දිව්‍යමය චරිත ලක්ෂණයන් අත්පත් කරගත හැකිවන ලෙස සහ දෘෂ්ට සහ දුර්වල චරිතයක් අත්පත් කරගැනීමට වඩා කිසිදු දරුණු අපායක් හෝ කිසිදු දැවෙන අගාධයක් නොමැති බව සැකයකින් තොරව ඔවුන්ට දැකගත හැකිවන පරිදි ඥානය විසුරුවා හැරිය යුතුය අතර දෝෂාරෝපණයට ලක්විය යුතු ගුණාංග විදහා දැක්වීමට වඩා අඳුරු වළක් හෝ පිළිකුල් සහගත උග්‍ර පීඩනයක් හෝ නොමැත."[33]**

ළමයින්ට ස්වර්ගීය ගුණාංගය පිළිඹිබු කිරීමේ ප්‍රීතිය අත්විදීමට උපකාර කිරීම සඳහා, අප ඔවුන් විසින් විදහා දැක්වීමට උත්සාහ කරන යහපත් හැසිරීම් තුල ඔවුන්ව ධෛර්යමත් කරමින් නුසුදුසු හැසිරීම් අධෛර්යමත් කළ යුතුය. දැඩි දඬුවම් සහ සීමාරහිත නිදහස යන ද්විත්වයම දරුවන්ට ඔවුන් කැමති පරිදි කටයුතු කිරීමට අවකාශය සලසන හෙයින් එයින් වැළකිය යුතුය. විශ්ව අධිකරණ මණ්ඩලය විසින් අපට

මතක් කරදෙන පරිදි ''ප්‍රේමය සඳහා විනය අවශ්‍යවන අතර, ළමයින් දුෂ්කරතාවයන්ට හුරුවීමට ඇති ධෛර්යය, ඔවුන්ගේ හදිසි ආශාවන් නිදහසේ ප්‍රීති නොවීමට හෝ ඔවුන් සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ අභිමතය පරිදි අතහැරීම නොවේ.'' එහි තවදුරටත් සඳහන් වන පරිදි, ළමයින්ව ''ආදරයෙන් නමුත් දැඩිව බහායි තත්වයන්ට අනුකූලව ජීවත්වීමට මඟපෙන්විය යුතුය''. අබ්දුල් බහාතුමා මෙසේ විස්තර කර ඇත.

> **''කුමන හෝ අවස්ථාවකදී, මවක් විසින් ඇයගේ දරුවා යහපත්ව කටයුතු කරඇති බව දකිනවිට, ඔහුට ප්‍රශංසා කිරීමට සහ අත්පොලසන්දී ඔහුගේ හදවත ප්‍රීතිමත් කිරීමට ඉඩ දෙන්න, සුළු හෝ නුසුදුසු ගතිලක්ෂණයක් ඔහු තුලින් ප්‍රකාශ වන්නේ නම්, ඇයට දරුවාට උපදෙස් ලබාදී දඬුවම් කිරීමට ඉඩ දෙන්න, එයට අවශ්‍යනම් සුළු වාචික දඬුවම් කිරීමක් වැනි හේතුව මත පදනම්වූ අදහස් කිරීමක් භාවිතා කළ හැක. කෙසේ වෙතත්, ඔහු පහරදීමකට හෝ වාචික අපයෝජනයකට ලක්වුවහොත් ළමයෙකුගේ චරිතය සම්පූර්ණයෙන්ම විකෘති වන බැවින් ළමයෙකුට පහර දීමට හෝ, ඔහුව අපකීර්තියට පත්කිරීමට අවසර නොමැත.''[34]**

අබ්දුල් බහාතුමාගේ මඟපෙන්වීම් අනුගමනය කිරීම සඳහා, ළමයින් විසින් යහපත් ක්‍රියාවන් කිරීමේදී ඔවුන්ව ප්‍රශංසා කිරීමට සහ ඔවුන් සතුටු ගෙනදීමේ මාර්ගයන් පිළිබඳ ගුරුවරුන් සිතා බැලිය යුතුය. මෙහිදී, ගුරුවරයා අවධානයෙන් සිටීම සෑම ළමයෙකුගේම ප්‍රගතිය සටහන් කිරීම අවශ්‍ය වන අතරම සෑමවිටම එකම ළමයින් කිහිප දෙනෙකුට ප්‍රශංසා කරමින් අනෙකුත් අය මඟනොහැරීමට වගබලා ගත යුතුය. ගුරුවරයාගෙන් ආදරණීය අවධානය ලබාගැනීමට පුරුදුවී ඇති ළමයෙකුට නොහැක්මුණු හැසිරීම් අනුමත නොකරන කුඩා ඉඟි කිරීමක් වුවත් දඬුවම් කිරීම සඳහා වූ සූක්ෂම නමුත් ඵලදායි ක්‍රමයක් විය හැක. විශේෂයෙන් ළමයෙකු යම් ක්‍රියාකාරකමක් කඩාකප්පල් කරන්නේ නම්, ඇතැම්විට, අවශ්‍ය නම් විෂමාචාරී හැසිරීම පිළබඳ වාචික අකමැත්ත ප්‍රකාශ කිරීමක් දක්වා ඉදිරියට යා හැක. මෙය සිදු කළ යුත්තේ ස්ථිර සහ ගෞරවනීය ස්වරයකින් යුතුව කෝපයේ හෝ නොඉවසිලිමත් බවේ සලකුණක් හෝ නොමැතිවය. මීට අමතරව, බොහෝවිට ගුරුවරුන්ට ළමයෙකුට හෝ තවත් අයෙකුට පන්ති වේලාවෙන් පිටතදී උපදෙස් දීමට කාලය සොයා ගත හැක.

ගුරුවරයා විසින් ඉහත පරිදි උපදෙස් අනුගමනය කළත් සමහර ළමයින් විසින් අපේක්ෂා කරන පරිදි නොහැසිරෙනු ඇත. එවැනි අවස්ථාවලදී, කුඩා සහ සුදුසු දණ්ඩයන් පැනවීම අවශ්‍ය විය හැක. ළමයෙකුට වර්ණ ගැන්වීමට ඉඩ නොදීම හෝ ක්‍රීඩා කටයුතුවලට විනාඩි කිහිපයක් ඇයට හෝ ඔහුට සහභාගිවීමට ඉඩ නොදීම ආදිය එවැනි දණ්ඩනය සඳහා උදාහරණයන් විය හැක. මේ සම්බන්ධයේදී අත්‍යාවශ්‍ය අදහස් දෙකක් මතක තබාගැනීම අවශ්‍ය වේ. පළමුවැන්න නම්, ''ඔබ විසින් මෙවැනි කටයුතු සිදු කළ නිසා ක්‍රීඩාවන් සඳහා එක්විය හැක්කේ විනාඩි පහකට පසුවයි.'' යනුවෙන් ගුරුවරයෙක් විසින් ළමයෙකුට දණ්ඩනයන් ලබාදීමේදී ඔහුට හෝ ඇයට එයට හේතුව පැහැදිලි ප්‍රකාශ කළ යුතුය. දෙවැනි අදහස වන්නේ වැරදි හැසිරීම සිදුවූ වහාම එයට අදාල දණ්ඩනය නියම කළ යුතු අතර එසේ නොවුවහොත් දඬුවම සහ හැසිරීමට සම්බන්ධ කරගැනීමට ඔවුන්ට නොහැකි වනු ඇත.

දැන් ඉහත අදහස් ඔබගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න. ළමයින් තුල යහපත් හැසිරීම් ධෛර්යමත් කිරීමට සහ ඔවුන් තනි තනිව හෝ කණ්ඩායමක් වශයෙන් ඇති කරගන්නා ප්‍රගතිය ප්‍රශංසා කිරීමට සුදුසු යයි ඔබ සිතන වාක්‍යයන් එකට සකස් කළ හැකිද? අවශ්‍ය අවස්ථාවන්වලසී නුසුදුසු හැසිරීම් අධෛර්යමත් කිරීමට සිදුසු වාක්‍යයන් මොනවාද?

## 14 වන කොටස

ළමයින් තුළ ප්‍රශංසනීය ගුණාංග වර්ධනය කිරීමට උපකාරීවීම සඳහා, පන්තිය තුළ සුදුසු පරිසරක් වන විනය සහ නිසි පිළිවලක් ඇතිබව පැහැදිලිව පෙනෙන පරිසරයක් ඔබ විසින් නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ.

අබ්දුල් බහාතුමා මෙසේ පවසා ඇත.

"ළමයන්ගේ මුල් වසරයන්වලදී ඔහුගේ සම්පූර්ණ සාරය තුළ, දිව්‍යමය අත්තිවාරම් අතුරා ශුද්ධත්වයේ ව්‍යුහයන් ගොඩනැංවිය හැකි ලෙස ළමයින්ගේ පාසල් උපරිම විනක් සහ නිසි පිළිවෙලක් ඇති, විශිෂ්ට උපදේශයනයන්ගෙන් යුත් ස්ථානයක් බවට පත්වී, චරිතයන් නිවැරදි කිරීමට සහ ශෝධනය කිරීමට අවශ්‍ය විධිවිධාන සලසා දිය යුතුය."[35]

සතිපතා ළමුන් සඳහා පවත්වන පන්ති වෙත අවධානය යොමුකර උන්වහන්සේ මෙසේ උපදෙස් ලබාදී ඇත.

**"ඇත්තවශයෙන්ම ඔබ විසින් මෙම සංවිධානාත්මක ක්‍රියාකාරකම නොනවත්වාම ඉදිරියට කරගෙන යායුතු අතර, ශුද්ධාත්මයාණන්ගේ ජීවවාතයෙන් එය ප්‍රාණවත් වීමට සහ දිනෙන් දින එය වර්ධනයවීම සඳහාත් එය වැදගත් කොට සලකන්න. මෙම ක්‍රියාකරකම හොඳින් සංවිධානය වී ඇත්නම්, එයින් විශිෂ්ට ප්‍රතිඵල ලැබෙන බව ඔබට සහතික විය හැක."**[36]

සෑම ළමයෙකුටම ඔහුගේ හෝ ඇයගේ හැසිරීම ප්‍රීතිමත් නමුත් විනයගරුක ඉගෙනුම් පරිසරයක් සඳහා දායකවන ආකාරයට ඔවුන් මඟ පෙන්විය යුතු ආකාරය දැනගැනීමට තුළ බොහොමයක් ඉගැන්වීමේ කලාව සමන්විත වේ. මේ සම්බන්ධයෙන් ඔබට අත්දැකීම් වලින් ලබාගැනීමට අවශ්‍ය බොහෝ තීක්ෂණ බුද්ධිය ඇතත්, ආරම්භයේ සිටම ඔබට සූදානම්වීමට උපකාරී වන මූලික අදහස් කිහිපයක් අප මෙහිදී සාකච්ඡා කරමු. ආරම්භයක් සඳහා පන්ති කාලපරිච්ඡේදයක් පිළිබඳ පහත විස්තරය කියවන්න.

ළමුන් පැමිණෙවිට ඔවුන්ට සූදානම්වීම සඳසා සහ නිශ්ශබ්දව අසුන් ගැනීමට ඔබ විනාඩි කිහිපයක් ලබාදෙන්න. සියළුම යෞවනයින් නියමිත ස්ථානයට පැමිණි පසු, මෙම සන්සුන් වාතාවරණය දැන් ඔබට පන්තිය ආරම්භ කිරීම සඳහා වූ යාඥාවන් සඳහා භාවිතා කළ හැක. ගීත ගායනා කිරීමට ඔබට මීළඟට හඳුන්වාදිය හැකි ක්‍රියාකාරකම වන අතර ඉන් පසුව පාඩමේ තේමාව ඉදිරිපත් කර එහි උද්ධෘත පාඨය කටපාඩම් කරගැනීමට ළමයින්ට උපකාර කළ හැක. ඉන්පසුව, අපේක්ෂාවේ වාතාවරණයක් නිර්මාණය කර ළමයින්ට කතාන්දරයක් පැවසීමෙන් අනතුරුව ක්‍රීඩාවන් සඳහා යොමුවිය හැක. එය අවසන්වීමෙන් පසු වර්ණ ගැන්වීම සඳහා වූ කඩදාසි සහ පාට කූරු හෝ පැන්සල් බෙදාදී ඔවුන්ට ලබාදී ඇති පින්තූර ප්‍රවේශමෙන් වර්ණ ගන්වන ලෙස ඉල්ලා සිටින්න. පන්ති අවසන් කිරීම සඳහා, ළමයින්ට නිශ්ශබ්දව වාඩිවී පන්තිය අවසන් කිරීම සඳහා වූ යාඥාවන් සඳහා ඔවුන්ව සූදානම් කළ හැකි අතර එහිදී ඔබට සහ යෞවනයින් කිහිප දෙනෙකු එක්වී යාඥා ගායනා කළ හැක.

මෙම ක්‍රියාකාරකම් අනුපිළිවෙලෙහි තාර්කික බවක් තිබේද? ක්‍රියාකාරකම් මේ ආකාරයෙන් සකසා ඇති අනුපිළිවෙල පිළිබඳ ඔබ සිතන්නේ කුමක්ද?

## 15 වැනි කොටස

ඉහත ඔබ සාකච්ඡා කර ඇති පරිදි, ළමයින් පන්තියට පැමිණෙන්නේ නිහඬව සිටීමට නොවේ. එය එසේවිය යුතුයැයි යන්න ඔබේ අභිප්‍රායද නොවිය යුතුය. ඔබ ඔවුන්ගේ ස්වාභාවික ශක්තිය ප්‍රයෝජනයට ගෙන එය ඉගෙනගැනීම සඳහා යොමු කිරීමට උත්සාහ කළ යුතුය. මෙය සිදු කිරීම සඳහා, ඔබ විසින් නිශ්ශබ්දතා අවස්ථාවන් සහ ක්‍රියාකාරකම් මෙන්ම ස්වයංසිද්ධි කාලපරිච්ඡෙදයන් සැලසුම් කිරීමට ඔබට අවශ්‍ය විය හැක. සෑම අවස්ථාවකදීම, සංවිධාන මූලික අංගය වේ. පන්තිය හොඳින් සංවිධානය කර ඇත්නම්, ළමයින්ට අවධානය යොමු කිරීමට සහ ඉගෙන ගැනීම පහසු කරයි. මේ සම්බන්ධයේදී අවම වශයෙන් පහත දක්වා ඇති කරුණු තුන පිළිබඳවත් සලකා බැලීම වටී.

1. සෑම පන්ති කාල පරිච්ඡේයක්ම පැහැදිලි සහ ස්ථාවර ආකාරයකින් ආරම්භ වී නිසි පිළිවෙළකට අවසන් විය යුතුය.

2. දිනචර්යාවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, ළමයින් ටිකෙන් ටික කුමන ක්‍රියාකාරකමින් පසු කුමක් පැමිණෙන්නේදැයි සහ ඔවුන්ගේ බලාපොරොත්තුව කුමක්දැයි ළමයින් අවබෝධ කරගනී.

3. එක් එක් ක්‍රියාකාරකම සඳහා වෙන් කරන ලද කාලය නම්‍යශීලී විය යුතු අතර ළමයින්ගේ උද්‍යෝගය සහ ශක්තිය මත එය රඳා පවතී.

පෙර කොටස්වල ඇති විස්තර කිරීමේ සඳහන් පරිදි, සෑම පන්ති කාල පරිච්ඡේදයකදීම ළමුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

I. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

II. ගීත ගායනය

III. බහායි ලේඛණයන්ගෙන් උපුටා ගත් උද්ධෘත පාඨයන් ඉගෙනගැනීම සහ කටපාඩම් කිරීම

IV. කතාන්දරයන් සඳහා සවන්දීම

V. ක්‍රීඩා කිරීම

VI. චිත්‍ර වර්ණ ගැන්වීම

VII. පන්ති අවසන් කිරීමට යාඥා ගායනය

මෙම ක්‍රියාකාරකම් ස්වාභාවිකවම ඒ සඳහා අවශ්‍ය ශක්තිය සහ චලනයේ මට්ටම් අනුව වෙනස් වන අතර සමහරක් ඉතා ක්‍රියාශීලී වන අතරම තවත් ඒවා වඩාත් සන්සුන්ව සිදුවේ.

මෙම ක්‍රියාකාරකම් හත තුළින් වඩාත් වැඩිපුර චලනය සම්බන්ධ වන්නේ කුමන ක්‍රියාකාරකම සඳහාද? ____________________

____________________

____________________

____________________

____________________

නිහඬ ක්‍රියාකාරකම් මොනවාද? ____________________

____________________

____________________

____________________

නිසි පිළිවෙලක වතාවරණයක් පවත්වගෙන යෑම සඳහා වූ සමහරක් නියමයන් ගුරුවරයා මත යෙදේ. පහත දක්වා ඇති ඒවා අතුරින් අපේක්ෂිත වාතාවරණයට දායකවන්නේ මොනවාද? සහ එයට බාධා කරන්නේ මොනවාද? ඒ අනුව C හෝ H අකුරු මඟින් එය සලකුණු කරන්න.

_____ පන්තිය පැවැත්වෙන ස්ථානය පිරිසිදුව සහ පිළිවෙලකට තබා ගැනීම.

_____ තත්වයන් කුමක් වුවත් සන්සුන්ව සහ ඉවසිලිවන්තව සිටීම.

_____ ළමයින් උපදෙස්වලට ඇහුම්කන් නොදෙනවිට කෙනෙකුගේ ඉවසීම නැතිවී යයි.

_____ සෑම ක්‍රියාකාරකමක් සඳහා වූ ද්‍රව්‍යයන් කලින් සූදානම් කර තිබීම.

_____ දරුවන් ක්‍රියාකාරකම වෙනුවෙන් බලා සිටියදී සෑම තැනකින්ම අවශ්‍ය ද්‍රව්‍ය සෙවීම.

_____ ළමයින් විසින් එක් එක් ක්‍රියාකාරකම සඳහ කළයුතු දේ පැහැදිලි කිරීම

_____ තම ක්‍රියාකාරකම් කල් ඇතිව අවසන් කරන ළමයින් යොමු කිරීම සඳහා වෙනත් ක්‍රියාකාරකම් සූදානම් කර තැබීම

_____ ළමයින්ට එක් ක්‍රියාකාරකමක සිට තවත් එකකට නිසි පිළිවෙලකට මාරුවීම සඳහා උපකාර කරීම

_____ පොත බලාගෙන ළමයින්ට කතාන්දරය පැවසීම

_____ ළමයින්ට කතාන්දරය පහසුවෙන් සහ උනන්දුවෙන් පැවසිය හැකි වන පරිදි එය හොඳින් අධ්‍යනය කිරීම

## 16 වන කොටස

පන්තිය තුල විනයකින් සහ නිසි පිළිවෙලකින් යුතු වාතාවරණයක් නිර්මාණය කිරීම උත්සාහ ගැනීමේදී, හැසිරීමේ යම් යම් ප්‍රමිතීන් ස්ථාපිත කිරීමට ඔබට අවශ්‍ය විය හැක. මේ සම්බන්ධයේදී පළමු සති කිහිපය විශේෂයෙන් වැදගත් වනු ඇත. මෙම ආරම්භක කාල සීමාව තුළදී ඔබ විසින් පිහිටුවන කුමන හෝ තත්වයන් වසර පුරාවටම පවත්වාගෙන යාමේ ප්‍රවණතාවයක් ඇත. ආරම්භයේදී, ගුරුවරයෙකුට එක් අවස්ථාවකදී හැසිරීමේ තත්වයන් තුනක් හෝ හතරකට නොවැඩි ගණනක් තෝරාගෙන, එය ළමයින්ට අවබෝධ කරගත හැකිවන ලෙස සරල වචනවලින් ඔවුන්ට පැහැදිලි කළ යුතුය. 'අපි හොඳින් හැසිරිය යුතුයි.' වැනි සාමාන්‍ය තත්වයන් ඒ සඳහා උපකාර නොවන අතර, 'අපි කතා කිරීමේදී මාරුවෙන් මාරුවට කතා කරමු.' වැනි අනෙකුත් ඒවා අවබෝධ කරගැනීමට පහසු වනු ඇත. පහත දක්වා ඇති ප්‍රකාශනවලින් කියවෙන තත්වයන් ඔබටග් කණ්ඩායමේ සාමාජිකයින් සමග සාකච්ඡා කර එම ලැයිස්තුවට තවත් කිහිපයක් එකතු කරන්න.

a. අපි ක්‍රීඩා කිරීමේදී අපි එකිනෙකාට උදව් කරමු.

b. අප එකමුතුව සිට කලහයන් නොකරමු.

c. අපගේ පන්තියට නවක මිතුරන් සාදරයෙන් පිළිගමු.

d. අපගේ පන්තියේ මිතුරන් සහ ගුරුවරයා කතාකරනවිට හොඳින් ඇහුන්කම් දෙමු.

e. අප එකිනෙකාට කාරුණිකව කතා කරමු.

f. අපට කතා කිරීමට අවස්ථාව එනතෙක් බලා සිටිමු.

g. අපගේ පාටකුරු අනෙකුත් අය සමග බෙදාහදා ගමු.

h. අපි අපගේ කාර්යයන් අවසන් කිරීමට උත්සාහ කරමු.

i. ____________________________________________________________

j. ____________________________________________________________

k. ____________________________________________________________

l. ____________________________________________________________

මේ ආකාරයට බලාපොරොත්තුවන හැසිරීම් මෙලෙස කුඩා වාක්‍ය ලෙස සකස් කළ පසු, එය ළමයින් සමඟ සාකච්ඡා කිරීමටත් නිතර නිතර කියවීමත් සිදු කළ හැක. මෙලෙස සිදු කිරීමෙන්, මෙම ප්‍රකාශයන් ළමයන් බලාපොරොත්තු වන තත්වයන්ට සමඟ අභ්‍යන්තරීකරණයවීමක් සිදුවන අතර දැඩි ලෙස පැනවූ නීති රීති මාලාවක් ලෙස නොසැලකේ. අපෙක්ෂිත තත්වයන් සමූහයක් සමඟ ඔවුන් හුරුපුරුදු වූ පසු, ගුරුවරයාට ක්‍රම ක්‍රමයෙන් අනෙක් ඒවා හඳුන්වාදිය හැකි නමුත් එකවර බොහෝ දේ එකතු කිරීමෙන් වැළකී සිටීමටද මතක තබාගත යුතුය. පන්ති වාරය තුළදී යම් කිසි දුෂ්කරතාවයන් මතුවුවහොත්, ඒ පිළිබඳ කතාබහ කරන වාක්‍ය කිහිපයක් නිර්මාණය කිරීමට ළමයින්ට උපකාර කල හැක. එවැනි අවස්ථාවලදී, ගුරුවරයා ස්ථිර සහ තිරසර විය යුතු අතරම මිත්‍රශීලී සහ මෘදු මොළොක් විය යුතුය.

## 17 වැනි කොටස

8 වැනි කොටස තුලදී අපි විසින් පළමු ශ්‍රේණියේ පාඩම්වල විවිධ අංගවන්හී වැදගත්කම පිළිබඳ කෙටියෙන් විමර්ශනය කල අතරම ඒ සෑම එකක්ම ප්‍රශංසනීය චරිතයක සඳහා දායකවන ආකාරයද සාකච්ඡා කළෙමු. මෙම කොටස සහ මීළඟ කොටස් හත තුළදී, යෝජනා කරන ලද කටපාඩම් කිරීමෙන් ආරම්භා වන ක්‍රියාකාරකම් සඳහා ළමයින් සම්බන්ධ කරගැනීමේදී ඔබට ගතහැකි සමහර ප්‍රවේශයන් කිහිපයක් පිළිබඳ අප සලකා බලමු.

ඔබ විසින් උගන්වන පාඩම්වල යාඥාවන් සහ ශුද්ධවූ ලේඛනයන්යන්ගේ උපුටා ගත් උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීමට කේන්ද්‍රීය කරුණක් වන අතර සෑම පන්ති කාලපරිච්ඡේදයකදීම ළමයින්ට මතකයෙන් යාඥාවක් ගායනා කිරීමට සහ නව උද්ධෘත පාඨයක් ඉගෙන ගැනීමට උපකාර කළ හැක. මෙම ක්‍රියාකාරකම සඳහා ළමයින් සම්බන්ධ කරගැනීම පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර, යෞවනයින්ට ශුද්ධවූ වචනයන් කටපාඩම් කිරීමට උපකාර කිරීමේදී පසෙකට දැමිය යුතු පොදු වැරදි මතයන් පිළිබඳ වචන කිහිපයක් පැවසිය යුතුය.

ඔබ විසින් ඉගැන්වීමට යැමේදී 'ළමයින් දේවල් නැවත නැවත සිදු නොකළ යුතුයි', 'ඔවුන් තමන්ගේම අදහස් ප්‍රකාශ කිරීමට ඉගෙන ගත යුතුයි', 'ඔවුන් ගිරවුන මෙන් කරුණු සහ තොරතුරු ලබානොගත යුතුයි' වැනි අදහස් අසා හෝ අසන්නට ලැබී ඇත. ඇත්ත වශයෙන්ම, කට පාඩමින් ඉගෙනගැනීම පිළිබඳ වූ විවේචනයන් බොහෝමයක් පැතිර පැවතියත් මෙම අදහස් ලෝකයේ සෑම තැනකම වඩ වඩාත් පුළුල්ව පැතිර යමින් පවතී. ගණිතමය සමීකරණයක්, භෞතික විද්‍යාවේ නීතියක් අර්ථ දැක්වීම් හෝ සාහිත්‍යයේ ගද්‍ය කාණ්ඩයක් කෙටි හෝ කිසිදු අවබෝධයකින් තොරව මතක තබාගැනීම සත්‍යයකි. නමුත් ඔබ ඔබගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය වන්නේ, ගැඹුරු ප්‍රකාශනයක් කටපාඩම් කිරීම සහ එහි අර්ථය අවබෝධ කරගැනීම එකිනෙකට ප්‍රතිවිරුද්ධව තැබිය යුත්තේ ඇයි? මතක තබාගැනීම යනු අවබෝධ කරගැනීමේ, සිතීමේ සහ පරිකල්පනයේ බලය හා සමාන වන මිනිස් මනසෙහි ඇති ශක්තියකි. එ සියල්ල එකිනෙකට අනුපූරක වන අතරම ශක්තිමත් කරයි. මිනිස් හදවත සහ මනස ප්‍රතිනිර්මාණය කිරීමේ නිමක් නොමැති ශක්තියෙන් යුත් දෙවියන්වහන්සේගේ වචනයන් කටපාඩම් කිරීම ළමයින්ගේ බුද්ධිය සහ අවබෝධය කෙතරම් ඉහළ නංවනු ඇතිදැයි අපට සිතා නොහැක. පසුව, ඔවුන් වර්ධනයේ විවිධ අවධීන් පසුකර යනවිට, ඔවුන් කටපාඩම් කරන ලද ඡේදයන්ගෙන් නව තීක්ෂණ බුද්ධියක් ලබාගන්නා අතරම, එතුලින් ඔවුන්ගේ ජීවිත කාලය පුරාවටම දවියන්වහන්සේගේ වචනයේ නිර්මාණාත්මක, පුනර්ජනනීය සහ පරිවර්තනීය බලයන් උකහා ගැනීමට හැකිවනු ඇත.

කාලයත් සමඟ ඉතාම ප්‍රණීත ඵල දැරීමට වර්ධනය වන බීජන් වන ආධ්‍යාත්මික දැනුමෙහි බීජ ළමයින්ගේ හදවත් සහ මනසෙහි ස්ථිරව සිටුවීම සඳහා උපකාරීවන දෙවියන්වහන්සේගේ වචන කටපාඩම් කිරීම ගුරුවරුන්ට ඒත්තු ගැන්වීමේ වැදගත් වන්නේ ඇයි දැයි ඔබගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න.

## 18 වන කොටස

ඉහත සමාලෝචනය සිතෙහි රඳවාගෙන, 1 වැනි පාඩමේ උද්ධෘත පාඨය උදාහරණයට ගනිමින් ඔබගේ සිසුන්ට ලේඛණයන්ගෙන් උපුටා ගන්නා ලද ඡේදයන් කටපාඩම් කිරීමට උපකාරීවන අදහස් කිහිපයක් අප ඔබට ඉදිරිපත් කරන්නෙමු. ආරම්භ කිරීම සඳහා, පාඩම විසින් අවධානය යොමු කරන ආධ්‍යාත්මික ගුණාංගයේ වැදගත්කම පිළිබඳ මූලික අවබෝධයක් ලබාගැනීමට ඔවුන්ට උපකාර කිරීමට ඔබට අවශය වනු ඇත. මෙම අරමුණ සඳහා, ඔබට අවධානය යොමු කිරීමට කෙටි හැඳින්වීමේ ප්‍රකාශයක් ලබාදී ඇත. උද්ධෘත පාඨයේ ඇති අසීරු වචන තෝරාගෙන ළමයින්ට ඒවා අවබෝධ කරගැනීමට පහසු අවස්ථාවන් භාවිතා කරමින් උද්ධෘත පාඨයේ තේරුම පිළිබඳ පළමු මූලික අවබෝධ ලබාගැනීමට ඔවුන්ට උපකාර කරන ලෙස අප ඔබව ධෛර්යමත් කර සිටිමු. මෙම ප්‍රවේශය ලබාගෙන ඇත්තේ 1 වැනි පාඩමේ පවිත්‍රත්වයේ ගුණාංගය විස්තර කර ඇති ආකාරයෙන් බව සලකන්න.

අපගේ හදවත් කැඩපත් වැනිය. අප සැමවිටම එය පිරිසිදුව තබාගත යුතුය. යමෙකු කෙරෙහි අමනාපයක් තබාගැනීම, යමෙකු කෙරෙහි ඊර්ෂ්‍යාවක් ඇතිවීම, කුමන හෝ හේතුවකට තවඅයෙකුට අකාරුණිකවීම යන මේවා අපගේ හදවත නමැති කැඩපතෙහි දූවිලි වැනිය. අපගේ හදවත් පවිත්‍රවූ විට, කාරුණිකබව, ආදරය සහ ත්‍යාගශීලීබව වැනි දෙවියන්වහන්සේගේ ආලෝකය සහ උන්වහන්සේගේ ගුණාංග එතුළින් පිළිබිඹු කරමින් අප අන් අයගේ සතුටට හේතුවක් කරයි. අපගේ හදවත් පවිත්‍රව තබාගැනීමට උපකාරීවීම සඳහා බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගන්න.

**"එම්බා මනුෂ්‍ය පුත්‍රය! මාගේ ප්‍රථම උපදේශය මෙයයි: පවිත්‍ර, කාරුණික හා දීප්තිමත් හදවතක් ඔබ සතු කරගන්න...."**

*උපදේශය*

1. දිනකදී ජෙරාඩ් සහ මේරි චිත්‍ර කිහිපයක් වර්ණ ගන්වමින් සිටින ලදි. ජෙරාඩ්ට කහ පාට පාට කූරු අවශ්‍ය වූ නමුත් මේරි එය ඔහුට නොදී සිටියාය. ගුරුවරයා විසින් බෙදාහදා ගන්නා ලෙස මේරිට පවසන ලදි. ගුරුතුමා විසින් මේරිට හොඳ උපදේශනයක් ලබා දෙන ලදි.

2. පැට්‍රිසියාට පැණිරස කෑමට හෝ කතාන්දර පොතකට මුදල් වියදම් කරනවාද යන්න තීරණය කළ යුතුව තිබුණි. ඇයගේ දෙමාපියන් ඇයට කතාන්දර පොතක් ගන්නා ලෙස උපදෙස් ලබාදුනි. පැට්‍රිසියාගේ දෙමාපියන් ඇයට හොඳ උපදේශනයක් ලබා දෙන ලදි.

*සතු කරගන්න*

1. ටිනායේ නින්දට යෑමට පෙර යාඥා කියවීමට කැමතිය. ඇයට කියවීම සඳහා කුඩා යාඥා පොතක් තිබුණි. ටිනායේ සතුව කුඩා යාඥා පොතක් ඇත.

2. අපි අපගේ ගෙවත්තේ රසවත් එළවළු රාශියක් වගා කරනවා. නැවුම් එළවළු රැසක් ලබාදෙන හොඳ ඉඩමක් අප සතුව ඇත.

*පවිත්‍ර හදවත*

1. කැතී කෝපයට පත්වී අගෝත්ට අකාරුණික වචන කීවාය. අගොත් දුක්විය. නමුත්ඉක්මනින්ම කැතීට සමාව දුන්නා. අගෝත් සතුව පවිත්‍ර හදවතක් ඇත.

2. අන් අය සමඟ කිසිදු දෙයක් බෙදා නොගන්නා ජෝර්ජ් ඇතුළු සියළු දෙනා සමඟ තමන්ගේ බිස්කට් බෙදා ගැනීමට ගුස්ටාවෝ කැමතිය. ගුස්ටාවෝ සතුව පවිත්‍ර හදවතක් ඇත.

*කාරුණික හදවත*

1. ඇයගේ දෙමාපියන් ඔවුන්ගේ මිතුරන්ට තම නිවසට ආරාධන කරනවිට, මින්ග් ලින්ග් සතුටින් ඔවුන්ට ආහාර පිළිගැන්වූවාය. කාරුණික හදවත් මින්ග් ලින්ග් සතුව ඇත.

2. රොබට්සන් මහතා ඉතාමත් වයසක පුද්ගලයෙකි. ඔහුගේ පළතුරු අස්වැන්න වෙළඳපොළට ගෙන යෑමට ජිමී උදව් කළේය. කාරුණික හදවත් ජිමී සතුව ඇත.

*දීප්තිමත් හදවත*

1. මට කණගාටුවක් ඇතිවනවිට මගේ අම්මා මාව නිරතම ධෛර්යමත් කරනවා, මාව සතුටු කරනවා. මාගේ මව සතුව දීප්තිමත් හදවත් ඇත.

2. ඔබුයාට අසනීව වී ඔහුගේ මුළු කාලයම ඇඳේ ගත කිරීමට සිදුවිය. ඔහු බොහෝ යාඥා කළ අතර දුක් නොවීය. නිරන්තරව ඔහු තුලින් සතුටු බවක් පෙන්වීය. ඔබුයා සතුව දීප්තිමත් හදවත් ඇත.

නියතවශයෙන්ම, ඔබ පොත තුළින් හඳුන්වාදී මේ ප්‍රකාශය සහ පැහැදිලි කිරීමේ වාක්‍යයන් සරල ලෙස කියවාගෙන නොගොස් එවා ස්වාභාවිත ලෙස ඉදිරිපත් කිරීම සඳහා ඔබ කල්තියා එයට සූදානම් විය යුතුය.

ළමයින් යාඥා කටපාඩම් කිරීමේදී, ඔබත් මෙහා සමාන ප්‍රවේශයක් ලබාගන්නනා ලෙස යෝජනා කරන නමුත්, පැහැදිලි කිරීම් අවශ්‍යා වන්නේ කුමන වචන හෝ වාක්‍ය සඳහාදැයි තීරණය කිරීම ඔබ වෙත පැවරී ඇත. මේ සම්බන්ධයෙන් යම් සැලකිල්ලක් දැක්වීම ඔබට අවශ්‍යා විය හැක. ඇතැම්විට යාඥාවන්ගේ වචනයන් ක්‍රමාණුකූලව ඔවුන්ට අවබෝධ කරගැනීමට යෞවනයින්ට ඉඩ ලබාදීමද ප්‍රමාණවත් විය හැක. උදාහරණයක් ලෙස 1 වැනි පාඩම තුළදී ළමයින් ඉගෙන ගැනීමට ආරම්භ කරන පහත යාඥාව දෙස බලන්න. 'පවිත්‍ර හදවත' සහ 'මුතු ඇට' යන ද්විත්වයම වටිනා දෙයක් බව ඔවුන් ඉක්මනින් හඳුනා ගනු ඇත. නමුත්, අවසානයේදී, දෙවියන්වහන්සේ විසින් අපට පවිත්‍ර හදවතක් ලබාදී ඇති බව තේරුම් ගැනීමට නම්, 'ප්‍රදානය' යන වචනයේ තේරුම ඔවුන් අවබෝධ කරගැනීම බොහෝවිට අවශ්‍යා වේ. මෙම අරමුණ සඳහා ඔබ විසින් සැලසුම් කරන වාක්‍ය මොනවාද?

**"උන්වහන්සේ දෙවියන්වහන්සේය! අනේ දෙවියනි. මාගේ දෙවියනි! මුතු ඇටයක් මෙන් පවිත්‍ර හදවක් මට ප්‍රදානය කරන්න."**

## 19 වැනි කොටස

යාඥා සහ උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීමට ඔබගේ සිසුන්ට උපකාර කිරීමේදී ඔබට ගත හැකි එක් ප්‍රවේශයක් පිළිබඳ අප දැන් සලකා බලමු. එක් අවස්ථාවකදී එක් කොටසක් පහසුවෙන් ඉගෙන ගත හැකි ලෙස ඡේදයන් කොටස්වලට බෙදා වෙන් කිරීමට ඔබට කළ හැකිය. පළමු කොටස කටපාඩම් කිරීමෙන් අනතුරු දෙවැනි කොටස එක් කළ හැකි අතර මෙලෙස සම්පූර්ණ යාඥාවම හෝ උද්ධෘත පාඨයම කටපාඩම් වන තුරු කොටස් වශයෙන් එක් කිරීම සිදු කළ හැක. ඇතැම්විට තනි තනිව හෝ කණ්ඩායම ලෙස ඔබ අනුගමනය කරමින් පවසන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිය හැක.

උදාහරණයක් ලෙස, 1 වැනි පාඩමේ උද්ධෘත පාඨය ඔබගේ සිසුන්ට ඉගැන්වීමට යාමේදී, "එම්බා මනුෂ්‍ය පුත්‍රය!" යන කොටස කියවීම ඔබට ආරම්භ කළ හැකි අතර ඔවුන්ට එය නැවත කියවීම සළස්වන්න. පසුව ඔබට, "එම්බා මනුෂ්‍ය පුත්‍රය!" යන කොටසට "මාගේ ප්‍රථම උපදේශය මෙයයි" යන කොටස එක් කළ හැකි අතර කොටස් දෙකම නැවන නැවත කියවන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න. අවසාන වශයෙන් ඔබට "පවිත්‍ර, කාරුණික හා දීප්තිමත් හදවතක් ඔබ සතු කරගන්න." යනු කොටස එක් කළ හැක. මේ ආකාරයට කණ්ඩායම විසින් උද්ධෘත පාඨය ඉගෙනගත් පසු, ළමයින් කිහිප දෙනෙකුට එය මතකයෙන් කියවීමට උපකාර කළ හැක. ඇත්ත වශයෙන්ම මෙම ක්‍රියාකාරකම උද්‍යෝගාත්මකව සිදු කිරීමට ඔබ වග බලාගත යුතු අතර එවිට ළමයින් අවධානාත්මක සහ ප්‍රීතිමත් වාතාවරණයක් පවත්වා ගනී. තවද ඔවුන්ගේ හැකියාවන් ක්‍රමාණුකූලව වර්ධනයවීමත් සමඟ, යාඥාවන්හි දීර්ඝ කොටස් සහ සම්පූර්ණ උද්ධෘත පාඨයම එකවර කටපාඩම කිරීමට ඔවුන්ට හැකි වනු ඇත.

ඔබ විසින් පන්තියේ මෙම  කොටස සිදු කරනවිට, අපේක්ෂා කිරීමට අපහසු ඇතැම් තත්වයන් පැන නැඟිය හැකි අතර එහිදී පළමු අත්දැකීමෙන්ම එය විසඳාගන්නේ කෙසේදැයි ඔබට ඉගෙන ගැනීමට සිදුවනු ඇත. කෙසේ වෙතත්, ඔබගේ සූදානම්වීමේ කොටසක් ලෙස ඔබ විසින් සලකා බැලිය යුතු සමහර තත්වයන් ඇත. පහත දක්වා ඇති ප්‍රශ්න ඔබගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න.

- ඔබගේ පන්තිය තුල ළමයින් බොහෝ ගණනක් සිටීනම්, උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීමට ඔවුන්ට උපකාර කරන්නේ කෙසේද?
- ළමයින් කිහිප දෙනෙකු අනෙක් අයට වඩා වේගයෙන් කටපාඩම් කරන්නේ නම් ඔබ සිදු කරන්නේ කුමක්ද?
- මතක තබාගැනීමට අපහසු ළමයෙකුට හෝ කිහිප දෙනෙකුට සිටීනම් කුමක් කළ හැකිද?
- පන්තියේ ළමයෙකුට උද්ධෘත පාඨය සම්පූර්ණයෙන්ම කටපාඩම් කරගැනීමට නොහැකි වූ අවස්ථාවදී වුවත්, ඔහුට හෝ ඇයට තවමත් ජයග්‍රාහණය පිළිබඳ හැඟීමක් දැනේ බව ඔබ සහතික කරන්නේ කෙසේද?

## 20 වැන කොටස

ළමයින් ගායනා කිරීමට කැමති හෙයින් උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීමට පෙර මෙම ක්‍රියාකාරකම වඩාත් ප්‍රීතිමත් එකක් වනු ඇත. සාර්ථකත්වයට අවශ්‍ය වන්නේ පුහුණුවීමයි. රිද්මයට සහ

තනුවට විශේෂ අවධානයක් යොමු කරමින් ඔබ දන්නා අයෙකු සමඟ ඔබටම ගීත ගායනා කළ යුතුය. ඔබට පටිගත කළ ගීතවලට සවන් දිය හැකිනම් ඔබට ඒවා වඩාත් වේගයෙන් ඉගෙන ගත හැක. ළමයින් හොඳින් ඉගෙන ගන්නා තුරු ඔබට ඔවුන් සමඟ ගීතය නැවත නැවත ගායනා කිරීමට සිදු වනු ඇත. ගීතවල වචනද උද්ධෘත පාඨ සිදු කළ ආකාරයට කටපාඩම් කළ හැකි අතර, මෙහිදී සිදුවන්නේ වචනයන් තනුව සමඟ යෙදීම පමණි. ඔබගේ සිසුන්ගේ හැකියාවන් අනුව ඇතැම් ගීත ගායනා කිරීම අපහසු බව ඔබට පෙනී යා හැක. එවැනි අවස්ථාවන්වලදී, ඔබගේ සිසුන් සමඟ එකතුවී ඔබට ගීපද ගායානා කළ හැක.

## 21 වැනි කොටස

අප විසින් සලකා බලන මීළග ක්‍රියාකාරකකම වන්නේ කතාන්දර පැවසීමයි. පෙර සඳහන් කළ පරිදි, පළමු ශ්‍රේණියේ බොහෝමක් කතාන්දරයන් අබ්දුල් බහාතුමාගේ ජීවිතයෙන් උපුටාගෙන ඇත. මෙම කතාන්දර සුවිශේෂී අරමුණක් ඉටු කරයි. ළමයින් විසින් අත්පත් කරගැනීමට උත්සාහ කරන ආධ්‍යාත්මික ගුණාංග, අංගසම්පූර්ණ ආදර්ශකයාණන් මෙම පෘථිවි තලය තුල උන්වහන්සේගේ දිනයන්වලදී සම්පූර්ණයෙන්ම ප්‍රකාශකල ආකාරය දැකීමට ඔවුන්ට උපකාරී වනු ඇත. ගුරුවරයා විසින් මෙම කතාංගයන් පවසනවිට දක්වන ගෞරවය ඔවුන්ගේ මෘදු මොළොක් හදවත් තුල ස්වර්ගීය හැඟීම් අවුස්සන අතරම ඔවුන්ගේ ආධ්‍යාත්මික සංවේදීතාවන් අවදි කරයි.

අබ්දුල් බහාතුමා පිළිබඳ ඔබ ළමයින්ට උගන්වන කතාන්දර කෙටි වුවත් එයින් ලබදෙන ආධ්‍යාත්මික අවබෝධය ඉතා ගැඹුරුය. එමනිසා, ඔබගේ සිසුන්ට ආධ්‍යාත්මික යථාර්ය තුල ක්ෂිණ ග්‍රහණයත් ලබාගැනීමට උපකාරීවන ලෙස විස්තර කර ඇති සිදුවීම්වලින් ඔබ්බට ඔවුන් ගෙනයාමට අවශ්‍ය වියහැක. මෙම දර්ශනයත් සමඟ 1 වැනි පාඩමේ කතාන්දරය විමසා බලමු.

*අබ්දුල් බහාතුමාට සෑමවිටම පුද්ගලයෙකුගේ හදවතේ ඇති දෑ පැවසිය හැකි වූ අතර, පවිත්‍ර සහ දීප්තිමත් හදවත් ඇති මිනිසුන්ට එතුමා බෙහෙවින් ආදරය කළේය. අබ්දුල් බහාතුමාගේ රාත්‍රී භෝජන සංග්‍රහයක ආරාධිතයෙකුවීමේ ගෞරවය හිමිවූ කාන්තාවක් සිටියාය. උන්වහන්සේගේ ප්‍රඥාවන්ත වචනයන්ට සවන්දෙමින් ඇය එහි වාඩිවූ අතර, ඇය ඉදිරිපස වූ වතුර වීදුරුවක් දෙස බලා 'ඔබ වතුර වීදුරුවක් පුරවා හිස්කරන ආකාරයටම, අබ්දුල් බහාතුමා විසින් මාගේ හදවත ගෙන එහි වූ සෑම භෞතික දෙයක්ම හිස්කර, දිව්‍යමය ප්‍රේමයෙන් සහ අවබෝධයෙන් නැවත පුරවන්නේ නම්' යනුවෙන් සිතුවාය.*

*මෙම සිතුවිල්ල ඇගේ මනස හරහා ඉක්මනින් ගමන් කළ අතර, ඇය ඒ පිළිබඳ කිසිවක් නොකියූ නමුත්, වැඩි වේලා නොගෝ ඇය සිතූ දේ අබ්දුල් බහාතුමා දැනගත් බව ඇයට වැටහෙන සිදුවීමක් සිදුවිය. උන්වහන්සේ කතාව සිදුකරන අතරතුර එහි සේවකයෙකුට කතා කිරීමට මදක් එතුමාගෙ කතාව නවතා, සෙමින් වචන කිහිපයක් ඔහුට පැවසූහ. එම සේවකයා නිශ්ශබ්දව මේසයේ කාන්තාව සිටි ස්ථානයට පැමිණ ඇයගේ වතුර වීදුර හිස් කර නැවත ඇය ඉදිරිපිට තැබුවේය.*

*මඳ වේලාවකට පසු, අබ්දුල් බහාතුමා දිගටම කතා කරමින් සිටින අතරතුරදී, මේසය මතවූ වතුර භාජනයක් ගෙන ඉතා ස්වාභාවික ආකාරයෙන් කාන්තාවගේ හිස් වීදුරුව සෙමෙන් පුරවන්නට විය. සිදුවූයේ කුමක්දැයි කිසිවෙකු අවබෝධකර නොගත්තද අබ්දුල් බහාතුමා විසින් තමන්ගේ හදවතේ ආශාවට පිළිතුරු දෙන බව කාන්තාව දැනගත්තාය. ඇය සතුටින් ඉපිල ගියාය. හදවත යනු විශිෂ්ඨ ආදරයකින් සහ කරුණාවකින් යුතුව කියවන තැනැත්තාණන් වන අබ්දුල් බහා තුමාට විවෘත වූ පොත් වැන වන බව ඇය දැනගත්තාය.*

පැහැදිලිවම සම්පූර්ණ පාඩමේ කතාන්දරය තුලදී ඇත්ත වශයෙන්ම අවධානය යොමුකර ඇත්තේ පවිත්‍රත්වය යනු ආධ්‍යාත්මික ගුණාංගය පිළිබඳවයි. ඔබගේ කථාංගය තුළදී මෙම ගුණාංග පිළිබඳ සිසුන්ගේ අවබෝධය ගැඹුරු කරන්නේ කෙසේද සහ ඒ සඳහා උත්සාහ කිරීම යන්නේන් අදහස් කදරන්නේ කුමක්ද යන්න පිළිබඳ සිතා බැලීමට පහත ප්‍රශ්න ඔබට උපකාරී වනු ඇත.

1. අබ්දුල් බහාතුමාගේ ආරාධිතයාට හදවතේ පවිත්‍රත්වය ලබාගැනීමට ආශාවෙන් සිටි බව ළමයින් විසින් හඳුනා ගැනීමට වැදගත් වනු ඇත. මෙම කතාව තුළ ආරාධිතයා ඉදිරියේ වූ වතුර වීදුර සහ මේ ආශාවත් අතර ඇති සම්බන්ධය කුමක්ද?

2. පවිත්‍රත්වය ළඟා කරගැනීම සඳහා, වීදුරුවක් හිස්කර නැවත පුරවන්නාක් මෙන්, දෙවියන්වහන්සේගේ ආදරය, ත්‍යාගශීලී බව, කරුණාව වැනි ගුණාංගවලින් අපගේ හදවත් ආලෝකවත් කිරීමට නම්, නොවටිනා සිතුවිලි සහ හැඟීම්වලින් අප මිදිය යුතුය. ඇත්ත වශයෙන්ම දෙවියන්වහන්සේ දර්ශනයෙන් කිසිවක් සැඟවිය නොහැකි බව අපි දනිමු. පවිත්‍රත්වය ළඟා කරගැනීමට කරන උත්සාහයේදී මෙම අවබෝධය අපට උපකාර කරන්නේ කෙසේද?

මෙම ප්‍රශ්න ඔබගේ කණ්ඩායමේ සාමාජිකයින් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව, ඔබගේ අදහස් කිහිපයක් පහතින් ලියා දක්වන්න.

______________________________________________________________________

අබ්දුල් බහාතුමාගේ ජීවිතයට සම්බන්ධ නොවුවත්, ආධ්‍යාත්මික ගුණාංගවල වැදගත්කම විදහා දැක්වෙන කථා කිහිපයක් මෙම ශ්‍රේණිය තුල අන්තර්ගත වේ. ඒවා තුළ, මෙම ගුණාංග පෙන්වීමෙන් ලබන ත්‍යාගයන් සහ ඒවා නොසලකා හැරීමෙන් සිදුවන ප්‍රතිවිපාක පිළිබඳ ළමයින්ට දැකගත හැක. උදාහරණයක් ලෙස, 4 වැනි පාඩමේ දක්වා ඇති බොහෝ සංස්කෘතීන්වල ප්‍රසිද්ධ වෘකයෙකු පැමිණි බවට කෑගසන එඬේරාගේ කතාව තුලින් බොරු කීමේ ප්‍රතිවිපාක දක්වන අතර, මේ තුළින් සත්‍යවාදීභාවයේ ගුණාංගය පිළිබඳ අවබෝධයක් ලබාදෙයි. මෙම කතාන්දරවලින් ඉදිරිපත් කරන පණිවුඩ දරුවන්ට බොහෝ සෙයින් ප්‍රයෝජනවත් විය හැකි අතරම, එය ඔවුන්ගේ චරිත ගොඩනැංවීමේදී ඔවුන්ට වටිනා බව ඔප්පුවනු ඇත.

## 22 වැනි කොටස

කතාන්දරයන් පැවසීම කලාවකි. කතාන්දරයක් ඵලදායි ලෙස පැවසීමට නම්, යමෙකු එය හොඳින් දැන සිටිය යුතුය. මෙම කොටස තුලදී, අප විසින් 1 වැනි පාඩමේ කතාන්දර වඩාත් විස්තරාත්මකව අධ්‍යානය කරනු ලබන්නේ ගුරුවරයෙකුට එය දරුවන්ට පැවසිය යුත්තේ කෙසේදැයි සොයා බැලීමටය.

වීදුරුව උදාහරණයට මෙම කතාව තුළ කේන්ද්‍රීයව ගවේෂණය කරන ආධ්‍යාත්මික ගුණාංගය හදවතේ පවිත්‍රත්වය බව අප තහවුරු කර ඇත. එසේ නම් ඔබ ඔබගෙන්ම ඇසිය යුතු පළමු ප්‍රශ්නය වන්නේ, කතාව තුල මෙම ප්‍රධාන තේමාවට ඍජුවම සම්බන්ධ වන කොටස් මොනවාද? මෙහිදී අත්‍යාවශ්‍ය කරුණක් වන කාන්තාව ඉදිරියේ තිබූ වීදුරව මෙන් අබ්දුල් බහාතුමාගේ ප්‍රඥාවන්ත වචනයන් මඟින් ඇයට ලෞකික ආශාවන්ගෙන් තම හදවත කෙතරම් පවිත්‍ර කරගත යුතුදැයි සිතීමට හේතු විය. අබ්දුල් බහාතුමා විසින් සේවකයෙකු ලවා වතුර වීදුරුව හිස්කර එතුමා විසින් නැවත පිරවීම තවත්

කාරණයක් වේ. උදාහරණයක් ලෙස, අබ්දුල් බහාතුමා විසින් කාන්තාවගේ වීදුරුව හිස් කරන ලෙස සේවකයාගෙන් ඉල්ලා සිටි බව ඔබ සඳහන් නොකළහොත් එය කෙබඳු වනු ඇතිද?

දැන් අපි කතාවේ අත්‍යාවශ්‍ය කොටස් හඳුනාගෙන තිබුණත්, එහි අනෙකුත් විස්තර අමතක කළ නොහැක. අබ්දුල් බහාතුමාගේ ආරාධිතයෙකු රාත්‍රී භෝජන සංග්‍රහයේ වාඩිවී සිටියදී, වීදුරුවක් හිස් කරන ආකාරයෙන් ඇයගේ හදවත පිරිසිදු වේයැයි ප්‍රාර්ථනා කළ බව සරළව පැවසුවහොත් එය කතාන්දරයක් විය හැකිද? කතාන්දරයක සැමවිටම එහි හැඟීම්හි වැඩිවීමක් ලබාදෙන සහ එය සිත් ඇදගන්නා සුළු විස්තර ඇතුළත් වේ. ඒවා මොනවාද?

- හිස් වීදුරුව පිළිබඳ සිතුවිල්ල ආරාධිතයාට පැමිණෙන්නේ ආහර වේලක් අතරතුර අබ්දුල් බහාතුමාගේ ප්‍රඥාවන්ත ප්‍රකාශයන්ට සවන්දෙන අතර වුවත් ඇය කිසිවිටෙකත් තම සිතිවිලි ශබ්ද නගා පවසා නැත.
- රාත්‍රී භෝජන සංග්‍රහයට පැමිණ සිට අයට කතා කරමින් සිටියද අබ්දුල් බහාතුමා විසින් කාන්තාවගේ නොපැවසූ සිතුවිල්ල ආමන්ත්‍රණය කිරීමට මදවිරාමයක් ගන්නා ලදි.
- සිදුවූයේ කුමක්දැයි කිසිවෙකු නොදන සිටියහ.
- අබ්දුල් බහාතුමා විසින් ඇයගේ හදවතේ ආශාව හඳුනාගත් බව දැනගැනීමෙන් පසු ආරාධිතයාට ඉමහත් සතුටක් දැනෙන්නට විය.

1 වැනි ශ්‍රේණියේ කතාන්දරයන් අමතර විස්තර සහ අනෙකුත් අංගවලින් අලංකාර නොකිරීමට සැම ගුරුවරයෙකුම වගබලා ගත යුතු බව මෙහිදී සටහන් කළ යුතු අතර, එමඟින් දරුවන්ගේ අවධානය කතාන්දරය විසින් ප්‍රකාශ කිරීමට අදහස් කරන ආධ්‍යාත්මික සත්‍යයන්ගෙන් වෙනතකට යොමු විය හැක.

එසේ නම්, ඔබගේ කතාංගය තුළදී ළමයින්ට වැදගත් යමක් ඉගැන්වීම කතාන්දරයක් පැවසීමේ අරමුණ බව ඔබට මතක තබාගැනීම අවශ්‍ය වනු ඇත. ඔබ විසින් එය ප්‍රීතියෙන් හා හැඟීමෙන් විස්තර කරනවිට, ඔවුන් එය වඩාත් හොඳින් වටහා ගනු ඇත. ඒකාකාරී ලෙස කියන කතාන්දරයන් කෙරෙහි ළමයින් තුල උනන්දුවක් ඇති නොවේ. ඔබගේ කටහඩ, මුහුණේ ඉරියව් සහ අභිනයන් තුළින් සතුට, දුක, බලාපොරොත්තු සුන්වීම, බිය සහ ධෛර්යය වැනි හැඟීම් ප්‍රකාශ කිරීමට ඔබ ඉගෙන ගත යුතුය. කතාන්දරයේ වර්ධනයට අනුව ඔබගේ කටහඬේ ස්වරය හ ප්‍රමාණය වෙනස් විය යුතු අතර, සරල වුවද ඔබගේ අභිනයන් එක් එක් කොටසට අනුරූප විය යුතුයි. ඔබගේ කතාංගයේ රිද්මය සහ වේගය පිළිබවද ඔබ විසින් සිතා බැලිය යුතුය. ඔබ සෙමින් කතා කළහොත් දරුවන්ට කම්මැලිකමක් ඇතිවන අතර ඔබ වේගයෙන් කථා කළහොත් ඔවුන්ට කතාව අනුගමනය කිරීමට නොහැකි වනු ඇත. මේ සියල්ලටම වඩා, ඔබ මෙය සෙල්ලමක් නොකරන බවත්, ඔබගේ හැඟීම් අවංක විය යුතු බවත් මතක තබාගත යුතුය. අවංකත්වයේ අඩුවක් පැතියහොත් යෞවනයින්ට එය පහසුවෙන් හඳුනාගත හැකිය. අපෙක්ෂා කරන්නේ දරුවන්ගේ හදවත් සමඟ සම්බන්ධ වීම සහ දැනට වසර දහස් ගණනක් තිස්සේ පැවති මනුෂ්‍යත්වය විසින් අත්පත් කරගත් ප්‍රඥාවේ ගබඩාවන් පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන කතාන්දර පැවසීමේ දිගුකාලීන සංස්කෘතය ඉදිරියට ගෙන යෑමයි.

## 23 වැනි කොටස

දැන් අපි කතාන්දරය පැවසීමෙන් පසුව යෙදෙන ක්‍රීඩා කිරීම සහ වර්ණ ගැන්වීම යන ක්‍රියාකාරකම් ද්ිත්වය පිළිබඳ සලකා බලමු. මෙම කොටස තුලදී, ක්‍රීඩා කිරීම සඳහා වෙන් කරන කාල පරිච්ඡේදයට ප්‍රවේශ වන්නේ කෙසේද යන්න සාකච්ඡා කරනු ලබන අතර වර්ණ ගැන්වීම පිළිබඳ මීළඟ කොටසේදී සාකච්ඡා කරනු ලබයි.

පෙර සඳහන් කළ පරිදි, 1 වැනි ශ්‍රේණියේ ක්‍රීඩාවන් ස්වාභාිකවම සහයෝගිතාවයෙන් යුක්ත වේ. බොහෝ අය විශ්වාස කරන්නේ ක්‍රීඩාවන් අභියෝගාත්මකවීම සඳහා ළමයින් එකිනෙකා සමඟ තරඟ කළ යුතු බවයි. අප විසින් අවබෝධ කරගත යුතු දෙය වන්නේ, ළමයින් තරඟකාරී තත්වයට පත් කළවිට, ක්‍රීඩා කරන කාලසීමාව ඉක්මවා යමින් පවතින ඇතැම් අනවශ්‍ය ආකල්ප සහ පුරුදු ඔවුන් තුළ වර්ධනය වන බවයි. තවද, විශිෂ්ඨත්වය ළඟා කරගත හැක්කේ තරඟකාරීත්වයෙන් පමණක් බවට මතක් පවතී. මෙම අදහසෙහි සත්‍යතාවය පිළිබඳ ඔබ හොඳින් විමා බැලිය යුතුය. සහයෝගිතාවයෙන් අපට

විශිෂ්ටත්වය ළඟා කරගත නොහැකි බව ඇත්ත වශයෙන්ම සත්‍යයද? තරඟයෙදී සමහරක් ජය ගෙන අනෙක් අය පරාජයට පත්වන අතර සහයෝගීතාවය තුළදී සෑම කෙනෙකුටම ජයග්‍රහණය පිළිබඳ හැඟීමක් ඇති වේ.

පළමු වැනි ශ්‍රේණියේ ක්‍රීඩාවලදී දරුවන් තුළ උපදෙස්වලට සවන්දීමේ සහ අනුගමනය කිරීමේ හැකියාවන් වැඩි දියුණු කිරීමට උත්සාහ කරයි. ළමයින්ගේ උත්සාහයන් සම්බන්ධීකරණය කර, කාර්යයන් සාක්ෂාත් කරගැනීම සඳහා ඔවුන් සෑම කෙනෙකුටම කාර්යයභාරයක් ඇතිබව හැඟී යන පරදි සෑම ක්‍රීඩාවක්ම මුළු පන්තියටම පොදු ඉලක්කයක් ඇතිව සකස් කර ඇති බව ඔවුන්ට පෙනී යයි. මේ සියල්ලටම වඩා, ඔවුන් එකිනෙකා කෙරෙහි දක්වන සැලකිලිමත්භාවයේ ප්‍රමාණය ශක්තිමත් කිරීමට සහ ඉගෙන ගැනීමට සඳහාවූ දැඩි උත්සාහයත් ඔවුන් සම්බන්ධ කරන මිත්‍රත්වයේ බැඳීම් ශක්තිමත් කිරීමටත් මෙයින් අපේක්ෂා කරයි. එසේ නම්, සාර්ථකත්වයේ හැඟීමක් ඇතිවීමට නම් ඔවුන් පරිපූර්ණ ලෙස ක්‍රීඩා කිරීමට අවශ්‍ය නොවන බව ඔබ මතක තබාගත යුතුය. උදාහරණයක් ලෙස, 1 වැනි පාඩමේ යෝජනා කරඇති ක්‍රීඩාව දෙස බලන්න. එය අපේක්ෂා කරන අරමුණ සඳහා දායක වන්නේ කෙසේද?

*මීළඟ ක්‍රියාකාරකම සඳහා, මෝටර් රථ ටයරයක් ගෙන එය බිම තබා ළමයින් කීදෙනෙකුට එකවර එහි නැඟී සිටිය හැකිදැයි බලන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න. ටයරයක් සොයා ගත නොහැකි නම්, පැදුරක් හෝ තුවායක් හෝ ඒ හා සමාන දෙයක් බිම ඇතිරිය හැක. ඔබ විසින් කුමන වස්තුවක් මේ සඳහා තෝරා ගත්තද, එය පන්තියේ ළමුන් ගණන අනුව ක්‍රීඩාව අභියෝගයක් කිරීමට තරම් කුඩාවිය යුතුය.*

ළමයින් එහි නිරතවන ආකාරය බලපානු ලබන්නේ ගුරුවරයා විසින් ක්‍රීඩාව හඳුන්වාදෙන ආකාරය මතය. එහි අරමුණ ඉතා හොඳින් පැහැදිලි කළ යුතුය. තවද, ළමයින්ට උපදෙස් ලබාදීමේදී, ගුරුවරයෙකුට බොහෝවිට එම ක්‍රීඩාව කරන ආකාරය පෙන්වාදීමට සහ ඔවුන් සමඟ පුහුණුවීම් කිරීමට සිදු වේ.

## 24 වැනි කොටස

ළමයින්ගේ නිර්මාණශීලීත්වය සහ මානසික හැකියාවන් වර්ධනය කිරීම සඳහා කලාත්මක ක්‍රියාකාරකම් වැදගත් වන අතර, කුඩා කල සිටම නිහස් මෝස්තර චිත්‍ර ඇඳීම සහ අනෙකුත් කලාත්මක ප්‍රකාශනය ක්‍රම තුළින් ඔවුන්ගේ පරිකල්පනය ක්‍රියාත්මක කිරීමට ඔවුන්ට අවස්ථාව ලබා දිය යුතුය. කෙසේ වෙතත්, ලෝකයේ බොහෝ ප්‍රදේශවල වයස අවුරුදු පහට හෝ හයට අඩු දරුවන්ට චිත්‍ර ඇඳීමට සහ පාට කුරු ලැබීමේ ඉඩකඩ අඩුය. පළමු ශ්‍රේණියේ පාඩම් තුළින් ඔවුන් සඳහා සපයා ඇති චිත්‍ර වර්ණ ගැන්වීම පන්තිය වඩාත් උද්යෝගිමත් කාල පරිච්ඡේදය වන අතර, එය පසුකාලීන ශ්‍රේණිවලදී යෙදෙන වඩාත් සංකීර්ණ කලාත්මක ක්‍රියාකාරකම් වෙත යාමට අවශ්‍ය විශ්වාසය ඔවුන් තුල ඇති කරයි. එය ඔවුන්ගේ දක්ෂතාව සහ විනයාත්මක හැඟීම් වර්ධනය කිරීමේ මාර්ගයකි. වර්ණ ගැන්වීම තුළින් ළමයින් තුල පහත සඳහන් හැකියාවන්, කුලසතාවයන් සහ ආකල්පයන් වර්ධනය වන්නේ කෙසේද?

- නිසි පිළිවෙළ සහ අලංකාරය අලය කිරීම
- තොරතුරු සඳහා අවධානය යොමු කිරීම
- කාර්යයන් කෙරෙහි අවධානය යොමු කිරීම
- අනෙකුත් අය සමඟ සම්පත් බෙදාහදා ගැනීම
- අනෙකුත් අයට ගරු කිරීම

සමහරක් කුසලතාවයන් සහ ආකල්පයන් වර්ධනය කිරීමට අමතරව, වර්ණ ගැන්වීට වෙනුවෙන් කැපවූ කාලය තුළදී ගුරුවරයාට පළමු ශ්‍රේණියේ පාඩම්වල සලකා බලනු ලබන ගුණාංග

පිළිබඳ තම සිසුන් සමඟ සාකච්ඡා කිරීමට තවත් අවස්ථාවක් ලබා දෙයි. චිත්‍රවල නිරූපණය කරන දෑ පිළිබඳ පන්තිය තුල ප්‍රශ්න ඇසීමෙන්, ගුරුවරයාට, චිත්‍රය තුල සිදුවන්නේ කුමක්දැයි යන්න ඔවුන් සාකච්ඡා කරනවිට තේරුම් ගන්නා අදහස් සහ ඔවුන්ගේ මනස අතර සම්බන්ධතාවයක් ගොඩනැගීමට අවස්ථාව ලබාදිය හැක. පළමු පාඩමේ වර්ණ ගැන්වීම සඳහා ලබාදී ඇති චිත්‍රය දෙස බලා එය ඔබ ළමයින්ට හඳුන්වා දෙන්නේ කෙසේදැයි ඔබගේ කණ්ඩායම තුල සාකච්ඡා කරන්න. ඔබගේ අදහස් පහතින් ලියා දක්වන්න.

__________________________________________________

__________________________________________________

__________________________________________________

__________________________________________________

__________________________________________________

මෙම ක්‍රියාකාරකම සඳහා ගුරුවරයා ප්‍රමාණවත් ලෙස සූදානම් විය යුතුය. ළමයින් නිරායාසයෙන්ම වර්ණ ගැන්වීමට මහත් ආශාවක් දක්වන නමුත්, නිසි ලෙස සංවිධානය නොවුවහොත් පන්තියේ මෙම කොටස අවුල සහගත විය හැක. ළමියන්ට වර්ණ ගැන්වීමේ ක්‍රියාකාරකම සඳහා ස්ථානයක් හඳුනාගත යුතු අතරම, එක් එක් පාඩම සඳහා වූ චිත්‍රවල පිටපත් කලින් සූදානම් කරගත යුතුය. විශේෂයෙන්ම පළමු පාඩම් කිහිපය තුළදී, ගුරුවරයාට ළමයින් පාටකූරු හැසිරවිය යුතු ආකාරය මෙන්ම විනය සහ සහයෝගිතාවය පිළිබඳ හැඟීමක් ඇති කරගන්නා ආකාරයේ ප්‍රමිතියක් ඔවුන් සමඟ සැකසීම අවශ්‍ය විය හැක. මුල් අවස්ථාවේදී, සෑම ළමයෙකුමෙ ගුරුවරයා සතුව ඇති පාට කූරු පෙට්ටියෙන් එක් පාට කූරු බැගින් තෝරාගන්නා ලෙස ඉල්ලා සිටිය හැක. ඔවුන්ට වර්ණය වෙනස් කිරීමට අවශ්‍යවනවිට, අවශ්‍ය වර්ණය ලබාගැනීමට ඔවුන් සතුවූ වර්ණය වෙනත් අයෙකු සමඟ හුවමාරු කරගත හැක. පන්ති වාර කිහිපයකින් පසු, ළමයින් වජ්කට එක් වර්ණයක් බැගින් ලබාගැනීමට හුරුවූ පසු, සම්පූර්ණ පාටකූරු පෙට්ටියම පන්තිය මැද ස්ථානයක තැබිය හැක.

දැන් පහත දක්වා ඇති අවස්ථාවන් දෙස බලන්න. මෙම ක්‍රියාකාරකමෙහි සඵලත්වයට එක් එක් යුගලයේ කුමන තත්වයන් දායක වේද?

____ ළමයෙකු හොඳින් වර්ණ ගැන්වීමට උත්සාහ කරනතාක් කල් ගුරුවරයා විසින් ඔහුට හෝ ඇයට රේඛාවෙන් පිටත වර්ණ ගැන්වීමට ඉඩ ලබාදීම.

____ සෑම ළමයෙකුටම රේඛාව තුළ වර්ණ ගන්වන ලෙස තදින් පැවසීම

____ ළමයින් වර්ණ ගැන්වීම් සිදු කරනවිට, ගුරුවරයා ඔවුන් අතර ඇවිදිමින්, ඔවුන්ට අවශ්‍ය උපකාර සහ දිරිගැන්වීම් ලබාදීම

____ වර්ණ ගැන්වීම සඳහා වෙන්කර ඇති කාලය තුලදී, ළමයින්ට පැවරී ඇති කාර්යය කෙරෙහි අවධානය යොමු කිරීම

____ වර්ණ ගැන්වීම සඳහා වෙන්කර ඇති කාලය තුලදී, ළමයින් එකිනෙකාගේ අවධානය වෙනතකට යොමු කිරීම

____ වර්ණ ගැන්වීම් සිදුකරන කාලයේදී ඔවුන් සම්පූර්ණ නිහඬතාවයෙන් සිටීම

____ වර්ණ ගැන්වීම් සිදුකරන කාලය තුළදී ළමයින් ප්‍රීතියෙන් කටයුතු කරමින් එකිනෙකා දිරිගැන්වීම

## 25 වැනි කොටස

තමන් උගන්වන යෞවන කණ්ඩායම පිළිබඳ මූලික තොරතුරු කිහිපයක් තබා ගත හැකි සටහන් පොතක් තබාගැනීම ප්‍රයෝජනවත් වන බව බොහෝ ගුරුවරුන් පෙන්වා දී ඇත. මේ සම්බන්ධයේදී වගු දෙකක් ප්‍රයෝජනවත් විය හැකි අතර, එකක් සිසුන්ගේ නම් සහ වයස ඇතුළත්ව

පන්තියට පැමිණීම සටහන් කිරීමට සහ අනෙක උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය සඳහා යෙදවිය හැක. උදාහරණයක් ලෙස මෙම අවසාන වගුවේ වම් පසු තීරුවේ ළමයින්ගේ නම් සහ ඉහළින් ඇති පේළිය තුල පාඩම් අංක යෙදිය හැක. එහිදී ගුරුවරයාට ළමයින්ට කටපාඩම් කිරීමට ඇති උද්ධෘත පාඨයන්ට අදාළ කොටුව සලකුණු කළ හැක.

මෙම සටහන් පොතට පාඩම් සඳහාම වෙන්වූ කොටසක් තිබිය හැකි අතර, එහි ගුරුවරුන්ට සෑම පාඩමකම ඔවුන්ගේ විශ්ලේෂණයන්, එය උගන්වන ආකාරය පිළිබඳ ඔවුන්ගේ සිතුවිලි සහ අවසානයේ ළමයින් විසින් පාඩම අවබෝධ කරගන්නා ආකාරය පිළිබඳ ඔවුන්ගේ සමාලෝචනයන් එක් කළ හැක.

තවත් කොටසකදී, ගුරුවරයාට සෑම ළමයෙකුගේම ප්‍රගතිය මෙන්ම ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන් සමඟ බෙදාහදා ගත හැකි යම්කිසි විශේෂ සිදුවීම් ද සටහන් කර තැබිය හැක. සමහර ගුරුවරුන් මෙම කොටස තුල ළමයින්ගේ දෙමාපියන්ගේ සහ සහෝදර සහොදරියන්ගේ නම් සහ ඔවුන්ගේ නිවසට ගිය අවස්ථාවේදී සාකච්ඡා කරන ලද මාතෘකාවල කෙටි විස්තරයක් ඇතුළත් කිරීම ප්‍රයෝජනවත් බව හඳුනා ගෙන ඇත.

## 26 වැනි කොටස

ළමා පන්ති ගුරුවරයෙකු ලෙස, ඔබ විසින් සෑම ළමයෙකුගේම දෙමාපියන් සමඟ සමීප හා ආදරණීය සබඳතාවයක් ගොඩනඟ ගතයුතු අතර, ඔවුන්ගේ පුතුන් සහ දියණිවරුන්ගේ වර්ධනය හා සංවර්ධනය ගැන සාකච්ඡා කිරීමට සහ ඔවුන්ගේ සහාය ලබා ගැනීමට ඔවුන් සමඟ නිරන්තරව හමුවීම අවශ්‍ය වේ. ඔබ විසින් 2 වැනි පොත අධ්‍යනය කිරීමෙන් පසු ඔබගේ සමාජයේ පන්තිවලට සහභාගිවන සමහර ළමයින්ගේ පවුල් වෙත ඔබ දැන්ටමත් ගොස් ඇත. ඔබගේ මතකය අලුත් කිරීම සඳහ, එම පොතේ තුන්වන ඒකකයේ 15 වැනි කොටස වෙත යොමුවීමට අවශ්‍ය විය හැක. එම කොටස තුළදී ළමා පන්තිවල ගුරුවරියක් වන මාරිබෙල්, තමන්ගේ දෙවැනි නිවෙස් සංචාරය තුළදී එමාගේ මවට පවසන දෑ ගැන ඇයගේ අදහස් එක්රුස් කරන ආකාරය අපට දැකගත හැකිවිය. එමා පන්තියේ සිටීම ඇයගේ හදවතට ගෙනෙන ප්‍රීතිය ඇයට පැවසීමෙන් සහ ඇයගේ දියණිය තුළ තමන් සොයාගත් අපූරු ගුණාංග ගැන සඳහන් කිරීමෙන් ඇය කතාව ආරම්භ කිරීමට තීරණය කර ඇත. ගුරුවරයෙකු විසින් සමාජයේ ළමයින්ට සේවය කරන ප්‍රීතිය සහ උද්‍යෝගය දැකීම දෙමාපියන්ට කෙතරම් වැදගත් වේද? දෙමාපියන්ගේ හදවත් ආකර්ෂණයකර ඔවුන් සමඟ විශ්වාසයේ බැඳීම් ඇති කරන වෙනත් ගුණාංග මොනවාද?

__________________________________________

ගුරුවරයෙකු විසින් ළමයින් විසින් වර්ධන කරගන්නා ආධ්‍යාත්මික ගුණාංග ඔවුන්ගේ දෙමාපියන්ගේ අවධානයට යොමු කිරීම වැදගත් වන්නේ ඇයි?

මාරිබෙල් විසින් මෙම ඒකකයේ 3 වන කොටසේදී ඔබ විසින් අධ්‍යනය කරන ලද උද්ධෘත පාඨය එමාගේ මව සමඟ බෙදාහදා ගැනීමට සහ ළමයින්ගේ අධ්‍යාපනය පිළිබඳ එහි වූ ගම්‍යාර්ථයන් ඇය සමඟ ගවේෂණය කිරීමටද තීරණය කරන ලදි. ඔබ විසින් දෙමාපියන් සමඟ සිදු කරන බොහෝ සංවාදයන්වලදී, ළමා පන්ති වැඩසටහන හැඩගැස්වීම සඳහා ලබාදී ඇති අධ්‍යාපනික අදහස් පැහැදිලි කිරීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. මෙම ඒකකය තුල ඔබ විසින් විශ්ලේෂණය කරන ආකල්පයන් කිහිපයක් පහත දක්වා ඇත. තම දරුවන්ගේ ආධ්‍යාත්මික අධ්‍යාපනය තුල වූ එක් එක් සන්දර්භයන් පිළිබඳ ඔබ දෙමාපියන්ට පවසන්නේ කුමක්ද? ඔබ දෙමාපියන් සමඟ කරන සාකච්ඡාවන්වලදී බෙදාහදා ගන්නා එක් හෝ තවත් සංකල්පයකට අදාළවන ලේඛණයන්ගෙන් වෙනත් පරිච්ඡේදයන් මොනවාද?

ප්‍රශංසනීය චරිතයක් ගොඩනැංවීම ________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

ආධ්‍යාත්මික ගුණාංග අත්පත් කරගැනීම ________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

ළමයින්ගේ හදවත්වල මත යාඥාවෙන් ඇතිවන බලපෑම ____________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

දෙවියන්වහන්සේගේ වචන කටපාඩම් කිරීමේ වැදගත්කම ____________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

අබ්දුල් බහාතුමාගේ ජීවිත කතාවලින් ළමයින්ගේ චරිතය දියුණු කිරීමට ඇතිවන බලපෑම ________

________________________________________

________________________________________

________________________________________

________________________________________

දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ආදර සහ දෙවියන්වහන්සේ කෙරෙහි වූ බිය ________________

________________________________________

________________________________________

විනය සහ නිදහස

මාරිබෙල් විසින් තම අදහස් ඉදිරිපත් කිරීමට මද විරාමයක් තබා එමාගේ මවට ඇයගේ අදහස් ප්‍රකාශ කිරීමට ආරාධනා කිරීමට තීරණය කරන ලදි. කාලයත් සමඟ ගුරුවරුන් සහ ළමයින්ගේ දෙමාපියන් අතර ගැඹුරු සංවාදයක් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරයි. දෙමාපියන් හමුවීමය යන පළමු අවස්තාවේදීම ගුරුවරුන් විසින් ඔවුන් සලකා බලනු ලබන තේමාවන් පිළිබඳ විස්තර සටහන්, සිතුවිලි සහ අදහස් නිරාවරණය කිරීම වැදගත් වන්නේ ඇයි?

ආධ්‍යාත්මික ගුණාංගයන්ගේ සාමාන්‍ය සංකල්පයන් දෙමාපියන් සමඟ සාකච්ඡා කිරීමට අමතරව, පාඩම් තුළින් ඔවුන්ගේ දූවරුන් සහ පුතුන් තුළ වගා කිරීමට උත්සාහ කරන විශේෂිත ගුණාංගයන් පිළිබඳ ඔවුන් සමඟ කතා කිරීමට වසර පුරා පවතින අවස්ථාවන්ගෙන් ඔබ ප්‍රයෝජන ගත යුතුය. 1 වැනි පාඩම තුළ සඳහන් කරන ලදි හදවතේ පවිත්‍රතාවයේ ගුණාංගය පිළිබඳ ඔබ ලබාගෙන ඇති තීක්ෂණ බුද්ධිය මනසේ තබාගෙන, මෙවැනි සාකච්ඡාවක් සඳහා ඔබ ප්‍රවේශය ලබාගන්නේ කෙසේදැයි ඔබගේ අධ්‍යන කණ්ඩායම සමඟ සාකච්ඡා කරන්න.

තමන්ගේ දියණිය සමභාගිවන පන්තිවල සම්පූර්ණ ප්‍රතිලාභය ලැබීමට නම්, එමාගේ මව සහ තමන් අතර අන්‍යොන්‍ය අවබෝධයක් සහ සහයෝගයක් තිබියු යුතු බව මාරිබෙල් දැන සිටයාය. උදාහරණයක් ලෙස, පන්තිය තුලදී ඉගෙන ගන්නනා යාඥාවන් සහ උද්ධෘත පාඨයන් දෙමාපියන්ගේ උපකාර ඇතිව නිවසේදී ගායනා කළ හැක. මේ ආකාරයෙන්, ළමයින්ට දෙවියන්වහන්සේගේ වචන වඩාත් හොඳින් ඔවුන් තුළට ඇතුල්කරගත හැකිවන අතර, එය ඔවුන්ගේ හදවත් සහ ආත්මය හරහා විනිවිද ගොස් ඔවුන්ගේ චරිත හැඩගස්සවනවා ඇත. ගුරුවරුන්ගේ මෙම උත්සාහයන් ශක්තිමත් කිරීමට සහ සහායදීමට දෙමාපියන්ට කුමක් කළ හැකිදැයි ඔබගේ කණ්ඩායමේ සාමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න.

ළමයින්ගේ හදවතේ සහ මනසේ අපේක්ෂිත ගුණාංග පෝෂණ කළ හැක්කේ දීර්ඝ කාලයක් තිස්සේ පවත්වන නිසි අධ්‍යාපනයක් තුළින් පමණි. කොතරම් කුඩා වුවත් ඔවුන්ගේ ළමයින් ලබා ඇති ප්‍රගතිය පිළිබඳ ඔබ දෙමාපියන් සමඟ නිරතුරුව පවත්වන රැස්වීම්වලදී ආධාරණය කළ යුතු බව

මේවනවිට පැහැදිලිය. ඔබගේ සංවාදයන් ඉදිරියට යනවිට, මෙම ජයග්‍රහණයන් මත ගොඩනගා ගන්නා ආකාකරය ඔබට දෙමාපියන් සමඟ ගවේෂණය කළ හැක. මෙවැනි ධනාත්මක සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කරගත්විට, ගුරුවරයෙකුට ළමයෙකු තුල නිරීක්ෂණය කරන ඕනෑම දුෂ්කතාවයක් ඉතාමත් සැලකිල්ලෙන් යුතුව ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන් සමඟ බෙදාහදා ගැනීමට හැකිවනු ඇත. ළමයෙකුට තම දුෂ්කරතා මඟහරවා ගැනීමට උපකාරවන සහයෝගිතා මාධ්‍යයක් සොයා ගැනීම අරමුණ විය යුතුය.

## 27 වැනි කොටස

ඒකකය ආරම්භයේ සඳහන් කර ඇති පරිදි, මෙම පාඨමාලාවට සහභාගිවන සෑම කෙනෙකුම ළමා පන්තියක් පිහිටුවීම සිදු නොකරනු ඇත. එසේ සිදු කරන අය වුවත්, වෙනත් සේවා මාර්ගයකට යොමුවීමට පෙර ටික කාලයක් පමණක් මෙවැනි පන්තියක් පැවැත්වීම තෝරා ගනු ඇත. තවත් සමහරක් දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් ළමයින් පෝෂණය කරන දීර්ඝ කාලීන පන්ති පවත්වා ගනිමින් මෙම ක්ෂේත්‍රය තුළ ප්‍රයත්න දැරීමට කැපවනු ඇත. නමුත්, සහභාගිවන්නන් ගමන් කරන මාර්ගය කුමක් වුවත්, අසල්වාසීන්ට කතාකිරීමේදී, රැස්වීමකට හෝ හමුවකට සහභාගිවීමේදී හෝ සහෝදර සහෝදරියන් සහ දෙමාපියන් ලෙස, සියළු දෙනාටම ඔවුන්ගේ සමාජයේ යෞවන සමාජිකයින් සමඟ අන්තර් ක්‍රියාවන් සිදු කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. තත්වයන් කුමක් වුවත්, සහභාගිවන්නන්ට විශ්ව අධිකරණ මණ්ඩලය අපට පවසන පරිදි 'මහත් වටිනාකමකින් යුත් වස්තුව' වූ ඔවුන්ගේ සමාජය රැකබලා ගැනීමේ වගකීම පිළිබඳ අවබෝධයක් මෙම ඒකකය තුල ගවේෂණය කරන ලද සංකල්ප සහ අදහස් මගින් අවබෝධයක් ලබාදෙනු ඇත. මනුෂ්‍ය වර්ගයාගේ දීප්තිමත් අනාගතය දෙස බලා සිටින අප සියළු දෙනාම පහත සඳහන් ඡේවයන්ගෙන් මහත් ප්‍රබෝධයක් සහ පෝෂණයක් ලබා ගනිමු.

> **"උන්වහන්සේගේ සේවකයින් අතර දෙවියන්වහන්සේගේ වචනයන්ගේ උත්කර්ෂයටත්, ඒ හා සමානව, පැවැත්මේ ලෝකයේ අභිවෘද්ධිය සහ ආත්මයන් නඟා සිටුවීමට හේතුවන දේ අප විසින් සියළුම මිනිසුන්ට නියම කරමු. මේ සඳහා හොඳම මාර්ය වන්නේ ළමයින්ගේ අධ්‍යාපනයයි."**[38]
>
> **"අධ්‍යාපනය යනු මානව විශිෂ්ටත්වයේ අත්‍යාවශ්‍ය පදනම වන අතර මිනිසුන්ට ස්ථිර මහිමයේ උච්චතම අවස්ථාව කරායැමට ඉඩ සලසන හෙයින්, සර්ව කාරුණිකයාණන්ගේ අනුග්‍රහයන් සහ උපකාරයන් ආකර්ෂණය කරගන්නා මනුෂ්‍ය වර්ගයාගේ අති පුණ්‍යතම ක්‍රියාවක් වන්නේ ළමයින්ගේ අධ්‍යාපනය සහ පුහුණු කිරීමයි. ශුද්ධවූ උයන්පල්ලාගේ ආදරණීය රැකවරණය තුලින් ආත්මයේ සහ දැනුමෙහි විනිවිද පෙනෙ ජලය පානය කර ළමයෙකු ළදරුවියේ සිටම පුහුණු කරනු ලැබුවහොත්, ඔහු ගලා බසින දියපාරවල් මැදවූ තරුණ ගසක් මෙන්වනු ඇත. නියත වශයෙන්ම, ඔහු සත්‍යයේ සූර්යයාගේ දීප්තිමත් කිරණ තමන් වෙත රැස් කරගනු ලබන අතර, එහි ආලෝකය සහ උණුසුම තුළින් ජීවන උයනේ නැවුම්ව සහ සාධාරණ ලෙස සදාකාලිකවම වැඩෙනු ඇත....**
>
> **"මෙම අතිශය වැදගත් කර්තව්‍යයේදී, මනුෂ්‍යත්වයේ ලෝකය වෙනත් සැරසිලිවලින් බැබළවීමට සහ දීප්තිමත්ම ආලෝකය විහිදුවීමට අතිශය බලවත් උත්සාහයක් දරනු ලැබුවහොත්. එවිට මෙම අඳුරු ප්‍රදේශය දීප්තියෙන් බැබළී මෙම පෘථිවි වාසස්ථානය ස්වර්ගය බවට පත්වනු ඇත."**[39]

## REFERENCES


1. From a message dated 21 April 2000, published in *Messages from the Universal House of Justice, 1986–2001: The Fourth Epoch of the Formative Age* (Wilmette: Bahá'í Publishing Trust, 2010), no. 331.26, p. 727.

2. Bahá'u'lláh, in "A Compilation on Bahá'í Education", compiled by the Research Department of the Universal House of Justice, published in *The Compilation of Compilations* (Maryborough: Bahá'í Publications Australia, 1991), vol. 1, no. 576, p. 251.

3. *Selections from the Writings of 'Abdu'l-Bahá* (Wilmette: Bahá'í Publishing, 2010, 2015 printing), no. 106.1, p. 187.

4. 'Abdu'l-Bahá, in "A Compilation on Bahá'í Education", published in *The Compilation of Compilations*, vol. 1, no. 614, pp. 273–74.

5. *Gleanings from the Writings of Bahá'u'lláh* (Wilmette: Bahá'í Publishing Trust, 1983, 2017 printing), CXXII, par. 1, p. 294.

6. *Selections from the Writings of 'Abdu'l-Bahá*, no. 108.1, p. 188.

7. Ibid., no. 110.2, p. 190.

8. Ibid., no. 100.2, p. 179.

9. Ibid., no. 99.1, pp. 178–79.

10. Ibid., no. 103.5, p. 183.

11. Ibid., no. 122.1, pp. 198–99.

12. Words of 'Abdu'l-Bahá, cited in *Star of the West*, vol. 8, no. 4 (17 May 1917), p. 41.

13. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXXXVI, par. 2, p. 334; also in *Bahá'í Prayers: A Selection of Prayers Revealed by Bahá'u'lláh, the Báb, and 'Abdu'l-Bahá* (Wilmette: Bahá'í Publishing Trust, 2002, 2017 printing), p. iii.

14. From a talk given on 5 August 1912, published in *The Promulgation of Universal Peace: Talks Delivered by 'Abdu'l-Bahá during His Visit to the United States and Canada in 1912* (Wilmette: Bahá'í Publishing, 2012), par. 6, p. 345.

15. 'Abdu'l-Bahá, in *Prayer and Devotional Life: A Compilation of Extracts from the Writings of Bahá'u'lláh, the Báb, and 'Abdu'l-Bahá and the Letters of Shoghi Effendi and the Universal House of Justice*, compiled by the Research Department of the Universal House of Justice (Wilmette: Bahá'í Publishing, 2019), no. 24, p. 7.

16. *Gleanings from the Writings of Bahá'u'lláh*, XLIII, par. 9, p. 109.

17. From a talk given by 'Abdu'l-Bahá on 24 April 1912, published in *The Promulgation of Universal Peace*, par. 1, p. 71.

18. Bahá'u'lláh, *The Hidden Words* (Wilmette: Bahá'í Publishing Trust, 2003, 2012 printing), Arabic no. 3, p. 4.

19. Ibid., Arabic no. 12, p. 6.

20. Ibid., Arabic no. 11, p. 6.

21. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXXVIII, par. 6, p. 313.

22. *The Call of the Divine Beloved: Selected Mystical Works of Bahá'u'lláh* (Haifa: Bahá'í World Centre, 2018), no. 2.43, p. 31.

23. *The Hidden Words*, Arabic no. 59, p. 17.

24. From a talk given by 'Abdu'l-Bahá on 26 May 1912, published in *The Promulgation of Universal Peace*, par. 1, p. 204.

25. *Selections from the Writings of 'Abdu'l-Bahá*, no. 129.2, p. 204.

26. *Gleanings from the Writings of Bahá'u'lláh*, CLV, par. 4, pp. 376–77.

27. Ibid., CLIII, par. 5, p. 369.

28. *The Hidden Words*, Arabic no. 9, p. 5.

29. From a talk given by 'Abdu'l-Bahá on 24 April 1912, published in *The Promulgation of Universal Peace*, par. 4, p. 73.

30. Bahá'u'lláh, *Epistle to the Son of the Wolf* (Wilmette: Bahá'í Publishing Trust, 1988, 2016 printing), p. 27.

31. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas* (Wilmette: Bahá'í Publishing Trust, 1988, 2005 printing), no. 8.53, p. 126.

32. 'Abdu'l-Bahá, *The Secret of Divine Civilization* (Wilmette: Bahá'í Publishing, 2007, 2016 printing), par. 74, p. 53.

33. *Selections from the Writings of 'Abdu'l-Bahá*, no. 111.1, p. 191.

34. Ibid., no. 95.2, pp. 176–77.

35. Ibid., no. 111.4, pp. 191–92.

36. Ibid., no. 124.1, p. 200.

37. 'Abdu'l-Bahá, in *Bahá'í Prayers*, p. 29.

38. From a Tablet revealed by Bahá'u'lláh, in *Social Action: A Compilation Prepared by the Research Department of the Universal House of Justice* (Wilmette: Bahá'í Publishing Trust, 2020), no. 178, p. 107.

39. *Selections from the Writings of 'Abdu'l-Bahá*, no. 103.1–3, p. 182.



# පළමු ශ්‍රේණියේ ළමා පන්ති සඳහා වූ පාඩම්

## අරමුණ

යාඥා සහ උද්ධෘත පාඨයන් කටපාඩම් කිරීම සහ ගීත, කතාන්දර, ක්‍රීඩා සහ වර්ණ ගැන්වීම් අන්තර්ගත කරමින් චරිත ශෝධනය කෙරෙහි අවධානය යොමුකර, වයස අවුරුදු පහක් හෝ හයක් වයසැති ළමුන්ගේ පන්ති සඳහා ඉගැන්වීමේ හැකියාව වර්ධනය කිරීම.

## 1 වැනි කොටස

අවසාන ඒකකයේදී ඔබ විසින් පළමු ශ්‍රේණිය තුළ ඔබගේ ඉගැන්වීමේ උත්සාහයන්ගේ ස්වභාවය පිළිබඳ අවධානය යොමු කර, පාඩමක අන්තර්ගත වන විවිධ අංගයන් පිළිබඳ විශ්ලේෂණයක් කරන ලදි. ඔබ දන්නා පරිදි, ආධ්‍යාත්මික ගුණාංග වර්ධනය කිරීම වටා නිර්මාණය වූ පාඩම් විසි හතරක් මෙම දෙවන ඒකකය තුළ අඩංගු වේ. මෙම මූලික කොටස්වලදී, පාඩම්වල අන්තර්ගතය පිළබඳව ඔබට හුරු කරවීමට සහ ඒවා පැවැත්වීම පුහුණුවීමට ඔබට අවස්ථාවක් ලබාදී ඇත. අප මෙහිදී එක් වරකට පාඩම් හතරක් ගෙන ඒ සෑම එකක් තුළම සාකච්ඡා කරනු ලබන ආධ්‍යාත්මික ගුණාංග ගැන සමාලෝචනය කරයි. ඔබ ඊළඟ පාඩම් හතරට යොමුවීමට පෙර, ඔබගේ සෙසු සහභාගිවන්නන් සමඟ විවිධ ක්‍රියාකාරකම් මාරුවෙන් මාරුවට සිදු කරමින් විස්තරාත්මකව පාඩම්වෙත යොමුවන ලෙස ඔබව දිරිමත් කරමු.

## 2 වැනි කොටස

1 වැනි ශ්‍රේණියේ සෑම පන්ති කාල පරිච්ඡේදයක්ම ගුරුවරයා විසින් ගායනා කරන ආරම්භක යාඥාවකින් ආරම්භ විය යුතුය. උපකාරයක් ලෙස, සම්පූර්ණ ලෙස යාඥා 6ක් එක්වන ලෙස සෑම පාඩම් හතරකට වරක් නව යාඥාවක් පවසන ලෙස ඔබට යෝජනා කර සිටිමු. ඔබට මෙම යාඥාවන් මතකයේ තබාගැනීමට හැකිනම් එය ළමයින්ගේ මතකතබා ගැනීමේ උත්සාහයන් සඳහා විශාල උනන්දුවක් වේ. 1 සිට 4 දක්වා වූ පාඩම් සඳහා පහත යාඥාව යෝජනා කරනු ලැබේ.

> **"අනේ දෙවියනි! මේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න. මේ දරුවෝ ඔබවහන්සේගේ උද්‍යානයෙහි පැළැටි වෙති. ඔබවහන්සේගේ තණ පිටියෙහි මල් වෙති. ඔබවහන්සේගේ පුෂ්පෝධ්‍යානයෙහි රෝස මල් වෙති. ඔබගේ වර්ෂාව ඔවුන් මත පතිතවීමට ඉඩ හරින්න. සත්‍යතාවයේ සූර්යයාට ඔබගේ ආදරයත් සමඟ ඔවුන් මත බැබළීමට ඉඩ හරින්න. ඔවුන් පුහුණු කරණු ලැබ, වැඩී සංවර්ධනය වී අති සුන්දරව දර්ශනය වන පිරිදි ඔබවහන්සේගේ මඳ නලින් ඔවුන් ප්‍රබෝධමත් කරන්න. ඔබවහන්සේ ප්‍රධනය කරන්ණාන් වන සේක. කාරුණික තැනැත්තාණන් ඔබවහන්සේය."[1]**

ඉහත යාඥාව පැවසීමෙන් පසු, මතකයෙන් පැවසිය හැකි යාඥා පවසන ලෙස ළමයින් කිහිප දෙනෙකුට පසන ලෙස ඔබව ධෛර්යමත් කරමු. ආරම්භයේදී සියළුම යෞවනයින්ට පන්තියේ මෙම කොටස සඳහා දායකවීමට නොහැකි විය හැක. කෙසේ වෙතත්, ක්‍රමණුකූලව ඔවුන් මෙම ශ්‍රේණිය තුළදී යාඥාවන් මතක තබාගැනීමට යොමුවන විට වැඩි වැඩියෙන් ඒ සඳහා දායකවනු ඇත. පෙර ඒකකය පිළිබඳ ඔබගේ අධ්‍යනයේදී, ඔවුන් පළමු පාඩම් කිහිපය කුළදී ඔවුන්ගේ උත්සාහයන් යොමු කරන පහත ප්‍රකාශය ඔබට දැනටමත් හුරුපුරුදු වනු ඇත.

> **"උන්වහන්සේ දෙවියන්වහන්සේය! අනේ දෙවියනි. මාගේ දෙවියනි! මුතු ඇටයක් මෙන් පවිත්‍ර හදවක් මට ප්‍රදානය කරන්න."**

ආරම්භක යාඥාවන් සඳහා කැප කරනු ලබන කාලය ඉතාමත් තීරණාත්මක වන අතර එය දෙවියන්වහන්සේ කෙරෙහි භක්තියේ වාතාවරණයක් සහ ඉගෙනීමට හිතකර වාතාවරණයක් නිර්මාණය කරනු ඇත. අබ්දුල් බහාතුමා අපට අපට පවසන්නේ ළමයින් එක්රුස්කර ඔවුන්ට යාඥාවන් ඉගැන්වීම ඔවුන්ගේ හදවත්වලට "ප්‍රීතිය ගෙන දෙන" බවයි. දෙවියන්වහන්සේ සමඟ සංවාදයෙහි යෙදීම "ඉහළ බුද්ධියේ නැඹුරුතාවයක් ඇති කරයි.".

දෙවියන්වහන්සේ කෙරෙහි ගැඹුරු ගෞරවනීය හැඟීක් වර්ධනය කරගැනීමට සහ යාඥා කිරීමේදී ඒ අනුව හැසිරීමට ළමයින්ට උපකාර කළ යුතුය. ළමයෙකු යාඥා කරනවිට හෝ වෙනත් ළමයෙකු විසින් ගායනා කරන යාඥාවකට සවන් දෙමින් සිටියද, ඔවුන්ගේ හදවත සහ මනස ශුද්ධවූ වචන මත කේන්ද්‍රගත කරගැනීමට උපකාර කිරීම අවශ්‍ය විය හැක. උදාහරණ ලෙස, ඔවුන් වාඩිවිය යුතු ආකාරය, ඔවුන්ගේ අවධානය වෙනතකට යොමු නොවන පරිදි ඔවුන් දෑත්වලින් කළ යුත්තේ කුමක්ද සහ ඔවුන්ගේ වටපිට බලන්නේ නම් ඇස් තබාගත යුත්තේ කෙසේද යනුවෙන් ගුරුවරයාට ළමයින්ගෙන් ගෞරවය පෙන්විය හැක්කේ කෙසේදැයි ඇසිය හැක. යාඥාවන් සඳහා ඔවුන් සූදානම් විය යුතු ආකාරය ගුරුවරයාට පෙන්වා දිය හැක. පන්තිය තුළ ශබ්ද සහ චලනයන් සිදුවන විට සෑම ළමයෙකුම යාඥාව බැගින් ගායනා කිරීමට වඩා ආධ්‍යාත්මික වාතාවරණයක් තුළ ළමයින් තිදෙනෙකු හෝ හතර දෙනෙකු එක්ව යාඥාවන් ගායනා කිරීම වඩා හොඳ බව ඔබ විසින් මතක තබාගත යුතුය. එසේ නම්, සෑම පන්ති කාලසීමාවක් ආරම්භයේදීම යාඥා කරන ළමයින් කල්තියා තෝරා ගැනීම

යෝග්‍ය වේ. අවම වශයෙන් සෑම පන්තිවාර තුනකට හෝ හතරකට වරක් සෑම ළමයෙකුටම යාඥාවක් ගායනා කිරීමට අවස්ථාව ලබාදීමට ඔබ වගබලා ගත යුතුය.

වසර පුරාවටම, යාඥාවේ ස්වභාවය සහ අප යාඥා කරන්නේ ඇයි දැයි යන්න පිළිබඳ ඔබගේ සිසුන් සමඟ වරින්වර සාකච්ඡා කිරීම ඔබට වැදගත් වනු ඇත. පළමු සති කිහිපය තුළ ඔබට ඔවුන්ට පැවසිය හැකි දේ පහත ලබාදී ඇති අවකාශය තුල විස්තර කරන්න.

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

## 3 වන කොටස

දැන් ඔබගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ පළමු පාඩම් හතර එකින් එක හොඳින් කියවන්න. මෙහිදී හඳුන්වාදීමේ අදහස් සහ ළමයින් විසින් මතක තබාගැනීමට වෙන් කරන ලද උද්ධෘත පාඨ කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන්න. ඇත්ත වශයෙන්ම, පළමු පාඩමේ අවධානය යොමු කරන්නේ පවිත්‍රත්වය යන තේමාව කෙරෙහි බව ඔබ දන්නවා ඇත. ඊළඟ පාඩම් තුනේ එක් එක් පාඩම යොමුවී ඇති ආධ්‍යාත්මික ගුණාංගය ලියා දක්වන්න.

1 වැනි පාඩම පවිත්‍රත්වය____________________________

2 වැනි පාඩම __________________________________

3 වැනි පාඩම __________________________________

4 වැනි පාඩම __________________________________

මෙම පාඩම ඉගැන්වීමට සූදානම්වීමේදී, පළමු ඒකකයේ දී හදවතේ පවිත්‍රත්වය පිළිබඳ ඔබ විසින් දැනටමත් සිදු කර ඇති පරිදි, එක් එක් ඒවා මඟින් ආමන්ත්‍රණය කරනු ලබන ගුණාංග පිළිබඳ සමාලෝචනය කිරීමට යම් කිසි කාලයක් ගත කරන්න. අනෙකුත් ගුණාංග කුනට අදාළව ලේඛණයන්ගෙන් උපුටා ගන්නා ලද උද්ධෘත පාඨයන් කිහිපයක් පහතින් දැක්වේ. ඔබගේ සිසුන් විසින් මතක තබාගන්නා උද්ධෘත පාඨය මනසේ රඳවාගෙන, ඔබගේ කණ්ඩායම සමඟ එකින් එක කිහිප සැරයක් කියවන ලෙස සහ සමාලෝචනය කරන ලෙස ඔබට යෝජනා කර සිටිමු. ඉන් පසුව, පොදුවේ තනි පුද්ගලයෙකුගේ ජීවිතයේ ගුණාත්මකභාවයේ වැදගත්කම සහ විශේෂයෙන් ගුරුවරයෙකු ලෙස ඔබ දරන උත්සාහය පිළිබඳ ඔබගේ අදහස් කිහිපයක් ලියා දක්වන්න.

යුක්තිය සම්බන්ධයෙන් අප මෙසේ කියවමු.

**"මනුෂ්‍යයින්ගේ ආලෝකය යුක්තියයි. පීඩාවේ සහ කුරිරු පාලනයේ ප්‍රතිවිරුද්ධ සුළඟින් එය නිවා නොදමන්න. යුක්තියේ අරමුණ මනුෂ්‍යයින් අතර ඒකීයභාවය ඇති කිරීමයි."[3]**

**"කිසිම දීප්තියකට යුක්තිය හා සැසඳිය නොහැක. ලෝකයේ පැවැත්ම සහ මනුෂ්‍ය වර්ගයාගේ ශාන්තභාවය රඳා පවතින්නේ ඒ මතය."[4]**

**"ත්‍යාගය සහ දඬුවම යන කුළුණු දෙක මත රැඳී පවතින් යුක්තිය සඳහා ලෝකය පුහුණු කරනු ලබයි. ලෝකයේ ජීවයේ සාරය වන්නේ මෙම කුළුණු දෙකයි."[5]**

**"එම්බා ආත්ම පුත්‍රයාට! මාගේ දර්ශනය තුල සැම දෙයකින්ම හොඳම ආදරණීයන් වන්නේ යුක්තියයි; ඔබට මා අවශ්‍ය නම් ඔබ එයින් ඉවත් නොවී ඔබ කෙරෙහි මාගේ විශ්වාස තබනු පිණිස එය නොසලකා නොහරින්න. එහි ආධාරයෙන් ඔබට එය අන් අයගේ ඇස්වලින් නොව ඔබගේම ඇස්වලින් දැකිය හැකි අතර, ඔබගේ අසල්වැසියාගේ දැනුමින් නොව ඔබගේම දැනුමින් ඔබට දැනගත හැකිවනු ඇත. ඔබ කෙසේ වියයුතුදැයි යන්න ඔබගේම හදවතින් මෙනෙහි කර බලන්න. ඇත්ත වශයෙන්ම, මාගේ කරුණාවන්ත භාවයේ සලකුණක් ලෙස ඔබ පිරිනමන මාගේ ත්‍යාගය යුක්තියයි. එසේ නම් එය ඔබගේ ඇස් ඉදිරිපිට තබාඇත."[6]**

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

ආදරයේ ගුණාංගය පිළිබඳ ලේඛණයන් අපට මෙසේ පවසා ඇත.

**"ප්‍රේමයේ හරය නම් මනුෂ්‍යයින් තම හදවත් ආදරණීය තැනැත්තා වෙතට හරවාගෙන, උන්වහන්සේ හැර අන් සියල්ලෙන්ම කමන් වෙන්කර, තම ස්වාමීන්ගේ ආශාව හැර අන් කිසිවකට ආශා නොකිරීමයි."[7]**

**"මෙ දවසේදී, දෙවියන්වහන්සේගේ ධර්මයට සේවය කිරීම යනු, උන්වහන්සේගේ මිතුරන් අතර ආදරය සහ සහයෝගිතාවය ඇති කිරිමයි."[8]**

**"සදාකාලිකවම ශුද්ධවූ ප්‍රකාශවීම් පහළවීමේ අරමුණ වූයේ මනුෂ්‍ය ලෝකය තුල මිත්‍රත්වය සහ ආදරය ස්ථාපිත කිරීමයි."[9]**

**"සර්වානුකම්පාවේ ප්‍රකාශවීම සහ ආධ්‍යාත්මික වැගිරවීමේ උල්පත වූ දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ශාසනයේ රහස ප්‍රේමය වන බව ඔබ සත්‍යවශයෙන්ම දැන ගන්න. ආදරය යනු ශුද්ධාත්මයාණන්ගේ සදාකාලික ශ්වසනයෙන් මනුෂ්‍ය ආත්මය ප්‍රාණවත් කළ කාරුණික ආලෝකයයි."[10]**

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

සත්‍යවාදි බව සම්බන්ධයෙන් අපට මෙසේ උපදෙස් ලබාදී ඇත;

**“කියන්න, සත්‍යවාදී බව සහ ආචාරශීලී බව ඔබගේ අභරණයන් වේවා.”[11]**

**“සත්‍යවාදී බවින් තොරව කිසිදු ආත්මයකට දෙවියන්වහන්සේගේ ලෝක සියල්ලෙහිම දියුණුව සහ ජයග්‍රහණය ළඟා කරගත නොහැක.”[12]**

**“සත්‍යවාදී බව තුල අනෙකුත් සියළුම ගුණ ධර්මයන් ඇතළත්වන හෙයින් එය යහපත්ම ගුණාංගයයි. සත්‍යවාදී බව සියළු දුෂ්චරිතයන් සහ දුසිරිතයන්ට ප්‍රතිවිරුද්ධවන හෙයින් සහ සත්‍යවාදී මිනිසෙකු ඒ සියල්ල මුළුමනින්ම පිළිකුල් කරන බැවින් සත්‍යවාදී පුද්ගලයෙකු සියළු සාදාචාර විපත්වලින් ආරක්ෂාවී, සෑම අකුසල ක්‍රියාවකින්ම වෙන්වී, සෑම දුෂ්ට ක්‍රියාවකින්ම ආරක්ෂා වනු ඇත.”[13]**

දැන්, මෙම පාඩම්වලදී ළමයින් විසින් කටපාඩම් කිරීමට යන උද්ධෘත පාඨයන් මතක තබාගැනීමට අමතරව, සෑම කට්ටලකින්ම අවම වශයෙන් එක් ඡේදයක්වත් මතක තබා ගැනීමට ඔබ කැමති වනවා ඇත.

## 4 වැනි කොටස

ඉහත සමාලෝචනයන් සිත්හි රඳවාගෙන, පළමු පාඩම් හතර තුළදී ඔබ විසින් ඔබගේ සිසුන්ට පවසන කතාන්දරය නැවත කියවන්න. ඔබ විසින් සටහන් කරගන්නා පරිදි, පාඩම් හතරෙන් තුනකම ඇත්තේ මානව පරමාදර්ශයේ උසස්තම ප්‍රතිමූර්තිය වන අබ්දුල් බහාතුමාගේ ජීවිත කතාවලින් උපුටා ගත් කතාන්දරයන්ය. ඔබ විසින් උගන්වන පළමු ශ්‍රේණියේ සමහරක් ළමයින්ට අබ්දුල් බහාතුමාගේ චරිතය තවමත් හුරුපුරුදු නොමැති බැවින් උන්වහන්සේට කෙටියෙන් හඳුන්වාදීමට ඔබට අවශ්‍ය විය හැක. උන්වහන්සේගේ අද්විතීය ස්ථානය පිළිබඳ ඔබගේම දැනුවත්භාවය 2 වැනි පොතේ තුන්වැනි ඒකකයෙන් ඉගෙන ගත්දෑ මඟින් ඉහළ නංවා ඇති අතර, මෙම අනුක්‍රමික පාඨමාලාව ඔබගේ හැදෑරීම ඉදිරියට කරගෙන යත්ම, අබ්දුල් බහාතුමා යන තැනැත්තාණන් තුළින් දෙවියන්වහන්සේ මනුෂ්‍ය වර්ගයා ලබාදී ඇති වටිනා ත්‍යාගය පිළිබඳ උන්වහන්සේ කෙරෙහි ඇති ඔබගේ කෘතවේදීත්වය වර්ධනය වනු ඇත. 1 වැනි ශ්‍රේණියේ පළමු පාඩම ළමුන් විසින් ආරම්භ කරනවිට උන්වහන්සේ පිළිබඳ ඔබ ඔවුන්ට පවසන්නේ කුමක්ද?

පළමු ඒකකය පිළිබඳ ඔබගේ අධ්‍යනය තුළින්, කතාන්දරයන් ළමයින්ට සම්බන්ධ කිරීමේදී ඔවුන් එහි සිදුවීම්වලින් ඔබ්බට ගෙනයාමට සහ ආධ්‍යාත්මික යථාර්ථයන් පිළිබඳ ක්ෂණික දර්ශනයක් ඔවුන්ට ලබාගැනීම සඳහා උපකාර අවශ්‍ය බව ඔබ දන්නවා ඇත. 1 වන පාඩමේ ඇති අබ්දුල් බහාතුමාගේ ආරාධිතයාගේ කතාව තුලින ඔබගේ සිසුන්ට පවිත්‍රත්වයේ ගුණාත්මක භාවයේ වැදගත්කම සහ ඒ සඳහා උත්සාහ කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමද යන්න අවබෝධ කරගැනීමට උපකාර කරන්නේ කෙසේදැයි සිතා බැලීමට ඔබට අවස්ථාව ලබාදී ඇත. මේ ආකාරයටම අප මීළඟ පාඩම් තුන තුළදී එම කතාන්දරයන් විමර්ශනය කරමු.

ඔබට දකින්නට ඇති පරිදි, 2 වැනි පාඩමේ තේමාව වන අබ්දුල් බහාතුමාගේ යුක්තිය සඳහා දක්වන සැලකිල්ල නිදර්ශනය කරන කතාන්දරයක් විස්තර කරනු ඇත. එහිදී අබ්දුල් බහාතුමා ඇකා නගරයේ සිට හයිෆා දක්වා ගමන් කිරීමේදී සිදුවන සිදුවීමක් විස්තර කරයි. මෙම කතාන්දරය තේරුම් ගැනීමට නම් ළමයින් විසින් ග්‍රහණය කරගත යුතු තොරතුරු කිහිපයක් ඇති අතර සාමාන්‍ය කෝච්චියක සහ පෞද්ගලික අශ්වරථයක ආසන අතර වෙනස හඳුනා ගැනීම උදාහරණයක් ලෙස දැක්විය හැක. එමඟින් අවශ්‍යතා ඇති අයට ආධ්‍යාත්මික සහ භෞතිකමය පෝෂණයන් ලබාදීම සඳහා අබ්දුල් බහාතුමා විසින් තම පෞද්ගලික සුවපහසුව අතහැරීමට කැමැත්තෙන් සිටි බව ඔවුන්ට දැකීමට උපකාරී වනු ඇත. අනවශ්‍ය ලෙස තමා වෙනුවෙන් වියදම් නොකිරීම සහ අවශ්‍යතා ඇති අය වෙනුවෙන් ලබාදීම යන අබ්දුල් බහාතුමාගේ ජීවන ක්‍රමය තුළින් යුක්තියේ ආධ්‍යාත්මික ගුණාංගය ප්‍රකාශ කරන බව ඔබගේ සිසුන් දැනගන්නා බවට ඔබ සහතික වන්නේ කෙසේද? මෙම කතාන්දරය පැවසීමට පෙර ඔබගේ මනසේ පැහැදිලිව තිබිය යුතු විස්තර මොනවාද?

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

තුන්වැනි පාඩමේ තේමාව ප්‍රේමය වන අතර, එහිදී ඇකා නගරයේ ජීවත්වූ තැනැත්තෙකු අබ්දුල් බහාතුමාට නිරන්තරව අගෞරව කළත්, වසර ගණනාවක් තිස්සේ එතුමාගේ ප්‍රේමණීය කරුණාව ලැබූ අයෙකුගේ කතාවක් ඔබ විසින් ළමයින්ට පවසනු ඇත. ඇත්ත වශයෙන්ම අපට කරුණාවන්ත අය කෙරෙහි අපගේ හදවත් තුල ආදරය ඇති කරගැනීම පහසුය. නමුත් අබ්දුල් බහාතුමාගෙ ආදරය සීමාවක් දැන නොසිටි අතරම කොන්දෙසි සහිත නොවීය. ඔබ විසින් මෙම කතාන්දරය විස්තර කරන ආකාරය මඟින් අබ්දුල් බහාතුමාගේ ප්‍රේමයේ මෙම ලක්ෂණයන් ළමයින්ට පැහැදිල වන බව ඔබ සහතික වන්නේ කෙසේද? නොදැනුවත්කම නිසා වැරදි ලෙස හැසිරෙන කෙනෙකුගේ හදවත පරිවර්තනය කිරීමට ආදරයේ බලය අවබෝධ කරදීමට ඔබ ඔවුන්ට උපකාර කරන්නේ කෙසේද? නොපවසා සිටීම මඟින් ළමයින්ට කතාව අවබෝධ කරගැනීමට සහ අන්තර් දෘෂ්ටීන් ලබාගැනීමට අපහසු වන සමහර කරුණු මොනවාද?

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

සත්‍යවාදී භාවයේ ගුණාංගය කෙරෙහි අවධානය යොමු කරන 4 වැනි පාඩම තුල වෘකයා පැමිණි බවට කෑගසන එඬේරාගේ ප්‍රසිද්ධ කතාන්දරය ඇතුළත් වේ. තරුණ එඬේරාගේ බොරුවල ප්‍රතිවිපාක මෙම කතාන්දරයෙක් පෙන්නුම් කරන අතර එය ළමයින්ට පහසුවෙන් ග්‍රහණය කරගත හැක. නමුත් සත්‍යවාදීවීම තුලින් ලැබෙන ත්‍යාගයන් හඳුනාගැනීමට ඔවුන් තවත් ඉදිරියට ගෙන යෑමට ඔබට අවශ්‍ය විය හැක. මෙම ත්‍යාගයන් මොනවාද, මෙම කතාන්දරය තුලින් ළමයින් මෙය අවබෝධ කරගන්නා බව ඔබට සහතික විය හැක්කේ කෙසේද?

## 5 වැනි කොටස

මෙම කොටස්වලදී ඔබ 1 වැනි ශ්‍රේණියේ පළමු පාඩම් හතර මගින් ආමන්ත්‍රණය කර ඇති ආධ්‍යාත්මික ගුණාංග ගැන සිතා ඇති අතර එතුළින් ඒවාගේ වැදගත්කම පිළිබඳ ඔබගේ අවබෝධට ගැඹුරු කරගෙන ඇත. ඔබගේ සිසුන් මෙම ශ්‍රේණිය තුළදී තවදුරටත් වර්ධනය කරගනු ඇතැය ඔබ බලාපොරොත්තුවන ගුණාංගවල ස්වභාවය පිළිබඳ කතාන්දර මගින් ක්ෂණික දර්ශනයක් ලබාදෙන බව ඔබට දකින්ට ලැබෙනු ඇත.

ඊළඟ පාඩම් හතරට යොමුවීමට පෙර, ඔබගේ සෙසු සහභාගිවන්නන් සමඟ පළමු පාඩම් හතර ඉගැන්වීමට සූදානම් කිරීම සඳහා යම් කිසි කාලයක් ගත කරන්න. පෙර ඒකකය තුළ සාකච්ඡා කරඇති ප්‍රවේශයන් මත පදනම්ව, කටපාඩම් කිරීම සඳහාවූ යාඥාව හඳුන්වාදීමට සහ සෑම ඒකකයක් තුළ ඇති කටපාඩම් කළයුතු උද්ධෘත පාඨයද ඇතුළත්ව එහි ආධ්‍යාත්මික ගුණාංග ඉදිරිපත් කිරීමට මාරුවෙන් මාරුවට අවස්ථාව ලබාගන්න. ඔබට යම්කිසි විශ්වාසයකින් යුතුව ඔවුන්ට ඉගැන්වීමට හැකිවන තෙක් ඔබ එකිනෙකාට කතාන්දරය කියාදී ගීත ගායනය සහ ක්‍රීඩාවන් කළ යුතුය. වර්ණ ගැන්වීම සඳහාවූ කඩදාසි හඳුන්වා දෙන්නේ කෙසේදැයි සිතා බලන්න. මෙම අභ්‍යාසය ආරම්භ කිරීමට පෙර පළමු ඒකකයේ 17 වැනි කොටසේ සිට 24 වැනි කොටස දක්වා සමාලෝචන කිරීම ඔබට ප්‍රයෝජනවත් විය හැක. යෝජනා කර ඇති විවිධ අංග ප්‍රගුණ කිරීමෙන් පසු, ඔබගේ කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුටම පාඩම් එකක් හෝ කිහිපයක් උගන්වන ලෙස ඉල්ලා සිටිය හැකි අතර අනෙකුත් අයට ළමයින් ලෙස කටයුතු කළ හැක. ඔබගේ තත්වයන්ට අනුව ඇතැම්විට ළමයින් තුන් හතර දෙනෙකු රැස් කර ඔවුන් සමඟ පාඩම් කිහිපයක් කිරීමේ හැකියාවද ඇත.

ඉහත පුහුණුවීම් සිදු කරන අතරතුර, එක් එක් පාඩම ගැන ඔබට අවශ්‍ය සටහන් තබාගැනීම සහ එය ඉගැන්විය යුතු ආකාරය පිළිබඳ ඔබගේ අදහස් සටහන් කිරීමද අවශ්‍ය වනු ඇත. තවද, සමහර ක්‍රීඩාවන් සඳහා පාඩමට පෙර අවශ්‍ය ද්‍රව්‍ය ඔබට සකස් කිරීමට අවශ්‍ය විය හැක. බොහෝ ගුරුවරුන් පළමු ඒකකයේ විස්තර කර ඇති සටහන් පොතේ කොටසක් එවැනි සූදානම්වීම් සඳහා වෙන් කළ හැක.

ඔබ නිසැකවම මෙම පොත සහ ඔබගේ සටහන් පොත් ඔබගේ පන්තියට රැගෙන යනු ඇති අතර ඔබ එවායින් සරලව කියවීමට අවශ්‍ය නැති බව මතක තබා ගන්න. ඔබට පහසුවෙන් සහ උනන්දුවෙන් මෙහි අන්තර්ගතයන් ඉදිරිපත් කිරීමට හැකිවන තාක් දුරට ඔබගේ සිසුන්ට ක්‍රියාකාකරකම් සමඟ සම්බන්ධවීමට හැකිවනු ඇත. එසේ නම් පුහුණුවීම් සහ සූදානම්වීම අත්‍යාවශය වේ.

## 6 වැනි කොටස

5 වැනි පාඩමේ සිට 8 දක්වා සෑම පන්ති කාල පරිච්ඡේදයක් ආරම්භ කිරීම සඳහා පහත යාඥාව කටපාඩමින් ගායනා කරන ලෙස යෝජනා කරමු.

> **"අනේ කාරුණික ස්වාමීනි! මෙම ආදරණීය ළමයින් ඔබවහන්සේගේ ශක්තිය නමැති ඇඟිවලින් නිමවූ යහපත් නිර්මාණයන් සහ ඔබවහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයේ පුදුමාකාර සංකේතයන් වෙති. අනේ දෙවියනි! මෙම ළමයින් ආරක්ෂා කරන්න, ඔවුන්ට අධ්‍යාපනය ලබාගැනීමට සහ මනුෂ්‍යත්වයේ ලෝකයට සේවය ලබාදිය හැකිවන ලෙස දයාන්විතව උපකාර කරන්න. අනේ දෙවියනි! මෙම දරුවන් මුතු වැනි වන අතර ඔවුන් ඔබවහන්සේගේ අදර කරුණාව නමැති කටුව තුල පෝෂණයවීමට සලස්වන්න.**
>
> **"ඔබවහන්සේ සර්ව ත්‍යාගශීලී වන සේක. සර්ව ප්‍රේමණීය වන සේක"[14]**

ඔබගේ ඉගැන්වීමේ උත්සාහයන්ට අනුව මෙම වචන පිළිබඳ සමාලෝචන කිරීමට මොහොතක් ගතකිරීමට ඔබ කැමති වනවා ඇත. ඔබ සෑම පන්ති කාලපරිච්ඡේදයකටම පිවිසෙන ආකාරය ඔවුන් කෙරෙහි බලපාන්නේ කෙසේද? මේවා ළමයින්ගේ මෘදු හදවත් තුළ දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ශක්තිමත් කරන්නේ කෙසේද?

මෙම පාඩම්වලදී ඔබ ඔබගේ සිසුන්ට පහත යාඥාව මතක තබා ගැනීමට උපකාර කරනු ඇති අතර එහි වැදගත්කම පිළිබඳ ඔවුන්ට යම් අවබෝධයක් තිබේ නම් එය කිරීමට පහසු වන බව ඔබ දන්නවා ඇත. මේ සම්බන්ධයෙන් ඔබගේ අදහස් කිහිපයක් පහත ලබාදී ඇති අවකාශය තුල ඔබට ලිවිය හැක. ඔබ සිතන පිරිදි කුමන වචනයන් ඔවුන්ට අසීරු හෝ නුහුරු වචන වන්නේ මොනවාද, සහ ළමයින්ට පහසුවෙන් හඳුනාගත හැකි තත්වයන් තුළින් ඔබට ඒවා පැහැදිලි කළ හැක්කේ කෙසේද? එවැනි වචනවලට අමතරව, පහනක් සහ තරුවක් යන ද්විත්වයම ආලෝකය ලබාදෙන බවත්, ආලෝකය නොමැතිව අඳුර පවතින අතර අපට නොපෙනී ගොස් අප අතරමං වන බව ඔවුන්ට අවබෝධ කරගැනීමට උපකාර කිරීම අවශ්‍ය විය හැක. එසේ නම්, අප යාඥාව තුළදී අප ආධ්‍යාත්මික ආලෝකයෙන් බබළවන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටිමින්, උන්වහන්සේගේ බලය සහ ශක්තිය තුළින් උන්වහන්සේගේ කැමැත්ත සිදු කළ හැකි බවටත් සාක්ෂි වෙමු.

**"අනේ දෙවියනි, මට මඟ පෙන්වන්න, මා ආරක්ෂා කර, මා දීප්තිමත් පහනක් සහ බැබළෙන තරුවක් කරන්න. ඔබවහන්සේ බලවත් සේක. ශක්තිධර සේක."**[15]

## 7 වැනි කොටස

දැන්, ඔබ සිසුන් සමඟ බෙදාහදා ගන්නා හඳුන්වාදීමේ අදහස් සහ ඔවුන්ට කටපාඩම් කිරීමට වෙන් කර ඇති උද්ධෘත පාඨයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් 5 වැනි පාඩමේ සිට 8 දක්වා එකින් එක කියවන්න. එක් එක් පාඩම්වල සාකච්ඡා කරනු ලබන ආධ්‍යාත්මික ගුණාංගයන් පහත සඳහන් කරන්න.

5 වැනි පාඩම ____________________

6 වැනි පාඩම ____________________

7 වැනි පාඩම ____________________

8 වැනි පාඩම ____________________

මෙම ගුණාංග හතර පිළිබඳ අන්තර් දෘෂ්ටියක් ලබාදීම සඳහා ලේඛණවලින් උපුටා ගන්නා ලද ප්‍රකාශයන් කිහිපයක් පහත දැක්වේ. ඔබ කලින් සිදු කළ ආකාරයටම එක් එක් කට්ටලය පිළිබඳ සමාලෝචනය කර ලබාදී ඇති අවකාශය තුල ඔබගේ අදහස් කිහිපයක් ලියන්න.

ත්‍යාගශීලී භාවයේ ගුණාංගය පිළිබඳ අප කියවමු.

**"ඔබගේ සමෘද්ධිමත් දිනයන්හීදී ත්‍යාගශීලී වන්න, අලාභයන් සිදුවන කාලය තුළදී ඉවසිලිවන්ත වන්න."**[16]

**"මහත්මාභාවයේ ආරම්භය නම්, මිනිසෙකු තම ධනය තමන් වෙනුවෙන්, තම පවුල වෙනුවෙන් සහ තම ධර්මය තුල සිටින සහෝදරයන් අතරවූ දුප්පතුන් වෙනුවෙනුත් වියදම් කිරීමයි."**[17]

**"ඔවුන්ට මුණගැසෙන ප්‍රතිවිරුද්ධතාවයන් වැඩිවන තරමට, ඔවුන්ගේම යහපත් ශ්‍රද්ධාව පෙන්වීමට ඔවුන්ට ඉඩ දෙන්න; ඔවුන් වැඩි වැඩියෙන් පීඩනයන්ට සහ විපත්වලට මුහුණ දෙන තරමට වඩා ත්‍යාගශීලීව ඔවුන්ට පරිත්‍යාගශීලි කුසලානය වටා යාමට ඉඩ සලසයි. ලෝකයේ ජීවය බවට පත්වන ආත්මය එබඳුවන අතර, එහි හදවතේ විහිදෙන් ආලෝකය එබඳුය..."**[18]

**"මෙම නව කාලය තුළ, මේ ආශ්චර්යමත් යුගයේදී, සියල්ලටම වඩා ඉහළම දීමනාව ඔබ විසින් ඔබට දිනා ගත හැකිවනු සඳහා, ඔබ ත්‍යාගශීලිභාවයේ දිවා තරුවක්ද, පැවැත්මේ අභිරහස්වල ආරම්භ ස්ථානයත්, ආශ්වාදය පහළවන ස්ථානය බවටත්, තේජස නැඟී එන ස්ථානයත්, ශුද්ධාත්මයාණන් විසින් දරන ආත්මයක් බවටත්, ස්වාමීන්වහන්සේගේ වශීකෘත ස්ථානයත් බවට පත්වී, මනුෂ්‍ය වර්ගයාගේ ගතිලක්ෂණයන්වලට වඩා ශුද්ධවූ උන්වහන්සේ හැර අන් සියල්ලෙන්ම වෙන්ව ස්වර්ගයේ දූතයන්ගේ ගුණාංගවලින් සැරසෙන්න."**[19]

____________________________________________________________________
____________________________________________________________________
____________________________________________________________________
____________________________________________________________________
____________________________________________________________________

පරාර්ථකාමීත්වය පිළිබඳ අප මෙසේ අනුශාසනා කරමු.

**"...ඔබ එකිනෙකා කෙරෙහි අසීමිත ආදරයක් තිබිය යුතු අතර, සෑම කෙනෙකුම තමාට කලින් අනෙක් අය ගැන සැලකිලිමත් විය යුතුය."**[20]

**"ස්වාමීනි! එහි වස්ත්‍රයෙන් මා සැරසෙන ලෙසත් එහි සාගරය තුල මා නිමග්න වන ලෙසත් පරාර්ථකාමීත්වයේ පාත්‍රයෙන් මට බීමට ඉඩ ලබාදෙන්න. ඔබවහන්සේගේ ආදරණීයන්ගේ මාර්ගයෙහි මා දූවිලි බවට පත්කර, අති කීර්තිමත් ස්වාමීනි, ඔබවහන්සේගේ මාර්ගයෙහි ඔබවහන්සේගේ තෝරාගත්තවුන්ගේ පිය සටහන්වලින් උතුම් වූ බූමියට මාගේ ආත්මය පූජා කිරීමට මට වරම් දෙන්න."**[21]

**"මනුෂ්‍යයෙකු යනු අන්අය වෙනුවෙන් තමාගේ කැමැත්ත අමතක කරන අයෙකි. සියල්ලන්ගේම යහපත උදෙසා කමාගේ සුවපහසුව අභිමිකර ගනියි. එපමණක් නොව, වඩා කැමැත්තෙන් මනුෂ්‍ය වර්ගයාගේ ජීවිතය වෙනුවෙන් තමන්ගේ ජීවිතය අභිමිකර ගනී. මනුෂ්‍යත්ව ලෝකයේ ගෞරවය එබඳු මිනිසෙකි. මනුෂ්‍යත්ව ලෝකයේ මහිමය එබඳු මිනිසෙකි. සදාකාලික ප්‍රමෝදය ලබාගන්නේ එබඳු මිනිසෙකි. එබඳු මිනිසෙකු දෙවියන්වහන්සේගේ එළිපත්තට සමීපය. එබඳු මිනසෙකු සදාකාලීක ප්‍රීතියේ පරම ප්‍රකාශනය වේ."**[22]

____________________________________________________________________
____________________________________________________________________

පහත දක්වා ඇති උද්ධෘත පාඨයන් තුළින් ප්‍රීතියේ ගතිකත්වය පිළිබඳ ක්ෂණික දර්ශනයක් අප ලබා ගනිමු.

**"ප්‍රීතියේ පියාපත්වලින් දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ අවකාශය තුල ඉහළට නැගී යන්න."[23]**

**"උන්වහන්සේගේ අභිමුඛයට පැමිණ, උන්වහන්සේගේ අලංකාරය දෙස බලාසිටි, උන්වහන්සේගේ තනුවලට සවන් දෙමින් උන්වහන්සේගේ ශුද්ධවූ සහ උත්තරීතර මෙන්ම උන්වහන්සේගේ මහිමයේ සහ දීප්තිමත් තොල්වලින් නිකුත් වූ වචන මගින් ඉක්මන් වන අයට සම්පූර්ණ ප්‍රීතිය හිමි වේ."[24]**

**"ප්‍රීතිය අපට පියාපත් ලබාදෙයි! ප්‍රීතිමත් කාලවලදී අපගේ ශක්තිය වඩා සක්‍රිය වන අතර අපගේ බුද්ධිය තියුණු වෙමින් අපගේ අවබෝධය නොපැහැදිලිතාවයෙන් අවම වේ."[25]**

**"ඔබට හැකි පමණ, සෑම රැස්වීමකදීම ආදරයේ පහන් දල්වා මෘදු මොළොක් බවින් ප්‍රමුදිත කර ඔබ සෑම හදවතක්ම ප්‍රමෝදමත් කරන්න."[26]**

පහත ඡේදයන් අපට අවංකභාවය පිළිබඳ ප්‍රකාශ කරයි.

**"කියන්න; කිරි බොන බිළිඳකු තම මවගේ පයෝධරයන්ට ආශා කරන තරමටම අවංක ආත්මයන් දෙවියන්වහන්සේට සමීපවීමට දැඩි සේ ආශා කරන අතර, ඔහුගේ ආශාව තවත් දැඩි නොවන අතර ඔබට එය දැනගත හැකිද! තවද, ඔහුගේ එම ආශාව මහිමයේ ජීවදායක ජලයෙන් සංසිඳෙන වේදනාකාරී පිපාසයක් මෙන් හෝ සමාව සහ අනුකම්පාව සඳහා වූ පව්කරන්නෙකුගේ අභිලාෂය වැනිය."[27]**

**"මේ දිනවලදී, සත්‍යවාදී බව සහ අවංකකම මිත්‍යාවේ ග්‍රහණය තුල දැඩි ලෙස පීඩා විඳින අතර, යුක්තිය අයුක්තියේ වසංගතයෙන් දැඩි ලෙස පීඩා විඳිති."[28]**

**"කෙටි කාලයක් පුරා පැවතෙන මෙම ජීවිතය තුල අවංකව සහ සාධාරණව ගමන් කිරීම සෑම කෙනෙකුටම පැවරී ඇත."[29]**

**"ඔබ දිව්‍යමය වරප්‍රසාදයන්ගේ ප්‍රතිලාභියෙකුවීම සඳහා ඔබගේ හදවත් පවිත්‍ර විය යුතු අතර ඔබගේ අභිප්‍රායන් අවංක විය යුතුය."[30]**

ඉහත සෑම කට්ටලයකින්ම අවම වශයෙන් එක් ඡේදයක්වත් මතක තබා ගැනීට උත්සාහ කරන්න.

## 8 වැනි කොටස

දැන් අපි 5 සිට 8 දක්වා පාඩම්වල කතාන්දරයන් වෙත හැරී, ළමයින් විසින් ගවේෂණය කරන ආධ්‍යාත්මික ගුණාංගයන් සඳහා තීක්ෂණ බුද්ධියක් වර්ධනය කරගැනීමට ඒවා ඔවුන් උපකාර වන්නේ කෙසේදැයි සිතා බලමු. සෑම කතාන්දරයක්ම නැවත කියවීමෙන් පසු පහත ප්‍රශ්න සලකා බලන්න.

ත්‍යාගශීලීබාවය යනු 5 වැනි පාමේ කතාන්දරයේ ප්‍රධාන තේමාව වන අතර එය අබ්දුල් බහාතුමාගේ ළමා කාලයේදී එතුමාගේ පියාගේ බැටළු රැළ සම්බන්ධ සිදුවීමක් මඟින් විස්තර කරයි. කතාන්දරයේ ප්‍රධාන තේමාවට සම්බන්ධ කොටස් මොනවාද? නොපවසා සිටීමෙන් ළමයින්ට කතාන්දරය අවබෝධ කරගැනීමට අපහසු වන සමහර විස්තර මොනවාද? ඇත්ත වශයෙන්ම, වඩා වැදගත් වන්නේ, තම පුත්‍රයා විසින් එඬේරුන් කෙරෙහි දැක්වූ ත්‍යාගශීලී ස්වභාවය දැනගැනීමෙන් පසු බහා'උ'ල්ලා තුමා විසින් පෙන්වූ සතුටයි. එතුමාගේ ප්‍රකාශනයෙන් පුරෝකථනය කළේ අබ්දුල් බහාතුමා භෞතික දේපළ පමණක් නොව එතුමාගේ මුළු ජීවිතයම ඇතුළුව එතුමා සතු සියල්ල මනුෂ්‍ය වර්ගයාගේ යහපත වෙනුවෙන් පරිත්‍යාග කිරීමට හැදී වැඩෙන බවයි. සීමා රහිත වූ අබ්දුල් බහාතුමාගේ ත්‍යාගශීලීභාවය ළමයින් හඳුනා ගන්නා බවට ඔබ සහතික වන්නේ කෙසේද?

___________________________________________________________________________

6 වැනි පාඩමේ කතාන්දර තුළින් ළමයින්ට පරාර්ථකාමීත්වය පිළිබඳ ක්ෂණික දර්ශනයක් ලබා දෙයි. අබ්දුල් බහාතුා විසින් මිළ අධික කබාය ප්‍රතික්ෂේප කරමින් තමාට වඩා අන්අයට පිළිබඳ සැලකිල්ලක් දක්වන බව පෙන්වා දෙයි. ඔබගේ කථාංගය තුළින් ළමයින් මෙම නිගමනයට එළඹෙන බව ඔබ සහතික වන්නේ කෙසේද? කතාන්දරය පැවසීට පෙර ඔබගේ මනසේ පැහැදිලි වියයුතු විස්තර මොනවාද?

7 වැනි පාඩමේ තේමාව ප්‍රීතිජනක බව වන අතර, කුඩා දරුවෙකු ලෙස අබ්දුල් බහාතුමා හමුවී පසුව දෙවියන්වහන්සේගේ ධර්මය ප්‍රවර්ධනය කිරීම සඳහා තම ජීවිතය කැප කළ ලිරෝයි අයෝස් පිළිබඳ කතාන්දරයක් ඔබ විස්තර කරනු ඇත. මේ කතාවේදී ලිරෝයි විසින් ඔහු අබ්දුල් බහාතුමා වෙනුවෙන් මිළදී ගත් මල් කළඹ එතුමාට නොදීමට තීරණය කළ අතර ඒ වෙනුවට ඔහුගේ හදවත එතුමාට පිළිගැන්වීය. ලිරෝයි මෙය කළේ මන්දැයි ළමයින්ට තේරුම් ගැනීම සඳහා, මනුෂ්‍ය හදවත ඕනෑම භෞතික දෙයකට වඩා වටිනා දෙයක් බව ඔවුන්ට අවබෝධ කරදීමට සැලැස්වීම වැදගත් වනු ඇත. ඔබ කතාන්දරයේ මෙම කොටස කියවනවිට ඔබගේ කටහඬින් එය අවධාරණය කිරීම පමණක් ප්‍රමාණවත්ද? ළමයින්ට අදහස් අනුපිළිවෙල අවබෝධ කරගැනීමට සහ අබ්දුල් බහාතුමා විසින් ලිරෝයිට තම කබායෙන් රතු රෝස මලක් ලබාදීමේ ඉඟියෙන් පිරිමි ළමයාට මෙතරම් සතුටක් ගෙන දුන්නේ මන්දැයි ළමයින්ට අවබෝධ කරගැනීමට ඔබගේ කථාංගය තුල අවධාරණය කළ යුතු විස්තර මොනවාද?

අබ්දුල් බහාතුමා තම ජීවිත කාලය පුරාවටම එතුමා හමුවට පැමිණි සියළු දෙනාටම ප්‍රීතිය ගෙන දුන්නේය. මෙම වාර්තාව මඟින් අපට පෙන්වා දෙන්නේ අබ්දුල් බහාතුමාගේ සිත සතුටු කිරීමට වඩා වැඩි යමක් ලිරෝයිට අවශ්‍ය නොවූ බවයි. ප්‍රීතියේ විශාලතම මූලය අන් අයට ප්‍රීතිය ගෙන දීම බව ළමයින් අවබෝධ කරගැනීම අත්‍යවශ්‍ය වන්නේ ඇයි?

8 වැනි පාඩමේදී අවධානය යොමු කරන්නේ අවංකකම කෙරෙහි වන අතර, ළමයින්ට එහි කතාන්දරය හඳුන්වාදීමේදී, සමහරවිට ගුණාංගයක් සතුවීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි හොඳින් අවබෝධ කරගැනීම සඳහා එය නොමැතිවීම පෙන්වන වාර්තාවකට සවන්දීමෙන් හොඳි තේරුම් ගතහැකි බව ඔබට පැහැදිලි කිරීමට අවශ්‍ය විය හැක. තම අසල්වැසියාට ඔහුට අයත් ගසක් කපා දැමීමට ඒත්තු ගැන්වූ මිනිසෙකුගේ කතාව උදාහරණයක් ලෙස ගත හැක. සමහරවිට බාහිර පෙනුම මඟින් රැවටීමට ලත්විය හැකි බව යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න ළමයින්ට තේරුම් ගැනීමට ඔබ උපකාර කරන්නේ කෙසේද? කතාන්දර පැවසීමේදී, අවංක නොවූ අසල්වැසියාට ඇත්ත වශයෙන්ම ප්‍රතිවිපාක ලැබුණේ යැයි සිතීම පමණක් සිදුනොවීමට ඔබ සහතික විය යුතුය. අවිනිශ්චිතතාවයේ සෘණාත්මක බලපෑම් තේරුම් ගැනීමට ළමයින්ට උපකාරවීම ස ඳහා ඔබ ඔවුන්ට පවසන්නේ කුමක්ද?

## 9 වැනි කොටස

දැන් ඔබ 5 සිට 8 දක්වා පාඩම්වල සාකච්ඡා කර ඇති ආධ්‍යාත්මික ගුණාංග පිළිබඳ යම්කිසි අවබෝධයක් ලබාඇති බැවින්, ඔබ විසින් පළමු පාඩම් හතර සිදුකළාක් මෙන් මෙම පාඩම් සහ ඒවායේ විවිධ අංග සිදු කිරීමට ඔබගේ සෙසු සහභාගිවන්නන් සමඟ පුහුණුවීමට මඳ වේලාවක් ගත කරන්න. ඔබගේ සටහන් පොතේ ඔබට එක් එක් පාඩම ගැන අවශ්‍ය ඕනෑම කරුණක් ලියා එය උගන්වන ආකාරය පිළිබඳ ඔබගේ අදහස් සටහන් කළ හැකි බව මතක තබා ගන්න.

## 10 වැනි කොටස

9 සිට 12 දක්වා පාඩම් සඳහා, පහත දක්වා ඇති යාඥාව කියවා ඔබගේ සෑම පන්ති කාලපරිච්ඡේදයක්ම ආරම්භ කරන ලෙස යෝජනා කරන අතර, එය කටපාඩම් කරගැනීට යොමුවන ලෙස ඔබව උනන්දු කරනු ලබයි.

> **"අනේ මාගේ ස්වාමීනි! ඔබගේ අලංකාරය මාගේ ආහරයත්, ඔබගේ පැමිණීම මාගේ පානය සහ ඔබගේ සතුට මාගේ බලාපොරොත්තුව මෙන්ම ඔබගේ ප්‍රශංසාව මාගේ ක්‍රියාව සහ ඔබගේ සිහිකිරීම මාගේ සහයකයා සහ ඔබගේ ස්වෛරී බලය මාගේ ආධාරයත් මෙන්ම ඔබගේ වාසස්ථානය මාගේ නිවස බවට පත්කර, ආවරණයකින් වැසී සිටින්නාක් මෙන් ඔබගෙන් ඈත්ව සිටින අයට පනවා ඇති සීමාවන්ගේ මාගේ වාසස්ථානය වන ආසනය ඔබවහන්සේ විසින් පවිත්‍ර කරඇති සේක.**
>
> **"සත්‍ය වශයෙන්ම ඔබවහන්සේ සර්ව බලධාරී වනසේක. සර්ව මහිම වනසේක. අති බලවත් සේක."[31]**

මෙම පාඩම් හතර තුළදී පහත යාඥාව කටපාඩම් කරගැනීමට ඔබගේ සිසුන්ට ඔබ උපකාර කරනු ඇත. යාඥාවේ වැදගත්කම අවබෝධ කරගැනීමට ළමයින්ට ඔබ විසින් පැහැදිලි කිරීමට අවශ්‍ය වන වචන හෝ වාක්‍ය ඛණ්ඩ මොනවාද?

**"දෙවියන්වහන්සේ පිළිබඳ සඳහන් කර ඇත්තාවූත්, උන්වහන්සේගේ ප්‍රශංසාව වර්ණනය කර ඇත්තාවූත් යම් නිවසක්, ස්ථානයක්, නගරයක්, හදවතක්, කන්දක්, ආරක්ෂක ස්ථානයක්, ගුහාවක්, මිටියාවතක්, ගොඩබිමක්, මුහුදක්, දිවයිනක් හෝ තණ බිමක් වේද සියල්ල ආශිර්වාදලත් ස්ථාන වෙති."**[32]

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

## 11 වැනි කොටස

දැන්, ඔබ සිසුන් සමඟ බෙදාහදා ගන්නා හඳුන්වාදීමේ අදහස් සහ ඔවුන්ට කටපාඩම් කිරීමට වෙන් කර ඇති උද්ධෘත පාඨයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් 9 වැනි පාඩමේ සිට 12 දක්වා එකින් එක කියවන්න. එක් එක් පාඩම්වල සාකච්ඡා කරනු ලබන ආධ්‍යාත්මික ගුණාංගයන් පහත සඳහන් කරන්න.

9 වැනි පාඩම ______________________________________________

10 වැනි පාඩම ______________________________________________

11 වැනි පාඩම ______________________________________________

12 වැනි පාඩම ______________________________________________

ඉහත ගුණාංග හතරේ වැදගත්කම පිළිබඳ ඔබගේ අවබෝධය ගැඹුරු කිරීම සඳහා තෝරාගෙන ඇති එක් එක් ඒවාට අදාළ උද්ධෘත පාඨ ගැන සිතා බලන්න. ඔබ එසේ සිදු කරනවිට, ඔබගේ සිසුන් එම ඡේදයන් කටපාඩම් කිරීමට ඉගෙන ගන්නා බව මතක තබාගන්න. ඉන්පසුව, තනිපුද්ගලයෙකුගේ සහ තරුණ ළමයින්ගේ ගුරුවරයෙකුගේ ජීවිතය තුළ ගුණාංගයන්ගේ වැදගත්කම පිළිබඳ ඔබගේ අදහස් ලියාදක්වන්න.

ලේඛණයන් තුල නිහතමානීබවේ ගුණාංගය සම්බන්ධයෙන් මෙසේ පවසා ඇත.

**"නිහතමානිබව මිනිසෙකු මහිමයේ සහ බලයේ ස්වර්ගයට උසස් කරන අතර, උඩඟුකම තුළින් ඔහුව කාලකණ්ණිකමේ සහ නින්දාවේ ගැඹුරටම පහත හෙළයි."**[33]

**"මේ දවසේදී, දෙවියන්වහන්සේ සමඟ නිහතමානීව ගමන් කරන සහ උන්වහන්සේට ඇලුම් කරන සෑම ආත්මයක්ම, සෑම යහපත් නාමයකම සහ තත්වයකම ගෞරවය සහ මහිමය මඟින් ලාභ ප්‍රයෝජන ගනු ඇත."**[34]

**"දෙවියනවහන්සේගේ ප්‍රේමවන්තයින් වන ඔවුන්, කුමන ස්ථානයක රැස්වුවද, කවුරුන් මුණගැසුණත්, දෙවියන්වහන්සේ කෙරෙහි ඔවුන්ගේ ආකලපයන් තුල සහ උන්වහන්සේගේ ප්‍රශංසාව සහ මහිමය ඔවුන් සමරන ආකාරයන් තුල, ඔවුන්ගේ පාද යට ඇති සෑම දූවිලි**

**අණුවක්ම ඔවුන්ගේ භක්තියේ ගැඹුර පිළිබඳ සාක්ෂි දරන තරමේ නිහතමානි බවක් හා යටහත් පහත්බවත් පෙන්විය යුතුය."[35]**

**"නිසැකවම මිනිසෙකුගේ ඉහළම විශිෂ්ටත්වය වන්නේ තමන්ගේ දෙවියන්වහන්සේ ඉදිරියේ යටහත් පහත් වී කීකරුවීමයි."[36]**

ස්තුතිවන්තවීමේ වැදගත්කම පිළිබඳ මෙසේ සඳහන් වේ.

**"ශුද්ධත්වයේ සියළු සුභන්දයන් ඔබ මතට විහිදුවා ඇති බවත්, මාගේ වචනයන් සම්පූර්ණයෙන්ම ඔබට අනාවරණය කරඇති බවත්, මාගේ වරප්‍රසාදයන් ඔබ තුළින් සම්පූර්ණ කරඇති බවත්, මා වෙනුවෙන් මා කැමති දේ ඔබගේ අභිප්‍රායන් කල බවත් ඔබ දැනගන්න. මාගේ කැමැත්තෙන් සෑහිමට පත්වී මාහට කෘතවේදීවන්න"[37]**

**"දෙවියන්වහන්සේ ඔබ සර්ව සෑහීම වන සේක. උන්වහන්සේගේ ආත්මය සමඟ ඉතා කුළුපගව සංවාදයෙහි යෙදී ඔබ ස්තුතිවන්ත වන්න."[38]**

**"එබැවින්, උන්වහන්සේගේ ධර්මට ආධාර කිරීමට ඔබට ශක්තිමත් කිරීම වෙනුවෙනුත්, ඔබගේ හදවතේ උයනේ දැනුමේ සහ අවබෝධයේ මල් පිපීමට සැලැස්වීම වෙනුවෙනුත් දෙවියන්වහන්සේට කෘතවේදී වන්න. මෙලෙස උන්වහන්සේගේ අනුග්‍රහය ඔබව වෙලාගෙන ඇතිසේම සකල නිර්මාපිතයම වෙලාගෙන ඇත."[39]**

**"සත්‍ය නම්, එතුළින් ස්වභාව ධර්මය සම්පූර්ණයෙන්ම අසරණ බවට පත්ව මෙන්ම මනුෂ්‍යයින් උසස් බවට පත්කරන, වෙනස හඳුනාගත හැකි සහ උත්තරීතර බවට පත්වන ගුණාජගයන්, බලයන් සහ පරමාදර්ශී අධිකාරයන් දෙවියන්වහන්සේ විසින් මනුෂ්‍යයින් වෙත ප්‍රදානය කර ඇත. අප විසින් මෙම වරප්‍රසාදයන්, උන්වහන්සේ විසින් අප වෙත ලබාදී ඇති බලයන් සහ අපගේ හිස මත තබා ඇති කිරුළ පිළිබඳ දෙවියන්වහන්සේට ස්තුති කළ යුතුය."[40]**

පහත උද්ධෘත පාඨයන් තුළින් අපට ක්ෂමායුක්ත භාවය පිළිබඳ පවසා ඇත.

**"යමෙකුගේ අවසානය කුමක්දැයි කිසිවෙකුත් නොදන්නා බැවින්, ඔහුගේ පව්වලට ක්ෂමාව දිය යුතු අතර කිසිවිටෙකත් ඔහුගේ තත්වය පහත් නොකළ යුතුය."[41]**

**"සෑම දෙයකම අභ්‍යන්තර සාරය සෑම දෙයක් තුළමු වූ සාක්ෂි මත ප්‍රකාශවී ඇත; මේ දවසේදී, කිසිවෙකුට සමාන කළ නොහැකි, හවුල්කරුවන්ට සම්බන්ධ විය නොහැකි වූත්, සියළු මනුෂ්‍යයින්ගේ ස්වෛෂී ආරක්ෂකවරයා වූත් සහ ඔවුන්ගේ පාපයන් සඟවා තබාගන්නා වූත් දෙවියන්වහන්සේ තුළින් සෑම ක්ෂමාමක්ම ගලා එනු ඇත."[42]**

**"එහෙයින්, කිසිවෙකුගෙත් අඩුපාඩුකම් දෙස නොබලන්න; ක්ෂමායුක්ත ඇසින් බලන්න. අසම්පූර්ණ ඇස දකින්නේ අසම්පූර්ණත්වයයි. වැරදි වසාගන්නා ඇස ආත්මයේ නිර්මාතෘවරයා දෙසට යොමු වේ."[43]**

**"ඔබගේ හදවත කිසිවෙකු සමඟ අමනාප නොකර ගන්න. යම්කිසි අයෙක් ඔබට දොෂයක් හෝ වැරද්දක් කරන්නේ නම්, ඔබ වහාම ඔහුට ක්ෂමාව දිය යුතුය."[44]**

මෙම උපුටා දැක්වීම් අප අපේක්ෂා කරන අවංකභාවයේ තත්වය විස්තර කරයි.

**"කියන්න; අවංකබව, ගුණවත්කම, ප්‍රඥාව සහ ශාන්තභාවයේ චරිතය මනුෂ්‍යයාගේ උත්කර්ෂවත් බවට හේතුවන අතර, වංකකම, වංචාව, නොසැලකිලිමත් බව සහ කුහකකම ඔහුව නින්දාවට පත් කරයි."[45]**

**"අහෝ දෙවියන්වහන්සේගේ නගරවල සිටින උන්වහ්සේගේ මිත්‍රවරුනි, උන්වහන්සේගේ දේශයන්වල සිටින උන්වහන්සේගේ අදරණීයනි! මෙම වරදකරනු ලැබූ තැනැත්තා ඔබට අවංක සහ භක්තිමත් වන ලෙස නියම කරයි. ඔවුන්ගේ ආලෝකයෙන් බබළන නගරයට ආශිර්වාද වේවා. ඔවුන් තුළින් මනුෂ්‍යයින් උත්කර්ෂයට පත්කරනු ලබන අතර, සියළු නිර්මාණයන්ගේ මුහුණ ඉදිරිපිට ආරක්ෂාවේ දොර අඟුළු හරිනු ලැබේ. ඒවාට තදින් ඇලී සිටින සහ එහි ගුණාංග හඳුනාගන්නා මනුෂ්‍යයින් ප්‍රීතිමත් වන අතර එහි තත්වයන් ප්‍රතික්ෂේ කරන්නන් ඛේදනීය තත්වයට පත්වේ."[46]**

**"සත්‍යයේ විශ්වාසවන්තකම, ප්‍රඥාව සහ අවංකකම දෙවියන්වහන්සේගේ නිර්මාණයාන් සඳහා වූ උන්වහන්සේගේ අලංකා ආභරණයන් වේ. මෙම ලක්ෂණ වස්ත්‍රයන් සෑම නළල් තලයකටම සුදුසු ආයිත්තම් වේ. එය අවබෝධ කරගන්නා අය ප්‍රීතියට පත්වන අතර, එවැනි ගුණාංගයන් අත්පත් කරගැනීම ඔවුන් සතුවේ."[47]**

ඉහත කට්ටලයන්ගෙන් අවම වශයනේ එක් ඡේදයක් හෝ කටපාඩම් කරගැනීමට උත්සාහ කරන්න.

## 12 වැනි කොටස

දැන් අප මෙම පාඩම් හතරේ ඇති කතාන්දරයන් ඉහත සාකච්ඡා කරන ලද ආධ්‍යාත්මික ගුණාංග පිළිබඳ ඔබගේ සිසුන්ට අවබෝධයක් ලබා දෙන්නේ කෙසේදැයි බලමු.

9 වැනි පාඩමෙන් විස්තර කරන්නේ අබ්දුල් බහාතුමා සමහර ධනවත් අමුත්තන් හමුවූවිට සිදුවූ සිදුවීමක් වන අතර එයින් ළමයින්ට එතුමාගේ නිහතමානිකම අවබෝධ වන ඇත. මෙහි කේන්ද්‍රීය

අදහස වන්නේ අබ්දුල් බහාතුමාට එතුමා අලංකාරවත් ලෙස සහ උත්කර්ෂවත් සැලකීමක් අවශය නොවීමයි. මෙයින් උන්වහන්සේගේ නිහතමානිකම පෙන්නුම් කරන්නේ කෙසේද? ඇත්ත වශයෙන්ම, උත්කර්ෂවත් බවේ ලක්ෂණයන් වන පාත්‍රය, ජලය සහ සුවඳ ගැන්වූ තුවා වැනි දෑ සිත් ඇඳගන්නා සුළු විස්තරයන් පමණක් වන අතර එයින් ඔබගේ කතාන්දර කීමේ කේන්ද්‍රීය තේමාවෙන් අවධානය වෙනතකට යොමුවීම වැළැක්විය යුතුය. ඒ වෙනුවට නිගමනය අවධාරණය කළ යුතු වේ. අබ්දුල් බහාතුමාගේ තිබූ නිහතමානීකම සහ අන් අයට සේවය කිරීමට ඇති ආශාව ගැන ළමයින්ගේ අවබෝධය තවදුරටත් පුළුල් කරන්නේ කෙසේද?

---

10 වැනි පාඩමේ තේමාව වන්නේ ස්තූතිවන්ත භාවය වන අතර, මෙහිදී අබ්දුල් බහාතුමා වෙත ගොස් ඇගේ සියළු කරදර සහ දුක් එතුමා සමඟ බෙදා ගැනීමට සූදානම්වන කාන්තාවකගේ කතාන්දරයකට ළමයින් සවන් දෙනු ඇත. පසුව අබ්දුල් බහාතුමා විසින් ඇයට මිර්සා හයිදර් අලිව හඳුන්වාදුන් අතර ඔහු ජීවිතයේ අතිවිශාල දුෂ්කරතා අත්විඳී නමුත්, දෙවියන්වහන්සේගෙන් තමන්ට ලැබුණු සියළු ආශිර්වාදයන්වලට කෘතගුණ දැක්වීම කිසිවිටකත් නතර නොකළේය. කතාන්දරය විස්තර කිරීමේදී අබ්දුල් බහාතුමා විසින් මිර්සා හයිදර් අලිව එම කාන්තාවට හඳුන්වාදීම අහම්බෙන් සිදු නොවූ බව ඔබගේ සිසුන්ට පැහැදිලි කිරීමට ඔබට අවශ්‍ය වනු ඇත. ඔහු හමුවීමෙන් කාන්තාව ඉගෙනගත්තේ කුමක්දැයි ඔබ සිතන්නේද? මෙම පාඩම පැහැදිලි කිරීමට කතාන්දරය උත්සාහ කරන්නේ කෙසේද?

---

11 වැනි පාඩමේ තේමාව ක්ෂමාවදීම වන අතර අප විසින් සමාව දෙන අයට සමාවදීමේ බලපෑම පෙන්නුම් කරන අබ්දුල් බහාතුමා පිළිබඳ කතාන්දරයක් මෙහිදී ඔබ සිසුන්ට පවසනු ඇත. ළමයින් අදහස් අනුපිළිවෙල අවබෝධ කරගැනීමට නම්, ඔබ පැහැදිලිව පැවසීමට අවශ්‍ය වන බොහෝ විස්තරයන් කතාන්දරය තුල ඇත. එය අබ්දුල් බහාතුමා සහ එම නගරයේ සිටි එතුමාගේ සහායකයින්ට විශාල හානියක් කිරීමට සැරසී සිටින ඇකා නගරයේ ආණ්ඩුකාරවරයා හා සම්බන්ධ වේ. මෙම කතාන්දරයේදී අබ්දුල් බහාතුමා විසන් ආණ්ඩුකාවරයාගේ ක්‍රියාවන්ට සමාව දෙනවා පමණක් නොව; සියල්ල අහිමිව දැඩි වේදනාවට පත්වන ඔහුට එතුමා කරුණාවන්ත වන අතරම උපකාර කරන ලදි. අපට වැරදි කරන අය කෙරෙහි නරක හැඟීම් ඇති නොකරගැනීමෙන් ඔබ්බට ගොස් අබ්දුල් බහාතුමා විසින් පෙන්වා දෙන සමාවදීි මෙම කතාන්දර තුලින් ළමයින් අවබෝධ කරගනු ඇතැයි බලාපොරොත්තු වන්නේ මොනවාද? ඔවුන් මෙම අදහස් ග්‍රහණය කරගෙන ඇත්දැයි ඔබ දන්නේ කෙසේද?

---

12 වැනි පාඩමේ කතාන්දරයෙදී, අශ්ව කරත්ත ගමනක් සඳහා අසාධාරණ මිලක් ඉල්ලා සිට රියදුරෙකුට අබ්දුල් බහාතුමා ප්‍රතිචාර දක්වන ආකාරය ළමයින් විසින් දකිනු ඇත. කරුණාවන්තභාවයේ සහ ආචාරශීලීත්වයේ සාරය වුවද, අබ්දුල් බහාතුමා කිසිවිටෙක තමා හෝ අන් අය කෙරෙහි වංක ලෙස හෝ වංචනික ලෙස කටයුතු කිරීමට මිනිසුන්ට ඉඩ දුන්නේ නැත. අබ්දුල් බහාතුමාගේ ප්‍රතිචාරයෙන් රියදුරා කුමක් ඉගෙන ගත්තේ දැයි ඔබ සිතන්නේද? සත්‍යවශයෙන්ම, රියදුරාට අහිමිවී ගිය සන්තෝෂම වැනි භෞතික දෙයකට වඩා විශාල දෙයක් වංකවීමෙන් අපට අහිමිවී යන බව ඔබගේ ළමයින්ට අවබෝධ කරගැනීමට ඔබ උපකාර කරන්නේ කෙසේද?

## 13 වැනි කොටස

ඔබගේ අනෙකුත් සහභාගිවන්නන් සමඟ 9 සිට 12 දක්වා පඩම්වල ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් පසු, ඔබට ඊළඟ පාඩම් හතරට යොමුවිය හැක. 13 සිට 16 දක්වා පාඩම් සඳහා පහත යාඥාව කටපාඩමින් කියවීමෙන් ඔබගේ සෑම පන්ති කාලපරිච්ඡේදයක්ම ආරම්භ කරන ලෙස යෝජනා කරයි.

> **"අනේ මාගේ සානුකම්පිත ස්වාමීනි! මේ ඔබවහන්සේගේ භද්‍ර සොමනස් උයනේ වැඩුණු මාණික්‍යයක් වන අතරම සත්‍ය දැනුමේ පළතුරු වත්තේ හටගත් රිකිල්ලකි. වරප්‍රසාදයන්ගේ ස්වාමීනි, සැමවිටම ඔබවහන්සේගේ ප්‍රාණවත් මඳ පවනින් නිරන්තරව ප්‍රබෝධමත් කිරීමට සලස්වා, ඔබවහන්සේගේ අනුග්‍රහයේ වළකුළුවලින් කඩාහැළෙන වර්ෂාව මඟින් එය සාරවත්, නැවුම් සහ සමෘද්ධිමත් කරන්න. අනේ මාගේ කාරුණික ස්වාමීනි!**
>
> **"ඇත්ත වශයෙන්ම ඔබවහන්ස් සර්ව මහිම වන සේක"[48]**

13 සිට 16 දක්වා පාඩම්වලදී ඔබගේ සිසුන් විසින් කටපාඩම් කරගත යුතු යාඥාව පහත දැක්වේ. එහි වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන්ට උපකාර කිරීම සඳහා, ඔබ විසින් ඔබගේ සිසුන්ට අළුත් හෝ නුහුරු වචන හෝ වාක්‍ය ඛණ්ඩ හඳුනාගෙන ඒවා පැහැදිලි කිරීමට සුදුසු වාක්‍ය සකස් කළ යුතුය. ඇත්ත වශයෙන්ම, මෙම පාඩම්වලදී ඔබ විසින් කටපාඩමින් ගායනා කරනවිට එයට අනුනාදව ඔවුන් වසින් යාඥාව තුළවූ චිත්‍ර සටහයනක් පහසුවෙන් ග්‍රහණය කරගනු ඇත.

> **"අනේ ස්වාමීනි! මෙම මෘදු මොළොක් බීජය ඔබවහන්සේගේ නානාවිධ වරප්‍රසාදයන්ගේ උද්‍යානයෙහි සිටුවා, ඔබවහන්සේගේ ආදර කරුණාවේ උලපත්වලින් එයට ජලය එක්කර, ඔබවහන්සේගේ පිටාර ගලන අනුග්‍රහයෙන් සහ කරුණාව තුළින් එය වටිනා ශාඛයක්වීමේ වරප්‍රසාදය ලබාදෙන්න.**
>
> **"ඔබවහන්සේ අතිප්‍රබල සේක. බලවත් සේක."[49]**

## **14** වැනි කොටස

ඔබ ඔබගේ අනෙකුත් සහභාගිවන්නන් සමඟ සුපුරුදු පරිදි සෑම පාඩමක්ම කියවීමෙන් පසු 13 සිට 16 දක්වා පාඩම්වල සඳහන් කරඇති ගුණාංග පහත ලියා දක්වන්න.

13 වැනි පාඩම ______________________________

14 වැනි පාඩම ______________________________

15 වැනි පාඩම ______________________________

16 වැනි පාඩම ______________________________

ඔබ විසින් පෙර සිදුකළාක් මෙන් මෙම පාඩම්වලද සාක්ච්ඡා කරන ලද ආධ්‍යාත්මික ගුණාංග පිළිබඳ තවදුරටත් සමාලෝචනය කිරීම සඳහා පහත සඳහන් උද්ධෘත පාඨයන් ලබාදී ඇත.

දැන් අප දයානුකම්පාව පෙන්වීමේ වැදගත්කම ගැන කියවමු.

**"දයානුකම්පාවේ ආලෝකය විහිදුවා හදවත් පිරිසිදු සහ පවිත්‍ර කරගැනිමෙන් උන්වහන්සේගේ ස්ථිරසාරභාවයෙන් කොටසක් ලබාගත හැකිවනු ඇත."**[50]

**"දයානුකම්පිත වන්න, එවිට ඔබගේ ක්‍රියාවන් පහනකින් විහිදි යනු අලෝකය මෙන් බබළනු ඇත."**[51]

**"ඔබ එක ගසක එල මෙන්ද එක අත්තක කොළ මෙන්ද වන බැවින් සියළුම මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ඔබ දයානුකම්පිත සහ කාරුණික වන්න."**[52]

**"දැන්, ඔවුන් මනුෂ්‍ය වර්ගයාගේ දරුවන් කෙරෙහි කාරුණාවන්ත පියවරුන්ද, තරුණයින්ට දයානුකම්පිත සහෝදරවරුන්ද සහ වසර ගණනාවක් අභිප්‍රායන් සමඟ සිටි අයගේ ප්‍රතික්ෂේපවීම වළක්වන දාරකයන් මෙන් විය යුතුය යන දෙවියන්වහන්සේගේ මෙම උපදේශයන් ක්‍රියාත්ක කිරීමට උන්වහන්සේට ප්‍රේම කරන්නන් නැඟී සිටිය යුතුය."**[53]

______________________________
______________________________
______________________________
______________________________
______________________________

මධ්‍යස්ථතාවයේ ගුණාංගය පිළිබඳ අපට මෙස් උපදෙස් දී ඇත.

**"මා හැරන් අන් සියල්ලෙන්ම ඔබ වෙන්වී, ඔබගේ මුහුණු මාගේ මුහුණ දෙසට හරවන්න, මන්ද ඔබ සතු දේට වඩා මෙය ඔබට යහපත් වන බැවිනි."**[54]

**"ලෝකයේ ඇති දෙවලින් සහ එහි නිෂ්ඵල ආභරණවලින් අතිශයින් සතුටට පත්නොවී ඒ කෙරෙහි ඔබගේ බලාපොරොත්තුද තබා නොගන්න. ඔබගේ විශ්වාසය අති උත්කෘෂ්ඨවූත් අති ශ්‍රේෂ්ඨවූත් දෙවියන්වහන්සේ සිහි කිරීම මත තබන්න."**[55]

**"මනුෂ්‍යයාගේ මධ්‍යස්ථභාවයේ සාරය නම් ඔහුගේ මුහුණ ස්වාමීන්වහන්සේගේ රාජසභාව වෙත යොමු කරමින් උන්වහන්සේගේ අභිමුවට ඇතුළවී, උන්වහන්සේගේ මුහුණුවර දැක සහ උන්වහන්සේ ඉදිරිපිට සාක්ෂිකරුවෙකු ලෙස පෙනී සිටීමටත්ය."[56]**

**"මධ්‍යස්ථතාවය සූර්යයා වැනිය; ඕනෑම හදවතක එය බැබළෙනවිට එය තෘෂ්ණාවේ සහ ආත්මාර්ථකාමිත්වයේ ගින්න නිවා දමයි. අවබෝධයේ ආලෝකයෙන් කෙනෙකුගේ දර්ශනය ආලෝකමත් කරගතහොත් ඔහු නිසැකවම ලෝකයෙනුත් එහි ඇති නිශ්ඵල දෙයිනුත් වෙන්වෙනු ඇත. ලෝකයටත් එහි දූෂ්ටභාවයටත් ඔබව දුකට පත්කිරිමට ඉඩ නොදෙන්න. නිශ්ඵල මහිමයෙන්ද හෝ දුක්ඛිතභාවයේ දිළිඳුබවින් හෝ තෘප්තිමත් නොවන තැනැත්තා ප්‍රීතියට පත්වේ."[57]**

පහත ඡේදයන් තුළින් තෘප්තිමත්භාවයේ ගුණාංගය පිළිබඳ පවසා ඇත.

**"එම්බා මනුෂ්‍ය පුත්‍රය! අභ්‍යවකාශයේ අතිවිශාලත්වය හරහා වේගයෙන් යමින් සිට සහ ස්වර්ගයේ විශාලත්වය විස්තාරණය කරමින් සිටියද, අපගේ නියෝගයන්ට අවනතවීමට සහ අපගේ මුහුණ ඉදිරියේ යටහත් පහත්වීමට හැර ඔබට වෙනත් විවේකයක් නොලැබෙනු ඇත."[58]**

**"අහෝ ආශාවේ පරමසාරය! තෘෂ්ණාව සදාකාලිකව විනාශවී යන අතර සන්තුෂ්ටිය සදාකල්ම ආදරයට සහ පැසසුමට ලක්වන බැවින් තෘෂ්ණාව අත්හැර සන්තුෂ්ටිය සොයන්න"[59]**

**"එබැවින් එකඟවීමේ සහ යටහත් බවේ මාර්ගයෙහි ගමන් කරන්න. කිසිදු දුෂ්කරතාවයකට ඔබගේ හදවත ශෝකයට පත්කිරීමට ඉඩ නොදී, ලෞකික දීමනා කෙරෙහි ඔබගේ බලාපොරොත්තු ඇතිකර නොගන්න. ඔබගේ හදවතට සහ ආත්මයට ශාන්තභාවය සොයාගත හැකිවන පිණිසත්, ඔබගේ අභ්‍යන්තර පැවැත්ම සහ හෘදසාක්ෂියට සත්‍ය ප්‍රීතිය අත්විඳීණු පිණිස දෙවියන්වහන්සේ කැමැති ඕනෑම දෙයකින් ප්‍රීතියටත් සන්තුෂ්ටියටත් පත්වන්න."[60]**

පහත උපුටා දැක්වීම්වලින් කරුණාවන්භාවය පිළිබඳ අපගේ අවබෝධය ආලෝකමත් කරයි.

**"සැමවිටම ඔබ, මිත්‍රත්වයේ සහයෝගයෙන් සහ මාගේ පරම සන්තුෂ්ටියේ පරාදීසයට අනුකූලව සිටිනු දැකීමත්, හිතවත්භාවයේ සහ ඒකීයභාවයෙත් මෙන්ම ප්‍රේමනීය කරුණාවේ සහ මිත්‍රත්වයේ සුවඳින් ඔබගේ ක්‍රියාවන් ආභූෂණය කරනු දැකීම අප ඇලුම් කරමු."[61]**

**"බාහිර පෙනුමෙන් පමණක් නොව ඔබ අවංකව කාරුණික වන්න. මිනිසාට ස්වාමීන්වහන්සේගේ කරුණාව වීමටත්, ස්වාමීන්වහන්සේගේ මහිමය වීමටත් යන්න කෙරෙහි දෙවියන්වහන්සේගේ සැම ප්‍රේමවන්තයෙකුම තම අවධානය යොමු කරන්න. ඔහුගේ මාර්ගයේ**

**මුණ ගැසෙන සෑම පුද්ගලයෙකුටම යහපතක් කිරීමට සහ ඔහුට වාසිසහගත දෙයක් සිදුකිරීමට ඔහුට ඉඩ ලබාදෙන්න."[62]**

**"දෙවියන්වහන්සේ ප්‍රතික්ෂෙප කරන ලද විදහා දක්වමින් මිනිසුන් එකිනෙකාට අසාධරණ සහ අකාරුණික වන්නේ ඇයි? උන්වහන්සේ අපට ප්‍රේම කරන බැවින් අප සතුරුකම සහ වෛරය ඇති කරගත යුත්තේ ඇයි? දෙවියන්වහන්සේ අප සියල්ලටම ප්‍රේම නොකළේ නම්, උන්වහන්සේ අප සියල්ලම නිර්මාණයකර, පුහුණුකර සහ පෝෂණය නොකරයි. ප්‍රේමණිය කරුණාව දිව්‍යමය ප්‍රතිපත්තිය වේ."[63]**

**"වචනයෙන් පමණක් මිත්‍රත්වය පෙන්වීමෙන් සෑහිමකට පත් නොවන්න, ඔබට මුණ ගැසෙණ සියළු දෙනා වෙනුවෙන් ඔබගේ හදවත ආදර කරුණාවෙන් දැවීමට සලස්වන්න."[64]**

ඉහත කට්ටලයන්ගෙන් අවම වශයෙන් එක් ඡේදයක් හෝ කටපාඩම් කරගැනීමට උත්සාහ කරන්න.

## 15 වැනි කොටස

පාඩම් 13 සිට 16 දක්වා සාකච්ඡා කර ඇති ආධ්‍යාත්මික ගුණාංග පිළිබඳ ඔබගේ අවබෝධය ගැඹුරු කරගත් පසු, කතින්දරයන් හතර නැවත කියවා පහත ප්‍රශ්න ඔබගේ කණ්ඩායම සමඟ සාකච්ඡා කරන්න.

13 වැනි පාඩමේ තේමාව වන්නේ අනුකම්පා වන අතර, ඔබ විසින් ළමයින්ට පවසන්නේ අබ්දුල් බහාතුමා මුණ ගැනීසට බලාපොරොත්තුවෙන් එතුමා නැවතී සිටි නිවසේ දොරටු තට්ටු කරනවිට එයින් ඇයව හරවා යවන ලද කාන්තාවක් හා සම්බන්ධ වන කතාන්දරයකි. කාන්තාව කෙරෙහි එතුමාගේ අනුකම්පාව නිරූපණය වන්නේ කතාන්දරයේ කුමන කොටසේදීද? කතාන්දරය අවබෝධ කරගැනීමට සහ විශේෂයෙන්ම දුෂ්කරතාවයෙන්, දුක්ඛිතව හෝ ශෝකයෙන් පෙළෙන අයට ගැන සංවේදී වෙමින් සියළු දෙනාට එකසේ සැලකිල්ලක් දක්වන දයානුකම්පිත හදවත් පිළිබඳ අවබෝධ කරගැනීමට කුමන විස්තරයන් ළමයින්ට ප්‍රයෝජනවත් වේද?

14 වැනි පාඩමේ අවධානය යොමුවී ඇත්තේ මධ්‍යස්ථභාවයේ ආධ්‍යාත්මික ගුණාංගය පිළිබඳවය. ශුද්ධ වූ භූමියට ගමන් කිරීමට සඳහා තීරණය කරන මිතුරන් දෙදෙනෙක් හා සම්බන්ධ කතාන්දරයක් වන අතර එක් අයෙකු පොහොසත් සහ අනෙක් මිතුරාට එතරම් වත්කම් නොතිබුණි. ඇත්ත වශයෙන්ම, මධ්‍යස්ථභාවයේ ගුණාංගය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා, ශුද්ධ වූ භූමියට යන ගමන දෙවියන්වහනසේට සමීපවීමේ සංකේතයක් ලෙස ළමයින් හඳුනාගත යුතුය. ඔබ ළමයින්ට තේරුම් කරදිය යුත්තේ මධ්‍යස්ථභාවය රඳා පවතින්නේ අප සතුව කොපමණ හෝ කොපමණ සුළු ප්‍රමාණයක් තිබේද යන්න මත නොව අපගේ වස්තූන් අප දෙවියන්වහන්සේට ළංවීමෙන් වැළැක්වීමට අප ඉඩ දෙනවාද යන්න මත බවයි. මෙම අවබෝධය වර්ධනය කිරීමට කතාන්දරය උපකාරී වන්නේ කෙසේද?

15 වැනි පාඩමේ කතාන්දරය මඟින් එහි තේමාව වන තෘප්තිමත් භාවයේ ගුණාංගය පිළිබඳ ළමයින්ට අවබෝධයක් ලබාදෙනු ඇත. අබ්දුල් බහාතුමා තම සහායකයින්ට පවසන්නේ එතුමා ඇකා බන්ධනාගර නගරයේ සිරගතව සිටියදී එතුමාට සේවා මවාතේ ගමන් කළ හැකිවූ නිසා එහි එතුමා සතුටින් සිටි බවයි. මෙම ප්‍රකාශය දරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ අවබෝධයට බලපාන්නේ කෙසේද? ශාරිරිකව අබ්දුල් බහාතුමා සිරගත කරන සිටියද, එතුමාගේ ආත්මය කිසිදිනක සීමා කළ නොහැකි බව ඔවුන් දකින්නේ කෙසේද?

16 වැනි පාඩමේ කතාන්දරය සම්බන්ධ වන්නේ, ඇකා නගරයේ ජීවත් වූ කෝපයෙන් සහ වෛරයෙන් පිරීගිය මිනිසෙකු පිළිබඳ වන අතර එහිදී ඇතැම් විස්තරයන් අවධාරණය කිරීමට සිදුවන්නේ කරුණාවන්ත භාවය පිළිබඳ ප්‍රධාන තේමාවට එය සම්බන්ධ වන ආකාරය ළමයින්ට මඟ හැරිය හැකි බැවිනි. මෙම තොරතුරු මොනවාද? මෙතරම් කාලයක් කෝපයෙන් සහ වෛරයේ එල්බ සිටි මිනිසාට අබ්දුල් බහාතුමා උගන්වන පාඩම කුමක්ද?

## 16 වැනි කොටස

13 සිට 16 දක්වා පාඩම් පිළිබඳ ඔබගේ විශ්ලේෂණය ඵලදායි සහ ඔබ සහ ඔබගේ අනෙකුත් සහභාගිවන්නන් විවිධ අංග එකට පුහුණු කිරීමෙන් සතුටත් ලබන්නට ඇති බවත් බලාපොරොත්තු වේ. 17 සිට 20 දක්වා පාඩම් සඳහා වූ සෑම පන්ති කාලපරිච්ඡේදයකදී පහත යාඥාව කටපඩමින් ගායනා කර පන්තිය ආරම්භ කරන්න.

> **“අනේ මාගේ දෙවියනි! අනේ මාගේ දෙවියන! ඔබවහන්සේගේ මේ සේවකයි ඔබවහන්සේ වෙත ළඟා වී, ඔබවහන්සේගේ ආදරයේ කාන්තාරයේ දැඩි උනන්දුවෙන් සැරිසරමින්, ඔබවහන්සේගේ සේවා මාර්ගයේ ඇවිදිමින්, ඔබවහන්සේගේ අනුග්‍රහයන් අපේක්ෂාවෙන්, ඔබවහන්සේගේ වරප්‍රසාද බලාපොරොත්තුවෙන්, ඔබවහන්සේගේ රාජධානිය මත විශ්වාසය තබා ඔබවහන්සේගේ ත්‍යාගයේ මුද්‍රිකපානයෙන් මත්වී සිටි. අනේ මාගේ දෙවියනි! ඔබවහන්සේ කෙරෙහි ඔහුගේ ඇති ස්නෙහය, ඔබවහන්සේගේ ප්‍රශංසාව කෙරෙහි වූ දැඩි භක්තිය සහ ඔබවහන්සේ කෙරෙහි වූ ආදරයේ බලවත් උනන්දුව වර්ධනය කරන්න.**

**"ඇත්ත වශයෙන්ම, ඔබවහන්සේ අති ත්‍යාගශීලී සේක. බහුල වරප්‍රසාදයන්ගේ ස්වමීන් වනසේක. ක්ෂමායුක්ත වූත් දයාන්විත වූත් ඔබවහන්සේ හැර අන් දෙවි කෙනෙක් නැත."[65]**

මෙම පාඩම්වලදී ළමයින්ට පහත යාඥාවන කටපාඩමින් ගායනා කිරීමට ඉගෙන ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර, ඔබ විසින් අනෙකුත් ඒවායේ කළ පරිදිම, ළමයින්ට කටපාඩම් කිරීමට වෙන් කරඇති වචන පිළිබඳ යම්කිසි අවබෝධයක් ඔවුන් ලබාගනු ඇතියි ඔබ සහතික විය යුතුය. මෙම යාඥාව පෙර යාඥාවන්ට වඩා තරමක් දිගින් වැඩි වන අතර, ළමයින්ට හෝ අනෙක් අයට මෙම යාඥාව වෙන්කර ඇති පාඩම් හතර තුළදී කටපාඩම් කිරීම අභියෝගයක් වුවහොත් ඔබට අවශ්‍ය යයි සිතන ඕනෑම වෙනස් සිදු කළ හැක.

**"මාගේ දෙවියනි, ඔබවහන්සේගේ නාමය මාගේ චික්ත්සනයයි, ඔබවහන්සේ සැමරීම මාගේ ප්‍රතිකාරයයි. ඔබවහන්සේට ළංවීම මාගේ අපෙක්ෂාවයි, ඔපවහන්සේ කෙරහි ඇති ආදරය මාගේ සහායකයයි. ඔබවහන්සේ මට දක්වන දයාව මට මෙලොයෙහිදීත් පරලෝවෙහිදීත් මාගේ චිකිත්සනයත් ආධාරයත් වේ. ඇත්තෙන්ම ඔබවහන්සේ සර්ව ත්‍යාගශීලී වෙති, සර්වඥ වෙති, සර්ව ප්‍රාඥ වෙති."[66]**

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

## 17 වැනි කොටස

17 සිට 20 දක්වා පාඩම් පිළිබඳ ඔබගේ සමාලෝචනය ආරම්භ කිරීම සඳහා, පෙර පරිදිම ඒවා එකින් එක කියවා, ඔබ ළමයින් සමඟ ගවේෂණය කරනු ලබන ආධ්‍යාත්මික ගුණාංගය පහතින් ලියා දක්වන්න.

17 වැනි පාඩම ______________________________

18 වැනි පාඩම ______________________________

19 වැනි පාඩම ______________________________

20 වැනි පාඩම ______________________________

ඉහත ගුණාංගවල වැදගත්කම පිළිබඳ ඔබට සහ ඔබගේ සෙසු සහභාගිවන්නන්ට අවබෝධයක් ලබා ගැනීමට උපකාර වන උපුටා දැක්වීම් කිහිපයක් පහත දැක්වේ. තනි පුද්ගලයාගේ ජීවිතයේ දෘෂ්ටි කෝණයෙන් පමණක් ඒයා සාකච්ඡා නොකිරීමට මතක තබාගෙන ඔබ වැනි තරුණ ළමයින්ගේ ගුරුවරයෙකුට ඒවායින් කුමන හැඟවීමක් ලබාදෙන්නේ දැයි ඔබ සිතා බැලිය යුතුය.

ධෛර්යමත්භාවයේ ගුණාංගය පිළිබඳ අපට මෙසේ අනුශාසනා කර ඇත.

**"ඔබට සහජ ධෛර්ය සහ පරමාදර්ශී බලය ලබාගත හැකිවන පරිදි සම්පූර්ණයෙන්ම රාජධානිය දෙසට හැරීමට ඔබට හැකි පමණ උත්සාහ කරන්න."[67]**

**"බිඳුණු හදවත් ඇති අයට ඔබ සැනසිල්ලේ උල්පත් වේවා. තැනින් තැන යන්නාට ඔබ රක්ෂස්ථානයක් වේවා. භීතියට පත් තැනැත්තාට ඔබ ධෛර්යයේ උල්ලතක් වේවා. එබැවින්, දෙවියන්වහන්සේගේ අනුග්‍රහය සහ උපකාරය තුලින් මනුෂ්‍ය වර්ගයාගේ සතුටෙහි ප්‍රමාණය ලෝකයේ මධ්‍යය තුළින් ඉහළ ඔසවා තබමින් සහ විශ්ව ගිවිසුමේ ධජය දිගහැරනු ලබේවා."[68]**

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

බලාපොරොත්තුවේ වැදගත්කම පිළිබඳ මෙසේ සඳහන් වේ.

**"ඔබගේ සියළු බලාපොරොත්තු දෙවියන්වහන්සේ වෙත තබා උන්වහන්සේගේ නොවරදිනසුළු දායාව කෙරෙහි දැඩි ලෙස ඇලී සිටින්න. උන්වහන්සේට හැර අන්කිසිවෙකුට දූප්පතුන් පොහොසතුන් කිරීමටත් පහත් තත්වයට වැටුණු අය මුදවා ගැනීමට හැකි වේද?"[69]**

**"එම්බා දූවිලලෙන් සලිවූවනි! ඔබ සමඟ සංවාදයෙහි යෙදීම මාගේ බලාපොරොත්තුව වූ නමුත් ඔබ මා කෙරෙහි විශ්වාසය නොතබයි. ඔබගේ බලවත් විරෝධයේ කඩුවෙන් ඔබගේ බලාපොරොත්තුවේ ගස බිමහෙළා ඇත. සෑම මොහොතකම මම වෙත ළඟාවී සිටින නමුත් ඔබ සදාකාලිකවම මගෙන් දුරස්ව සිටී. චිරස්ථාස් මහිමය මා ඔබ වෙනුවෙන් තෝරා තිබුණද, ඔබ විසින් ඔබ සඳහා සීමාරහිත නින්දාව තෝරාගෙන ඇත. නමුත් තවමත් කාලය ඉතිරිව ඇති බැවින් ඔබගේ අවස්ථාව මඟ නොහැරගනු සඳහා අපසු හැරෙන්න."[70]**

**"මනුෂ්‍යයින් සෑම තත්වයක් යටතේදීම දෙවියන්වහන්සේගේ ආශිර්වාදයන්ගේ සාගරයේ නිමග්න වී සිටී. එබැවින්, ඔබ කිසිදු හේතුවක් මත බලාපොරොත්තු රහිතභාවයට පත්නොවී, වඩාත් ඔබගේ බලාපොරොත්තුවෙහි ස්ථිර වන්න."[71]**

**"හදවත් දෙවියන්වහන්සේ පිරිනමන ආශිර්වාදයන්ගෙන් ඉවතට හැරයි නම්, එය ප්‍රීතිය බලාපොරොත්තු වන්නේ කෙසේද? එය දෙවියන්වහන්සේගේ දයාව කෙරෙහි විශ්වාසය සහ බලාපොරොතුතව නොතබයි නම් එයට විවේකයක් සොයා ගතහැක්කේ කොහේද? අහෝ දෙවියන්වහන්සේ විශ්වාස කරන්න! මක්නිසාද යත් උන්වහන්සේගේ වරප්‍රසාදයන් සදාකාලික සහ උන්වහන්සේගේ ආශිර්වාදයන් විශිෂ්ට වන බැවින"[72]**

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

විශ්වාසවන්තභාවය පිළිබඳ ලේඛනයන් අපට මෙසේ පවසා ඇත.

**"අහෝ මිනිසුනි! මෙදවස දෙවියන්වහන්සේ ඉදිරියේ ඇති ඉස්තරම්ම වස්ත්‍රය වන්නේ විශ්වාසවන්තභාවයයි. සියළුම වරප්‍රසාදයන් සහ ගෞරවයන් මෙම ශ්‍රේෂ්ඨතම ආභරණයන්ගෙන් සැරසී සිටින ආත්මයේ කොටසක් විය යුතුය."[73]**

**"විශ්වාසවන්තභාවය යනු මනුෂ්‍යත්වයේ නගරයට බලකොටුවක් මෙන් වන අතර, මිනිසුන්ගේ මන්දිරයට ඇසක් බඳුය. එය අහිමි වූ අයෙකු වෙතොත්, උන්වහන්සේගේ සිංහාසනය ඉදිරියේ දර්ශනයෙන් වියුක්ත වූවෙකු ලෙස සැලකේ."[74]**

**"ඔබ සෑම රටකදීම දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තභාවයේ ප්‍රකාශනයක් වන්න. ඔබගේ බද්ධ දෘෂ්ටිය එක මොහොතකටවත් එහි ආකර්ෂණයෙන් වසඟ නොවී ඔබ මෙම ගුණාංගය සම්පූර්ණයෙන්ම පිළිබිඹු කළ යුතුය."[75]**

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

පහත වචනයන් අපට උද්‍යෝගිමත්භාවය පිළිබඳ පවසයි;

**"එම්බා මිත්‍රවරුණි! එබැවින් මෙ දවස, ඔබ සැවොම, එහි උණුසුම ඔබගේ සියළුම නහරවලින්ද, ඔබගේ අත්පා සහ ඔබගේ ශරීර අවයවවලින්ද ප්‍රකාශවන පරිදි, දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ගිනනේ ඇවිළි යා යුතු අතර එම උණුසුමින් ලෝකයේ මිනිසුන් අවිළීගොස් ආදරණීයයන්ගේ ක්ෂිතිජය දෙසට හැරෙනු ඇත."[76]**

**"විශ්වයේ ජලයටත් එහි ඇඩි ආශාව සිසිල් කිරීමට බලහීන වන තරම් වූ ලෝකයේ හදවත් මධ්‍යයේ දැල්වෙන නොනැසෙන තේජසේ ගිනිදැල්ලෙන් ඔබගේ ආත්මය බැබළෙන්ට ඉඩ හරින්න."[77]**

**"ඔබ තුළින් උන්වහන්සේගේ ආදරයේ උණුසුම උන්වහන්සේගේ ප්‍රියතමයින්ගේ හදවත් තුළ දැල්වෙනු පිණිස සර්ව දයානුකම්පිතයාණන් විසින් නිර්මාණයන්ගේ හදවත් මාධ්‍යයේ දැල්වූ මෙම නොනැසී පවතින තේජසේ ගිනිදැල්ලෙන් ඔබව දීප්තිමත් ලෙස දල්වා ගන්න. මාගේ මාර්ගය අනුගමනය කර, සර්ව බලධාරීවූත්, අති උත්කෘෂ්ඨ වූත් මා සිහිකිරීම තුළින් මිනිසුන්ගේ හදවත් අතිශය ප්‍රීතියට පත්කරන්න."[78]**

**"ආදරයේ ගිනි සිළුව දල්වා එයින් සියල්ල දවාලන්න; ඉන්පසු ආදරවන්තයින්ගේ භූමියට ඔබ ගමන් කරන්න."[79]**

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

ඉහත කට්ටලයන්ගෙන් අවම වශයෙන් එක් ඡේදයක් හෝ කටපාඩම් කරගැනීමට උත්සාහ කරන්න.

## 18 වැනි කොටස

දැන් අපි 17 සිට 20 දක්වා පාඩම්වල කතාන්දරයන් වෙත හැරෙමු. සෑම එකක්ම නැවත කියවීමෙන් පසු ඔබගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ පහත ප්‍රශ්න සලකා බලන්න.

17 වැනි පාඩමේදී දූෂිත නිළධාරියෙකු විසින් තර්ජනය කරනු ලැබූ පසුවත් බොරු කීමට සහ වංචා කිරීමට පොළඹවා ගත නොහැකි වූ අලි අස්කර් කතාන්දර ඔබ පවසනු ඇත. බොරුකීම

දෙවියන්වහන්සේ ඉදිරියේ ප්‍රිය නොරන බව ළමයින් දැනටමත් දන්නවා ඇත. පාඩමේ තේමාව වන ධෛර්යමත්භාවයේ උල්පත වන්නේ දෙවියන්වහන්සේගේ ඉගැන්වීම්වලට කීකරුවීම බව ඔවුන්ට දැකගැනීමට කතාන්දරය උපකාර වනු ඇත. මෙම සම්බන්ධතාවයට අවබෝධ කරගැනීඹ සඳහා උපකාර වන්නේ කතාවේ කුමන කොටසද? ළමයින්ට කතාන්දරයේ මෙම වැදගත් තොරතුරු අවබෝධ කරගැනීමට සහ තේරුම් ගැනීමට නම් ඔබගේ විස්තරයේ අවධෘරණාය කළ යුතු වැදගත් කරුණු මොනවාද?

18 වැනි පාඩමේ කතාන්දරය බලාපොරොත්තු සහගතභාවයේ ගුණාංගය වටා ගෙතී ඇති අතර, අබ්දුල් බහාතුමා විසින් සිත්තැවුලට පත් මිනිසෙකු යථා තත්වයට පත් කරන කථාවක් ඔබ විසින් එහිදී ළමයින්ට පවසනු ඇත. එතුමා විසින් ඔහු සම්පූර්ණ කරුණාවෙන් සනසා ඔහු දෙවියන්වහන්සේගේ රාජධානියේ පොහොසතෙකු බව මතක කරදෙන ලදි. දෙවියන්වහන්සේගේ රාජධානියේ පොහොසතෙකුවඹී යනු අපට විශාල භෞතික ධනය් ඇති බව අදහස් නොකෙරේ. එයින් අදහස් කරන්නේ කුමක්ද? අබ්දුල් බහාතුමා විසින් සිදුකළ මතක්කර දීමෙන් දෙවියන්වහන්සේගේ වප්‍රසාදයන් කෙරෙහි මනුෂ්‍යයාගේ විශ්වාසය වර්ධනය වන්නේ කෙසේද? දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසයක් නොනැතිව, බලාපොරොත්තු සහගතව සිටීමට දුෂ්කර බව අවබෝධ කරගැනීමට ඔබ ළමයින්ට උපකාර කරන්නේ කෙසේද?

19 වන පාඩමේ තේමාව වන්නේ විශ්වාසවන්තභාවය වන අතර, මෙම ගුණාංගයේ වැදගත්කම විදහා දැක්වීම සඳහා අබ්දුල් බහාතුමා විසින් ශුද්ධ වූ දේශයෙන් ලිපි නිකුත් කිරීම සහ ලැබීමේ කාර්යය සඳහා විශ්වාසයෙන් භාරදුන් මුහම්මද් ටබ්ගේ කතාන්දරය ඔබ විසින් ළමයින්ට පවසනු ඇත. ළමයින්ට කතාන්දයේ ප්‍රධාන තේමාව අතපසු නොවන පරිදි කතාන්දරය විස්තර කිරීමේදි ඔබ මතක තබාගත යුතු විස්තර බොහෝමයක් ඇත. ඒවා මොනවාද? මුහම්මද් ටබීව විස්තර කිරීමේද "විශ්වාසනීය" සහ "යැපෙනසුළු බව" යන වචන භාවිතා කරනු ඇත. එකම අවස්ථාවේදී විශ්වාසනවන්ත සහ නොසැලකිලිමත් වියහැකි යයි ඔබ සිතනවාද?

20 වැනි පාඩමේ තේමාව වන උනන්දුසහගත බව තෝමස් බ්‍රේක්වෙල්ගේ චරිතය මත කේන්ද්‍ර කරගනිමින් සකසා ඇත. දෙවියන්වහන්සේ කෙරෙහි අපගේ හදවත් තුල ඇති ආදරයේ තීව්‍රතාවය සමාන කරමින් බොහෝවිට ලේඛණවන ඇති උනන්දු සහගතබව අපට අවබෝධ කරගැනීම සඳහා දැල්වූ ඉටිපන්දමක, දිලිසෙන ගිනිදැල්ලක හෝ ඇවිලෙන ගින්නක උපමාවාක්‍ය යොදාගනු ලබයි. මෙම උපමාවාක්‍ය තුළින් ඔබගේ සිසුන්ට උනන්දු සහගතබව යනු කුමක්දැයි යන්න පිළිබඳ යම්කිසි අවබෝධයක් ලැබෙනු ඇතියි යන විශ්වාසය ඔබට තිබිය යුතුය. දූරවබෝධ නුවණ ළමයින් තුල කුඩා කාලයේ සිටම පවතින අතර, ඔවුනගේ මෙම හැකියාව භාෂාව වර්ධනයේ පහසුවත් සමඟ වර්ධනය වේ.

මෙම අදහස් මනසේ තබාගෙන, දෙවියන්වහන්සේ කෙරෙහා වූ ආදරයෙන් තොමස් බ්‍රේක්වෙල් උනන්දු සහගතවීම පෙන්නුම් කළේ කුමන කොටම්දැයි හඳුනා ගන්න. කතාව සිත්ඇදගන්නා සුළු තවත් විස්තරයන් මොනවාද?

## 19 වැනි කොටස

ඔබ සහ ඔබගේ අනෙකුත් සහභාගිවන්නන් 17 සිට 20 දක්වා පාඩම්වල අංගයන් පුහුණුවීමෙන් පසු ලබාගත් පෙළඹවීමක් සමඟ ඔබ දැන් 1 ශ්‍රේණියේ අවසන් පාඩම් හතරවන 21 සිට 24 දක්වා වූ පාඩම් සඳහා සූදානම්වනු ඇතැයි උපෙක්ෂා කෙරේ. සෑම පන්ති කාලපරිච්ඡේදයක් ආරම්භ වන අවස්ථාවකදීම පහත යාඥාව කටපාඩමින් ගායනා කිරීමට කැමති වනවා ඇත.

> **"මාගේ දෙවියනි, මා තුළ පවිත්‍ර හෘදයක් මවන්න. මාගේ අපේක්ෂාව වූ උතුමාණනි, මා තුල ශාන්ත හෘද සාක්ෂියක් දනවන්න. මාගේ අත්‍යාදරණීයිණෙනි! ශක්ති සාරයෙන් මා ඔබවහන්සේගේ ධර්මයෙහි ස්ථිර කරවන්න. මාගේ ආශාවේ අරමුණු වූ ස්වාමීනි! ඔබවහන්සේගේ මහිමයේ ආලෝදයෙන් ඔබවහන්සේගේ මාර්ගය මට අනාවරණය කරන්න. මාගේ පැවැත්මේ ප්‍රභවය වූ ස්වාමීනී! ඔබවහන්සේගේ අති උත්තම ශකක්තියේ බලයෙන් ඔබවහන්සේගේ ශුද්ධත්වයේ ස්වර්ගයට මා නංවන්න. මාගේ දෙවියන්වූ ස්වාමීනී! ඔබවහන්සේගේ සදාතනත්වයේ මඳ පවනින් මා පිනවන්න. මාගේ මිත්‍රයාණනි! ඔබවහන්සේගේ පෞරාණික මුහුණුවරෙහි වස්තුව ඔබවහන්සේ හැර අනුසියල්ලෙන්ම මා නිදහස් කෙරොවාග මාගේ ස්වාමීනි ඔබවහන්සේගේ අදෘෂ්‍ය සාරයේ අනාවරණය පිළිබඳ ආරංචිය මට ප්‍රීතිය ගෙනඒවා ප්‍රකට වූවන්ගේ ඉතා ප්‍රකටවූත් සැඟවුනු අයගෙන් ඉතා සැඟවුනාවත් උතමාණනි."[80]**

ළමයින් විසින් මෙම ශ්‍රේණියේදී කටපාඩම් කරගනු ලබන අවසන් යාඥාව පහතින් දැක්වේ. එහි වැදගත්කම ඔවුන් ඉතා ඉක්මනින් අවබෝධ කරගනු ඇති නමුත්, ඔවුන්ට අලුත් හෝ නුහුරු වචන හො ්වාක්‍ය පැහැදිලි කරන්නේ කෙසේදැයි ඔබ විසින් තීරණ් කළ යුතුය.

> **"අනේ කාරුණික ස්වාමීනී, මම කුඩා දරුවෙක් වන අතර මා රාජ්‍යයට ඇත්ළත් කරගැනීමේ උසස් තත්වය පත්කරන්න. ලෞකික වන මා ස්වර්ගීය කරන්න; පහළ ලෝකයේ සිටින මා ඉහළ රාජධානියට අයිතිවීමට ඉඩ දෙන්න; අඳුරු වේදනාවෙන් සිටින මට දීප්තිමත්වීමට ඉඩ දෙන්න; භෞතිකවන මා ආධ්‍යාත්මික කරන්න; ඔබවහන්සේගේ අසීමිත වරප්‍රසාදයන් මාහට ප්‍රකාශ කිරීමට ඉඩ ලබදෙන්න.**
>
> **"ඔබවහන්සේ ප්‍රබල සේක. සර්ව ආදාරණීය සේක."[81]**

## 20 වැනි කොටස

සෑම අවස්ථාවකදීම මෙන් ඔබගේ සිසුන් කටපාඩම් කරගැනීමට උත්සාහ කිරීම සඳහා ඔබ විසින් ඔවුන් සමඟ බෙදාහදා ගන්නා උද්ධෘත පාඨයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් 1 වැනි ශ්‍රේණියේ ඔබ උගන්වන අවසන් පාඩම් හතර කියවන්න. සෑම පාඩමකදීම අවධානය යොමු කරන ගුණාංගය පහත ලියා දක්වන්න.

21 වැන පාඩම ______________________________

22 වැන පාඩම ______________________________

23 වැනි පාඩම ______________________________

24 වැනි පාඩම ______________________________

පෙර පාඩම්වලදී සිදු කළාත් මෙන්. ඔබට සහ ඔබගේ කණ්ඩායමේ අනෙකුත් සාමජිකයින්ට මෙම පාඩම්වල සාකච්ඡා කර ඇති ආධ්‍යාත්මික ගුණාංග පිළිබඳ මෙනෙහි කිරීමට උපකාරීවීම සඳහා පහත උද්ධෘත පාඨයන් දක්වා ඇත.

දීප්තිමත් භාවයේ වැදගත්කම පිළිබඳ අපට මෙසේ පවසා ඇත.

**"අහෝ, දෙවියන්වහන්සේගේ පේමයේ ගිනි සිළුව! හිරු උදාවිය යුතුය; රශ්මි දහරා ආලෝකය විහිදුවිය යුතුය; පූර්ණ චන්ද්‍රයා දීප්තිමත්ව; තරකා දිලිසිය යුතුය. ඔබ රශ්මි දහරාවක් වන බැවින්, ඔබට ප්‍රදීපාලෝකය සහ ඥානාලෝකය ලබාදී දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ගින්නෙන් ලෝකය දවාගැනීමට සහ ක්ෂිතිජය අලෝකමත් කිරීමට හැකි කරවන ලෙස ඔබ ස්වාමීන් වහන්සේගෙන් අයැද සිටින්න."[82]**

**"එම්බා මිනිසුනි, ඔබ එකිනෙකා සමඟ දීප්තිමත්ව සහ ප්‍රීතියෙන් ජීවත් වන්න."[83]**

**"සර්ව ප්‍රේමණීය දෙවියන්වහන්සේ විසින් මනුෂ්‍යයා නිර්මාණය කරන ලද්දේ දිව්‍යමය දිප්තිය විහිදුවීමට සහ ඔහුගේ වචනයනයෙන් සහ ක්‍රියාවෙන් ලෝකය අආලෝකමත් කිරීමටත්ය. "[84]**

**"මනුෂ්‍ය වර්ගයාට කරන සේවය දෙවියන්වහන්සේට කරන සේවයකි. ඔබ දෙස බලන සියළුදෙනා එහි පරාවර්තනයෙන් ආලෝකමත් වනතුරු රාජධානියේ ප්‍රේමය සහ ආලෝකය ඔබ තුළින් විහිදෙන්නට සලස්වන්න. එවායේ ස්වර්ගීය තත්වයේ උච්චස්ථානයේසී කාන්තිමත් සහ දීප්තිමත් තරු මෙන් වන්න."[85]**

______________________________

______________________________

______________________________

______________________________

______________________________

පහත පරිච්ඡේදයන්ගෙන් අප භක්තිමත් භාවයේ ගුණාංගය පිළිබඳ අන්තර් දෘෂ්ටිය ලබාගනිමු.

**"සෑම ස්ථිර හා නොසැලෙන හදවතක් මත සහ සෑම අචල හා විශ්වාසවන්ත ආත්මයක් මතම දෙවියන්වහන්සේගේ මහිමය රඳා පවතී."[86]**

**"පරීක්ෂණයක් උග්‍ර තත්වයට පත්වූවිට ඔවුන් නොසැලී සිටිය යුතු මෙන්ම බහා කෙරෙහි ඇති ඔවුන්ගේ ආදරය කෙරෙහි විශ්වාවන්ත විය යුතුයි යන පණිවුඩය දයාන්විතයාණන්ගේ**

**සේවිකාවන්ට පවසා සිටින්න. ශීත ඍතුවේදී කුණාටු පැමිණ මහා සුළං හමනු ඇති නමුත් පසුව දැකීම ප්‍රියමනාප අලංකාරවත් කඳු හා සුවඳ ගැන්වූ පැළ සහිත තැනිතලා සහ රතු අනිමෝනස් සමඟ එහි සියළු අලංකාරයත් සමඟ වසන්ත කාලය පැමිණෙනු ඇත.”**[87]

**“තමන්ගේ සතුරන්ට පවා වරප්‍රසාදයේ ආභාරණයන් පරිත්‍යාග කරන තැනැත්තෙකු, ඔහුගේ පිරිහුන පීඩකයින්ට පවා උපකාරයේ දෑත් දිගු කරන, තමන්ගේ දරුණුම සතුරාට පවා ආදරණීය මිතුරෙකු වන තැනැත්තෙකු මේ දවසේදී, ස්වාමීන් වහන්සේගේ එළිපත්තෙහි අනුග්‍රහය ලබන තැනැත්තා විශ්වාසවන්ත භාවයේ සම්පූර්ණ කුලසානයම හිමිවූවෙකි.”**[88]

පහත ඡේදයන් තුල ඉවසිලිවන්ත භාවය පිළිබඳ සඳහන් වේ.

**“එම්බා මනුෂ්‍ය පුත්‍රය! සෑම දෙයකටම සලකුණක් ඇත. ආදරයේ සලකුණ නම් මාගේ නියෝග යටතේ ධෛර්යවන්ත බව සහ මාගේ විනිශ්චය යටතේ ඉවසිලිවන්ත බවයි.”**[89]

**“ඔවුන් අසනීප සහ දුෂ්කරතා යටතේ ඉවසිලින්ත වේද, කිසිවෙකු තමන්ට සිදුවන කිසිදු දෙයකට විලාප නොදෙන්නේද සහ යම් කෙනෙක් යටහත් මාවතේ ගමන් කරන අවලව චිරස්ථායි අයවළුන් ආශිර්වාදලත් වෙති.”**[90]

**“වෙනස් කළ නොහැකි නියෝගයකින් නියම කරන ලද දෙයින් සෑහීමට පත්වී ඉවසිලිවන්ත භාවයෙන් විඳදරා ගන්නා අයගෙන් කෙනෙකු වන්න.”**[91]

**“ඉවසිලිවන්ත භාවයේ යොතට දැඩි බැඳී සිටීමත් සහ උපද්‍රවයේදී පිහිට වන්නා වූත් අසංරුද්ධ වූත් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන ඕනෑම කෙනෙකුට අති උත්තරීතර ක්ෂිතිජය දෙසට තමන්ගේ මුහුණ යොමා සිටීමට යෝග්‍ය වේ.”**[92]

ස්ථිරභාවය පිළිබඳ අපට පහත සඳන් දෑ කියවමු.

**“සදාකාලික සත්‍යය තැනැත්තාණන් වන උන්වහන්සේ හඳුනාගැනීමෙන් පසුව මනුෂ්‍යයින්ට නියමකර ඇති පළමු සහ ප්‍රධානතම කාර්යය වන්නේ උන්වහන්සේගේ ධර්මයෙහි ස්ථිරභාවයෙන් යුතුවීමේ කාර්යයි.”**[93]

**“දෙවියන්වහන්සේගේ ධර්මයේ ඔබගේ ස්ථිරභාවයෙන් එවැනි විය යුතු අතර එමඟින් කිසිදු ලෞකික දෙයකට ඔබගේ කාර්යයෙන් ඔබව වළක්වා ගැනමේ බලයක් නැත.”**[94]

**“ඔබ දෙවියන්වහන්සේගේ ප්‍රේමය තුල ස්ථිරභාවයෙන් ගමන් කර උන්වහන්සේගේ ධර්මයේ ඍජුව නොවෙනස්ව සිට ඔබගේ වචනයේ බලයෙන් උන්වහන්සේට උපකාර කරන්න.”**[95]

**"මෙලෙස, දෙවියන්වහන්සේගේ යහපත් පන්තුෂ්ටියේ තණ පිට්ටනියේ මඳ සුළඟ අප වෙත හමා එන ලෙසත්, දිව්‍යමය සම්මුතියේ මිහිරි එරස අප වෙත ගලා එනු ලැබීමටත් සහ අපට මනුෂ්‍යාත්වය අවසන්කර සදාකාලික තේජසේ රාජධානි වෙත ළඟාවීමටත් හැකිවන සඳහා අපට ස්ථිර පියවරයන් සමඟ නිශ්චිත භාවයේ මාවතේ ගමන් කළ හැකි කරවන්නග"[96]**

**"ඔබගේ අභිප්‍රාය උසස් බැවින් ද ඔබගේ අරමුණ පවිත්‍ර හා වටිනා හෙයින් ඔබගේ සේවය ස්වර්ගයේ බලයන් විසින් තහවුරු කර ඇති බැවින් ඔබ විශ්වාසයෙන් සහ ස්ථිරභාවයෙන් සිටින්න."[95]**

සෑම කට්ටලයකින්ම අවම වශයෙන් එක් ඡේදයක් හෝ කටපාඩම් කරගැනීමට උත්සාහ කරන්න.

## 21 වැනි පාඩම

අපි දැන් ඔබ විසින් ළමයින් සමඟ ආශ්චර්යයමත් පැය ගණනක් ගතකර ඇති අතරම ඔවුන් ගෙන ගත් ආධ්‍යාත්මික ගුණාංග ඔවුන් තුල පෝෂණය කිරීමට උත්සාහ කරඇති ඔබගේ සිසුන් සමඟ ඔබ විසින් බෙදහදා ගැනීමට යන අවසන් කතාන්දරයන් හතර දෙස බලමු. සෑම කතාන්දරයක්ම නැවත කියවීමෙන් පසු, පහත ප්‍රශ්න ඔබගේ කණ්ඩායම සමඟ සාකච්ඡා කරන්න.

21 වැනි පාඩමේදී කුඩා දැරියක ලෙස ඩොරති බ්‍රේකර් පළමු වතාවට අබ්දුල් බහාතුමා මුණගැසුණු කතාන්දරයට ළමයින් විසින් සවන් දෙනු ඇත. කතාන්දරයේ ප්‍රධාන තේමාව වන උන්වහන්සේගේ දීප්තියට ඇය වශී වන්නේ කෙසේදැයි ඔවුන්ට දැක ගතහැකි වනු ඇත. අබ්දුල් බහාතුමාගේ දීප්තිය ඩොරති කෙරෙහි ඇති කරන බලපෑම කුමක්ද? මෙම කතාන්දරයෙන් අබ්දුල් බහාතුමා කෙරෙහි ළමයින්ගේ බැඳීම වර්ධන කිරීමට ඔබ බලාපොරොත්තු වන්නේ කෙසේද?

ඉස්ෆන්ඩියාර්ගේ කතාන්දරයෙන් විශ්වාසවන්ත භාවය යන ගුණාංගය නිරූපනය වන අතර එය 22 වැනි පාඩමේ තේමාව වේ. මෙම තේමාවට වඩාත්ම සෘඩුව සම්බන්ධ වන්නේ කතාන්දරයේ කුමන කොටසද? විශ්වාසවන්ත භාවයෙන් සිටීමට උපකාරී වන ඉස්ෆන්ඩියාර් විසින් පෙන්නුම් කරන වෙනත් ආධ්‍යාත්මික ගුණාංග මොනවාද? ඔබගේ කතාංගයට ඇතළත් කිරීමට ඔබ සහතික වන විස්තර මොනවාද?

23 වැනි පාඩමේදී ඉවසිලිවන්ත භාවයේ ගුණාංගය කෙරෙහි අවධානය යොමු කරයි. කුඩා බීජයක සිට අවසානයේදී ඵල දරන ගසක් දක්වා වර්ධනයේ විවිධ අවධීන් හරහා ගමන් කරනවිට ලී ෂීන් විසින් ඉවසිලිවන්තව ඔහුගේ පීච් ගසට සාත්තු කරන ආකාරය කතාන්දරයේ දැක්වේ. දීර්ඝ කාලයක් වෙහෙස මහන්සිවී ඉවසිලිවන්ත වීමෙන් ලැබෙන ප්‍රීතිය කතාන්දරයෙන් අවධාරණය කරන අතර, අපගේ ශ්‍රමයේ ප්‍රතිඵල දැකීමට පෙර් අප කොපමණ වාරයක් විශාල උත්සාහයක් දැරිය යුතුද යන්න පෙන්වා දෙයි. ළමයින්ට ඉවසිලිවන්ත භාවයේ ගුණාංගය මේ ආකාරයෙන් දැකීම වැදගත් වන්නේ ඇයි? මෙම කතාන්දරය ඔබගේ සිසුනට පැවසීමේදී ඔබ විසින් ඔබගේ මනසේ පැහැදිලි කරගැනීමට අවශ්‍ය වන තොරතුරු මොනවාද?

24 වැනි පාඩමේදී ඔබ විසින් අබ්දුල් බහාතුමාගේ සහෝදරිය යන බහියිහා ඛානුම්තුමියගේ ජීවිතය පිළිබඳ කතාන්දරයක් ළමයින්ට පවසනු ඇත. ආපදා අවස්ථාවන්වලදී බහියිහා ඛානුම්තුමිය ස්ථිරභාවය පිළිහිඹු කළ ආකාරය ඔවුන්ට දැකගත හැකිවනු ඇත. නමුත්, යම්කිසිවකුගේ නිශ්චිත අර්බුදයක් හෝ දුෂ්කරතාවයක් ජයගැනීමට වඩා වැඩි යමක් දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ස්ථිරභාවය තුල ඇතුළත් වන බව ඔවුන් විසින් අවබෝධ කරගැනීමටද ඔබට අවශ්‍ය විය හැක. ඇයගේ ජීවිත කතාව මඟින් දෙවියන්වහන්සේගේ මාර්ගයේ ස්ථාවරත්වය සඳහා අවශ්‍යවන ශක්තිය සහ ධෛර්යය පිළිබඳ දර්ශනයක් ළමයින්ට ලබා දෙන්නේ කෙසේද?

## 22 වැනි පාඩම

මෙම ඒකකය තුළදී, ඔබ පළමු ශ්‍රේණියේ ළඹයින් සමඟ ගවේෂණය කරන ආධ්‍යාත්මික ගුණාංග ගැන සිතා බලා ඔබ ඔවුන්ට උගන්වන පාඩම් විසි හතරේ විවිධ අංග ක්‍රියාවට නැංවීමට පුහුණු වී ඇත්තේ ඔවුන්ගේ චරිතයට සංවර්ධනයට දායකවීමේ අපේක්ෂාවෙනි. පළමු ශ්‍රේණියේදී ඔබගේ සිසුන්ට දියුණුවීමට උපකාර කිරීමේ වරප්‍රසාදය තුල ඔබට ඇති සියළුම ආධ්‍යාත්මික ගුණාංග දැන් ඔබගේ මනසට නංවාගැනීමට මොහොතක් ගත කරන්න. මෙහිදී, දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ආදරයේ ස්ථිරභාවය මෙම පාඩම් අතරින් අවසන් තේමාව වන්නේ ස්ථිරභාවය වන අතර හදවතේ පවිත්‍රත්වය පිළිබඳ පෙර සාකච්ඡා කළ පරිදිම මේ සඳහාද අවධානය යොමු කරමින් ආරම්භ කිරීම ඔවුන්ට වැදගත්වනු ඇත. ඔබ ඔබගේ පළමු ඉගැන්වීමේ උත්සාහය ආරම්භ කරනවිට ඔබගේ රැකවරණයේ සිටින සිසුන්ට ඔවුන් තුළ සැඟවී ඇති සියළුම මැණික් වැනි ගුණාංග ප්‍රකාශ කිරීමට දරන උත්සාහයට උන්වහන්සේ කෙරෙහි ආදරයේ ස්ථිරභාවය උපකාරි වන ආකාරය පිළිබඳ නිතර සිතා බැලිය යුතුය.

# ළමයින් සඳහා වූ පාඩම් 24

## 1 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

දිව්‍යමය ආශිර්වදායන් සහ ආධ්‍යාත්මික වාතාවරණයක් ඇති කිරීම සඳහා 2 වැනි කොටසේ යෝජනා කර ඇති පරිදි ඔබට කටපාඩම් යාඥාවක් ගායනා කිරීමෙන් පන්තිය ආරම්භ කරන්න. ඉන් අනතුරුව ළමයින්ගෙන් කිසිවෙකුට හෝ කටපාඩමින් යාඥාවක් පන්තිය සඳහා ගායනා කළ හැකිදැයි විමසිය හැක. පසුව ඔවුන්ට පහත යාඥාව කටපාඩම් කළ හැක. එහි වැදගත්කම අවබෝධ කරගැනීමට ඔවුන්ට උපකාර කිරීම සඳහා, ප්‍රත්‍යක්ෂ උදාහරණ සමඟ පැහැදිලි කරදිය යුතු යයි ඔබට හැගෙන වචනයන් හඳුනා ගන්න. බොහෝමයක් ළමයින් මෙය පහසුවෙන් අවබෝධ කරගනු ඇතැයි බලාපොරොත්තු වන නමුත්, ඔබ විසින් ඊළඟ පන්ති වාර තුන තුන ආරම්භයේදී ඔවුන් සමඟ එය සමාලෝචන කළ යුතු අතර, ඔවුන් 5 වැනි පාඩම ආරම්භ කරනවිට මෙය ඔවුන්ගේ හදවතේ සහ මනසේ මුල්බැස ගත යුතුය.

> **“උන්වහන්සේ දෙවියන්වහන්සේය! අනේ දෙවියනි. මාගේ දෙවියනි! මුතු ඇටයක් මෙන් පවිත්‍ර හදවක් මට ප්‍රදානය කරන්න.”[98]**

මෙම පළමු පාඩම් කිහිපය තුළ ළමයින් කටපාඩම් කරගන්නා යාඥාවන් කෙටි වන බැවින්, 2 වැනි කොටසේ සඳහන් කර ඇති ගෞරවය සහ යාඥාවේ ස්වභාවය පිළිබඳ අදහස් කිහිපයක් ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට ඔබට අවස්ථා කිහිපයක් ලැබේ.

### B. ගීත ගායන

යාඥාවන් සඳහා වෙන්වූ කාලය අවසන්වීමෙන් පසු, ළමයින් විසින් පසුව කටපාඩම් කිරීමට යොදා ඇති එම පාඩමේ තේමාව වන හදවතේ පවිත්‍රත්වය පිළිබඳ තනුව සකසා ඇති උද්ධෘත පාඨයට අනුව සැකසූ ගීතය ගායනා කිරීමට ඉගෙන ගත හැක. ඇතැම් යෞවනයින්ට සමහරක් වචන අපහසු විය හැකි බැවින් පළමු පේළි හතර ඔවුන්ට ගායනා කිරීමට උපකාර කර ඉතිරි කොටස ඔබට ගායනා කළ හැකිය.

මාගේ ප්‍රථම උපදේශය

```
C   C/B              Am C/B
එම්බා ආත්ම පුත්‍රය!
C  C/B               Am C/B
එම්බා ආත්ම පුත්‍රය!
F                    G
මාගේ ප්‍රථම උපදේශය මෙයයි
F                    G
මාගේ ප්‍රථම උපදේශය මෙයයි

F       G  C                 Am
පවිත්‍ර, කාරුණික හා දීප්තිමත් හදවක් ඇති කරගන්න
F       G        C           C/B        Am        C/B
පෞරාණික, නොනැසී පවතින සහ සදාකාලික
F       G        C
පෞරාණික හා නොනැසි පවතින
F       G        C           Am
ඔබගේ පරමාධිපත්‍යය එයයි
```

## C. උද්ධෘත පාඨය කටපාඩම් කිරීම

මීළඟ ක්‍රියාකාකරකම වන්නේ බහායි ලේඛණවලින් උද්ධෘත පාඨයක් කටපාඩම් කිරීමයි. පහත දක්වා ඇති පරිදි ඔබට පාඩමේ තේමාව සහ කටපාඩම් කිරීම සඳහා වූ උද්ධෘත පාඨය හඳුන්වා දිය හැක.

අපගේ හදවත් කැඩපත් වැනිය. අපි ඒවා සැමවිටම පිරිසිදුව තබාගත යුතුයි. යමෙකු කෙරෙහි අමනාපයක් ඇතිකර ගැනීම, යමෙකු කෙරෙහි ඊර්ෂ්‍යා කිරීම සහ කුමන හේතුවක් නිසා කිසිවෙකුට අකාරුණිකවීම යන මේවා අපගේ හදවතේ කැඩපත ආවරණය කරන දූවිලි වැනිය. අපගේ හදවත් පවිත්‍ර වූවිට එයින් දෙවියන්වහන්සේගේ ආලෝකය සහ උන්වහන්සේගේ ආකල්ප කාරුණිකබව, ආදරය සහ ත්‍යාගශීලී බව වැනි ආකල්ප පිළිඹිබු කරනු ඇත. අපගේ හදවත් පවිත්‍රව තබාගැනීඹ සඳහා බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය කියවමු.

**"එම්බා මනුෂ්‍ය පුත්‍රය! මාගේ ප්‍රථම උපදේශය මෙයයි: පවිත්‍ර, කාරුණික හා දීප්තිමත් හදවතක් ඔබ සතු කරගන්න…."[99]**

ළමයින් විසින් උද්ධෘත පාඨය හොඳින් තේරුම් ගතහොත් එය නටපාඩම් කිරීමට පහසුවන බව ඔවුන් අවබෝධ කරගනු ඇත. එමනිසා ඔවුන් සමඟ වචන සහ වාක්‍ය ඛණ්ඩවල තේරුම සාකච්ඡා කිරීමට යම්කිසි කාලයක් ගත කරන ලෙස නිර්දේශ කරනු ලැබේ. මේ සඳහා පහත වාක්‍ය ඔබට උපකාරී වනු ඇත.

*උපදේශය*

1. දිනකදී ජෙරාඩ් සහ මේරී චිත්‍ර කිහිපයක් වර්ණ ගන්වමින් සිටින ලදි. ජෙරාඩ්ට කහ පාට පාට කූරු අවශ්‍ය වූ නමුත් මේරී එය ඔහුට නොදී සිටියාය. ගුරුවරයා විසින් බෙදාහදා ගන්නා ලෙස මේරීට පවසන ලදි. ගුරුතුමා විසින් මේරීට හොඳ උපදේශනයක් ලබා දෙන ලදි.
2. පැට්‍රිසියාට පැණිරස කෑමට හෝ කතාන්දර පොතකට මුදල් වියදම් කරනවාද යන්න තීරණය කළ යුතුව තිබුණි. ඇයගේ දෙමාපියන් ඇයට කතාන්දර පොතක් ගන්නා ලෙස උපදෙස් ලබාදුනි. පැට්‍රිසියාගේ දෙමාපියන් ඇයට හොඳ උපදේශනයක් ලබා දෙන ලදි.

*සතු කරගන්න*

1. ටිනායේ නින්දට යෑමට පෙර යාඥා කියවීමට කැමතිය. ඇයට කියවීම සඳහා කුඩා යාඥා පොතක් තිබුණි. ටිනායේ සතුව කුඩා යාඥා පොතක් ඇත.
2. අපි අපගේ ගෙවත්තේ රසවත් එළවළු රාශියක් වගා කරනවා. නැවුම් එළවළු රැසක් ලබාදෙන හොඳ ඉඩමක් අප සතුව ඇත.

*පවිත්‍ර හදවත*

1. කැතී කෝපයට පත්වී අගෝත්ට අකාරුණික වචන කීවාය. අගොත් දුක්විය. නමුත්ඉක්මනින්ම කැතීට සමාව දුන්නා. අගෝත් සතුව පවිත්‍ර හදවතක් ඇත.
2. අන් අය සමඟ කිසිදු දෙයක් බෙදා නොගන්නා ජෝර්ජ් ඇතුළු සියළු දෙනා සමඟ තමන්ගේ බිස්කට් බෙදා ගැනීමට ගුස්ටාවෝ කැමතිය. ගුස්ටාවෝ සතුව පවිත්‍ර හදවතක් ඇත.

*කාරුණික හදවත*

1. ඇයගේ දෙමාපියන් ඔවුන්ගේ මිතුරන්ට තම නිවසට ආරාධන කරනවිට, මින්ග් ලින්ග් සතුටින් ඔවුන්ට ආහාර පිළිගැන්වූවාය. කාරුණික හදවත් මින්ග් ලින්ග් සතුව ඇත.
2. රොබට්සන් මහතා ඉතාමත් වයසක පුද්ගලයෙකි. ඔහුගේ පළතුරු අස්වැන්න වෙළඳපොළට ගෙන යෑමට ජිමී උදව් කළේය. කාරුණික හදවත් ජිමී සතුව ඇත.

*දීප්තිමත් හදවත*

1. මට කණගාටුවක් ඇතිවනවිට මගේ අම්මා මාව නිරතම ධෛර්යමත් කරනවා, මාව සතුටු කරනවා. මාගේ මව සතුව දීප්තිමත් හදවත් ඇත.

2. ඔබුයාට අසනීව වී ඔහුගේ මුළු කාලයම ඇඳේ ගත කිරීමට සිදුවිය. ඔහු බොහෝ යාඥා කළ අතර දුක් නොවීය. නිරන්තරව ඔහු තුලින් සතුටු බවක් පෙන්වීය. ඔබුයා සතුව දීප්තිමත් හදවත් ඇත.

## D. කතාන්දරය

ළමයින් විසින් උද්ධෘත පාඨ්‍ය කටපාඩම් කරගත් පසු, ඔබට ඔවුන්ට අබ්දුල් බහාතුමා ගැන පහත කතාව පැවසිය හැකි අතර එය ඔවුන්ට හදවතේ පවිත්‍රත්වයේ වැදගත්කම තවදුරටත් අවබෝධ කරදෙනු ඇත. ඔබගේ පන්තියේ සමහර යෞවනයින් අබ්දුල් බහාතුමා පිළිබඳ නොදන්නේ නම් ඔබ පන්තිය ආරම්භ කිරීමට පෙර එතුමා ගැන වචන කිහිපයක් පැවසීමට සූදානම් විය යුතුය.

*අබ්දුල් බහාතුමාට සෑමවිටම පුද්ගලයෙකුගේ හදවතේ ඇති දෑ පැවසිය හැකි වූ අතර, පවිත්‍ර සහ දීප්තිමත් හදවත් ඇති මිනිසුන්ට එතුමා බෙහෙවින් ආදරය කළේය. අබ්දුල් බහාතුමාගේ රාත්‍රී භෝජන සංග්‍රහයක ආරාධිතයෙකුවීමේ ගෞරවය හිමිවූ කාන්තාවක් සිටියාය. උන්වහන්සේගේ ප්‍රඥාවන්ත වචනයන්ට සවන්දෙමින් ඇය එහි වාඩිවූ අතර, ඇය ඉදිරිපස වූ වතුර වීදුරුවක් දෙස බලා 'ඔබ වතුර වීදරුවක් පුරවා හිස්කරන ආකාරයටම, අබ්දුල් බහාතුමා විසින් මාගේ හදවත ගෙන එහි වූ සෑම භෞතික දෙයක්ම හිස්කර, දිව්‍යමය ප්‍රේමයෙන් සහ අවබෝධයෙන් නැවත පුරවන්නේ නම්' යනුවෙන් සිතුවාය.*

*මෙම සිතුවිල්ල ඇගේ මනස හරහා ඉක්මනින් ගමන් කළ අතර, ඇය ඒ පිළිබඳ කිසිවක් නොකියූ නමුත්, වැඩි වේලා නොගෝ ඇය සිතූ දේ අබ්දුල් බහාතුමා දැනගත් බව ඇයට වැටහෙන සිදුවීමක් සිදුවිය. උන්වහන්සේ කතාව සිදුකරන අතරතුර එහි සේවකයෙකුට කතා කිරීමට මදක් එතුමාගෙ කතාව නවතා, සෙමින් වචන කිහිපයක් ඔහුට පැවසූහ. එම සේවකයා නිශ්ශබ්දව මේසයේ කාන්තාව සිටි ස්ථානයට පැමිණ ඇයගේ වතුර වීදුර හිස් කර නැවත ඇය ඉදිරිපිට තැබුවේය.*

*මද වේලාවකට පසු, අබ්දුල් බහාතුමා දිගටම කතා කරමින් සිටින අතරතුරදී, මේසය මතවූ වතුර භාජනයක් ගෙන ඉතා ස්වාභාවික ආකාරයෙන් කාන්තාවගේ හිස් වීදුරුව සෙමෙන් පුරවන්නට විය. සිදුවූයේ කුමක්දැයි කිසිවෙකු අවබෝධකර නොගත්තද අබ්දුල් බහාතුමා විසින් තමන්ගේ හදවතේ ආශාවට පිළිතුරු දෙන බව කාන්තාව දැනගත්තාය. ඇය සතුටින් ඉපිල ගියාය. හදවත යනු විශිෂ්ඨ ආදරයකින් සහ කරුණාවකින් යුතුව කියවන තැනැත්තාණන් වන අබ්දුල් බහා තුමාට විවෘත වූ පොත් වැන වන බව ඇය දැනගත්තාය.*

## E. ක්‍රීඩාව "බෙදාහදා ගැනීම"

මීළඟ ක්‍රියාකාරකම සඳහා, මෝටර් රථ ටයරයක් ගෙන එය බිම තබා ළමයින් කීදෙනෙකුට එකවර එහි නැඟී සිටිය හැකිදැයි බලන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න. ටයරයක් සොයා ගත නොහැකි නම්, පැදුරක් හෝ තුවායක් හෝ ඒ හා සමාන දෙයක් බිම ඇතිරිය හැක. ඔබ විසින් කුමන වස්තුවක් මේ සඳහා තෝරා ගත්තද, එය පන්තියේ ළමුන් ගණන අනුව ක්‍රීඩාව අභියෝගයක් කිරීමට තරම් කුඩාවිය යුතුය.

## F. වර්ණ ගැන්වීම : 1 වැනි චිත්‍රය

ක්‍රීඩාවක් පසු, ළමයින් එක්රැස් කර ඔවුන්ට වර්ණ ගැන්වීමට පළමු චිත්‍රයේ පිටපතක් ලබාදිය හැකි අතර ඔවුන් කටපාඩම් කරගත් උද්ධෘද පාඨය පිටුවේ පහළින් ඇති බවත් පාඩමේ තේමාව සම්බන්ධ වන එම රූපය පිළබඳ ඔබ කලින් සූදානම් කරගත වචන කිහිපයක් මෙහිදී පැවසිය හැක.

### G. අවසන් කිරීමේ යාඥාව

පන්තිය අවසන් කිරීම සඳහා ළමයින් දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට ඔවුන්ට කටපාඩමින් ගායනා කළ හැකි යාඥාවක් හෝ උද්ධෘත පාඨයක් ගායනා කරන ලෙස ඉල්ලා සිටිය හැක. පසුව ඔබට අවසන් යාඥාව සිදුකළ හැක.

## 2 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

1 වැනි පාඩම ආරම්භයේදී ඔබ කියු යාඥාව ගායනය තුලින් මෙම පන්ති වාරය සහ ඊළඟ පන්ති වාර දෙක ආරම්භ කරන ලෙස ඔබට යෝජනා කරයි. ඉන්පසුව ඔබ කලින් තෝරා ගන්නා ලද ළමයින් කිහිප දෙනකුගෙන් ඔවුන් දන්නා එක් යාඥාව බැගින් කියන ලෙස ඉල්ලා සිටිය හැක. අවසානයේදී පෙර පාඩමේ හඳුන්වාදුන් යාඥාව කටපාඩම් කිරීමට ඔබගේ සිසුන්ට උපකාර කළ හැක.

### B. ගීත ගායනය

මීළඟ ක්‍රියාකාරකම සඳහා ළමයින්ට පෙර පාඩමේ ගීතය සහ පහත මෙම පාඩමේ තේමාව වන යුක්තිය සම්බන්ධ අලුත් හඳුන්වාදෙන ගීතයද ඇතුළත්ව ගීත දෙකක් ගායනා කළ හැකිය.

උතුම් මාවත

```
D
උතුම් මාවත යුක්තියයි

A                     D
යුක්ති දීප්තිමත් දිනයක් ගෙන එයි

G            D
අසරණයින් හට ආලෝකයකි

A            D
යහපත් ක්‍රියාවෙන් බැබළෙයි

D    A       D
ඕ, යුක්තිය මාවතයි

A            D
ආදරය පෙන්වමින් දයාව පෙන්වමින්

D
අබ්දුල් බහාතුමා ලබාදෙනු ඇතැයි අප දනිමු

G            D
උන්වහන්සේගේ සැහිම අල්පතර විය

A            D
සතුටට ගෙන එනු පිණිස

D            A            D
උන්වහන්සේගේ සැහීම අල්පතජ් විය
```

D
ධාර්මිෂ්ඨ වීමට නම් අප දිය යුතුය

A D
ජීවත් වන්නට අපගේ ආදරය හා සතුට බෙදා ගන්න

G D
අප ලබනා ආශිර්වාදයන් බෙදා ගමු

A D
වඩා හොඳ ලෝකයක් අප ගොඩ නඟමු

D A D
ඕ, යුක්තිය මාවතයි

(පළමු කොටස නැවත කියන්න, අවසාන පේළිය දෙවරක් ගායනා කරන්න)

## C. උද්ධෘත පාඨය කටපාඩම් කිරීම

ගීත දෙක ගායනා කිරීමෙන් පසුව, ළමයින්ට බහා'උ'ල්ලා තුමාගේ ලේඛණවලින් උපුටා දැක්වීම කටපාඩම් කරගැනීමට ඔවුන්ව ධෛර්යමත් කළ හැක. පාඩමේ තේමාව සහ යෝජනා කරඇති උද්ධෘත පාඨය ඉදිරිපත් කිරීම සඳහා අදහස් කිහිපයක් පහත දැක්වේ.

> දෙවියන්වහන්සේ යුක්තියට ප්‍රිය කරයි. යුක්තිය ඇතිවට සෑම කෙනෙකුට ජීවිතයේ යහපත් දේ භක්ති විඳිති. සෑම ළමයෙකුටම පාසල් යා හැකි අතර සෑම පවුලකට සුවපහසු නිවසක් ඇති සේම වැඩියෙන් ඇති අය අන්අයගේ යහපත උදෙසා සතුටින් ලබාදීම ඔවුන් දෙවියන්වහන්සේගෙන් ලැබුණු වරප්‍රසාදයන් වේ. අප එකිනෙකාට සාධාරණව සහ යුක්තියෙන් සලකනවිට දෙවියන්වහන්සේ අප පිළිබඳ සතුටු වේ. අප කිසිවෙකු හිරිහැරයට භාජනය වී සිටිනු දුටුවහොත් ඒ අය වෙනුවෙන් පෙනී සිට උපකාර කළ යුතුය. අප අපගේ මිතුරන්ගෙන් හෝ අසල්වැසියන්ගෙන් ඔවුන්ගේ දේ නොගත යුතුය. අපට යමක් බෙදා ගැනීමට අවශ්‍ය වූවිට කිසිවෙකු මග නොහැර සෑම කෙනෙකුටම සාධාරණ කොටසක් ලැබෙන බවට අප සහතික විය යුතුය. අපට සාධාරණවීමට උපකාරී වීමට බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු.
>
> **"ඇත්ත වශයනේම, ඔබ දෙවියන්වහන්සේගේ යුක්තියේ මාර්ගයේ ගමන් කරන්න, ඍජු මාවත එයයි."[100]**

ඉහත උද්ධෘත පාඨ්‍ය කටපාඩම් කරගැනීමට පෙර ඒ සම්බන්ධයෙන් මූලික අවබෝධයක් තිබිට යුතු බවට සහතිකවීම ඉතා වැදගත් වේ. ඔවුන්ට නුහුරු වියහැකි වචනවල අර්ථයක පැහැදිලි කිරීමට ඔබට උපකාරීවන වාක්‍ය කිහිපයක් පහත දක්වා ඇත.

*ගමන් කරන්න*

1. වනාත්රයේ ඇති ගස්වලින් බොහෝ කොළ වැටී මාර්ගය වැසී ඇත. ෆුම්කෝ වනාන්තරය හරහා ගමන් කරයි. ඇය කොළ වලින් වැසුණු මාර්ගයේ ගමන් කරයි.

2. පෙද්‍රෝ සතුටින් එකට සෙල්ලම් කරන ඔහුගේ මිතුරන්ට උදව් කිරීමට කැමතියි. පෙද්‍රෝ සහ ඔහුගේ මිතුරන් ඉතා එකමුතුයි. පෙද්‍රෝ ඒකීය භාවයේ මාර්ගයේ ගමන් කරයි.

*මාවත*

1. ලුයිස්ට බූරුවෙක් සිටී. ඔහු බූරුවාට තණකොළ කෑමට තණබිමකට ගෙන ගොස් එහි තනි කළේය. බූරුවා නිවසට යන මාවත තනිව සොයා ගත්තේය.

2. පාසලට යෑමට මාර්ගයන් දෙකක් ඇත. මිලී නිතරම කැමති වන්නේ ඇයගේ ආච්චිගේ නිවස අසලින් යන මාවතේ යෑමටයි.

*යුක්තිය*

1. කාලෝස්ට පන්තියේදී බෙදාදීමට පාටකූරු ලබා දුන්නේය. පන්තියේ ළමයික් පස් දෙනෙක් සිටි අතර පාටකූරු දහයක් විය. කලෝස් විසින් සෑම ළමයෙකුට පාටකූරු දෙක බැගින් ලබා දුන්නේය. කාලෝස් පාටකූරු ලබාදීමේ යුක්ති සහගත විය.
2. ඇනාගේ ගෙවත්තේ ඇති ළිඳේ වතුර සෑහෙන ප්‍රමාණයක් තිබුණත් ඇයගේ අසල්වැසියාගේ ළිඳ සිඳී යයි. ඇනා කිසිවිටකත් තම අසල්වැසියාට දුක් විඳීමට ඉඩ නොදෙන අතර සෑමටවිටම ජලය ලබාගැනීමට ඉඩ ලබාදුන්නාය. ඇනා යුක්තිය ප්‍රිය කරයි.

## D. කතාන්දරය

ළමයින් උද්ධෘත පාඨය කටපාඩමින් ගායනා කිරීමට ඉගෙන ගත්පසු අබ්දුල් බහාතුමා කෙතරම් සාධාරණයි පෙන්වා දෙන පහත කතාන්දරය ඔවුන්ට පැවසිය හැක.

*දිනක් අබ්දුල් බහාතුමාට ඇකා නගරයේ සිට හයිෆා දක්වා යෑමට අවශ්‍ය විය. එතුමා සාමාන්‍ය අශ්ව රථයක මිළ අඩු අසුනක් ලබාගැනීමට ගිය අතර එය බොහෝවිට මගීන්ගෙන් පිරී පවතී. එහි රියදුරා පුදුමයට පත්වී අබ්දුල් බහා තුමා මෙතරම් මිළ අඩු රථයක ගමන් කිරීමට අරපිරිමැස්මෙන් කටයුතු කරන්නේ ඇයි දැයි තමන්ගෙන්ම අසන්නට විය. "ඇත්තෙන්ම, ඔබවහන්සේ පෞද්ගලික රථයක ගමන් කිරීම කැමතිද?" යනුවෙන් රියදුරා ඇසවේය. "නැහැ" යනුවෙන් පිළිතුරු දුන් ගුරුතුමාණන් සාමාන්‍ය රථයෙන් හයිෆා දක්වා ගමන් කළේය. හයිෆා නගරයට පැමිණි එම රථයෙන් එතුමා බසිනවිට ධීවර කාන්තාවක් පැමිණ ඒතුමාගෙන් උදව් ඉල්ලා සිටියාය. දවස පුරාම ඇයට කිසිවක් හමුනොවූ නිසා කුසගින්නේ සිටින ඇයගේ පවුල වෙත ඇයට යෑමට සිදුව තිබුණි. අබ්දුල් බහාතුමා විසින් ඇයට සෑහෙන ප්‍රමාණයේ මුදලක් ලබාදී රියදුරා වෙත හැරී "මෙතරම් පිරිසක් කුසගින්නේ සිටිනවිට මම සැපපහසු ලෙස ගමන් කළ යුත්තේ ඇයි?" යනුවෙන් ඇසුවේය.*

## E. ක්‍රීඩාව "දැවෙන පිපාසය"

කතාන්දරයන් සඳහා වූ කාලය නිමවීමෙන් පසු, ළමයින් ක්‍රීඩා කිරීම සඳහා උනන්දුවක් දක්වනු ඇත. ඔවුන්ගේ වැලමිට නැමීමට නොහැකි වන පරිදි ඔවුන්ගේ අත් ලී කැබලි තබා බැඳීමෙන් පසු ඔවුන් කාන්තාරයක එක්ව ගමන් කරමින් සිටින බවත් සියළු දෙනා ඉතා පිපාසයෙන් සිටින බවත් රඟදක්වන්න යයි පවසන්න. ඔබ ඔවුන් සඳහා තබා ඇති වතුරු කෝප්පවල වෙත ඔවුන් පැමිණි පසු, ඔවුන්ට එය පානය කිරීමට මාර්ගයක් සොයා ගත යුතු වේ. එය කිරීමට ඇති එකම මාර්ගය ඔවුන් එකිනෙකාට උදව් කරගැනීමට බව ඔවුන් අවබෝධ කරගනු ඇති අතර ඔවුන් තෙමීමෙන් වැළකීමටද වගබලා ගත යුතුය.

## F. වර්ණ ගැන්වීම : 2 වැනි චිත්‍රය

ඊළඟ ක්‍රියාකාරකම සඳහා සෑම ළමයෙකුටම 2 වැනි චිත්‍රය වර්ණ ගැන්වීම සඳහා එහි පිටපතක් බැගින් ලබාදෙන්න. ඔවුන් කටපාඩම් කර ඇති උපුටා දැක්වීම පිටුවේ පහළ ඇති බව ඔබ දරුවන්ට මතක් කර දිය යුතු අතර පින්තූරය පාඩමේ තේමාවට සම්බන්ධ වන ආකාරය ගැන වචන කිහිපයක් පැවසීමටද සූදානම් විය යුතුය.

## G. අවසන් කිරීමේ යාඥාව

ළමයින් වර්ණ ගැන්වීම අවසන් වූ විට, මෙම පාඩමේදී හෝ පෙර පාඩමේදී ඔවුන් කටපාඩම් කළ යාච්ඤාවක් හෝ උද්ධෘත පාඨයක් ගායනා කිරීමට ඔවුන්ගෙන් කිහිප දෙනෙකුට ආරාධනා කළ හැකිය. අවසානයේදී ඔබට අවසන් යාඥාව සිදු කළ හැකිය.

## 3 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

පන්ති ආම්භ කිරීම සඳහා කටපාඩමින් යාඥාවක් සිදු කළ හැකි අතර කලින් තෝරාගත් ළමයින් කිහිපදෙනෙකුට එක් යාඥාව බැගින් ඉදිරිපත් කරන ලෙසත් පවසා සිටිය හැක. පසුව ඔබගේ සිසුන් 1 වැනි පාඩමෙන් ඉගනෙ ගැනීමට ආරම්භ කළ යාඥාව සමාලෝචනය කිරීම සඳහා ඔවුන් සමඟ යම්කිසි කාලයක් ගත කළ හැක.

### B. ගීත ගායනය

පෙර පාඩම්වලින් ඉගෙන ගත් ගීත දෙක ළමයින් විසින් ගායනා කිරීමෙන් පසු ඊළඟ මෙම ක්‍රියාකාරකම් ආරම්භ කළ හැක. ඉන්පසු පාඩමේ තේමාව වන ආදරය හා සම්බන්ධ පහත ගීතය ඔවුන්ට ඉගැන්විය හැක.

ආදරේ, ආදරේ, ආදරේ

C F
ආදරේ, ආදරේ, ආදරේ

G C
ඔබගේ සමීපතමයින්ට ආදරේ කරන්න

C F
ආදරයෙන් ආදරයෙන් ආදරයෙනි

D7 G
ලෝකය බිහි වුනේ

C F
දෙවියන් නිර්මාණයන්ට ආදරය කරයි

C G
එම නිසා උන්වහන්සේ ඔබ මැව්වා

C F
එතුමාට ආදරය ආදරය කරන්න

G C
මිනිසුන්ටත් ආදරය කරන්න

ආදරේ ආදරේ ආදරයයි
සදාකාලික යහපත
ආදරේ ආදරේ ආදරයයි
සහෝදරත්වයේ බීජය
සැම නිර්මාණයකට ආදරය කළ නිසා
එතුමා ඔබ මැව්වා එතුමාට ආදරය කරන්න
මිනිසුන්ටත් ආදරය කරන්න

ඔවුන් දුර සිටියද ළඟ සිටියද,
දෙවියන්ගේ මැවීවට ආදරය කරන්න
ඔවුන් සැවොම දිලිසෙන තරුවක් මෙන් දකින්න
සියළු මැවීමට ආදරය නිසා
උන්වහන්සේ ඔබ මැව්වා
උන්වහන්සේට ආදරය කරන්න
මිනිසුන්ටත් ආදරය කරන්න

## C. උද්ධෘත පාඨය කටපාඩම් කිරීම

කටපාඩම් කිරීම සඳහා වූ උද්ධෘත පාඨය ඉදිරිපත් කිරීමත් සමඟ ඔබට ඔබගේ සිසුන් සමඟ පාඩමේ තේමාවට අදාළ පහත අදහස් බෙදාහදා ගත හැකිය.

සූර්යයාගේ කිරණ මෙන් දෙවියන්වහන්සේගේ ප්‍රේමය සකල මනුෂ්‍ය වර්ගයා මතම බැබළෙයි. සූර්යයාගේ කිරණ වියළි කාන්තාර සහ හරිත උද්‍යාන මත එකසේ පතිත වේ. එහි උණුසුම නිසා සාරවත් බිමක රෝපණය කරන ලද බීජ වර්ධනයවී අගනා ඵල හට ගනී. එමනිසා, උන්වහන්සේගේ ප්‍රේමණීය රැකවරණයේ උණුසුම යටතේ වර්ධනය වී මල් හටගන්නා දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ බීජ අපගේ හදවත් නැමැති පවිත්‍ර පසෙහි සිටුවිය යුතුය. එවිට අපගේ පැතිර යනු ඇති අතර ඇතැම්විට අපට අකාරුණික වන අයද ඇතුළුව සෑම කෙනෙකුටම අපට ආදරය පෙන්විය හැක. සකල මනුෂ්‍ය වර්ගයාටම ආදරය කිරීමට අපට උපකාරීවීම සඳහා අප බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු.

**"එම්බා මිත්‍රය! ඔබගේ හදවත් නමැති උද්‍යානය තුල ආදරයේ රොස මල් හැර අන්කිසිවක් නොසිටවන්න."[101]**

මෙම උද්ධෘත පාඨය තුල ඇති "කිසිවක් නොමැත" යන අර්ථය ඇති "අන්කිසිවක්" යන වචනය පමණක් පැහැදිලි කිරීමට අවශ්‍ය විය හැක.

1. ඕනියෝ සූර්යයා හා මල් පිළිබඳ ගීත ගායනා කිරීමට ඇලුම් කරන අතර ඔහු ඒ පිළිබඳ හැර ගීත ගායනා කරන වෙනත් කිසිවක් නොමැත. ඕනියෝ හිරු එළිය සහ මල් හැරන අන් කිසිවක් ගැන ගීත ගායනා නොකරයි.

2. ටා ජෙන්ට ගඟට යෑමට අවශ්‍ය වූ නමුත් ඔහු නිවසේ වැඩකටයුතු අවසන් කර නොතිබුණි. ඔහුගේ පියා විසින් ඔහුගේ වැඩ අවසන්වන තුරු ඔහුට පිටව යා නොහැකි බව පැවසීමෙන් ටා ජෙන් කණගාටුවට පත්විය. "ඔබගේ පියාට කීකරුවීමෙන් හැර අන්කිසිවකින් ඔබගේ සියළු සැලසුම් සාර්ථක වෙනනේ නැහැ මාගේ දරුව" යනුවෙන් ඔහුගේ අච්චි පැවසුවාය.

## D. කතාන්දරය

කටපාඩම් කිරීමට වෙන්කළ කාලය නිමවීමෙන් පසු, ඔබගේ සිසුන්ට පහත සඳහන් කතාන්දරය ඔබට පැවසිය හැක.

*අබ්දුල් බහාතුමා ඇකා බන්ධනාගර නගරයේ ජීවත් වූ කාලයේදී එතුමාට ඉතාමත් නරක අන්දමින් සැලකී මිනිසෙකු සිටියේය. අබ්දුල් බහාතුමා යහපත් පුද්ගලයෙකු නොවන බවත් බහායිවරුන්ට කෙතරම් නරක අන්දමින් සැලකුවත් දෙවියන්වහන්සේ එය නොසලකා හරිනු බව ඔහු සිතුවේය. ඔහුගේ මුළු හදවතින්ම අබ්දුල් බහාතුමාට වෛර කළේය. ඔහු තුළ එය වර්ධනය වී පැසුණු වෛරයක් බවට පත්වූ අතර ඇතැම් අවස්ථාවලදී බිඳුනු බඳුනකින් ජලය ගලා යන සේ ඔහු තුලින් එය පිටවිය. මිනිසුන් යාඥා කිරීමට පල්ලියට පැමිණෙන විට මොහු අබ්දුල් බහාතුමාට විරුද්ධව කෑගසමින් එතුමා පිළිබඳ දරුණු දේවල් කියන්නට විය. ඔහු නගරයේ විදියේ අබ්දුල් බහාතුමා පසු කරනවිට එතුමා නොපෙනෙන ලෙස තම ඇඳුමෙන් මුහුණ වසා ගන්නට විය.*

*දැන්, මේ මිනිසා ඉතා දුප්පත් වූ අතර ඔහුට කෑමට හෝ උණුසුම් ඇඳුම් ගැනීමටවත් නොහැකිව සිටියේය. අබ්දුල් බහාතුමා කුමක් කළේ යැයි ඔබ සිතනවාද? එතුමා ඔහුට කරුණාව දක්වමින් ඔහුට අවශ්‍ය ආහාර සහ ඇඳුම් යවා ඔහුව රැකබලා ගන්නා බවට සහතික විය. උදාහරණයක් ලෙස, වරක් මෙම පුද්ගලයා රෝගාතුර වූවිට, අබ්දුල් බහාතුමා විසින් ඔහු වෙත වෛද්‍යවරයෙකු යවා ඔහුගේ බෙහෙත් සහ ආහාර සඳහා මුදල් ගෙවා ඔහුටද මුදලක් ලබා දුන්නේය. ඔහු අබ්දුල් බහාතුමාගේ දීමනාවන් පිළිගත් නමුත් එතුමාට ස්තුති නොකළේය. ඇත්ත වශයෙන්ම, ඔහු තම නාඩි බැලීම සඳහා එක් අතක් වෛද්‍යවරයා වෙත දිගු කර අබ්දුල් බහාතුමාගේ මුහුණ නොපෙනීම සඳහා අනෙක් අතින් තම මුහුණ වසා ගත්තේය. මෙලෙස අවුරුදු ගණනාවක් ගතවිය. පසුව අවසානයේදී එක් දිනයකදී මිනිසාගේ හදවත වෙනස් විය. ඔහු අබ්දුල් බහාතුමාගේ නිවසට පැමිණ, එතුමාගේ දෙපාමුල වැද වැටී, දැඩි කණස්සලු හදවතින් සහ නිවුන් ගංගාවක් මෙන් ඔහුගේ මුහුණේ ගලා ගිය කඳුළින් යුතුව "ස්වාමීන මට සමාවෙන්න. අවුරුදු විසි හතරක් තිස්සේ මම ඔබට නපුරුකම් කළෙමි. අවුරුදු විසි හතරම ඔබ මට දැක්වූයේ යහපත්කම පමණයි. දැන් මම දන්නවා මම වැරදියි කියලා. කරුණාකර මට සමාව දෙන්න." යයි පැවසීය. මේ ආකාරයට අබ්දුල් බහාතුමාගේ විශිෂ්ට ප්‍රේමයෙන් වෛරය පරදවා ජය ගත්තේය.*

### E. ක්‍රීඩාව "පාලම"

ඊළඟ ක්‍රියාකාරකම සඳහා රේඛාවක් සාදා ගැනීමට බංකු, පුවරු, ගඩොල් හෝ ටයිල් ඔබට භාවිතා කළ හැක. මෙය "පාලම" වේ. ළමයින් කණ්ඩායම් දෙකකට වෙන්කර, පාලමෙන් කිසිවකුට වැටෙන්නට නොදී, දෙපිරිසම එකවර ප්‍රතිවිරුද්ධ දිශාවට ගොස් පාලමෙන් එගොඩ විය යුතු බව පවසන්න. එහිදී, එකිනෙකා පසුකරමින් එකිනෙකාගේ ස්ථානය වෙනස් කිරීම සඳහා ඔවුනොවුන්ට උපකාර කරගත යුතු බව ළමයින් විසින් අවබෝධ කරගන්නවා ඇත.

ඔවුන්ට උපකාර කිරීමේදී, ඔබ ඔවුන්ගේ ආරම්භ ස්ථානය වෙත ගොස් ළමයින්ට පරිස්සමින් ඔවුන්ගේ පියවරයන් මතින් යෑමට මඟ පෙන්වීම සඳහා උපකාර කළ හැක. සියලුම යෞවනයින් එකවර පාලම මත තැබීම වෙනුවට, ඔබට ඔවුන්ගෙන් කිහිප දෙනෙකු සමඟ එකවර පුහුණු කළ හැකිය. නිර්ශනයන් කිහිපයකට පසු, සියලු දෙනාම සහභාගීවන තෙක් පාලම මත සිටින ළමයින් සංඛ්‍යාව වැඩි කළ හැක.

### F. වර්ණ ගැන්වීම : 3 වැනි චිත්‍රය

ක්‍රීඩාවෙන් පසුව, අවසන් ක්‍රියාකාරකම සඳහා සෑම ළමයෙකුටම 3 වැනි චිත්‍රය වර්ණ ගැන්වීම සඳහා එහි පිටපතක් බැගින් ලබාදෙන්න. පින්තූරය පාඩමේ තේමාවට සම්බන්ධ වන ආකාරය ගැන වචන කිහිපයක් පැවසීමටද සූදානම් විය යුතුය.

### G. අවසන් කිරීමේ යාඥාව

පන්තිය අවසන් කිරීම සඳහා, ළමියන් දෙදෙනෙකුට හෝ තිදෙනෙකුට ඔවුන් කටපාඩම් කරගත් යාඥාවක් හෝ උද්ධෘත පාඨයක් පැවසන ලෙසත් අනෙක් සිසුන්ට නිහඬව වාඩිවී සිටින ලෙසට ඉල්ලා සිටින්න. ඉන්පසුව ඔබට හෝ වෙනත් ළමයෙකුට පන්ති අවසන් කිරීම සඳහා යාඥාවක් ගායනා කළ හැක.

## 4 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

යාඥා මෙහෙය අවසන්වීමෙන් පසු, පසුගිය පාඩම් කිහිපය තුළ ඔවුන් කටපාඩම් කිරීමට ඉගෙන ගත් යාඥාව ඔබගේ සිසුන් සමඟ සමාලෝචනය කරන්න.

## B. ගීත ගායනය

මීළඟ ක්‍රියාකාරකම සඳහා, සත්‍යවාදී බව යන තේමාව පිළිබඳ වූ මෙම අලුත් ගීතය ඔවුන්ට ඉගැන්වීමට පෙර පෙර පාඩම්වලදී ඉගෙන ගත් ගීත ළමයින්ට ගායනා කිරීමට සලස්වන්න.

සත්‍යවාදී වචන

G D
දූවිල්ලෙන් විසුණු කැඩපතකට

A D
හිරුගේ දීප්තිමත් ආලෝකය පරාවර්තනය කළ නොහැක

G D
මඩ තැවරුණු පියාපත් ඇති කුරුලෙකුට

A D D7
පියඹා යාමට නොහැක

සමූහ ගායනය:

G D
සියලුම අපගේ වචන සත්‍ය වූවිට

A D D7
අපගේ ආත්මයන්ට දියුණු විය හැක

G D
මනුෂ්‍ය වර්ගයාගේ සියළු ගුණාංගයන්ගේ පදනම

A D
සත්‍යවාදී බව අප දනිමු

සමූහ ගායනය

ඉරුණු රුවල් ඇති නැවකට
අල්ලා ගත නොහැක
ආවරණයකින් වැසී ඇත්නම්
ඇසකට ඉදිරි මඟ නොපෙනෙයි

සමූහ ගායනය *(අවසාන වාක්‍ය නැවත කියන්න)*

## C. උද්ධෘත පාඨය කටපාඩම් කිරීම

පහත ආකාරයෙන් පාඩමේ තේමාව සහ කටපාඩම් කිරීම සඳහා වූ උද්ධෘත පාඨය ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමු.

සෑම මනුෂ්‍යයෙකුට තිබිය යුතු වැදගත්ම ආධ්‍යාත්මික ගුණාංගය වන්නේ සත්‍යවාදී බවයි. කිසිවෙකුට දැනගැනීමට නොහැකි වුවද අප කිසිවිටකත් කුඩා හෝ බොරුවක් කීමෙන් වැළකිය යුතුය. ඇතැම්විට මිනිසුන් ඇත්ත කීමට ඇති බිය නිසා බොරු කියනවා. එහෙත් දෙවියන්

වහන්සේ අපගේ සියලු ක්‍රියාවන් ගැන දන්නා බවත් අපට උන්වහන්සේගෙන් කිසිවක් සැඟවිය නොහැකි බවත් අපි දනිමු. අපි සත්‍යයට ආදරය කළ යුතුයි. අප සත්‍යවාදී නොවන්නේ නම්, යුක්තිය, ප්‍රේමය සහ කරුණාව වැනි වෙනත් ගුණාංග වර්ධනය කර ගැනීමටත් දෙවියන් වහන්සේට ළං වීමටත් අපට අපහසු වනු ඇත. පහත සඳහන් අබ්දුල් බහාතුමාගේ උද්ධෘත පාඨය අපි කටපාඩම් කරගනිමු.

**"සත්‍යවාදී බව සියළුම මානුෂීය ගුණාංගයන්ගේ පදනමයි."**[102]

ඉහත උද්ධෘතයේ ඇති දරුවන්ට අපහසු විය හැකි වචනවල තේරුම පැහැදිලි කිරීමට ඔබට උපකාරි විය හැකි වාක්‍ය කිහිපයක් පහත දැක්වේ.

*සත්‍යවාදී බව*

1. සංජය අතින් වීදුරුවක් බිම වැටී බිඳී ගියා. සිදුවුනේ කුමක්දැයි මව විසින් ඇසූ පසු ඔහු සත්‍ය පවසා සිටියා මිස බොරු නොකියන ලදි. සංජය සත්‍යවාදීව කටයුතු කරන ලදි.

2. ගීතා එක සැන්දෑවක සෙල්ලම් කරමින් බොහෝ වේලාවක් ගත කළ අතර ඇය ගෙදර වැඩ නිම කළේ නැත. පසුදින එය භාරදීමට යන අවස්ථාවේදී ගුරුවරයා නොසතුටට පත්වන බව ඇය දැන සිටියද ඇය සත්‍ය පැවසීමට තීරණ කළාය. ගීතා සත්‍යවාදීව කටයුතු කරන ලදි.

*පදනම*

1. ආලෝක්ගේ තාත්තා ගෙයක් හදනවා. බිත්ති බැඳීමට කලින් බිත්ති ඉදිවන ස්ථානයේ යටට ගල් සහ සිමෙන්ති යොදන ලදි. ගල් හා සිමෙන්ති නිවසේ පදනම වේ. එය නිවස එකට බැඳ තැබීමට උපකාරී වේ.

2. කියවීමට හා ලිවීමට ඔබ ඉගෙන ගැනීමට පෙර, ඔබ අකුරු සහ ඒවායේ ශබ්ද දැන සිටිය යුතුය. අකුරු වල ශබ්ද ඉගෙනීම කියවීමට සහ ලිවීමට ඉගෙනීම සඳහා පදනමයි.

*ගුණාංග*

1. අවුරෝරා මිත්‍රශීලි, ආචාරසම්පන්න හා කාරුණික වේ. මිත්‍රශීලී භාවය, ආචාරශීලී භාවය සහ කාරුණික බව ඇය සතු ගුණාංගයන්ගෙන් කිහිපයකි.

2. පටෙල් මහත්මිය යුක්තිය, ත්‍යාගශීලී බව, නිහතමානීකම සහ අවංකකම ගැන දරුවන්ට උගන්වයි. මේවා සෑම කෙනෙකු තුළම තිබිය යුතු වැදගත් ගුණාංගයන් කිහිපයකි.

## D. කතාන්දරය

මීළඟ ක්‍රියාකාරකම ලෙස, ඔබට පහත කතාව ඔබේ සිසුන්ට පැවසිය හැකිය, එය සත්‍යවාදී බවේ ගුණාංගය පිළිබඳ සිතීමට ඔවුන්ට උපකාර වනු ඇත.

*කාලයකට පෙර ඈත රටක තරුණ එඬේරයෙකු ජීවත් වූ අතර ඔහුගේ පියා කුඹුරු වැඩ කළ අතර මව නිවසේ කටයුතු බලාකියා ගත් අතර තරුණයාගේ කාර්යය වූයේ බැටළුවන් රැකබලා ගැනීමයි. දිනක් තරුණයාට කම්මැලි හැඟීමක් ඇති වූ හෙයින් අසල්වැසියන් උප්පරවැට්ටියක් සිදු කිරීමේ අදහසක් පහළ විය. "වෘකයෙක්, වෘකයෙක්, වෘකයා බැටළුවන් කනවා!" යනුවෙන් ඔහු හදිසියේම කෑගසයන්නට විය. ඔහුගේ මිතුරන් සියල්ලෝම වෘකයා පලවා හැරීමට උදව් කිරීමට දිව ආ නමුත් ඔවුන් එහි ගිය විට, එතරම් බියක් ඇති වීමට ඇත්ත වශයෙන්ම වෘකයෙකු එහි නොවූ නිසා තරුණ එඬේරා ඔවුන්ට සිනාසෙමින් සිටිනු දුටුවේ ය. තරුණයා ඉතාමත් නරක ලෙස හැසිරුනු බව පවසමින් ඔහුගේ මිතුරන් නැවත ඔවුන්ගේ වැටකටයුතු සඳහා පිටත් විය.*

*ඊළඟ දවසේ, පිරිමි ළමයා "වෘකයෙක්! වෘකයෙක්! මට උදව් කරන්න! මට උදව් කරන්න!" යනුවෙන් කෑගසමින් ඔහුගේ මෝඩකම නැවත නැවතත් කළේය. සමහර අසල්වාසීන් නැවතත් උදව් කිරීමට දුවගෙන ආ අතර, තරුණ එඬේරා ඔවුන්ට සිනාසෙමින් සිටිනු දුටුවේ මෙවරත් වෘකයාගේ කතාව බොරුවක් වූ බැවිනි. තුන්වෙනි දවසේ, තරුණයා විසින් "වෘකයෙක්! වෘකයෙක්! වෘකයා බැටළුවන් කනවා! කරුණාකර උදව් කරන්න එන්න! " පැවසූ නමුත් කිසිවෙකු අවධානය යොමු නොකළේ එය තවත් බොරුවක් බව ඔවුන් සිතූ නිසාය. එදින වෘකයා ඇවිත් බැටළුවන් කන්නට විය! තරුණ එඬේරාට ගොඩක් දුක් වූ නමුත් ඔහුට හොඳ පාඩමක් ඉගෙන ගන්නට හැකි විය. අපි බොරු කිව්වොත් අපේ දෙමාපියන්, අපේ සහෝදර සහෝදරියන්, අපේ යාළුවෝ කවුරුවත් අපි කියන දේ ඒක ඇත්ත වුවත් විශ්වාස නොකරන දවසක් පැමිණේ!*

### E. ක්‍රීඩාව "ස්පර්ශ දුරකථනය"

ඉහත කතාන්දරය පැවසීමෙන් පසු, ඔබට සිසුන්ට ක්‍රීඩාවක් කිරීමට හැකි වනු ඇත. ඔවුන්ට පේළියක සිටගෙන සිටින ලෙස පවසන්න.

ඔවුන් සියල්ලෝම එකම දිශාවට මුහුණ දී සිටිය යුතු අතර, අවසාන සිසුවා බිත්තියක හෝ ගසක එල්ලා ඇති කඩදාසි කැබැල්ලක් දෙස හෝ හැකි නම් කළු ලෑල්ලක් දෙස බලා සිටිය යුතුය. ලිවීම සඳහා ඔහුට හෝ ඇයට යම් උපකරණයක් අවශ්‍ය වේ. ළමයින් බොහෝමයක් සිටී නම් පේළි එකකට වඩා සංවිධානය කළ හැකිය.

දැන්, ඔබේ ඇඟිල්ල භාවිතා කරමින්, පළමු සිසුවාගේ පිටුපස යමක් අඳින්න, ඔහු එය දෙවන සිසුවාගේ පිටුපසට ඇඳිය යුතුය. දෙවන දරුවා එය තුන්වන දරුවාගේ පිටේ ඇඳිය යුතු අතර එලෙස එය කඩදාසි කැබැල්ලක හෝ කළු ලෑල්ලක ඇඳින අවසන් දරුවා වෙත ළඟා විය යුතුය. දැන් ඔබ පළමු සිසුවාගේ පිටේ අඳින ලද චිත්‍රය ඒ අසලින් ඇඳිය යුතුය. සෑම ළමයෙකුට අනුකරණය කළ හැකි වන පරිදි ඔබගේ චිත්‍රය සරල එකක් විය යුතුය.

### F. වර්ණ ගැන්වීම : 4 වැනි චිත්‍රය

ඊළඟ ක්‍රියාකාරකම ලෙස ළමයින්ට වර්ණ ගැන්වීම සඳහා 4 වැනි චිත්‍රයේ පිටපත් ඔබට සුපුරුදු පරිදි ළමයින් අතර බෙදා දෙන්න.

### G. අවසන් කිරීමේ යාඥාව

සෑම අවස්ථාවකදීම උද්ධෘත පාඨයන් සහ යාඥාවන් ගායනා කරන අතරතුර ළමයින්ට නිශ්ශබ්දව වාඩිවන ලෙස පවසා යාඥාවන් අවසන් වීමෙන් පසු පන්තිය අවසන් කරන්න.

## 5 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

මේ පාඩම සහ මීළඟ පාඩම් තුන සඳහා ඔබ කටපාඩමින් දන්නා වෙනත් යාඥාවක් ගායනා කිරීමෙන් පන්තිය ආරම්භ කළ හැකි අතර මෙම අරමුණ සඳහා 6 වැනි කොටසේ යෝජනාවක් ඉදිරිපත් කර ඇත. ළමයින් කිහිප දෙනෙකු ඔබ සමඟ එක්ව ආරම්භ යාඥාව ගායනයෙන් පසු ඔවුන්ට නටපාඩම් කිරීම සඳහා පහත යාඥාව හඳුන්වා දිය හැක. මෙම පාඩම තුළ දී ඔවුන්ට අවම වශයෙන් එයින් කොටසක් හෝ කටපාඩම් කරගැනීමටත් 8 වැනි පාඩම දක්වා පැමිණි පසු සම්පූර්ණ යාඥාවම කටපාඩම් කරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**"අනේ දෙවියනි, මට මඟ පෙන්වන්න, මා ආරක්ෂා කර, මා දීප්තිමත් පහනක් සහ බැබළෙන තරුවක් කරන්න. ඔබවහන්සේ බලවත් සේක. ශක්තිධර සේක."**[103]

## B. ගීත ගායනය

මෙම කොටසේදී, ළමයින්ට පහත සඳහන් ගීතය ඉගැන්වීමට අමතරව, ඔවුන් දැනටමත් දන්නා වෙනත් ගීත ඔවුන් සමඟ ගායනා කළ හැක.

තයාගශීලී භාවයේ උල්පත

C
උප්පතක් වන්න, වසන්තයක් වන්න

C G
සැම දාම ගලා යන්න

F C
ඔබ කරනවා නම් එය සත්‍යයකි

Dm7 G7 C
සතුට ඔබ වෙත එන බව

F C
ඔබගේ හදවතින් සැමදා සොයන්න

D7 G7
යමක් ඔබට දිය හැකි දැයි

සතුට ඔබගේ අරමුණ කරගන්න
ඔබගේ හදවත් ඔබගේ ආත්මයත් දෙන්න
එය සත්‍යයකි ඔබ කලහොත්
දෙවියන් සමැවිට ඔබ ළඟ බව
ඔබගේ හදවතින් සැමදා සොයන්න
යමක් ඔබට දිය හැකි දැයි

සතුට ඔබගේ අරමුණ කරගන්න
ඔබගේ හදවත් ඔබගේ ආත්මයත් දෙන්න
එය සත්‍යයකි ඔබ කලහොත්
දෙවියන් සමැවිට ඔබ ළඟ බව

## C. උද්ධෘත පාඨය කටපාඩම් කිරීම

පහත අදහස් පාඩමේ තේමාව සහ ළමයින් කටපාඩම් කරන උද්ධෘත පාඨය හඳුන්වා දීමට ඔබට උපකාරී වනු ඇත.

> දෙවියන්වන්හන්සේ උන්වහන්සේගේ නිර්මාණය වෙත ඉතාම ත්‍යාගශීලිය. උන්වහන්සේ වැසි මඟින් ශාකවලට ජලටද මිනිසුන්ට සහ සතුන්ට ආහාර සහ පෝෂණයද ලබා දේ. උන්වහන්සේ අප සැවොම ආරක්ෂ කරති. කඳු, ගංඟා, තරු සහ අප අවට ඇති සැම සුන්දරත්වයක්ම දැකීමට අපගේ ඇස් සහ මිහිරි ගීත, කුරුළු නාද, අපගේ දෙමාපියන්ගේ උපදෙස් සහ දෙවියන්වහන්සේගේ වචනයන්ට සවන් දීමට අපගේ කන් වැනි බොහෝ ත්‍යාග අපට ලබාදී ඇත. උන්වහන්සේ අපට විශ්වයේ අභිරහස් ගැන ඉගෙන ගත හැකි බුද්ධිය ලබා දී ඇති අතර, ඒ සියල්ලටම වඩා, අපට උන්වහන්සේව දැන ගැනීමට සහ ප්‍රේම කිරීමට හැකි අධ්‍යාත්මික බලයන් ඔහු අපට ලබා දී ඇත. දෙවියන් වහන්සේ අප සමඟ ත්‍යාගශීලී වන්නා සේම අප අන් අයට ත්‍යාගශීලී විය යුතුය. අන් අයගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අප සතුව ඇති අපගේ ආහාර,

අපගේ දේපළ, අපගේ කාලය, අපගේ දැනුම වැනි දෑ ලබා දිය යුතුය. අපි අපේ ආදරය, ප්‍රීතිය සහ අපි නිවසේදී සහ පාසැලේදී ඉගෙන ගන්නා හොඳ දේවල් බෙදා හදා ගත යුතුයි. ත්‍යාගශීලී වීම සඳහා වූ අපගේ උත්සාහයන්ට අපට උපකාරීවීම සඳහා, දෙවියන් වහන්සේගේ ත්‍යාගශීලී බව අපට මතක් කර දෙන බහා'උ'ල්ලා තුමාගේ මෙම උපුටා දැක්වීම කටපාඩම් කරගනිමු:

**"දීම සහ පරිත්‍යාගශීලී භාවය මාගේ ගුණාංගයන් වන අතර මාගේ ගුණාංගයන්ගෙන් සැරසෙන්නාට යහපතක්ම වේ."[104]**

*ත්‍යාගශීලී බව*

1 රාම් සහ රාජීෂ් සුළු මුදලක් ඉතිරි කර ඇත. ඔවුන් තම බාල සහෝදර සහෝදරියන්ට පොත් කිහිපයක් මිලදී ගැනීමට තීරණය කරයි. රාම් සහ රාජීෂ් ත්‍යාගශීලී වෙති.

2 මර්ෆි මහත්මිය මුළු උදෑසනම කේක් පිළිස්සීමේ නිරත වූවාය. ඒවා නගරයට ගෙන ගොස් විකිණීමට පෙර ඇය විශාල කේක් දෙකක් අසල්වැසියන්ට ලාබදුන්නාය. මර්ෆි මහත්මිය ත්‍යාගශීලිය.

*ගුණාංග*

1. ගල් ඉතා දැඩිය. දැඩි බව ගලෙහි ගුණාංගයකි.

2. "ඔබගේ එක් ගුණාංගයක් වන්නේ වෙහෙස මහන්සිවී වැඩ කිරීමයි" ගුරුවරයා චාර්ලීන්ට පැවසීය.

*සැරසීම*

1 අද රාත්‍රියේ ප්‍රජා මධ්‍යස්ථානයේ ආධ්‍යාත්මික රැස්වීමක් ඇත. රැස්වීම් ශාලාවේ තැබීමට ළමයින් මල් නෙළා ගත්හ. කාමරය මල් වලින් සරසා ඇත.

2 ලී ෆෙන්ග් දීප්තිමත් සිනහවක් ඇත. බොහෝවිට ඔහුගේ මුහුණ සිනහවෙන් සැරසී ඇත.

## D. කතාන්දරය

මෙම පාඩමේදී, ත්‍යාගශීලී බව සංකල්පය සමාලෝචනය කිරීමේදී ඔවුන්ට උපකාරී වන පහත කතාන්දරය ඔබ විසින් ළමයින්ට පවසනු ඇත.

*තම පියා වන බහා'උ'ල්ලා තුමාට අයත් බැටළුවන් රැකබලා ගන්නා පුද්ගලයා විසින් එඬේරුන් සමඟ ගම්බද ප්‍රදේශයේ දවසක් ගත කරවීම සඳහා අබ්දුල් බහාතුමාට ආරාධනා කරන ලදි. එකල අබ්දුල් බහාතුමා කුඩා දරුවෙකු වූ අතර, මෙය බහා'උ'ල්ලා තුමාට සහ එතුමාගේ පවුලේ අයට කම මව්බිම අතැර යෑමට බලකිරීමට බොහෝ කලකට පෙර සිදුවිය. බහා'උ'ල්ලා තුමාට කඳුකර ප්‍රදේශයේ විශාල ඉඩමක් සහ විශාල බැටළු රංචුවක් තිබුණි. එතුමාගේ මවගේ කැමැත්ත ඇතිව අබ්දුල් බහාතුමා එඬේරුන් වෙත ගිය අතර එහිදී ගීත ගායනයෙන්, නැටමින් සහ අලංකාරවත් උත්සවයක් ආකාරයෙන් ඔවුන් අපූරු දවසක් ගත කරන්නට විය. දවස අවසන් වී අබ්දුල් බහාතුමා පිටත්ව යාමට සූදානම් වූ විට, එඬේරුන් සියල්ලෝම එතුමා වටා රැස් වී සමුදීමේ කතා පැවැත්වන්නට විය. මෙවැනි අවස්ථාවක් අවසානයේදී ඉඩම සහ බැටළු රැළ හිමි අය විසින් එඬේරුන්ට ත්‍යාගයක් පිරිනැමීම සිරිතක් බව අබ්දුල් බහාතුමා සමඟ පැමිණි අයෙකු පවසන ලදි. අබ්දුල් බහාතුමා මඳ වේලාවකට නිහඬ වූහ. එතුමාට ඔවුනට දීමට කිසිවක් නොතිබූ නමුත් එඬේරුන් යමක් බලාපොරොත්තු වන බව එම පුද්ගලයා තරයේ කියා සිටින්නට විය. එවිට අබ්දුල් බහාතුමාට අදහසක් පහළවී එඬේරුන් විසින් බලාකියා ගන්නා බැටළු රැලෙන් බැටළුවන් කිහිප දෙනෙකු ඔවුන්ට ලබාදුන්හ. එඬේරුන් කෙරෙහි අබ්දුල් බහාතුමාගේ ත්‍යාගශීලී සිතුවිලි ගැන දැනගත් විට බහා'උ'ල්ලා තුමා මහත් සේ සතුටු විය. එතුමා සිනහ සෙමින් ප්‍රකාශ කළේ, අබ්දුල් බහාතුමා කවදා හෝ ඔහුව පරිත්‍යාග කරනු ඇති බැවින්, සෑම කෙනෙකුම එතුමා හොඳින් රැකබලා ගැනීම වඩා හොඳ බවයි. ඇත්ත වශයෙන්ම, අබ්දුල්*

*බහාතුමා එතුමාගේ ජීවිත කාලය පුරාම කළේ මෙයයි. එතුමා සතුව තිබූ සෑම දෙයක්ම, එතුමාගේ ජීවිතයේ සෑම මොහොතක්ම, මනුෂ්‍යත්වයටත් අපව එක්සත් සේසත් කිරීමට සහ අපට සත්‍ය ප්‍රීතිය සඳහා පරිත්‍යාග කළේය.*

### E. ක්‍රීඩාව "නිවුන් දරුවන්"

කතාන්දරයන් සඳහා වූ කාලපරිච්ඡේදයෙන් පසු සෑමවිටම මෙන් ළමයින් ක්‍රීඩාවන් සඳහා යොමු වනු ඇත.

ඔවුන් යුගල වශයෙන් බෙදන අතර තුරු එකට වැඩ කිරීමට එකම උසකින් යුත් දරුවන් එක්ව තැබීමට හැකි තරම් උත්සාහ කරන්න. සෑම යුගලකම අයට එකිනෙකාට පිටුපස හරවා සිට පහත්වවන ලෙස දන්වන්න. ඉන්පසු වැලමිටෙන් එකිනෙකා අත්බැඳගෙන සිට ගැනීමට උත්සාහ කරන ලෙස ඉල්ලා සිටින්න. ඔවුන්ට එය සාර්ථකව නිම කිරීමට හැකිවීමෙන් පසු ළමයින් තුන් හතර දෙනෙකුගේ කණ්ඩායම් ලෙස සකස් කර මෙම ක්‍රියාකාරකමම සිදු කිරීමට උත්සාහ කරන්න.

### F. වර්ණ ගැන්වීම : 5 වැනි චිත්‍රය

අවසන් ක්‍රියාව ලෙස 5 වැනි චිත්‍රය වර්ණ ගැන්වශී සඳහා එහි පිටපත් සෑම ළමයෙකුටම බෙදා දෙන්න.

### G. අවසන් කිරීමේ යාඥාව

සුපුරුදු පිරිදි ඔබ සහ ළමයින් කිහිප දෙනෙකු විසින් ගායනා කරනු ලබන යාඥාවන්ගෙන් සහ උද්ධෘත පාඨයන්ගෙන් පන්ති ය අවසන් කරන්න.

## 6 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

ඔබ සහ සිසුන් කිහිප දෙනෙකු ආරම්භක යාඥාවන් ගායනයෙන් පසු, 5 වන පාඩමේ හඳුන්වා දී ඇති යාඥාව දිගටම ඉගෙන ගැනීමට දරුවන්ට උපකාර කළ හැකිය.

### B. ගීත ගායනය

ඊළඟ ක්‍රියාකාරකම ලෙස, පාඩමේ තේමාවට අදාළ පහත ගීතය ගායනා කිරීමට ළමයින්ට උගන්වන්න. ඔවුන් විශේෂයෙන් රසවිඳින තවත් කිහිපයක් ගායනා කළ හැකිය.

ඔබගේ සහොදරයාට මුල්තැන දෙන්න

C G/B Am7 C
මට තිබහයි, මට තිබහයි

Dm G C Am7
නමුත් මාගේ සහෝදරයාට මුල්තැන දිය යුතුයි

F Em Dm C
එහෙයින් මම ඔහුට දුන්නා

Dm G C
ඔහුගේ පිපාසය සංසිඳුවීමට

සමූහ ගායනය:
F G C Am
තම සහෝදරයාට මුල්තැන දීම ආශිර්වාදයකි

F G C Am
ඔබගේ ඒකවරනය පෙන්වීමේ මාර්ගය මෙයයි

F G C Am
තම සහෝදරියට මුල්තැන දීම ආශිර්වාදයකි

F G C
ඔබ පොහොසත් නම් වැඩියෙන් බෙදහදා ගන්න

මට බඩගිනි, මට බඩගිනියි
මාගේ සහෝදරියටත් එසේමයි
එහෙයින් මගේ ආහරයෙන් කොටසක් ඇයටත් දුන්නා
සිදු විය යුත්තේ එලෙසයි

සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම පාඩමේදී ළමයින් විසින් බහා'උ'ල්ලා තුමාගේ ලේඛණවලින් උපුටා ගන්නා ලද පරාර්ථකාමීත්වය පිළිබඳ වූ උද්ධෘත පාඨයක් ඉගෙන් ගනු ඇත. මෙම තේමාව ඔබට පහත පරිදි ඉදිරිපත් කළ හැක.

> දෙවියන් වහන්සේ අප සෑම කෙනෙකුටම ප්‍රේම කරන අතර, උන්වහන්සේ දැන ගැනීමට සහ උන්වහන්සේට ප්‍රේම කිරීමට උන්වහන්සේ මිනිස් හදවත නිර්මාණය කර ඇත. අපගේ හදවත් නිර්මල වූ විට, දෙවියන් වහන්සේගේ නිර්මාණයන් තුළ දෙවියන්ගේ සලකුණු පිළිබිඹු වන අපට දැකගත හැකිය. උන්වහන්සේගේ ත්‍යාගශීලී බව, කරුණාව, දයාව අපි දකිමු. දෙවියන්වහන්සේ කෙරෙහි අපගේ ඇති ආදරය තුලින් අපගේ දෙමාපියන්, අපගේ සහෝදර සහෝදරියන්, අපගේ මිතුරන් සහ අපගේ අසවැසියන් යන සියල්ලටම ප්‍රීතිය සහ සතුට ගෙනඒම අපට අවශ්‍ය වේ. අන් අයට ප්‍රීතියට පත්වීමෙන් අප වඩා සතුටට පත්වීම සහ ඔවුන්ගේ සුවපහසුව අපට ඉහළින් තැබීමෙන් අපගේ ආදරය වඩාත් විශිෂ්ට වේ. එසේනම් අප අප ගැන සිතීමට පෙර අපගේ සහෝදර මිනිසුන් ගැන සිතිය යුතුය. බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු.
>
> **"තමාට ඉහළින් තම සහෝදරයා සලක තැනැත්තා ආශිර්වදලත් වෙති."**[105]

*ආශිර්වාදය*

1 අමේලියාගේ මව ඇයට කඩයට ගොස් භාණ්ඩ පහක් මිළදී ගන්නා ලෙස පැවසුවාය. එය මතක තබාගැනීමට සඳහා ඇය ලැයිස්තුවක් සදා නොගත් නමුත් කිසිවක් අමතක නොකර මිලදී ගත්තාය. අමේලියාට මතක ශක්තියේ ආශිර්වාදය ඇත.

2 වික්ටර්ගේ පවුලේ අය සෑම උදෑසනකම එක්ව යාඥාවන් සිදු කරයි. වික්ටර්ගේ නිවැසියන්ට දෙවියන්වහන්සේ සිහි කිරීමේ ආශිර්වාදය ලැබී ඇත.

*කැමැත්ත*

1 අනුෂ්කාගේ ආච්චි මින්ට් තේ සහ ලෙමන් තේ දෙකටම කැමතියි, නමුත් ඇයට තේරීමක් සිදු කිරීමට ඇති විට, ඇය මින්ට් තේ තෝරා ගනී. ඇය මින්ට් තේ වලට වැඩි කැමැත්තක් දක්වයි.

2 විඑස්නා එළියට ගොස් සෙල්ලම් කිරීමට හෝ ඇයගේ පියාගේ ගෙවත්තේ වැඩවලට උදව් කළ හැකිය. ඇය පියාට උපකාර කිරීමට තීරණය කළාය. විඑස්නා පියාට උදව් කිරීමට වැඩි කැමැත්තක් දක්වයි.

## D. කතාන්දරය

පහත කතාන්දරයෙන් අපට පෙන්නුම් කරන්නේ අබ්දුල් බහාතුමාගේ වචන සහ ක්‍රියාව යන දෙකෙන්ම එතුමා අපට පරාර්ථකාමීත්වයේ මාර්ග පෙන්වා දෙන ආකාරයයි.

*අබ්දුල් බහාතුමා තමන්ට අවශ්‍ය ඇඳුම් මිලදී ගැනීමේදී මිල අඩු ඇඳුම් ගැනීමට වඩා කැමතිය. අබ්දුල් බහාතුමාට වඩා වැදගත්වූයේ උපරිම පිරිසිදුවෙන් සිටීමයි. උන්වහන්සේට අමතර ඇඳුම් තිබෙන විට, උන්වහන්සේ ඒවා නිතරම අන්‍යයන්ට දුන් පරිත්‍යාග කරන ලදි. දිනක් එතුමා ඇකා නගරයේ ආණ්ඩාකාරවරයාට සංග්‍රහ කිරීමට සූදානමින් සිටන ලදි. එතුමාගේ ලෝගුව මෙම විශේස අවස්ථාව සඳහා සුදුසු නොවන බව එතුමාගේ බිරිඳ සිතන්නට විය. ප්‍රමාණවත් කාලයක් ඇතිව ඇය ඇඳුම් මසන්නා වෙත ගොස් අබ්දුල් බහාතුමාට ලෝගුවක් ඇණවුම් කරන්නට විය. ආණ්ඩුකාරවරයා පැමිණෙන දිනයෙද් එතුමා වෙනුවෙන් නව ලෝගුව තබා තිබුණි. නමුත් අබ්දුල් බහාතුමා පැරණි ලෝගුව සොයන්නට විය. මෙවැනි මිළ අධිත ලෝගුවක් එතුමාගේ විය හැක්කේ කෙසේද? එම මුදලටම සාමාන්‍ය ලෝගු පහක් ලබාගත හැක. "එතකොට ඔබට ජේනවද? මට අලුත් ලෝගවක් ලැබෙනව විතරක් නෙමෙයි තව හතරක් අනෙක් අයටත් දෙන්න පුළුවන්" යනුවෙන් එතුමා තම බිරිඳට පැවසීය.*

## E. ක්‍රීඩාව "ගොළුබෙල්ලා"

ඊළඟ ක්‍රියාකාරකම සඳහා, ඔවුන් ගොළුබෙල්ලෙකු වීමට යන බව දරුවන්ට පවසන්න. එය සාර්ථක වීමට නම්, ඔවුන් පේළියක සිටිය යුතුය, අත් අල්ලාගෙන, යන්නට ඉඩ නොදිය යුතුය. එක් කෙළවරක සිටින පුද්ගලයා කේන්ද්‍රය වනු ඇත, ඔහු හෝ ඇය ඉතා නිශ්චලව සිටිය යුතුය. අනෙක් අන්තයේ සිටින ළමයා මධ්‍යයේ සිටින ළමයා වටා ගමන් කිරීමට පේළියේ සිටින අනෙක් සියල්ලන්ට මඟ පෙන්විය යුතුය. ටිකෙන් ටික ඔවුන් ගොළුබෙල්ලෙකු සෑදීමට සර්පිලාකාරව ගමන් කළ යුතුය.

ඉහත ක්‍රීඩාවට විකල්පයක් ලෙස ළමයින්ට අත් අල්ලාගෙන නැවත පේළියක සිටගන්නා ලෙස පවසන්න. එක් අන්තයක සිටින ළමයෙකුට අනෙක් අය ඔහු හෝ ඇය වටා කැරකවෙන ලෙසින් රවුමට ගමන් කරන ලෙස ඉල්ලා සිටින්න. එසේ කරනවිට අනෙකුත් අයගේ කකුල් නොපැගීමට වගබලා ගන්න.

ළමයින් විසින් ගොළුබෙල්ලා සෑදීමෙන් පසු, කාලය ඇත්නම්, මැද සිටින ළමයින්ට නැමෙන් ලෙස පවසා එහි කේන්ද්‍රයේ සිටින ළමයාට තමන් අසල සිටින අනෙකුත් ළමයින්ගේ දැත් යටට යන ලෙසත් එලෙස ගොළුබෙල්ලාගෙන් පිටතට පැමිණෙන තුරු අත් යටින් පැමිණෙන ලෙසත් දන්වන්න.

## F. වර්ණ ගැන්වීම : 6 වැනි චිත්‍රය

## G. අවසන් කිරීමේ යාඥාව

# 7 වැනි පාඩම

## A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

ඔබ සහ යෞවනයින් ආරම්භ යාඥා මෙහෙය සිදු කිරීමෙන් පසු, 5 වැනි පාඩමේදී ඔවුන් කටපාඩම් කිරීමට ආරම්භ කරන ලද යාඥාව ඔවුන් සමඟ සමාලෝචනය කළ හැක.

## B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචන ඇතුළත්ව)

සතුටට අපට පියාපත් ලබා දෙයි

D A D G D
සතුටට පියඹ යැමට අපට පියාපත් ලබාදෙයි, සතුටට අපට පියාපත් ලබා දෙයි

D A D A D
සතුටට පියඹ යැමට අපට පියාපත් ලබාදෙයි, සතුටට අපට පියාපත් ලබා දෙයි

A D
ප්‍රීතිමත් කාලවලදී අපගේ ශක්තිය බලයෙන් වැඩි වේ

A D
ප්‍රීතිමත් කාලවලදී, අපගේ බුද්ධිය ඉහළට යයි

A D
ප්‍රීතිමත් කාලවලදී, අපගේ අවබෝධය දීප්තිමත් වේ

D A D A D
සතුටට පියඹ යැමට අපට පියාපත් ලබාදෙයි, සතුටට අපට පියාපත් ලබා දෙයි

Dm A7 Dm A7 Dm
නමුත් දුක අප වෙත පැමිණෙවිට, දුක අප වෙත පැමිණෙනවිට

A Dm A Dm
අප දුර්වල වේ, අපගේ ශක්තිය ඉවතට යයි

A Dm A Dm
අපගේ තීක්ෂණ බුද්ධිය හීනවී, අපගේ සිතුවිලි දැවීයයි

A7
ඒ කෙසේ වෙතත්

සතුටට පියඹ යැමට අපට පියාපත් ලබාදෙයි, සතුටට අපට පියාපත් ලබා දෙයි
සතුටට පියඹ යැමට අපට පියාපත් ලබාදෙයි, සතුටට අපට පියාපත් ලබා දෙයි

ප්‍රීතිමත් කාලවලදී අපගේ ශක්තිය බලයෙන් වැඩි වේ
ප්‍රීතිමත් කාලවලදී, අපගේ බුද්ධිය ඉහළට යයි
ප්‍රීතිමත් කාලවලදී, අපගේ අවබෝධය දීප්තිමත් වේ
සතුටට පියඹ යැමට අපට පියාපත් ලබාදෙයි, සතුටට අපට පියාපත් ලබා දෙයි

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

ප්‍රීතියේ තේමාව අරමුණු කරගත් මෙම පාඩමේදී ළමයින් විසින් කටපාඩම් කරගත යුතු උද්ධෘත පාඨය ඉදිරිපත් කිරීම සඳහා පහත දෑ ඔබට උපකාරී වනු ඇත.

අබ්දුල් බහාතුමා අපට පවසන්නේ ප්‍රීතිය අපට පියාපත් ලබා දෙන බවත්, ප්‍රීතියෙන් සිටින විට අප ශක්තිමත් වන බවත්, සතුටින් සිටින විට අප ඉක්මනින් තේරුම් ගන්නා බවත්ය. ප්‍රීතිය මිනිස් හදවතේ ඇති ගුණාංගයකි. ප්‍රීතියෙන් පිරුණු හදවත් තුළින් ආදරණීය දෙමාපියන්ගේ ආශීර්වාදය, මිත්‍රත්වයේ ආශීර්වාදය සහ, සියල්ලටත් වඩා, උන්වහන්සේව දැන හඳුනා ගැනීමට

සහ උන්වහන්සේට ප්‍රේම කිරීමට ඇති ආශීර්වාදය ආදී අප අවට සෑම තැනකම දෙවියන් වහන්සේගේ ආශීර්වාද අපට දැකගත හැක. අපි සියලු තත්වයන් යටතේ සතුටින් හා ප්‍රීතියෙන් සිටිය යුතු අතර අන් අයට ප්‍රීතිය ගෙන දීමට අපගේ උපරිමය කළ යුතුය. අබ්දුල් බහාතුමාට අවශ්‍ය වන්නේ සියළුම ළමයින් සෑම තැනකම ප්‍රීතියේ ආලෝකය විහිදුවන දීප්තිමත් පහන් මෙන් බැබළීමටයි. අප සැමවිටම ප්‍රීතියෙන් සිටිය යුතු බව මතක තබා ගැනීමට උපකාර කිරීම සඳහා පහත සඳහන් උද්ධෘත පාඨය කටපාඩම් කරමු.

**"එම්බා මනුෂ්‍ය පුත්‍රය! ඔබට මා මුණගැසීමට සහ මාගේ සුන්දරත්වය පිළිබිඹු කිරීමටත් හැකිවීමට යෝග්‍ය පරිදි ඔබගේ හදවතේ ප්‍රීතියෙන් සන්තොෂයට පත්වන්න."[106]**

*සන්තෝෂයට පත්වන්න*

1 රොනාල්ඩ් ඔහුගේ ආච්චි සහ සීයාගේ නිවසින් බොහෝ දුර ජීවත්වේ. පාසල් නිවාඩු කාලයේදී ඔවුන් බැලීමට යන බව ආරංචිවීමෙන් ඔහු බොහෝ සතුටට පත්විය. ඔහුගේ හදවත සන්තෝෂයට පත්විය.

2 මවුෂ්ගන් ඇගේ මවට සහ ඇගේ පියාට ඔවුන්ගේ ගෙවත්තේ පිපිඤ්ඤා බීජ සිටුවීමට උපකාර කළාය. පළමු කුඩා පිපිඤ්ඤා පෙනෙන්නට පටන්ගත් විට ඇගේ හදවත සන්තෝෂයට විය.

*යෝග්‍ය*

1. ස්ජෝනා ඉතා වෙහෙස මහන්සි වී ඉගෙන ගත් අතර විශිෂ්ට ලකුණු ලබා ගත්තාය. ගුරුතුමිය ඇගේ කඩිසරකම සහ වෙහෙස මහන්සි වී වැඩ කිරීම අගය කළාය. ස්ජෝනාගේ වෙහෙස මහන්සි වී වැඩ කිරීම ගුරුවරයාගේ පැසසුමට යෝග්‍ය විය.

2. ඩේවිඩ් නිතරම තම සහෝදර සහෝදරියන්ව හොඳින් රැකබලා ගත්තා. දරුවන් ඔහු සමඟ සිටීම විශ්වාස කළ හැකි බව ඔහුගේ දෙමාපියන් දැන සිටියහ. ඩේවිඩ් ඔහුගේ දෙමාපියන්ගේ විශ්වාසයට සුදුසු විය.

*පිළිබිඹු කරනවා*

1. අමාරි තමා සොයාගත් ගල ඉතා දිලිසෙන තෙක් ඔප දැමූ අතර එය ආලෝකය පරාවර්ථනය කිරීමට පටන් ගත්තේය

2. පවිත්‍ර හදවත දෙවියන්වහන්සේගේ ගුණාංගයන් පිළිඹිබු කරයි.

*සුන්දරත්වය*

1. ඉලානාගේ මව අහසේ පියාසර කරන කුරුල්ලන්, මල් පිපෙන ආකාරය සහ සාගර රළ වෙරළට පෙරළෙනු දැකීමෙන් සතුටක් ලබයි. ඇය සොබාදහමේ සුන්දරත්වය දකියි.

2. විටෙක අපගේ නෙතට කඳුලක් ගෙන එන තරම් ගීතයක සුන්දරත්වයෙන් අප හදවත් ස්පර්ශ කරයි.

3. මුනීර් යාඥා කරන සෑම විටම, දෙවියන් වහන්සේගේ සුන්දරත්වය, උන්වහන්සේගේ ආදරය, උන්වහන්සේගේ ත්‍යාගශීලීත්වය සහ උන්වහන්සේගේ ප්‍රඥාව සිහිපත් කරයි.

## D. කතාන්දරය

අබ්දුල් බහාතුමා එතුමා අවට සිටි අයගේ සිත්වලට සතුට ගෙන දුන් ආකාරය පහත කතාවෙන් ළමයින්ට පැහැදිලි වනු ඇත.

*ලිරෝයි ලොආස් කැපී පෙනෙන බහායිවරයෙකු වූ අතර ඔබ වයසින් වැඩත්ම ඔහු පිළිබඳ බොහෝවිට ඉගෙනගනු ඇත. 1912 ගුරුතුමාණන් චිකාගෝ නගරයට යනවිට ඔහු කුඩා පිරිමි ළමයෙකි. අබ්දුල් බහාතුමා ඉදිරියේ සිටීමට අවස්ථාව ලැබීමෙන් මෙම ආධ්‍යාත්මික දරුව කෙතරම් උද්‍යෝගිමත්වූයේ දැයි ඔබට සිතාගත හැකිද? දිනක්, ඔහු සහ ඔහුගේ පියා*

*ගුරුතුමාණන් නවාතැන් ගෙන සිටි හෝටලයට යමින් සිටියදී, ලිරෝයිට ඔහු අබ්දුල් බහාතුමාට මල් කිහිපයක් රැගෙන යාමට අවශ්‍ය බව තීරණවූ අදහසක්ළ විය. ඔහු අත තිබුණු සුළු මුදලින් ලස්සන සුදු කාර්නේෂන් මල් කළඹක් මිලදී ගැනීමට ඔහු සමත් විය. නමුත් ඔවුන් හෝටලය අසලට ළඟා වනවිට ඔහුගේ අදහස වෙනස් විය. ගුරුතුමාණන්ට කිසිදු භෞතික දෙයක්, අවම වශයෙන් ලස්සන මල් හෝ දීමට අවශය නොවන බව ඔහු තීරණය කළේය. ඔහුට තම හදවත එතුමාණන්ට පූජා කිරීම සිතුනි. ඔහුට පිරිනැමිය හැකිව තිබූ වටිනාම දෙය එයයි. එමනිසා ලිරොයිගේ පියා මල් ගෙනාවේ කවුරුන්ද යන්න සඳහන් නොකර අබ්දුල් බහාතුමාට මල් කළඹ ලබාදෙන ලදි.*

*පසුව අබ්දුල් බහාතුමා විසින් එතුමා මුණ ගැසීමට හෝටලයට පැමිණි මිතුරන් අමතා කතාවක් කළේය. එතුමාගේ කතාව අතරතුර ලිරොයි එතුමාගේ පාමුල වාඩි වී නිශ්ශබ්දව එතුමාගේ ප්‍රඥාවන්ත සහ ආදරණීය වචනවලට සවන් දුන්නේය. අවසානයේදී අබ්දුල් බහාතුමා නැගිට අමුත්තන්ට අතට අතදී තමන්ගේ ආදරයේ සංකේතයක් ලෙස සෑම කෙනෙකුටම සුදු කාර්නේෂන් මල බැගින් ලබාදුන්නේය. මේ අවස්ථාවෙදී ලිරෝයි ගුරුතුමාණන්ගේ පිටුපසින් සිටගෙන සිටන ලදි. "අනේ එතුමා පිටුපස හැරී මටත් ඒ මලක් දෙනවා නම්" යයි තරුණ ළමයා සිතන්නට විය. සමහරවිට එ.ුමාට අලංකාරවත් මල් ගෙනාවේ කවුරුන්දැයි ඇතත්වම ගුරුතුමාණන් දැනගන්නවාට ඔහුගේ හදවතේ ආශාව විය හැක. එහෙත් සුදු කාර්නේෂන් මල් එකින් එක අනෙක් මිනිසුන්ට ලැබුණ අතර ලිරෝයිට මලක් ලැබෙනු ඇතැයි සිකිය නොහැකි විය. එවිට හදිසියේම ගුරුතුමාණන් ලිරෝයි ලොආස් දෙසට හැරී එතුමාගේ බැල්ම ඔහු වෙත යොමු කළේය. එතුමාගේ මුහුණ ආදරයෙන් දිලිසුන අතර එතුමාගේ දෑස් කරුණාවෙන් පිරී තිබුණි. එතුමා ඔහුට සුදු කාරනේෂන් මලක් දුන්නාද? නැහැ. අබ්දුල් බහාතුමා ඔහුට ඊටත් වඩා වටිනා යමක් දෙන ලදි. එතුමා තමන්ගේ ලෝගුවේ රතු රෝස මලක් පැළඳ සිටියේය. එතුමා එය ගලවා කරුණයාට ලබා දෙන ලදි. ලිරෝයිගේ හදවත ප්‍රීතියෙන් පිනා ගියේය. ගුරුතුමාණන් තමන්ට සුදු කාර්නේෂන් මල් ගෙනාවේ කවුරුන්දැයි දැන සිටියේය.*

### E. ක්‍රීඩාව "මකරාගේ නැට්ට ඇල්ලීම"

ඊළඟ ක්‍රියාකාරකම ආරම්භ කිරීම සඳහා ළමයින් ඔවුන් ඉදිරියෙන් සිටින අයගේ උරහිස් හෝ ඉණ මත අත් තබාගෙන් පේළියකට සිටගත යුතුය. පේළියේ පළමු ළමයා මකරාගේ හිස වනු ඇත. පේළියේ අවසාන ළමයා මකරාගේ වලිගය වන අතර හිසෙන් බේරී සිටීම සඳහා දකුණට සහ වමට ගමන් කළ යුතුය. "යන්න" යන සංඥාව දෙන තෙක් මකරා කෙලින් සිටිය යුතුය. එක යෞවනයෙකු ගණන් කිරීම ආරම්භ කර "එක, දෙක, තුන යන්න" ලෙස සංඥාව ලබාදුන් පසු හිස වලිගය දෙසට දිව ගොස් එය අල්ලා ගැනීමට උත්සාහ කළ යුතුය. මුළු සිරුරම හිස සමඟ ගමන් කළ යුතු අතර නොකැඩී පැවතිය යුතුය. හිස වලිගය අල්ලා ගැනීමට සමත් වුවහොත් හෝ ඔහු හෝ ඇය එසේ කිරීමට පෙර ශරීරයට කැඩී ගියහොත් හිස වලිගය වන අතර පේළියේ ඊළඟ සිටින ළමයා හිස බවට පත්වේ. සෑම ළමයෙකුටම අවම වශයෙන් එක් වරක්වත් හිස සහ වලිගයවීමට අවස්ථාව ලැබෙන තෙක් ක්‍රීඩාව මේ ආකාරයෙන් දිගටම කරගෙන යා හැක.

### F. වර්ණ ගැන්වීම : 7 වැනි චිත්‍රය

### G. අවසන් කිරීමේ යාඥාව

## 8 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

සාමාන්‍ය ආකාරයෙන් කල්වේලා ඇතිව තෝරාගත් සිසුන් කිහිප දෙනෙකුට යාඥාවක් කටපාඩමින් ගායනා කරන ලෙස ඉල්ලා සිට එයින් පසු පන්ති ආරම්භ කළ හැක. එයින් පසුව ඔවුන් 5 වැනි පාඩමේදී ඉගෙන ගැනීමට ආරම්භ කරන ලද යාඥාව සමාලෝචනය කළ හැක.

**B.** **ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචන ඇතළත් කරන්න)**

සෑම අවස්ථාවකදීම

සමූහ ගායනය:

E A
අප සැමවිට ප්‍රකශයට පත්කළ යුත්තේ

B E A B
අපගේ සත්‍යවාදී බව සහ අවංකත්වයි

E A
අප සැමවිට ප්‍රකශයට පත්කළ යුත්තේ

B E A B
අපගේ සත්‍යවාදී බව සහ අවංකත්වයි (නැවත වරක් කියන්න)

E A B
මම කතා කරනවිට, මගේ හදවතේ ගැඹුරින් බෙදහදා ගමි

E A B
කාරුණික හා සත්‍ය වචන මාගේ කලාව වීමට මා ඉඩ දෙමි

E A B
අවංකකම කෙතරම් වටිනා වස්තුවක්ද

A E B E
පවිත්‍රත්වය සහ අවංක කව ලස්සන සංයෝගයකි

A E B E A E
අවංකකම කෙතරම් වටිනා වස්තුවක්ද

මම සේවය කරනවිට, මාගේ හද පතුලෙන්ම ලබාදෙමි
ආරම්භයට පෙර අදහස් පවිත්‍ර කර යාඥා කරමි
එයින් මාගේ ක්‍රියා තුලින් සත්‍ය ගොඩ නැගිය හැක
අවංකකම කෙතරම් වටිනා වස්තුවක්ද
අවංකකම කෙතරම් වටිනා වස්තුවක්ද

මම යාඥ කරනවිට මම මගේ හදවත් පතුලෙන් යාඥා කරමි
මම මාගේ දෑස් වසා දෙවියන්වහන්සේ සිහි කරමි
මාගේ අභිප්‍රායන් නොසිතමි, මාගේ අවශ්‍යතාවන් නොසිතමි
මගේ ක්‍රියාවෙන් අවංකකම බබළන්නේ කෙසේදැයි සිතමි
අවංකකම කෙතරම් වටිනා වස්තුවක්ද

සමූහ ගායනය (දෙවරක් නැවත කියන්න)

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

ඔබට පහත සඳහන් අදහස් මත අවධානය යොමු කරමින් පාඩමේ තේමාවට සම්බන්ධ කටපාඩම් කිරීමට යොමු කරන ලද උද්ධෘත පාඨය ඉදිරිපත් කළ හැක.

> අපගේ වචනයෙන් සහ ක්‍රියාවෙන් අපගේ හදවතේ ඇති දේ පිළිබිඹු වන විට, අපි අවංකකමේ ගුණාංගය පෙන්වමු. අවංකකම අපව අන් අය සමඟ අපගේ ගනුදෙනුවලදී සත්‍යවාදී සහ විශ්වාසවන්ත වීමට පොළඹවයි. අපි අවංකව කටයුතු කරන්න අවස්ථාවක් ලෙස අප කළ දෙයක් ගැන කණගාටු වන බව පවසන විට සහ අපගේ වැරදි නැවත නොකිරීමට අප සෑම උත්සාහයක්ම ගන්නා බව අපගේ හදවතින් සිතීම උදාහරණයක් ලෙස දැක්විය හැක. අන් අයට අපගේ හදවතේ පවිත්‍රත්වය අවබෝධ කරගෙන අප කෙරෙහි විශ්වාසය තැබිය හැක්කේ අපගේ අවංකභාවය තුළිනි. මෙම ගුණාංගයේ වැදගත්කම මතක තබා ගැනීමට අපට උපකාර කිරීම සඳහා, අපි අබ්දුල් බහාතුමාගේ පහත උද්ධෘත පාඨය කටපාඩම් කර ගනිමු:
>
> **"අපි සෑම අවස්ථාවකදීම අපගේ සත්‍යවාදී බව සහ අවංකත්වය ප්‍රකාශයට පත් කළ යුතුය...."[107]**

*ප්‍රකාශයට පත්කරනවා*

1. කසාබා මුහුදු වෙරළේ තිබී සොයාගත් සිප්පි කටුවේ මඩ පිරිසිදුකර එය සුමට සහ දිලිසෙන තෙක් ඔප දැමීය. ඔහු එය අවසන් කළ පසු සිප්පි කටුවේ සැබෑ සුන්දරත්වය ප්‍රකාශයට පත්විය.
2. හිරු නැඟී උදෑසන මීදුම පහව යන විට කඳුකරයේ තේජස ප්‍රකාශයට පත් විය.

*අවංකත්වය*

1. ලියෝගේ පන්තියේ මිතුරන් බොහෝ විට පාඩම් කරනවා වෙනුවට ක්‍රීඩා කරති. ඔවුන් පාසැලේදී හොඳින් ඉගෙන නොගනු ඇතැයි ලියෝ කනස්සල්ලට පත්ව, ඔවුන් සියල්ලන්ටම එකට පාඩම් කිරීමට යෝජනා කර ඔවුන් එකිනෙකාට ඉගෙන ගැනීමට උපකාර කළ හැකි ක්‍රම ගැන සිතීමට උත්සාහ කරයි. ලියෝ තම පන්තියේ මිතුරන් කෙරෙහි දක්වන සැලකිල්ල අවංකය.
2. රෝසා හැමදාම ගෙදරවැඩ කරන බවට ඇයගේ මවට පොරොන්දු විය. ඇයගේ දෙමාපියන් නැතිවට රෝසා තම ගදෙරවැඩවල ඇති පැවරුම් උනන්දුවෙන් සිදු කළාය. රෝසා ඇයගේ පොරොන්දුවට අවංක විය.

## D. කතාන්දරය

මෙම පාඩමේ ඔබ ළමයින්න්ට පවසන කතාන්දරය ඔවුන්ට අවංකකමේ ගුණාංගය තිබීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න ගැන සිතා බැලීමට සහ එය අඩු වන අවස්තාවන් පිළිබඳ සිතා බැලීමට ඔවුන්ට උපකාර කරයි.

> *දරුවන් කිහිප දෙනෙකු සිටින ස්වාමිපුරුෂයෙකුට සහ බිරිඳකට අයත් නිවසක් පිටුපස වසර ගණනාවක් පැරණි විශාල ගසක් තිබුණේය. ගස වැඩෙත්ම, එහි අතු ඉහළට හා පිටතට පැමිණ, පවුලේ අයගේ නිවසේ පිටුපසට සෙවන ලබාදුනි. ශීත ඍතුවේ එක් උදෑසනක පියා ගසයට පසුකරමින් යනවිට අසල්වැසියෙකු හමු විය. ඔවුන් ගමේ යන එන තැන් පිළිබඳ කතා කරන්නට විය. පසුව එම අසල්වැසිය විශාල ගස දෙස බලා "ඔබ දන්නවාද ඇත්තෙන්ම ඔබට මෙම දැවැන්ත ගස කපා දැමීමට දැන කාලය හරි. එය බොහෝ පුළුල්ව මෙන්ම මෙල්ලකල නොහැකි තරමට වැඩී ඇත." යනුවෙන් පැවසීය. එක් අත්තක් කැඩී ඔබේ වහලය මතට වැටුණොත් හෝ ඊටත් වඩා දරුණු ලෙස ඔබේ දරුවෙකු සෙවණෙහි සෙල්ලම් කරමින් සිටියදී ඔවුන්ගෙන් කෙනෙකු මතට කඩා වැටුනොත් ඔබ කුමක් කරන්නද? යනුවනේ පැවසූ අතර දෙදෙනා වෙන්වි ගිය පසු, මිනිසා විසින් තම අසල්වැසියාගේ උපදෙස් සලකා බලන්නට විය. ඔහුට මතක ඇති කාලයකට පෙර සිටම ගස මෙම ස්ථානයේ සිට ඇති අතර එයින් කිසිදු හානියක් සිදු නොවීය. එය ගිම්හානයේදී හොඳ සෙවනක් ලබා දුන් අතර ශීත ඍතුවේ කටුක සුළඟින් නිවස ආරක්ෂා කළේය. එය දැඩි හා ශක්තිමත් බවක් පෙනෙන්නට තිබුණි. "නමුත්, සමහර විට මගේ අසල්වැසියාගේ අදහස නිවැරදියි." මිනිසා තමාටම කියා ගත්තේය. "පෙනුම සමහර විට රැවටිය*

*හැකිය. ගස පෙනෙන තරම් ශක්තිමත් නොවේ නම් කුමක් කළ යුතුද? " යයි සිතා ඔහු එය කපා දැමීමට තීරණය කළේය.*

*එය ඔහුට දුෂ්කර කාර්යයක් වූයේ ගස ඉකා විශාල සහ බොහෝ අතු සහ ශාඛාවන් තිබූ අතරම සමහර ඒවා ඔහුටත් වඩා උස් විය. ඔහු ගස කපා අවසන් වනවිට ඔහුගේ අසල්වැසියා තම පුතුන් දෙදෙනා සහ කරත්තයක්ද සමඟ පැමිණියේය. "මට පේන විදියට ඔයා ගහ කපා දාන්න ගන්න තීරණය කරලා" අසල්වැසියා කීවේ එහි වූ දර ගොඩ දෙස බලමිනි. "මම හිතන්නේ ඔබට මෙම දර රැගෙන යාමට යමෙකු අවශ්‍ය වනු ඇත. සමහර විට අපට ඔබට උදව් කළ හැකිය. මම මගේ කරත්තය සහ මගේ පුතුන් දෙදෙනා රැගෙන ආවා, මේ සියල්ල ඔබගේ මිදුලෙන් ඉවත් කිරීමට අපි කැමතියි." පිළිතුරක් දෙන තුරු බලා නොසිටි පුතුන් දෙදෙනා කරත්තයට දර පටවන්නට පටන් ගත්හ. ඔවුන් පටවාගත් කරත්තය රැගෙන යද්දී, මිනිසා මෙතරම් කාලයක් තම නිවසට සෙවන ගෙන දුන් ගසේ කඳ මත වාඩි විය. අසල්වැසියා තම පවුලේ ආරක්ෂාව ගැන සැලකිලිමත් නොවූ නමුත් ශීත ඍතුවේ මාසවලදී ඔහුව උණුසුම් තබාගැනීමට අවශ්‍ය දර ලබාගැනීම ගැන සිතා කටයුතු කළ බව ඔහුට වැටහුණේය. "පෙනුම ඇත්ත වශයෙන්ම සමහර විට රැවටිලිකාර විය හැකිය," ඔහු සුසුමක් හෙළමින් පැවසීය. එදින එම පවුලට අලංකාරවත් ගස නැතිවීම පිළිබඳ විශාල කණගාටුවක් ඇති විය. නමුත් කණගාටුවට කරුණ නම්ටත් වඩා තම අසල්වැසි මිතුරාගේ විශ්වාසය නැති වූ අතර දෙවියන්වහන්සේගේ යහපත් සන්තුෂ්ටිය දිනා ගැනීමේ වරප්‍රසාදයද අහිමි කරගැනීමයි.*

## E. ක්‍රීඩාව "උණුසුම සහ සීතල"

එක් ළමයෙක් කණ්ඩායමෙන් වෙන් කර ඔහුගේ හෝ ඇයගේ ඇස් බැඳීමෙන් මෙම ක්‍රියාකාකරම ආරම්භ කළ හැක. අනෙකුත් ළමයින් කුඩා දෙයක් උදාහරණයක් ලෙස පැන්සලක් හෝ පාටකූරක් යම්කිසි ස්ථානයක සඟවා පළමු ළමයාගේ ඇස් බැඳුම ඉවත් කර සැඟවූ වස්තුව සොය ලෙස දන්වන්න. එම වස්තුවට ළඟාවන තරමට වඩා ශබ්ද නඟා අත්පොලසන් දීමෙන් අනෙක් අයට උදව් කළ හැක. දරුවා වස්තුව සඟවා ඇති ස්ථානයෙන් ඉවතට ගියහොත්, අත්පුඩි ගැසීමේ ශබ්දය වඩාත් අඩු කළ හැක. අත්පුඩි ගසනවා වෙනුවට වස්තුව සොයන ළමයා ඒයට ළංවන විට ළමයින්ට "උණුසුම්", "ගොඩක් උණුසුම්" සහ "රශ්නෙයි" ලෙස පැවසිය හැකි අතර ළමයා ඉවතට ගියහොත් "සීතලයි", "ගොඩක් සීතලයි" සහ "අයිස්" ලෙස පැවසිය හැක. සැඟවූ වස්තුව සොයා යන ළමයා නොමඟ නොයැවීමට අනෙකුත් ළමයින් වගබලා ගතයුතු අතර එසේ නොවුවහොත් ඔහුට හෝ ඇයට අන් අය කෙරෙහි ඇති විශ්වාස නැතිවී ගොස් ක්‍රීඩාව නිෂ්ඵලවී යනු ඇත.

## F. වර්ණ ගැන්වීම : 8 වැනි චිත්‍රය

## G. අවසන් කිරීමේ යාඥාව

# 9 වැනි පාඩම

## A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

මෙය සහ මීළඟ පන්ති තුන ආරම්භ කිරීම සඳහා, 10 වැනි කොටසේ යෝජනා කර ඇති ආකාරයට කටපාඩම් කිරීමට යාඥාවක් තෝරා ගන්න. ආරම්භක යාඥාවන් කීමට සිසුන් කිහිප දෙනෙකුට ඔබ හා එක් විය හැකි අතර ඉන්පසු ඔබට කටපාඩම් කිරීම සඳහා පහත යාඥාව හඳුන්වා දිය හැක. මෙම යාඥාව ළමයින් විසින් කටපාඩම් කරන ලද පෙර දෙකට වඩා දිගු වේ, නමුත් එය ඔවුන්ට ග්‍රහණය කර ගැනීමට අපහසු නොවනු ඇති අතර 12 වන පාඩම වනවිට ඔවුන් සියළුදෙනාම එය කටපාඩම් කරගත යුතුය.

> **"දෙවියන්වහන්සේ පිළිබඳ සඳහන් කර ඇත්තාවූත්, උන්වහන්සේගේ ප්‍රශංසාව වර්ණනය කර ඇත්තාවූත් යම් නිවසක්, ස්ථානයක්, නගරයක්, හදවතක්, කන්දක්, ආරක්ෂක ස්ථානයක්, ගුහාවක්, මිටියාවතක්, ගොඩබිමක්, මුහුදක්, දිවයිනක් හෝ තණ බිමක් වේද සියල්ල ආශිර්වාදලත් ස්ථාන වෙති"[108]**

**B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)**

පෘතුවිය මෙන් වන්න

C G<br>
පෘතුවිය දෙස බලන්න

F G C<br>
එය හරිම නිහමානි වේ

C G<br>
දෙවියන්වහන්සේගේ සෑම ධනයක්ම ප්‍රධානය කරඇත

F G C<br>
අපට ජීවත්වීමට අවශ්‍ය සියළු දේ

C G<br>
අප සෑම දිනකම එහි ගමන් කරනවා

F G C<br>
නමුත් ඔබ කිසිදා අසා ඇත්ද

C G<br>
“මම ඔබට වඩා පොහොසත්

F G C<br>
මම ඔබට වඩා විශිෂ්ටයි” කියා පවසනවා

ගස දෙස බලන්න<br>
එය හරිම නිහතමානි වේ<br>
ඵලදාය එහි වැඩිවනවිට<br>
එය වඩාත් වැඩායෙන් පොළොවට පහත්වී<br>
එහි ඵලදායි බෙදා දෙයි<br>
නමුත් ඔබ කවදා හෝ අසා ඇත්ද<br>
“මම ඔබට වඩා පොහොසත්<br>
මම ඔබට වඩා විශිෂ්ඨයි” කිය පවසනවා

C G<br>
පෘථිවිය මෙන් වන්න

F G C<br>
ගසක් මෙන් වන්න

C G<br>
මහිමයේ ස්ර්ගයට නැගී සිටින්න

F G C<br>
නිහතමානි බවේ පියාපත් මතින්

C G<br>
මහිමයේ ස්ර්ගයට නැගී සිටින්න

F G C<br>
නිහතමානි බවේ පියාපත් මතින්

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම පාඩමේ තේමාව සහ කටපාඩම් කිරීම සඳහා වූ උද්ධෘත පාඨය හඳුන්වා දීමට පහත අදහස් ඔබට උපකාරී වනු ඇත.

ඉතා වැදගත් අධ්‍යාත්මික ගුණාංගයක් වන්නේ නිහතමානීකමයි. දෙවියන් වහන්සේ ඉදිරියෙහි නිහතමානී අය දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ත්වය සහ උන්වහන්සේගේ නිර්මාණ අවබෝධ කරගනී. උන්වහන්සේගේ උපකාරය සහ අනුග්‍රහය නොමැතිව අප කිසිවකුට කිසිවක් අත්පත් කරගත නොහැකි බව ඔවුහු දනිති. උන්වහන්සේ සර්වබලධාරී වන සේක, අතිප්‍රබල සේක. තවද, අප කිසිදාක දෙවියන් වහන්සේ ඉදිරියෙහි උඩඟුකමක් නොපෙන්වන සේම, උන්වහන්සේගේ සියලු නිර්මාණ ඉදිරියේ අපි නිහතමානීව සිටින්නෙමු. පෘථිවිය සහ එහි සිටින සියල්ලන්ම උන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද බවත් උන්වහන්සේගේ සලකුණු සහ ගුණාංග පිළිබිඹු කරන බවත් අප මතක තබාගත යුතුය. අපි සොබාදහමට ගරු කරන අතර අප අවට සිටින අයගෙන් අපට ඉගෙන ගත හැකි යමක් සෑම විටම ඇති බව අපගේ හදවත් තුළින් දනිමු. අපි පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු.

**"එම්බා මනුෂ්‍යා පුත්‍රය! මාහට ඔබ වෙත කරුණාවෙන් පැමිණිය හැකිවනු සඳහා ඔබ මා ඉදිරියේ නිහතමානී වන්න."[109]**

*නිහතමානි*

1. ෂයිනාබ් ඇගේ ගණිත පැවරුම් ඉතා උනන්දුවෙන් සිදු කරන අතර සෑම විටම හොඳින් කරයි. ඇය නිහතමානී වන අතර ඇගේ ජයග්‍රහණ ගැන කිසිවිටක පුරසාරම් දොඩන්නේ නැත.

2. යොන්ග් හුගේ අසල්වැසි දරුවන් ඉගෙනීමට උනන්දු වන අතර, ඔවුන් සඳහා කුඩා පන්තියක් පිහිටුවීමට ඔහුගෙන් ඉල්ලා සිටියේය. ඔහුට එතරම් අත්දැකීම් නොමැති අතර තමා නුසුදුසු යැයි සිතුවද, ඔහු දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබමින් තම උපරිමය කටයුතු කරන ලදි. ඔහු නිහතමානීව එම කාර්යයට එළඹුනේය.

*කරුණාවෙන්*

1. කැන්ඩේස්ගේ පවුලේ අය විසින් භෝජන සංග්‍රහක් සඳහා අසල්වැසියන් කිහිප දෙනෙකුට තම නිවසට කරන ලදි. අමුත්තන් පැමිණෙන විට, කැන්ඩස් ඔවුන්ව උණුසුම් ලෙස පිළිගෙන කරුණාවෙන් ඔවුන්ට සිසිල් බීම පිරිනැමුවාය.

2. තම වයෝවෘද්ධ අසල්වැසියා ඇගේ බඩු මල්ල රැගෙන නිවසට යාමට අපහසුවෙන් උත්සාහ කරන බව ජියෝවන්නි දුටු නිසා ඔහු එය ඇය වෙනුවෙන් රැගෙන යාමට කරුණාවෙන් ඉදිරිපත් විය.

## D. කතාන්දරය

*නිහතමානිබව අබ්දුල් බහාතුමාගේ කැපී පෙනෙන ගුණාංගවලින් එකක් විය. බොහෝ දෙනෙකුට උන් වහන්සේට ශ්‍රේෂ්ඨ පදවි ලබා දීමට අවශ්‍යා වූ නමුත් උන් වහන්සේට අවශ්‍යාවූයේ "මහිමයේ සේවකයා" යන අරුත ඇති "අබ්දුල් බහා" ලෙස හැඳින්වීමට පමණි. උන්වහන්සේගේ දැඩි ආශාව වූයේ සේවය කිරීමයි. වරක්, සමහර ධනවත් අමුත්තන් ආහාර වේලකට පෙර උන්වහන්සේගේ දැත් සේදීම සඳහා උන්වහන්සේ වෙනුවෙන් විචිත්‍ර සැලැස්මක් සකස් කරන ලදි. "සුපැහැදිලි ජලය" සහිත විසිතුරු බඳුනක් රැගෙන යාමට ඔවුන් විශේෂයෙන් ඇඳ පැළඳගත් පිරිමි ළමයෙකු සූදානම් කළ අතර සුවඳ විලවුන් ගැන්වූ තුවායක් උන්වහන්සේ වෙනුවෙන් වෙන් කරන ලදි. මිතුරන් පිරිස කුඩා ළමයා, බඳුන සහ තුවාය සමඟ ගෙමිදුලේ එහා පැත්තේ සිට පැමිණෙන විට උන්වහන්සේට ඔවුන්ගේ අරමුණ පැහැදිලි විය. උන්වහන්සේ කඩිමුඩියේ ඒ අසල වතුර ටිකක් සොයාගෙන, දැත් සෝදා, උයන්පල්ලා සතුව තිබූ රෙදි කැබැල්ලකින් අත් වියළා ගත්තේය. දීප්තිමත් ලෙස, උන්වහන්සේ කණ්ඩායමට පැමිණි පිරිසට ආචාර කිරීමට ඔවුන් වෙත හැරුනි. ඉන්පසුව, උන්වහන්සේ තම ආගන්තුකයන්ට තමාට ලබා දුන් ගෞරවය ලබා දෙමින්, ජලය සහ සුවඳ විලවුන් තුවාය ආදරයෙන් ඔවුන්ට පිරිනමන්නට විය.!*

## E. ක්‍රීඩාව "සමහරවිට අප උසයි"

එක් ළමයෙකුගේ ඇස් බැඳ අනෙක් ළමයින් ඔහු හෝ ඇය වටා රවුමක් ලෙස සිටගන්න. ඔවුන් එකහඬින් මෙසේ කිව යුතුය.

"අපි ගොඩක් උසයි" (ඔවුන් තම කකුල්වල ඇඟිලිවලින් සිටගෙන ඔවුන්ට හැකි තරම් ඉහළට

යොමුවිය යුතුය)

"අපි ඉතා කොටයි. " (ඔවුන් හැකි තරම් පහත්වී උස අඩු බවක් පෙන්විය යුතුය.)

"සමහරවිට අපි උසයි" (ඔවුන් තම නැවතත් ඔවුන්ට හැකි තරම් ඉහළට යොමුවිය යුතුය)

"සමහරවිට අපි කොටයි" (ඔවුන් තම නැවතත් ඔවුන්ට හැකි තරම් පහළට යොමුවිය යුතුය)

දැන් ළමයින්ට ඔවුන් පහත වාක්‍ය එක්ව පවසමින් ඔවුන් උස්ව සිටිය යුතුද නැතහොත් පහත්වී

සිටිය යුතුද යන්න අංග චලනයෙන් දක්වන ලෙස කියන්න.

"අපි දැන් ඉන්නේ කොහොමද?"

අස් බැඳගෙන සිටින ළමයා අනෙකුත් අයගේ හඩ අනුව ඔවුන් සිටගෙන සිටින්නේ පහත්වී සිටින්නේ ද යන් අනුමාන කළ යුතුය. සෑම ළමයෙකුට ඇස් බැඳගත් පුද්ගලයාවීඹට අවස්ථාව ලබාදිය යුතුය.

## F. වර්ණ ගැන්වීම : 9 වැනි චිත්‍රය

## G. අවසන් කිරීමේ යාඥාව

# 10 වැනි පාඩම

## A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

ආරම්භක යාඥවන් පැවසීමෙන් පසු, අවසාන පාඩමේදී ළමයින්ට හඳුන්වාදුන් යාඥාව කටපාඩම් කළ හැකිය.

## B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

මම ස්වාමීන්වහන්සේට ස්තූති සහ ප්‍රශංසා කරමි

C Am Em
මම ස්වාමීන්වහන්සේට ස්තූති සහ ප්‍රශංසා කරමි

F G
කරුණාවන්තභායේ කිරුළ වෙනුනේ

C Am
මාගේ හිසේ පැළන්දූ

F C
එය සදාකල් බැලලෙනු ඇත

G7 Am
මගේ ප්‍රශංසාව වැඩැවන තරමට

Dm G7 C
මම ස්වාමීන්වහන්සේට ස්තුති සහ ප්‍රශංසා කරමි

මම ස්වාමීන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමි
ආදරය සහ දැනුම වෙනුවෙන්
මාගේ හදවතේ සටහන් කළ
එය තව තවත් වර්ධනය වේ
මාගේ ප්‍රශංසාව වැඩිවන තරමට
මම ස්වාමීන්වහ්සේට ස්තුති ප්‍රශංසා කරමි

මම ස්වාමීන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමි
ආලෝකය සහ සත්‍ය වෙනුවෙන්
මාගේ ඇස් දීප්තිමත් කළ
ගලා එන ඔබගේ වරප්‍රසාදයන් මම දුටිමි
මාගේ ප්‍රශංසාව වැඩිවන තරමට
මම ස්වාමීන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමි
මම ස්වාමීන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමි

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

කටපාඩම් කිරීමට ලබාදී ඇති උද්ධෘත පාඨය පහත සඳහන්වන පරිදි ඔබගේ සිසුන්ට හඳුන්වා දිය හැකිය.

යම්කෙනෙකු අපට ඉතා කුඩා ත්‍යාගයක් ලබාදුන්නත් අපට එම පුද්ගලයාට ස්තුතිය පුද කරනවා. එසේනම්, අපව බලගෙනීම සඳහා රැකවරණයේ දැස් සහ අපට ආදරය කිරීමට හදවත් මෙන්ම අපගේ වර්ධනය සඳහා උන්වහන්සේ විසින් මේ සියළුදේම නිර්මාණය කරමින් දෙවියන්වහන්සේ විසින් මෙම අසංඛ්‍යාත ත්‍යාග සහ වරප්‍රසාදයන් ලබාදීම පිළිබඳ අප කොපමණ කෘතඥපූර්වක විය යුතුද. අබ්දුල් බහාතුමා අපට පවසන්නේ දෙවියන් වහන්සේ අපට ලබා දී ඇති බොහෝ වරප්‍රසාද සඳහා සහ උන්වහන්සේගේ ආදරයෙන් අපගේ හදවත් පිරවීම පිළිබඳ අප දෙවියන්වහන්සේට කෘතඥපූර්වක විය යුතු බවයි. දුෂ්කර කාලවලදී මෙන්ම අපි සෑම අවස්ථාවකදීම දෙවියන්වහන්සේට කෘතඥපූර්වක විය යුතුය. දෙවියන්ට කෘතඥපූර්වකවීමෙන් උන්වහන්සේගේ අසීමිත වරප්‍රසාද වැඩි වැඩියෙන් ලබා ගැනීමට අපට හැකියාව ලැබේ. අපි පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු.

**"ඔබ ප්‍රීතියට පත්වන්න. ඔබ කෘතඥශීලී වන්න. වරප්‍රසාදයන් වර්ධනයවීමට උපකාරීවීම සඳහා ඔබගේ ස්තුතිවන්ත බව හේතුවන බැවින් දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම වෙනුවෙන් නැගී සිටින්න."**[110]

*නැඟීසිටින්න*

1. දීර්ඝ කාලයක් අසනීප වී සිටි ආච්චි ඇඳෙන් නැගිසිට ඇවිදින්න යන ආකාරය දැකීමෙන් සල්මා සතුටු වූවාය.

2. යාඥා කිරීම සඳහා ළමයින් සෑම උදෑසනකම වේලාසනින්නම නැඟීසිටිති.

*උපකාරීවීම*

1. නදියා සෑමවිටම පිරිසිදුව සිටී. ආධ්‍යාත්මික වර්ධනය සඳහා පවිත්‍රත්වය වැදගත් බව ඇය දනී. පවිත්‍රත්වය ආධ්‍යාත්මිකත්වයට උපකාරී වේ.

2. සේජ්ගේ පවුලේ සාමාජිකයන් සියලු වැදගත් කාරණාවලදී එකිනෙකාට සහයෝගය සහ උපකාරය දක්වති. ඔවුන් සහයෝගයෙන් කටයුතු කරන නිසා ඔවුන් සමගියෙන් ජීවත් වේ. සහයෝගීතාවය සමගිය ඇති කිරීමට උපකාරී වේ.

*වර්ධනයවීම*

1. පසුගිය වසරේ මරියාගේ පාසලේ සිටියේ ගුරුවරුන් පස් දෙනෙකු පමණි. මේ වසරේ එහි ගුරුවරු අට දෙනෙක් සිටිති. එම පාසලේ ගුරුවරුන් සංඛ්‍යාව තුනකින් වර්ධනයවී ඇත.

2. ෂයාන් ඉතා සතුටින් සිටින පිරිමි ළමයෙකු වන අතර අන් අයට උපකාර කිරීමට හැකි සෑම විටම ඔහුගේ ප්‍රීතිය තවත් වැඩි වේ. අන් අයට සේවය කරන විට ඔහුගේ සතුට වර්ධනය වේ.

## D. කතාන්දරය

*දිනක් ඉතා දුර බැහැර සිට ධනවත් කාන්තාවක් අබ්දුල් බහාතුමා බැලීමට ශුද්ධ භූමියට පැමිණියාය. දිගු වේලාවක් ඇය තම කුඩා කරදර එකින් එක එතුමාට කියන්නට විය. අබ්දුල් බහාතුමා බොහෝ වේලාවක් ඉවසීමෙන් සහ කරුණාවෙන් සවන් දුන් අතර, අවසානයේදී තවත් හමුවීමක් සඳහා එතුමා කැඳවාගෙන ගියේය. කෙසේ වෙතත්, එතුමාගේ ආගන්තුකයාගෙන් ඉවත්ව යාමට පෙර, එතුමා ජනේලයෙන් පිටත ඇවිද යන මහත්මයෙකු පෙන්වීය. “අර යන පුද්ගලයා මම ඔයාව බලන්න එක්කගෙන එන්නම්” කියා එතුමා පැවසුවා. “ඔහුගේ නම මිර්සා හයිධර් අලි ඔහු පොළොවේ ඇවිදින නමුත් ඔහු ජීවත් වන්නේ ස්වර්ගයේ ය,” "ඔහුට බොහෝ කරදර ඇති අතර ඔහු ඒවා ගැන ඔබට කියයි." අබ්දුල් බහාතුමා පැහැදිලි කළේය.*

*මිර්සා හයිධර් අලිට බොහෝ කරදර තිබුණා. ඔහු, බහායිවරුන්ට අයුක්තිය සහ දැඩි කුරිරුකම් සිදු වූ පර්සියාවේ සිට පැමිණි ඇත. සමහරු අත්අඩංගුවට ගෙන වැරදි ලෙස සිරගත කරන ලදී; තවත් අය වෛරයෙන් හා ක්‍රෝධයෙන් පිරුණු මිනිසුන්ගේ පහර කෑමට ලක්විය. මිර්සා හයිධර් අලි ඔහුගේ ජීවිතයේ විඳි සියලු දුක් ගැහැට පිළිබඳ ඇසීමෙන් ඔබේ හදවත්වලට බොහෝ දුක් වනු ඇත.*

*පසුව, අබ්දුල් බහාතුමා විසින් මිර්සා හයිධර් අලි මුණගැසී ඔහුව අමුත්තා වෙත කැඳවාගෙන ඒම සඳහා පිටත්විය. ඔහුව කාන්තාවට හඳුන්වා දීමෙන් පසු ‘අබ්දුල් බහාතුමා පිටත්ව ගියේය. ඒ සමඟම මිර්සා හයිධර් අලි අප ජීවත් වන අපූරු කාලය සහ දෙවියන් වහන්සේගේ සියලු ආශීර්වාද ගැන මහත් ප්‍රීතියෙන් සහ නිහතමානීව ඇයට කතා කිරීමට පටන් ගත්තේය. ආගන්තුක කාන්තාව නොඉවසිලිමත්ව, මඳ වේලාවක් සවන් දී සිට ඔහුට බාධා කරමින්, “නමුත් ‘අබ්දුල් බහාතුමා කිව්වා ඔබ ඔබේ කරදර ගැන මට කියයි කියලා’ යැයි කීවේය. මිර්සා හයිධර් අලී පුදුමයෙන් හිස ඔසවා බලන්නට විය. "කරදර?" “ඇනේ මහත්මිය, මට කවදාවත් කරදරයක් වුණේ නැහැ. කරදර මොනවද කියලා මම දන්නේ නැහැ" ඔහු පිළිතුරු දුනි. ඇත්ත වශයෙන්ම, මිර්සා හයිධර් අලි මහත් දුෂ්කරතා අත්විඳින නමුත්, ඒවාට කිසි විටෙකත් ඔහුගේ සතුටට විනාශ කළ නොහැකි වූ බවත්, දෙවියන්වහන්සේ ඔහුට ජීවිතයේ ලබා දුන් සියලු ආශීර්වාද ගැන පමණක් ඔහු දුටු බවත්, ඒ සඳහා ඔහු ස්තුතිවන්ත වූ බවත් අබ්දුල් බහාතුමා දැන සිටියේය.*

## E. ක්‍රීඩාව “ක්ෂණික ස්පන්දනය”

අත් අල්ලාගෙන රවුමක් සාදන ලෙස සිසුන්ගෙන් ඉල්ලා සිටින්න. පළමුව, ඔවුන්ගේ වම් අත මිරිකීමට සහ පසුව ඔවුන්ගේ දකුණු දෑත් මිරිකන්න පුරුදු වන්න. පසුව, ඔවුන් කණ්ඩායම හරහා "ස්පන්දන" සංඥාවක් යැවීම සිදුකළ යුතු ආකාරය ඔවුන්ට පැහැදිලි කරන්න. එක් ළමයෙකු ඔහුගේ හෝ ඇයගේ දකුණට පසින් සිටින ළමයාගේ අත ක්ෂණික මිරිකීමකින් ආරම්භකර, ඊළඟ දරුවාට සංඥාව ලබා දෙන අතර, එය පළමු දරුවා වෙත නැවත පැමිණෙන තුරු රවුම වටා සිදු කරගෙන යන්න. ළමයින්ට එක් වටයක් සඳහා ගතකරන කාලය මැනිය යුතු අතර වේගයෙන් හා ඉතා වේගයෙන්

ස්පන්දය යැවීමට අභියෝග කළ යුතුය. ඔවුන් මෙම මූලික ක්‍රීඩාව ඉගෙන ගත් පසු, ඔබට ස්පන්දනය ප්‍රතිවිරුද්ධ දිශාවට යැවීමට හෝ එක් ස්පන්දනයකට අත මිරිකන ගණන වැඩි කිරීමට ඔවුන්ගෙන් ඉල්ලා සිටිය හැකිය.

**F. වර්ණ ගැන්වීම : 10 වැනි චිත්‍රය**

**G. අවසන් කිරීමේ යාඥාව**

## 11 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

කටපාඩමින් යාඥාවක් ගායනා කිරීමෙන් පසු තවත් යාඥාවක් සඳහා සිසුන් කිහිප දෙනෙකුට ආරාධනා කිරීමෙන් සුපුරුදු ආකාරයෙන් පන්තිය විවෘත කරන්න. 9 වන පාඩමෙන් ඉගෙන ගැනීමට පටන් ගත් යාඥාව කටපාඩම් කරගැනීමට ළමයින්ට උපකාර කළ හැකිය.

### B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

යහපත සෙවීම

C
මාගේ ඉලක්කය විශිෂ්ටත්වයයි

F7
නමුත් මට බොහෝ දිගු දුරක් යෑමට ඇත

C
මම දන්නවා මගේ ගමනේදී එය මට උපකාරී වේ කියා

G7 C
මම සෑම ෙදනකම යහපත දකිනවිට

F7
එහෙයින් ඔබ වැරදි යමක් සිදු කරනවා මම දුටුවහොත්

C
මේ ගීතයේ මම ඒ ගැන නොගයමි

G7
මම එය මගේ මිතුරන් සමඟ කතා නොකරමි

F7 C
මම ඒ පිළිබඳ නැවත නොසිතමි

සමූහ ගායනය:

F7
මම ඔබගේ හොඳ දකිමි

C
මම ඔබගේ හොඳ දකිමි

G7
ඔබට මා අවශ්‍ය බව මම දනිමි

F7 C
මක්නිසාද මට කිරීමට අවශ්‍ය එයයි

F7
දෙවියන්වහන්සේ බලන්නේ මා තුළ ඇති යහපතයි

C Am
උන්වහන්සේ බලන්නේ මා තුල ඇති යහපතයි

C G
මම ආවරණයක් දැමූවිට

F7
අනෙක් අයගේ පුංචි අඩුපාඩු මත

C G7 C
දෙවියන්වහන්සේ මගේ අඩුපාඩු මත ආවරනයක් දමනු ඇත

අබ්දුල් බහාතුමා බොහෝ ඥානවන්තයි
ඔබගේ ඇස් තුලින් එතුමා ඔබගේ හදවත දුටුවා
එතුමා යම්කිසි වැරද්දක් දුටුවහොත්
එතුමා ඔබ ශක්තිමත් කිරීමට මඟක් සොයාගනු ඇත
එමනිසා මම ඔබගේ වැරද්දක් දුටුවහොත්
මම දන්නවා කුමක් කළ යුතුදැයි කියා
මම කිසිවෙකුට පවසන්නට නොයමි
නෑ, මම මටවත් කියා ගන්නේ

සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

පාඩම් තේමාව සහ කටපාඩම් කිරීම සඳහා උද්ධෘත පාඨය හඳුන්වාදීම සඳහා පහත සඳහන් අදහස් ඔබගේ සිසුන් සමඟ බෙදාහදා ගන්නා ලෙස ඔබට යෝජනා කර සිටිමු.

සමාව දීම දෙවියන්ගේ එක් ගුණාංගයකි. අබ්දුල් බහාතුමා අපට පවසන්නේ අප සැමවිටම එකිනෙකාට සමාව දිය යුතු බවයි. අප බැලිය යුත්තේ සමාව දීමේ ඇසින් මිස එකිනෙකාගේ වැරදි දෙස නොබැලිය යුතුය. අපි අබ්දුල් බහාතුමාගේ ආදර්ශය අනුගමනය කරන්නේ නම්, අපගේ මිතුරන් වැරදි කරන විට පමණක් නොව, අපට අකාරුණික වන අයටද අපි සමාව දැක්විය හැක. සමාව දීමට අප දරන උත්සාහයේදී අපට උපකාරීවීම සඳහා, අපි පහත උද්ධත පාඨය කටපාඩම් කරගනිමු:

**"දෙවියන්වහන්සේගේ මනා ප්‍රියතමයින්ගේ හදවත් සතුටට පත් කරනු සඳහා ක්ෂමායුක්තබව සහ අනුකම්පාව ඔබගේ අලංකාරයවීමට ඉඩ දෙන්න."[111]**

*දයාව*

1. වැස්ස දවස් ගණන් දවස් ගණන් පැවතුණා. ගම ගංවතුරෙන් යටවෙද්දීත් වැස්ස නතර වුණේ නැහැ. වැස්ස කිසිම අනුකම්පාවක් දැක්කුවේ නැත.

2. අප දෙවියන්වහන්සේට යාඥා කරනවිට, උන්වහන්සේ අපගේ වැරදිවලට ක්ෂමාව දෙනු ඇත. උන්වහන්සේ අපට අනුකම්පාව දක්වයි.

*සතුටු කරනවා*

1. උර්සුලාට අසනීපයෙන් පසුවිය. ඇගේ මිතුරිය එල්සී ඇයට මල් ගෙනැවිත් ඇය සමඟ බොහෝ වේලාවක් වාඩි වී කතන්දර කියමින් කතා කරන්නට විය. එල්සිගේ පැමිණීම උර්සුලාට වඩා හොඳ සුවයක් ඇති විය. ඇගේ පැමිණීම උර්සුලාගේ සිත සතුටට පත්කරන්නට විය.

2. රැකියාවක් සඳහා අසල නගරයකට ගිය තම සැමියාගෙන් සැන්චෙස් මහත්මියට දිගු ලිපියක් ලැබිණි. ඔහු ඉක්මනින් ගෙදර එන බවට සුබ ආරංචිය එම ලිපියෙහි තිබිණ. එම පුවත ඇයව මහත් සේ සතුටට පත් කළේය.

*ප්‍රියතතම*

1. ගුරුවරිය තම සියලුම සිසුන්ට ආදරය කළ අතර සෑම කෙනෙකුටම විශේෂ අවධානයක් යොමු කළේය. ඇය ඔවුන් සියල්ලන්ටම ප්‍රියතාවයක් දැක්වූවාය.

2. ජේම්ස් පාසලේ සියලුම විෂයයන් වලට කැමති වූ නමුත් ඔහු විද්‍යාව හොඳින්ම සිදු කළේය. ඔහු වඩාත් ප්‍රියතම විෂය වූයේ විද්‍යාවයි.

**D. කතාන්දරය**

*ගුරුතුමාණන් ඇකා නගරයෙහි ජීවත් වූ දිනවලදී, වරින් වර බහායිවරුන්ට හානි කිරීමට උත්සාහ කළ ආණ්ඩුකාරවරයෙක් සිටියේය. එක් අවස්ථාවක ඔහු ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග විනාශ කිරීමට සැලැස්මක් සකස් කළේය. සියලු බහායිවරුන්ගේ කඩ වසා දමා යතුරු රැගෙන එන ලෙස ඔහු සිය මුරකරුවන්ට නියෝග කළේය. නමුත් අබ්දුල් බහා ආණ්ඩුකාරවරයාගේ සැලැස්ම ගැන දැනගත් අතර පසුදා ඔවුන්ගේ වෙළඳසැල් විවෘත නොකරන ලෙස මිතුරන්ට උපදෙස් දුන්නේය. දෙවියන් වහන්සේ නියම කරන්නේ කුමක්දැයි බලා සිටින ලෙස එතුමා ඔවුන්ට කීවේය.*

*වෙළඳසැල් විවෘත කර නොතිබූ නිසා ඔහුගේ ආරක්ෂකයින්ට යතුරු ගෙන ඒමට නොහැකි බව ඇසූ විට ආණ්ඩුකාරවරයා පුදුමයට පත් වූ ආකාරය ඔබට සිතා බැලිය හැකිද. එහෙත් ඊළඟට කුමක් කළ යුතු දැයි සිතා ගැනීමටත් පෙර නොසිතූ දෙයක් සිදු විය. නගරයේ ආණ්ඩුකාර ධුරයෙන් ඔහුව නෙරපා හරිමින් ඔහුගේ ප්‍රධානියාගෙන් විදුලි පණිවුඩයක් පැමිණියේය. එහෙයින් බහායිවරුන්ගේ කඩ සාප්පු සුරැකිනි.*

*හිටපු ආණ්ඩුකාරවරයාට ඇකා නගරය හැර දමා දමස්කස් නම් වෙනත් නගරයකට යන ලෙස නියෝග කරන ලදී. කුමක් කළ යුතු දැයි ඔහුට අවබෝධ කරගත නොහැකි විය. ඔහුට ඉක්මනින් හා තනිව පිටව යාමට සිදු විය. ඔහුගේ පවුලේ අයට කුමක් සිදුවේද? ආණ්ඩුවේ ප්‍රසාදය අහිමි වූ කෙනෙකුට පිහිට වන්නේ කවුද? ගුරුතුමාණන් එම පුවත අසා ඔහුව හමුවීමට ගියේය. ඔහු කිසිදා ධර්මයේ සතුරෙකු නොවූවාක් මෙන්, අසතුටුදායක මිනිසාට මහත් කරුණාවක් දැක්වූයේය. එක වරක්වත් උන් වහන්සේ ඔහුගේ අතීත වැරදි ගැන සඳහන් කළේ නැත. ඒ වෙනුවට, එතුමා හැකි සෑම ආකාරයකින්ම ඔහුට උපකාර කිරීමට ඉදිරිපත් විය. හිටපු ආණ්ඩුකාරවරයා තම බිරිඳ සහ දරුවන් තනිකර යාම ගැන කනස්සල්ලට පත්ව සිටියේය. අබ්දුල් බහාතුමා ඔහුට සහතික වූයේ එම කාරණය ගැන වගබලා ගන්නා බවයි. පසුව ඔහු සුවපහසු ගමනක් සූදානම් කර, බිරිඳ සහ දරුවන් කැටුව යාමට විශ්වාසවන්ත කෙනෙකු සපයා, සියලු වියදම් ගෙවා, එම පවුල දමස්කස් වෙත යැවීය.*

*හිටපු ආණ්ඩුකාරවරයා ඔහුගේ පවුලේ අය සමඟ නැවත එක් වූ විට, ඔහු සතුටට පත්විය. කෘතඥපූර්වකත්වයෙන් පිරුණු හදවතකින් ඔහු තම පවුලේ අය සමඟ ගමන් කළ පුද්ගලයා දෙසට හැරී ගමනේ වියදම ගැන විමසීය. එය අබ්දුල් බාහාතුමා විසින් ගෙවා ඇති බව මිනිසා පැහැදිලි කළේය. එවිට හිටපු ආණ්ඩුකාරවරයා ගමනේදී ඔහු දැක්වූ කරුණාව සහ කඩිසරකම වෙනුවෙන් තෑග්ගක් පිරිනැමීය. නමුත් ඔහු එම ත්‍යාගයද පිළිනොගත්තේය. ඔහු හුදෙක් අබ්දුල් බහාතුමාට කීකරු වන බවත් ඔහුගේ සේවය සඳහා කිසිවක් ලබා ගැනීමට කැමති නැති බවත් ඔහු පැවසීය. එවිට හිටපු ආණ්ඩුකාරවරයා මෙම පුද්ගලයාට තම නිවසේ අමුත්තෙකු ලෙස රාත්‍රිය නවාතැන් ගන්නා ලෙස ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, ප්‍රමාදයකින් තොරව ඇකා නගරය වෙත ආපසු යන ලෙස තමාට ගුරුතුමාණන් දුන් උපදෙස් පිළිපැදීමට තමා උනන්දු වන*

*බව ඔහු පැවසීය. අවම වශයෙන් අබ්දුල් බහාතුමාට ලිපියක් ලියන තෙක් ගතවන වේලාවක් සිටින ලෙස හිටපු ආණ්ඩුකාරවරයා එම පුද්ගලයාගෙන් ඉල්ලා සිටියේය. ඔහු එය පිළිගෙන ආපසු ඇකා නගරයට පැමිණි පසු ලිපිය ගුරුතුමාණන් වෙත භාර දුන්නේය. "අබ්දුල් බහාතුමනි, ඔබතුමා මට සමාව දෙන මෙන් ඉල්ලා සිටිමි. මට කිසි අවබෝධයක් තිබුණේ නැහැ. මම ඔබ තුමාව දැන සිටියේ නැත. මම ඔබතුමාට මහත් නපුරක් කළෙමි. මම ඔබතුමාට මහත් වූ හිරිහැර කළා." යනුවෙන් එම ලිපියේ මෙසේ සඳහන් විය.*

### E. ක්‍රීඩාව "මිනිසුන් මිනිසුන්ට"

අත්පුඩි ගසමින් "මිනිසුන් මිනිසුන්ට" යැයි කියමින් තැනින් තැන ඇවිද යන ලෙස ළමයින්ට පවසන්න. ඔබ "පසුපසට පසුපසට" යනුවෙන් පවසනවිට, ඔවුන් නතරවී, එක් එක් හවුල්කරුවෙකු වෙතට ගොස් පසුපස හරවා සිටිය යුතුය. ඔබේ සංඥාව මත, අත්පුඩි ගසමින්, "මිනිසුන් මිනිසුන්ට" යනුවෙන් හඬ නගමින් ඔවුන් නැවතත් එහා මෙහා යාමට පටන් ගත යුතුය. ඔබ "මුහුණට මුහුණ" යනුවෙන් පවසනවිට, ඔවුන් එක් එක් හවුල්කරුවෙකුට මුහුණ හරවා නතරවී හිස නමාගෙන සිටිය යුතුය. මෙම විධාන දෙක කිහිප වතාවක් සිදු කරමින් මෙම ක්‍රීඩාව ඉහත ආකාරයෙන් ඉදිරියට යා හැකිය. උදාහරණයක් ලෙස, "දණහිස දණහිසට" සහ "වැලමිට වැලමිටට" වැනි වෙනත් විධාන පසුව ඇතුළත් කළ හැකිය.

### F. වර්ණ ගැන්වීම : 11 වැනි චිත්‍රය

### G. අවසන් කිරීමේ යාඥාව

## 12 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

සැමවිටම පන්ති කාලපරිච්ඡේදය ආරම්භ කළ යුත්තේ ආරම්භක යාඥාවන් සමඟිනි. පසුව ඔබට ළමයින් සමඟ පසුගිය පාඩම් තුන පුරා ඉගෙන ගත් යාඥාව සමාලෝචනය කළ හැකිය. 13 පාඩමේදී ඔවුන් හට කටපාඩම් කිරීමට නව යාඥාවක් ඔබ හඳුන්වා දෙන බැවින්, ඔවුන් සියල්ලන්ටම එය හොඳින් පැවසිය හැකි බවට ඔබ සහතික විය යුතුය.

### B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

හිරුටත් වඩා එළියයි

```
          C     G        D       G
සත්‍යවාදී බව හිරුගේ ආලෝකයටත් වඩා දීප්තිමත් වේ

          C     G        D       G
සත්‍යවාදී බව හිරුගේ ආලෝකයටත් වඩා දීප්තිමත් වේ

          C     G        D       G
අනේ මිනිසුනි, සත්‍යවාදී බවෙන් යුතුව, ඔබගේ දිව සරසා ගන්න

          C     G        D       G
අනේ මිනිසුනි, සත්‍යවාදී බවෙන් යුතුව, ඔබගේ දිව සරසා ගන්න
```

අවංකත්වය සැම කෙනෙකුගේම ආත්මය අලංකාරවත් කරයි
අවංකත්වය සැම කෙනෙකුගේම ආත්මය අලංකාරවත් කරයි
අවංකත්වය හිරුගේ ආලෝකයටත් වඩා දීප්තිමත් වේ
අවංකත්වය හිරුගේ ආලෝකයටත් වඩා දීප්තිමත් වේ

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

පාඩමේ තේමාව එනම් අවංකකම සහ ඔවුන් කටපාඩම් කරන උද්ධෘත පාඨය ඉදිරිපත් කිරීම සඳහා ඔබේ සිසුන් සමඟ බෙදා ගත හැකි අදහස් කිහිපයක් පහත දැක්වේ.

> උද්‍යාන විවිධ හැඩයන් සහ වර්ණ මල් වලින් අලංකාරවත් කරඇත. වසන්තයේ දී පලතුරු ගස් සුවඳ මල් වලින් අලංකාරවත් වනු ඇත. අපි පිරිසිදු හා නොකැළැල් ඇඳුම් වලින් සැරසෙමු. මෙම සියලු සැරසිලි අලංකාරත්වය නිර්මාණය කරයි. එහෙත්, ද්‍රව්‍යමය දේවලට වඩා, මනුෂ්‍යයන් අලංකාර කරන්නේ, අපගේ හදවත්වලට ප්‍රීතිය ගෙන දෙන්නේ අධ්‍යාත්මික ගුණාංගවල දීප්තියයි. අවංකත්වය අපේ ජීවිතය අලංකාර කළ හැකි ලස්සනම ගුණාංගයක් වේ. අපි අවංකත්වයෙන් අපව අලංකාර කරගත්විට, අපි අනුන්ට අයත් දේ ඔවුන්ගේ අවසරයකින් තොරව නොගන්නා අතර, අපි කිසි විටෙකත් කිසිවෙකු රැවටීමට හෝ උපායන් මඟින් යමක් කිරීමට පොළඹවන්නේ නැත. අවංකකමේ ගුණාංගය මතක තබා ගැනීමට අපට උපකාර කිරීම සඳහා, අපි බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු.
>
> **"එම්බා මිනිසුනි, සත්‍යවාදී බවෙන් ඔබගේ දිව අලංකාරවත් කර අවංකත්වයේ ආභරණයෙන් ඔබගේ ආත්මය සරසං ගන්න."[112]**

*අලංකාරත්වය*

1. මලිත් විසින් අලංකාරවත් රෝස මල් ගෙවත්තේ සිටුවන ලදි. රෝස මල් ගෙවත්ත අලංකාරවත් කරයි.

2. සුනිල් සත්‍ය පමණක් කතා කරයි. ඔහුගේ වචන සෑමවිටම සත්‍යවාදී බවෙන් අලංකාරවත් වේ.

## D. කතාන්දරය

> *එතුමාගේ ජීවිතයේ අවසාන භාගයේදී, අබ්දුල් බහාතුමාට ලොව පුරා බොහෝ ස්ථානවල සංචාරය කිරීමට හැකි විය. එතුමා කොතැන ගියත්, කම්කරුවන්, නායකයින්, අධ්‍යාපනඥයින් සහ විද්‍යාඥයින් - යන සෑම තරාතිරමකම මිනිසුන් එතුමා මුණගැසුන අතර සෑම කෙනෙකුටම පහසුවක් දැනිය හැකි සෑම දෙයක්ම එතුමා සිදු කළේය. දිනක්, ඊජිප්තුවේදී, දිවා ආහාරය සඳහා තම ආගන්තුකයෙකු ලෙස එතුමා උසස් රාජ්‍ය නිලධාරියෙකුට ආරාධනා කළේය. අබ්දුල් බහාතුමා ඔවුන්ව ඔවුන්ගේ ගමනාන්තයට ගෙනයාමට අශ්ව කරත්තයක් කුලියට ගැනීමට තීරණය කළේ එම නිලධාරියා මේ ආකාරයේ සුවපහසුවකට හුරුවී සිටි බැවිනි.*
>
> *ගමන සඳහා වැඩි වේලාවක් ගත නොවූ අතර ඔවුන් ඉක්මනින්ම ඔවුන්ගේ දිවා භෝජන සංග්‍රහයට පැමිණියහ. නමුත් එහි රියදුරු මුදල් ලබාගැනීම සඳහා අබ්දුල් බහාතුමා වෙත පැමිණි විට, ඔහු ගමන සඳහා සාධාරණ මිලකට වඩා වැඩි මුදලක් ඉල්ලා සිටියේය. රියදුරු අවංක නොවූ බව අබ්දුල් බහාතුමා දැන සිටියේය. එතුමා එම පුද්ගලයාට ගෙවිය යුතු මුදල පමණක් ගෙවා පිටත්ව ගියේය*
>
> *රියදුරු තර්ක කිරීමට උත්සාහ කළ විට, අබ්දුල් බහාතුමා ස්ථාවර මතයක සිටියේය. එතුමා එම පුද්ගලයාට පැවසුවේ, ඔහු ගාස්තුව ගැන අවංක වූයේ නම්, ඔහුට සතුටුදායක සන්තොෂමක් ගෙවනු ඇති බවයි. රියැදුරුට තමාගේ ක්‍රියාව ගැන සිතන්නට ඉඩ හැර ගුරුතුමාණන් එතැනින් ඉවත්ව ගියේය.*

## E. ක්‍රීඩාව "චතුරශ්‍රය, රවුම සහ ත්‍රිකෝණය"

අවම වශයෙන් "චතුරශ්‍රය", "රවුම" සහ "ත්‍රිකෝණය" වැනි හැඩතල කිහිපයක නම් ළමයින් දන්නා බව මෙහිදී උපකල්පනය කෙරේ. ඔවුන් එක් එක් ඒවා හඳුනාගත හැකි බවට වග බලා ගැනීම සඳහා ළමයින් සමඟ මෙම හැඩතලවල නම් සමාලෝචනය කිරීමෙන් මෙය ආරම්භ කරන්න. ඊළඟට, උදාහරණයක් ලෙස, රවුම, රවුම, චතුරශ්‍රය යන හැඩතල තුනක අනුපිළිවෙලකින් ඔබ ඇඳ ඇති කාඩ්පතක් පෙන්වා එදෙස සමීපව බලන ලෙස ඔවුන්ට කියන්න. ඉන් පසු කාඩ්පත පසෙක තබා එක ළමයෙකුට අනුපිළිවෙල හඩනඟා කියන ලෙස ඉල්ලා සිටින්න. ඔබ කලින් විවිධ අනුපිළිවෙලින් ඇඳි කාඩ්පත් භාවිතා කරමින් මෙය කිහිප වතාවක් නැවත නැවත සිදු කරන්න. හැඩතල තුනක අනුපිළිවෙලක් ළමයින්ට මතක තබා ගැනීමට අපහසු නම්,

හැඬතල දෙකක් පමණක් ඇති කාඩ්පත් කිහිපයක් මෙන්ම හැඬතල තුනක අනුපිළිවෙල ඉතා පහසු ඔවුන් අවබෝධ කරගනී යයි ඔබ සිතන්නේ නම්, හැඬතල හතරක හෝ පහක අනුපිළිවෙලක් සහිත කාඩ්පත් කිහිපයක්ද ඔබට කලින් සූදානම් කර තැබිය හැක.

දැන් ඔබගේ සිසුන්ගේ හැකියාව අනුව හැඬතල දෙකක්, තුනක් හෝ හතරක් වැනි අනුපිළිවෙලක් ඔබ විසින් පවසා එය පන්තියේ සිසුවෙකුව නැවත පවසන ලෙස ඉල්ලා සිටිමින් මෙය දිගටම කරගෙන යාහැක. ඔබ විසින් සෑම ළමයෙකු සමගම මෙය කිහිප වතාවක් සිදු කිරීමෙන් පසු ඔබ පවසන අනුපිළිවෙල ළමයින්ට ඇඳීමට යෝජනා කිරීමෙන් මෙ ක්‍රීඩාව තවත් අභියෝගාත්මක කළ හැකිය.

## F. වර්ණ ගැන්වීම : 12 වැනි චිත්‍රය

## G. අවසන් කිරීමේ යාඥාව

# 13 වැනි පාඩම

## A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

මෙම පන්තියේදී සහ ඊළඟ පන්ති වාර තුන තුළදී ළමයින් විසින් පහත සඳහන් යාඥාව කටපාඩම් කරගැනීමට ඔවුන්ගේ උත්සාහය යොමු කරනු ඇත. 13 වැනි කොටසේදී යෝජනා කර ඇති පරිදි, ඔබ කටපාඩමින් ආරම්භක යාඥාවක් ගායනා කිරීමෙන් පසු සහ ඔබේ සිසුන් කිහිප දෙනෙකු ද යාඥා කිරීමෙන් පසු ඔබට එය ඔවුන්ට හඳුන්වා දිය හැක.

> **"අනේ ස්වාමීනි! මෙම මෘදු මොළොක් බීජය ඔබවහන්සේගේ නානාවිධ වරප්‍රසාදයන්ගේ උද්‍යානයෙහි සිටුවා, ඔබවහන්සේගේ ආදර කරුණාවේ උලපත්වලින් එයට ජලය එක්කර, ඔබවහන්සේගේ පිටාර ගලන අනුග්‍රහයෙන් සහ කරුණාව තුළින් එය වටිනා ශාඛයක්වීමේ වරප්‍රසාදය ලබාදෙන්න.**
>
> **"ඔබවහන්සේ අතිප්‍රබල සේක. බලවත් සේක."**[113]

## B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

සාධාරණ වන්න

සමූහ ගායනය:

```
                A
සාධාරණ වන්න, සාධාරණ වන්න

                E7    A
සෑම කෙනෙකුටම සුවපහසුව ලබාදෙන්න උත්සාහ කරන්න

                A
සාධාරණ වන්න, සාධාරණ වන්න

                E7    A
සෑම කෙනෙකුටම සුවපහසුව ලබාදෙන්න උත්සාහ කරන්න
```

A E
අන් අය සමඟ අපගේ ගනුදෙනුවේදී සාධාරණ වන්න

E7 A
සහෝදර සහෝදරියන් අතර විශ්වාසය ඇති වන්නේ

A7 D
අප සමානව බෙදා හදා ගැනීමෙනි

E A
ලෝකයට දැකියහැකි ලෙස යුක්තිය බැබළේ

සමූහ ගායනය

ඔබ සත්‍ය සුවපහසුව සහ උපකාර කරනවිට
ගුරුතුමාණන්ගේ මාර්ගයේ ඔබ ගමන් කරනු ඇත
ඔබගේ වචන සහ ක්‍රියාවන් ඥානවන්ත හා සාධාරණ වූවිට
ඔබ අවට අයගේ හදවත් ප්‍රීතිමත් කරනු ඇත.

සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම පාඩමේදී ළමයින් විසින් ඉගෙන ගන්නා අනුකම්පාවේ ගුණාංගය පිළිබඳ උද්ධෘත පාඨය පහත පරිදි ඔබට ඉදිරිපත් කළ හැකිය.

දෙවියන්වහන්සේ ඉත්මත් දයාවන්කම්පිත සහ සර්වානුම්පිත වන සේක. දුෂ්කර කාලවලදී, අපි අපගේ හදවත් උන්වහන්සේ වෙතට හරවා, අපව සුවපහසුව සහ අපව ශක්තිමත් කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටිමු. ඒ නිසා අපිත් අන් අයට දයානුකම්පාව පෙන්විය යුතුයි. අප දන්නා හඳුනන කෙනෙකුට ප්‍රශ්නයක් හෝ දුකක් ඇති වූ විට, ඔහු හෝ ඇයව තේරුම් ගැනීමට සහ උපකාර කිරීමට අප අපට හැකි උපරිමය එය සිදු කළ යුතුය. සියලු තත්වයන් යටතේ, අපට ගල් ගසන අයටද ඇතුළුව අපි සෑම කෙනෙකුටම අනුකම්පාවෙන් හා කරුණාවෙන් සිටිය යුත්තේ සෑම සහ සියළුම දෙනාට ඵලයන් ලබාදෙන වෘක්ෂය මෙනි. අබ්දුල් බාහා තම ජීවිතය දුෂ්කරතාවලින් පිරී තිබුණද, සෑම විටම, සියලු මිනිසුන්ට අනුකම්පාව දැක්වීය. දයානුකම්පිතවීම සඳහා වූ අපගේ උත්සාහයට උපකාර කිරීම සඳහා, අපි එතුමාගේ පහත වචන කටපාඩම් කරගනිමු:

**"දෙවියන්වහන්සේගේ රාජධානිය ප්‍රතිස්ථාපිත වී ඇත්තේ සාධරණත්වය සහ යුක්තිය මත මෙන්ම සෑම ජීවමාන ආත්මයකටම දක්වන දයාව, අනුකම්පාව සහ කරුණාව මතයි."**[114]

*ප්‍රතිස්ථාපිත*

1. වෛද්‍යාවරයා ගම්වල දරුවන්ගේ සෞඛ්‍යය ගැන සැලකිලිමත් වූ අතර, ඔවුන් රැකබලා ගැනීම සඳහා ඔහු සායනයක් විවෘත කළේය. සායනය ස්ථාපිත වුයේ දරුවන් කෙරෙහි ඇති ඔහුගේ ආදරය නිසාය.

2. ජෙනා සහ මර්සිඩීස් ඉතා දීර්ඝ කාලීන මිතුරන් වේ. ඔවුන් සෑම විටම එකට පාඩම් කරන අතර ඔවුන් ඉගෙනගත් ප්‍රයෝජනවත් දේවල් එකිනෙකා සමඟ බෙදා ගනී. ඔවුන්ගේ මිත්‍රත්වය කරුණාව සහ ආදරය මත පදනම් වී ඇත.

*සාධාරණත්වය*

1. රාජධානියේ සියලු මිනිසුන් එහි සමෘද්ධිය සඳහා වෙහෙස මහන්සි වී වැඩ කළහ. සියලු භෝග එක්රැස් වූ පසු, රජු ඒවා තම යටත්වැසියන් අතර ඔවුන්ගේ පවුල්වල ප්‍රමාණය අනුව බෙදා දුන්නේය. රජු තම යටත්වැසියන්ට සාධාරණ ලෙස සැලකුවේය.

2. නගර සභාවට ඊළඟ ගමට පාරක් සෑදීමට නියමිතව තිබුණි. මාර්ගය ගොවිබිම් වටා ඉදි කිරීමට තීරණය කළේය. මේ ආකාරයට නව මාර්ගයෙන් බොහෝ දෙනෙකුට ප්‍රතිලාභ ලබා ගැනීමට මෙන්ම ගොවීන්ටද හානියක් සිදු නොවීය. සභාව සිය තීරණයේ සාධාරණත්වය පිළිබඳ හැඟීමක් පෙන්නුම් කළේය.

*අනුකම්පාව*

1. තම මිතුරිය සහ්රා අසතුටින් සිටින බව ලී යොන්ග් දුටු බැවින් ඔහු ඇයට කෙසේ හෝ උදව් කළ හැකිද යන්න සොයා බැලීමට ගියේය. සහ්රා ඔහුට පැහැදිලි කළේ ඇගේ මව අසනීප වී රෝහලේ සිටින බවයි. ලී යොන්ග් සහ්රාට සවන් දී සැනසුවේ පසු දින ඇය සමඟ රෝහලට යාමට පැමිණෙන බවයි. ලී යොන්ග් සහරාට අනුකම්පාව දැක්වීය.

2. දිනක් ෂියෝරි ගම්බද ප්‍රදේශයක ඇවිදිමින් සිටින විට කුඩා බැටළු පැටවෙකුගේ කකුල වැටක සිරවී සිටිනු දුටුවාය. ෂියෝරි හෙමිහිට කකුල වැටෙන් මුදවාගෙන වෙළුම් පටියකින දැමීය. ෂියෝරි බැටළු පැටවාට අනුකම්පාව දැක්විය.

## D. කතාන්දරය

*අබ්දුල් බහාතුමා බටහිර රටවලට සංචාරයේ නිරතව සිටියදී, එතුමා ගිය සෑම නගරයකම, බොහෝ අය එතුමා මුණ ගැසීමට සහ එතුමාගේ දිරිගන්වන සුළු වචනවලට සවන් දීමට පැමිණියහ. දිවා රෑ එතුමා තරුණ, මහලු, ධනවත් සහ දුප්පතුන්, නිලධාරීන් සහ සාමාන්‍ය පුරවැසියන් වැනි සියලු දෙනා නියෝජනය වන මිනිසුන් හමුවිය. සමහරුන් ගුරුතුමාණන් කෙරෙහි ඇති දැඩි ආදරය නිසා පැමිණි අතර තවත් සමහරු උන්වහන්සේ කීමට ඇති දේ පිළිබඳ කුතුහලයෙන් පැමිණියහ.*

*දිනක් ගුරුතුමාණන් නවාතැන් ගෙන සිටි නිවසට කාන්තාවක් පැමිණ දොරට තට්ටු කළාය. ඇය අබ්දුල් බහාතුමා සමඟ සුළු මොහොතක් ගත කිරීමට ආශා කළ සාමාන්‍ය තැනැත්තියක් විය. "ඔබ ගුරුතුමාණන් හමුවීමට වේලාවක් වෙන්කර තිබේද?" දොර විවෘත කළ පුද්ගලයා ඇසුවේය. ඇය එසේ වේලාවක් වෙන් නොකළ බව පැවසුවාය. අබ්දුල් බහාතුමා ඉතා වැදගත් පුද්ගලයන් කිහිප දෙනෙකු මුණගැසෙන බැවින් ඇයට එතුමා මුණ ගැසීමට නොහැකි වනු ඇතැයි ඇයට දන්වන ලදී. ඇය දුකෙන් නැවත හැරී එම නිවස ඉදිරිපිට පඩිපෙළ බැස යන්නට වූවාය. ඇගේ සිත මොනතරම් කලකිරීමක්ද පිරී යන්නට ඇත්ද! නමුත් හදිසියේම අබ්දුල් බහාතුමාගෙන් පණිවිඩකරුවෙකු ඇය වෙත පැමිණ ආපසු පැමිණෙන ලෙස ඉල්ලා සිටියේය. ගුරුතුමාණන්ට ඇය දැකීමට අවශ්‍ය විය. "හදවතක් රිදී ඇත. ඉක්මන් කරන්න, ඉක්මන් කරන්න, ඇයව මා වෙත ගෙනෙන්න! " එතුමාගේ බලවත් සහ අධිකාරී හඬකින් පවසන්නට විය.*

## E. ක්‍රීඩාව "එක්ව"

එකිනෙකා දෙපැත්තට සිටගෙන සිටින පරිදි දරුවන් යුගල වශයෙන් බෙදා එක් දරුවෙකුගේ වම් පාදය අනෙක් දරුවාගේ දකුණු කකුලට බැඳින්න. මෙම ක්‍රීඩාව සාර්ථක කර ගැනීමට නම්, ඔවුන් එකට වැඩ කිරීමට ඉගෙන ගත යුතු බව දරුවන්ට පැහැදිලි කරන්න. ඉන්පසු සෑම යුගලයක්ම එක් නම් කරන ලද ස්ථානයක සිට තවත් ස්ථානයකට ගමන් කරවීමට සලස්වන්න. අතු සහ ගල් වැනි කුඩා බාධක ඔවුන්ගේ ගමන් මාර්ගයේ තැබීමෙන් ඔබට ක්‍රීඩාව වඩාත් අභියෝගාත්මක කළ හැකිය. එය ආරක්ෂිතව සිදු කිරීමට වග බලාගන්න. ඊට අමතව සරලව ඇවිදීම වෙනුවට, යුගලට ගෙම්බන් මෙන් පැනීමට, අශ්වයන් මෙන් ගමන් කරන ලෙසද ඉල්ලා සිටිය හැකිය. එක් යුගලයක් අනෙක් යුගලයන් සමඟ තරඟ නොකරන බව දරුවන්ට පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

**F. වර්ණ ගැන්වීම : 13 වැනි චිත්‍රය**

**G. අවසන් කිරීමේ යාඥාව**

## 14 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

සෑම විටම මෙන්, ඔබ සහ සිසුන් කිහිප දෙනෙකු පන්තිය ආරම්භ කිරීම සඳහා යාඥා කිහිපයක් ගායනා යුතුය. පසුව ළමයින්ට පෙර පාඩමේ ඉදිරිපත් කළ යාඥාව කටපාඩම් කිරීමට දිගටම කරගෙන යාහැකිය.

### B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

මධ්‍යස්ථතාවයේ පියාපත් මත

සමූහ ගායනය:

C F G

දවසක්දා කුරුල්ලෙක් ඉහළ අහසේ පියඹමින් සිටියා

C F G

අතිශය ප්‍රීතියෙන් හා විශ්වාසයෙන්

C F G C F G

පරාදීසයේ ඉහළ උගේ අහසේ

C F G C F G

කුරුල්ලා පියඹා යනවිට බඩගිනි වැඩි වන්න විය

C F G C F G

එබැවින් ඌ පහළ ජලය හා පොළව දෙසට හැරුණි

C F

පහළ බිමට

G C F

කුරුල්ලා එහි කොටුවිය

G C

කුරුල්ලාගේ ආශාව මගින්

F G C F G

ඌගේ පියාපත් මඩින් වැසී ගියා\

C

පියඹන්නට නොහැකි තරම් බරවැඩි විය

G C F G

කුරුල්ලා නැවත ඌෆග් නිවසට යා නොහැකි විය

සමූහ ගායනය

ඒ කුරුල්ලා මෙන් මමත් ස්වර්ගයට අයත් වෙමි
එහෙයින් මම පහළ පොළොවේ නොඇලෙමි
මම ධනයට නොඇලෙමි
මම මාගේ අපේක්ෂාවන්ට නොඇලෙමි
දෙවියන්වහන්සේ හැර අන් කිසිවකට නොඇලෙමි

C G F G
එහෙයින් මම මධ්‍යස්ථතාවයේ මාවතේ ගමන් කරමි

C G F G
මම මධ්‍යස්ථතාවයේ පියපත් මත ඉහළට යමි

C G F
දෙවියන්වහන්සේ හැර

C
මම සියළු බැඳීම්වලින් නිදහස් වෙමි (නැවත කියන්න)

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම පාඩමේ තේමාව වන මධ්‍යස්ථතාවයේ ගුණාංගය පිළිබඳ උද්ධෘත පාඨය ළමයින් විසින් කටපාඩම් කරගනු ඇත. ඔබට පහත ආකාරයෙන් ඔවුන්ට මෙම තේමාව හඳුන්වා දිය හැක.

අපගේ ජීවන තත්වයන් වැඩි දියුණු කිරීමට අපට නව සොයාගැනීම් සිදු කිරීම සහ නව නිපැයුම් නිර්මාණය කිරීමට අපට හැකියාව ලබාදීම සඳහා හොඳ සෞඛ්‍යය, රසවත් ආහාර, ආදරය සහ මිත්‍රත්වය, සොබාදහමේ සුන්දරත්වය සහ මනසෙහි බලයන් වන මේ ලෝකයේ සෑම යහපත් දෙයක් දෙවියන්වහන්සේ මවා ඇත්තේ අපට භුක්ති විඳීමය. අපි දෙවියන්වහන්සේගේ සියලු වරප්‍රසාද ප්‍රයෝජනයට ගත යුතු අතර ජීවත්වීමේ ප්‍රීතිය වෙනුවෙන් උන්වහන්සේට ස්තුතිවන්ත විය යුතුය. නමුත් අපි මේ ලෝකයට ඇලී නොසිටීමට පරිස්සම් විය යුතුයි. අපගේ ආත්මය සෑම විටම නිදහස් විය යුතු අතර නිදහස් හා ශක්තිමත් කුරුල්ලන් මෙන්, එය ශුද්ධත්වයේ ස්වර්ගයේ නැඟිය යුතුය. කුරුල්ලෙකු තමා අවට ඇති දේවලට ඇති ඇල්ම නිසා පියාසර කිරීමට නොහැකිව පොළොවේ රැඳී සිටීම කොතරම් කණගාටුදායකද? අපි පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු:

**"ඔබගේ සත්‍ය ආභරණය සමන්විත වන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය සහ උන්වහන්සේ හැර අන් සියල්ලේන්ම වෙන්වීම තුල බව ඔබ දැන්ගන්න…"**[115]

*සමන්විත*

1. වලැඩිස්ලාව්ගේ දිවා ආහාරය සඳහා සොසේජස්, අර්තාපල් කිහිපයක් සහ බෝංචි තිබුණි. ඔහුගේ දිවා ආහාර සොසේජස්, අර්තාපල් සහ බෝංචිවලින් සමන්විත විය.

2. මෙම වාක්‍යයේ වචන පහක් ඇත. එය වචන පහකින් සමන්විත වේ.

*වෙන්වීම*

1. හෙල්ජිට ඇත්තවශයෙන්ම ඔහුගේ මිතුරන් සමඟ පිහිනීමට අවශ්‍යවිය. නමුත් ඔහුගේ වට වෙළඳ සැලට යෑමට අවශය නිසා ඔහු සහෝදරියත් සමඟ නිවසේ නතරවිය. හෙල්ජි තම පවුලට උදව් කිරීමට අවශ්‍ය නිසා ඔහුගේ සැලසුම්වලින් දුරස්වූ බවක් පෙන්නුම් කළේය.

2. පාසල් වසර අවසානයේදී ගුරුතුමාට මල් ලබා දුනහොත් හොඳ බව අංජලී සිතන්නට විය. ඒ වෙනුවට කේක් එකක් සකස් කරන ලෙස ඇගේ සහෝදරිය යෝජනා කළාය. අංජලීද එය හොඳ අදහසක් බව සිතුවාය. ඇය ඇයගේ පළමු අදහසින් වෙන්වූවාය.

*හැර අන්සියල්ල*

1. ඉගෙන නොගත් අයෙකු හැර අනෙකුත් සියළුම ළමයින් විභාගය හොඳින් සමත් විය. එක් සිසුවෙක් හැර අන්සියල්ල පරීක්ෂණය හොඳින් සමත්විය.

2. පවුලේ අයට විශේෂ කෑම වේලක් සකස් කිරීමට අම්මාට අවශ්‍ය විය. ඒ සඳහා වැදගත් එක් අමුද්‍රව්‍යක් නොමැති බැවින් එය කළ නොහැකි බව ඇයට අවබෝධ විය. ඇය සතුව එක් අමුද්‍රව්‍යක් හැර අන්සියල්ලම තිබුණි.

## D. කතාන්දරය

*දිනක් දීර්ඝ කාලයක් මිතුරන්ව සිටි දෙදෙනෙක් තේ පානය කරමින් අධ්‍යාත්මික කරුණු සාකච්ඡා කරමින් සිටියහ. දැන්, මෙම පුද්ගලයිනගෙන් එක් අයෙකු තම ජීවිත කාලය තුළ බොහෝ ධනය රැස් කර ඇති අතර කිසිවක් අවශය නොවිය. අනෙකාට එතරම් වත්කම් නොතිබිණ. “මම ශුද්ධ භූමියට සංචාරය කිරීමට කැමතියි,” දෙවැන්නා තම ධනවත් මිතුරාට පැවසීය. පළමු පුද්ගලයා පැකිලීමකින් තොරව පිළිතුරු දෙමින්, “මෙය අපූරු අදහසක්! මමත් ඔබ හා එක්වන්නෙමි." යයි පවසා දෙදෙනාම තම තේ කෝප්ප බිම තබා එකවරම නැඟිට ශුද්ධ භූමිය දෙසට ගමන් කළහ.*

*රාත්‍රිය උදාවන විටත් ඔවුන් ඇවිද ගොස් තිබුණේ සුළු ප්‍රමාණයකි. දුප්පත් පුද්ගලයා වේගය අඩු කර නැවතී, “මගේ මිත්‍රය, අපි රාත්‍රිය ගත කිරීමට අපේ නිවෙස්වලට යමු. එය වඩාත් සුවපහසු වනු ඇත, අපට උදේ නැවත ආරම්භ කළ හැකිය.” යනුවෙන් පැවසීය. "ඇත් ඇයි අපි ආපහු හැරෙන්නෙ?" අනෙක් පුද්ගලයා පිළිතුරු දෙමින් ඇසුවේය. "අපි ශුද්ධ භූමියට යන ගමන් ඉන්නේ!" එසේ වුවද ඔහුගේ මිතුරා සෑහීමකට පත් නොවීය. "ශුද්ධ භූමියට පයින් ගමන් කිරීමට බොහෝ දුරයි" " මට ආපසු ගොස් අඩුම තරමින් මම අත්හැර යාමට අකමැති මගේ බුරුවා ගෙන ඒමට ඉඩ දෙන්න." ඔහු නැවතත් උත්සාහ කළේය.*

*“එසේ නම්, මේ සෑම දෙයකින්ම පසු, සමහරවිට මේ ගමනට මවෙ කැටුව යන්නේ ඔබ නොවෙයි. මම ඉතා සතුටින්, අශ්වයන්, ඉඩකඩම් සහ වටිනා ඇඳුම් ආදී විශාල සැපසම්පත් අත්හැර පැමිණිත් මට ඒවා අහිමිවීම පිළිබඳ හැඟීමක් ඇතිවී නැහැ. මොකද ශුද්ධ වූ භූමියේ එක මොහොතක් හෝ ගත කිරීම වඩා වෙනත් විශාල වරප්‍රසාදයක් තිබේද? ඔබට අඩුමගානේ බුරුවාවත් දාලා යන්න බැරිද?” යනුවෙන් පොහොසත් පුද්ගලයා ඇසුවේය. කනගාටු දායක ලෙස, ඔහුට ඔහුගේ වටිනා වස්තුව අත්හැරීමට නොහැකි විය. එබැවින් ඔහු තම මිතුරා අත්හැර ගියේය, පොහොසත් මිතුරා ශුද්ධ භූමියට යන ගමන දිගටම කරගෙන ගිය අතර කිසි විටෙකත් ආපසු හැරී බැලුවේ නැත.*

## E. ක්‍රීඩාව “රෝදය”

ළමයින්ට වෘත්තයක ආකාරයෙන් සිටගෙන ඔවුන්ගේ වම් දැත් මැද ඇතුළට වන පරිදි දිගු කර, අත් අල්ලා ගන්නා ලෙස ඉල්ලා සිටින්න. ඔවුන් දැන් රෝදයකට සමාන විය යුතුය, ඔවුන්ගේ දැත් එහි ගරාදිය (ස්පෝක්) ලෙස සකස් වීඇත. ඊළඟට, ළමයින් කේන්ද්‍රය වටා රෝදයක් මෙන් රවුමට කැරකිය යුතුය. ඔවුන් එසේ කළ පසු, පන්තිය පැවැත්වෙන අවකාශය වටා ඔවුන්ගේ නිර්මාණය බිඳී නොයන පරිදි රවුමට ගමන් කරන ලෙස ඔවුන්ට කියන්න. උඩපැනීම සහ යම්දුරක් පැනීම ඔවුන්ගේ ගමනට එක්කර මෙය තවත් අභියෝගාත්මක කළ හැක.

ළමයින් බිම රවුමක ආකාරයෙන් ඉඳගෙන එහි කේන්ද්‍රය තුළ ඔවුන්ගේ පාද ස්පර්ශ වන පරිදි ඔවුන්ගේ කකුල් කෙළින් දිගු කිරීමෙන් ඔබට ක්‍රීඩාව තවදුරටත් අභියෝගාත්මක කළ හැකිය. ඉන්පසු ඔවුන් තම අත්ල ඔවුන්ගේ ඉණට පහළින් බිම තැබිය යුතුය. ඔවුන් දැන් රෝදය චලනය කිරීමට සූදානම් විය යුතුය. එසේ කිරීම සඳහා, ඔවුන් සියල්ලන්ම තම දෑතින් ඉහළට එසවී එක් පියවරක් දකුණට චලනය විය යුතුය. ඔවුන් මේ ආකාරයෙන් රෝදයේ කේන්ද්‍රයේ ඔවුන්ගේ පාද තබාගනිමින් තම දෑතින් පියවරෙන් පියවර සම්පූර්ණ චක්‍රයක් භ්‍රමණය වන තුරු සිදු කරගෙන යා යුතුය.

**F. වර්ණ ගැන්වීම : 14 වැනි චිත්‍රය**

**G. අවසන් කිරීමේ යාඥාව**

## 15 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

ආරම්භක යාඥාවන් කියවා අවසන් වූ පසු, 13 වන පාඩමේ හඳුන්වා දුන් යාඥාව කටපාඩම් කිරීමට ඔබට ළමයින්ට උපකාර කළ හැක.

### B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

මගේ කොටස මට දෙන්න

සමූහ ගායනය:

A
මාගේ කොටස මට ලබාදන්න

D A
අනේ ස්වාමීනි, අනේ ස්වාමීනි

A D A
මාගේ කොටස මට ලබාදන්න

E A
ඔබවහන්සේගේ අභිප්‍රාය පරිදි

A
සෑහීමට පත්වීමට එය පහසුවේ

D A
සිද්ධීන හොඳින් සිදුවනවිට

A
සෑහීමට පත්වීමට එය පහසුවේ

E A
ඔබට වැඩිවීමක් දැනෙන විට

D A
නමුත් සත්‍යවශයෙන්ම වඩා අභියෝගාත්මක වන්නේ

E A
යමක් වැරදුනු විටත් සෑහීමට පත්වීමයි

D A
දුෂ්කර අවස්ථාවන්වලදී ඉවසිලිවන්ත වීමයි

E A
සමහරවිට ගීතයක් ගායනා කල හැකිය

සමූහ ගායනය

එතුමා කුඩා ළමයෙකුවූ කල සිට ගුරුතුමාණන් අවමන් වින්දා
එතුමාගේ ජීවිතයේ මුල් අවධියේ සිට
එතුමාට සුවපහසුවක් හෝ සහනයක් නැතිකරම් විය
නමුත් එතුමා සතුටින් හා සන්සුනව සිටියා
කිසිවිටකත් කණස්සල්ලට පත් නොවිනි
එතුමා දෙවියන්වහන්සේ විශ්වාස කර
උන්වහන්සේගේ කැමැත්ත පිළිගත්තා
සැමවිට ඉවසීමෙන් සිටියා

සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

පහත දැක්වෙන්නේ ඔබට පාඩමේ තේමාව ඉදිරිපත් කිරීමට උපකාර වන අදහස් කිහිපයක් වන අතර දක්වා ඇති උද්ධෘත පාඨය ළමයින් විසින් කටපාඩම් කිරීමට ඉගෙන ගනු ඇත.

අබ්දුල් බහාතුමා සැම තත්වයක් යටතේදීම දෙවියන් වහන්සේගේ කැමැත්තෙන් සෑහීමට පත් විය. සැම දෙයක්ම හොඳින් සිදුවන විට, කෙනෙකු නිරෝගීව සහ සුවපහසුවකින් ජීවත් වන විට සෑහීමකට පත්වීම පහසු බව එතුමා අවට සිටින අයට නිතර කියන්නට විය. වඩාත් දුෂ්කරවන්නේ ආපදාවන් ගෙන් යුත් කාලවලදී, අසනීප හා දුෂ්කර කාලවලදී සතුට හා තෘප්තිමත් වීමයි. එතුමාගේ ජීවිතය දුක් වේදනාවන්ගෙන් පිරී ඇති තිබුණත් අබ්දුල් බහාතුමා කිසිවිටෙකත් අධෛර්යයට පත්නොවිනි. ඉතා බරපතල හා දුෂ්කර කාලවලදී පවා එතුමා සෑහීමට පත් වූ අතර දෙවියන්වහන්සේට ස්තුතිවන්ත විය. එතුමා සැමවිටම සතුටින් සහ ශුභවාදී සිතින් යුක්ත විය. සැම අවස්ථාවකදීම අපට දෙවියන්වහන්සේගේ කැමැත්ත සමඟ තෘප්තිමත්වීමේ වටිනාකම අපගේ මතකයට නැංවෙනු සඳහා පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු.

**“ස්වාමීන්වහන්සේ විසින් ප්‍රදාණය කරනලද ඕනෑම දෙයක් පිළිගැනීම සහ දෙවියන්වහන්සේ විසින් නියම කරන ලද දෙයින් තෘප්තිමත්වීම සැම මහිමයකම උල්පත වේ.”**[116]

*මහිමය*

1. පාසැලේදී විද්‍යාව හැදෑරීමෙන් පසු පොහ් ලෙන්ග් විද්‍යාඥයින් කණ්ඩායමකට සම්බන්ධ විය. ඔවුන් බොහෝ වැදගත් සොයාගැනීම් සිදු කරන ලදි. අයගේ ක්‍රියාවෙන් ඇය පවුලේ නමට කීර්තියක් අත්කර දුන්නාය.

2. ස්වී කඳු, ගස් සහ මුහුද දෙස වැනි ස්වභාවධර්මය දෙස බැලීමට ප්‍රියා කළාය. ඇය ලෝකයේ සුන්දරත්වය දකින සැමවිටම, සියළුදේහිම නිර්මාතෘවරයාණන් වන දෙවියන්වහන්සේගේ තේජස හා ශ්‍රේෂ්ඨත්වය ගැන ඇය සිතුවාය. ස්වභාවධර්මය දෙස බලනවිට ස්වීට දෙවියන්වහන්සේගේ මහිමය පිළිබඳ කල්පනා කළාය.

*ප්‍රදානය*

1. තම ආදරණීය පවුල, තමන්ගේ යහපත් සෞඛ්‍යය සහ දෙවියන්වහන්සේ ඔහුට ලබා දී ඇති සියලු යහපත් දේ සඳහා පාවුලෝ සැම දිනකම දෙවියන්වහන්සේට ස්තුති කළේය. දෙවියන්වහන්සේ ඔහුට දී ඇති බොහෝ ප්‍රදානයන් පිළිබඳ පාවුලෝ කෘතඥශීලි විය.

2. සූර්යයා නොමැතිව පෘථිවිය අඳුරු හා සීතලවනු ඇති අතර කිසිවකට එහි ජීවත් විය නොහැකි වේ. සූර්යයා අපට ආලෝකය සහ උණුසුම ප්‍රදානය කරයි.

*නියම කරනලද*

1. රජතුමා විසින් තම රටේ සියලු ජනතාව වසන්තයේ කාලයේ පළමු දිනයේ වැඩ නොකළ යුතු බවට නියෝගයක් ලබා දුන්නේය. වසන්ත කාලයේ පළමු දිනය නිවාඩු දිනයක් ලෙස නියම කරන ලදී.

2. මාස ගණනාවක් තිස්සේ කලාපයට වැසි නොලැබුණු හෙයින් ජලය භාවිතය සීමා කරන ලෙස ගම් සභාව විසින් ජනතාවට නියෝග කරන ලදී. ජලය ඉතිරි කර ගැනීම සඳහා සභාව විසින් මෙම සීමා කිරීම් නියම කරන ලදී.

## D. කතාන්දරය

*එක් සැන්දෑවක, අබ්දුල් බහාතුමා බහායිවරුන් කිහිප දෙනෙකු සමඟ අලංකාරවත් ලන්ඩන් නගරයේ ඇවිදිමින් සිටියේය. ඔවුන් ගමන් ගත් වීදියේ දෙපසම ඇසට පෙනෙන තාක්දුරට විහිදෙන ලෙස දිලිසෙන පහන් දල්වා තිබුණි. ආදරණීය ගුරුතුමාණන්ගේ ඇසුරේ සිටි අයට දැනුණේ තමන්ගේ හදවත වෙනත් ලෝකයකට රැගෙන ගියාක් මෙනි.*

*“මෙම දර්ශනයෙන් මම ගොඩක් සතුටු වෙනවා, මෙහි ආලෝකය හොඳයි, වඩාත්ම හොඳයි. ඇකා සිරගෙදර බොහෝ අන්ධකාරයි. ” අබ්දුල් බහාතුමා ප්‍රකාශ කරන්නය විය.*

*අබ්දුල් බහාතුමාට ආදරය කළ මෙම කුඩා මිතුරන් කණ්ඩායම, එතුමා තම පියාණන් වන බහා‘උ’ල්ලා තුමා සමඟ වසර ගණනාවක් සිරකරුවෙකු ලෙස ඇකා බන්ධනාගාර නගරයේ ගත කළ ජීවිතය සිහිපත් කරමින් ශෝකයට පත් විය. එය ඉතා අප්‍රසාදයකින් යුත් ස්ථානයක් වූ අතර, පවුලේ දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය. "ආනේ, ඔබතුමා නිදහස් වීම ගැන අපි ඉතාමත් සතුටට පත්වෙනවා" කියා ඔවුන් පැවසුහ.*

*" ඒ දවස් සේවා මාවතේ ගෙවී ගිය නිසා මම එම සිරගෙදර සතුටින් සිටියා." එයට අබ්දුල් බහාතුමා එලෙස ප්‍රතිචාර දක්වමින් පැවසුහ. සිරගෙයක් ලෙස ශ්‍රේෂ්ඨතම සිරගෙය එය බව උන්වහන්සේ ඔවුන්ට පැවසුහ. අපි අප ගැන පමණක් සිතනවා නම් සහ අප අවට සිටින අය ගැන නොසිතන්නේ නම් අප සැබවින්ම සිරගතව ඇති බවත්, අප සැබවින්ම දුක් විඳින බවත්! අබ්දුල් බහාතුමා සැමවිටම තෘප්තිමත් වූයේ උන්වහන්සේ දෙවියන්වහන්සේට සහ මනුෂ්‍ය වර්ගයාට සේවය කිරීමේ මාවතේ ගමන් කළ බැවින් බව ඔබට දැකගත හැක. එලෙසම, ඇකා හි සිරකරුවෙකු ලෙස එතුමා ගතකළ අඳුරුතම දිනවලදී පවා, එතුමාගේ අසමසම ආත්මයේ ආලෝකයෙන් අන් අයට උණුසුම සහ සැනසීම ලබාදුනි.*

## E. ක්‍රීඩාව “මූර්ති ශිල්පියා”

ඔබ මූර්ති ශිල්පියෙකු ලෙස කටයුතු කරන අතර ඔබේ කලා නිර්මාණය සඳහා ළමයින්න් ඔබට උපකාර කරනු ඇත. ළමයෙකුට පන්තිය ඉදිරිපිටට පැමිණ, උදාහරණයක් ලෙස, දෑත් දිගු කර නැමී සිටීම වැනි ඔබ නිරූපණය කරන ඉරියව්වක සිටින ලෙස ඉල්ලා සිටින්න. ඉන්පසුව, කණ්ඩායමේ අනෙක් ළමයින් එක එක්නා බැගින් හෝ කිහිප දෙනෙකු, පන්ති ඉදිරිපසට කැඳවා ඔවුන් අනුකරණය කළ යුතු ඉරියව් පෙන්විය යුතුය. ඔවුන් සියල්ලන්ම ඔවුන්ගේ ඉරියව් අවබෝධ කරගත් පසු, ඔවුන් එකට එකතු කර කලා නිර්මාණය සකස් කරන්න. ඉන්පසු එහි අවසාන කොටස ලෙස ටද කණ්ඩායමට එකතු වියහැක.

ඔබේ සිසුන් යුගල වශයෙන් බෙදීමෙන් ඔබට මෙම ක්‍රීඩාව දිගටම කරගෙන යා හැක. එක් යුගලයේ එක් අයෙක් මූර්ති ශිල්පියා ලෙස පෙනී සිටින අතර අනෙක් සිසුව ඉරියව් නිරූපණය කරන ලෙස, මාරුවෙන් මාරුවට මෙය සිදු කළ හැක.

මෙහි සඳහන් ආකාරයෙන් ඔබට මෙම ක්‍රීඩාවේ වෙනත් වෙනස්කම් ගැනද සිතිය හැක. උදාහරණයක් ලෙස, ඔබට "ඔබට වැටක් විය හැකිද?" නොඑසේනම් "ඔබට ගෙවත්තක් විය හැකිද?" වැනි ප්‍රශ්න ඇසිය හැකි අතර එවිට ළමයින් තමන් කැමති ආකාරයට සකස් කර ගැනීමෙන් එය ප්‍රතිචාර දක්වනු ඇත.

**F. වර්ණ ගැන්වීම : 15 වැනි චිත්‍රය**

**G. අවස න් කිරීමේ යාඥාව**

## 16 වැනි පාඩම

**A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම**

මෙම පන්තිය වාරය වනවිට 13 වන පාඩමේ හඳුන්වා දී ඇති යාඥාව කටපාඩමින් ගායනා කිරීමට ළමයින්ට හැකි විය යුතු අතර එය ඔබට ආරම්භ යාඥා මෙහෙයෙන් පසු ඔවුන් සමඟ සමාලෝචනය කළ හැකිය.

**B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)**

අප දිය බිඳු මෙන් වෙමු

C
අප දිය බිඳු මෙන් වෙමු
අප දිය බිඳු මෙන් වෙමු (පසුබිම් හඬ)

C
එකම සාගරයක
එකම සාගරයක

F
අප දිය රැළි මෙන් වෙමු
අප දිය රැළි මෙන් වෙමු

G
එකම මුහුදක
එකම මුහුදක

සමූහ ගායනය:

C
එන්න අපහා එක් වන්න
එන්න අපහා එක් වන්න (පසුබිම් හඬ)

F
අප හා එකිමුතුකම සෙවීම සඳහා

C G C F C
එය ඔබගේත් මාගේ ජීවන මඟ වේ

අප මල් මෙන් වෙමු (පසුබිම් හඬ)
එකම උයනක
අප කොළ මෙන් වෙමු
එකම ගසක

සමූහ ගායනය

මුළු ලොවම (පසුබිම් හඬ)
එකම රටකි
සැවොම එකම මිනිසුන් ලෙස
ඔබට දැකිය හැකිද

සමූහ ගායනය (අවසාන වාක්‍ය නැවත ගායනා කරන්න)

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

පාඩමේ තේමාව වන කරුණාවන්ත භාවය හඳුන්වාදීම සඳහා උපකාරී වන අදහස් කිහිපයක් සහ ළමයින්ට කටපාඩම් කරගැනීමට ඇති උද්ධෘත පාඨය පහත සඳහන් වේ.

දෙවියන් වහන්සේ සියළුම මිනිසුන් නිර්මාණය කර ඇත්තේ එකම පවුලක් ලෙස එකට ජීවත් වීමටය. එය සිදු කිරීමට නම් අපි අතරේ මතභේද ඇති වීමට ඉඩ නොදිය යුතුය. ඒ වෙනුවට, අපගේ හදවත් තුළ ආදරය හා කරුණාවෙනු යුතුව අපි සෑම ආගමකම, ජාතියකම සහ පසුබිමක මිනිසුන් සමඟ ඇසුරු කළ යුතුය. මෙය මතක තබා ගැනීමට අපට උපකාර කිරීම සඳහා, අපි බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය මතක තබා ගනිමු.

**"සියළුම මිනිසුන් සමඟ උපරිම කරුණාවෙන් සහ ආදරයෙන් ඇසුරු කරන තැනැත්තා ආශිර්වාදලත් අයෙකු වේ."**[117]

*ඇසුරු කරනවා*

1. කුඩාරාජලියා සහ කච්බර්ඩ් යනු තණබිම් වල ජීවත් වන පක්ෂීන් වර්ග දෙකකි. ඔවුන් බොහෝ විට එකට සිටිනු දැකගත හැක. මෙම පක්ෂීන් වර්ග දෙක එකට ඇසුරු කරයි.

2. ආධ්‍යාත්මික මෙහෙයේ යාඥා කියවීමෙන් පසු මිනිසුන් එහි රැඳී එකිනෙකා ඇසුරු කරන්නට විය.

## D. කතාන්දරය

*අපගේ පෙර කතාන්දර කිහිපයක් මඟින් අබ්දුල් බහාතුමා ප්‍රථම වරට ඇකා නගරයට පැමිණිවිට බොහෝ මිනිසුන් එතුමාට නරක ලෙස සැලකූ බව ඔබ දන්නවා ඇත. ඔවුන් බහායිවරුන්ට කුරිරු වූ අතර ඔවුන් සමඟ කතා කිරීමට අකමැති විය. ඔවුහු බහායිවරුන්ට කුරිරු ලෙස සැලකූ අතර ඔවුන් සමඟ කතා කිරීමට අකමැති විය. කෙසේ වෙතත්, වැඩි කල් නොගොස්, බහායිවරුන් ආදරය හා කරුණාවන්ත බව ඔවුන් අවබෝධ කරගත් අතර, සෙමෙන් බොහෝ නගරවාසීන් ඔවුන්ට කරුණාව දැක්වීමට පටන් ගත්හ. නමුත් තවදුරටත් තරහ වෛරයේ ඇලීසිටි කිහිප දෙනෙකු සිටින ලදි.*

*දිනක්, අබ්දුල් බහාතුමා කෙරෙහි තවදුරටත් දැඩි වෛරයක් සිතේ තබාගෙන සිටි මිනිසෙකුට අන් අය එතුමාගේ ශ්‍රේෂ්ඨත්වය සහ යහපත්කම ගැන ප්‍රශංසා කරනු ඇසෙන්නට විය. මෙයින් මිනිසා කෝපයට පත්විය. ඔවුන් සියල්ලෝම ගරු කරන මෙම පුද්ගලයා එතරම් අපූරු නොවන බව ඔහු ඔවුන්ට පෙන්වා දෙන්නම් යයි ඔහු කෝපයෙන් පැවසීය. ඔහුගේ හදවත කෝපයෙන් දැවෙමින් ඔහු එතැනින් පිටත්ව ගියේය. අබ්දුල් බහාතුමා එම අවස්ථාවේදී පල්ලියේ යාඥා කරමින් සිටින බව ඔහු දැන සිටි හෙයින් ආදරණීය ගුරුතුමාණන්ට ප්‍රචණ්ඩත්යෙන් යමක් සිදු කිරීමට සූදානම්ව ඔහු එතැනට දිව ගියේය. නමුත් අබ්දුල් බහාතුමා ඔහු දෙස සන්සුන්ව හා ගෞරවයෙන් බැලීය. අපට වඩා වෙනස් වූ අයට මෙන්ම සියළුම ආගන්තුකයින්ට අපි ත්‍යාගශීලී විය යුතු බවට දෙවියන් වහන්සේගේ ඉගැන්වීම් එතුමා ආදරයෙන් ඔහුට මතක් කර දුන්නේය. මෙහිදී, අබ්දුල් බහාතුමා සහ බහායිවරුන් සැබවින්ම තම නිවස වන ඇකා හි අමුත්තන් මෙන් වන බව එම මිනිසාට වැටහී යන ලදි. එසේම, ත්‍යාගශීලී සත්කාරකයකු මෙන් තමන් ඔවුන් ආදරයෙන් පිළිගෙන කරුණාවෙන් සැලකිය යුතු බවත් අවබෝධ කරගත්තේය.*

**E. ක්‍රීඩාව "සැඟවුණු ගුණාංග"**

ඔවුන්ගේ අත් දෙක ඔවුන් ඉදිරියේ තබාගෙන රවුමක් සාදන ලෙස ළමයින්ට කියන්න. ගල් කැටයක් වැනි කුඩා වස්තුවක් අල්ලාගෙන රවුම මැද සිටගෙන සිටින්න. එම වස්තුව ගුණාංගයක් නියෝජනය කරන අතර උදාහරණයක් ලෙස, "කරුණාව" දැක්විය හැක. ඔබ රවුම වටේ ගමන් කරන විට, සෑම දරුවෙකුගේම දෑත් මත ඔබේ අත තබා ගුණාංගයක් සඳහන් කළ හැකි අතර, උදාහරණයක් ලෙස, "ජෝන් කරුණාවන්තයි", "ඉසබෙලා කරුණාවන්තයි", "ඩර්වි කරුණාවන්තයි" යනාදිය දැක්විය හැක. ඔබ ඔහුට හෝ ඇයට වස්තුව ලබා දී ඇති ආකාරයට රඟ දක්වමින් සෑම ළමයෙකුම ඔහුගේ හෝ ඇයගේ දෑත් වසා ගත යුතුය. ඔබ ඇත්ත වශයෙන්ම එම වස්තුව එක් ළමයෙකුගේ අත තැබිය යුතුය. ඔබ මුළු රවුම වටා ගිය පසු, එක් ළමයෙකු වස්තුව ඇත්තේ කාඅතදැයි අනුමාන කිරීමට උත්සාහ කළ යුතුය, උදාහරණයක් ලෙස, "කෙන්ජි ඉතා කරුණාවන්තයි." යනුවෙන් පැවසිය හැක. ඊට පස්සේ කෙන්ජි අත දිග හැර වස්තුව ඔහු ළඟ තිබේද නැද්ද යන්න පෙන්විය යුතුය. වස්තුව ඇත්තේ කවුරුන්ද යන්න අනුමාන කිරීමට එක් ළමයෙකුට උත්සාහ තුනක් ලබා දිය යුතු අතර, පසුව ක්‍රීඩාව වෙනත් ගුණාංගයක් භාවිතයෙන් නැවත නැවතත් කළ හැකිය. සෑම ළමයෙකුටම අවම වශයෙන් එක් අවස්ථාවක් වස්තුව ලබා දෙන බවට ඔබ සහතික විය යුතුය.

**F. වර්ණ ගැන්වීම : 16 වැනි චිත්‍රය**

**G. අවසන් කිරීමේ යාඥාව**

## 17 වැනි පාඩම

**A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම**

මීළඟ පාඩම් හතරේදී, දරුවන් පහත යාඥාව කටපාඩමින් ගායනා කිරීමට ඉගෙන ගනු ඇති අතර, 16 වැනි කොටසේදී යෝජන කරන ලද යාඥාවක් වැනි ඔබට කටපාඩම් ඇති නව යාඥාවක් සමඟ සෑම පන්ති කාලපරිච්ඡේදයක්ම ආරම්භ කළහොත් එය ළමයින් ධෛර්යමත් කිරීමේ මූලාශ්‍රයක් වනු ඇත. ආරම්භක යාඥාවන් ගායනා කිරීමට සිසුන් කිහිප දෙනෙකු ඔබ හා එක් වූ පසු, ඔබට මෙය සුපුරුදු ආකාරයෙන් හඳුන්වා දිය හැක.

> **"මාගේ දෙවියනි, ඔබවහන්සේගේ නාමය මාගේ චික්ත්සනයයි, ඔබවහන්සේ සැමරීම මාගේ ප්‍රතිකාරයයි. ඔබවහන්සේට ළංවීම මාගේ අපෙක්ෂාවයි, ඔපවහන්සේ කෙරහි ඇති ආදරය මාගේ සහායකයයි. ඔබවහන්සේ මට දක්වන දයාව මට මෙලොයෙහිදීත් පරලෝවෙහිදීත් මාගේ චිකිත්සනයත් ආධාරයත් වේ. ඇත්තෙන්ම ඔබවහන්සේ සර්ව ත්‍යාගශීලී වෙති, සර්වඥ වෙති, සර්ව ප්‍රාඥ වෙති."[118]**

**B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)**

ධෛර්යාය් ප්‍රභවය

සමූහ ගායනය:

```
            Am
ධෛර්යයටේ සහ බලයේ ප්‍රභවය වන්නේ
            Dm    E          Am
දෙවියන්වහන්සේගේ වචනය ප්‍රවර්දනයයි
            Am
ධෛර්යයටේ සහ බලයේ ප්‍රභවය වන්නේ
            Dm    E          Am
උන්වහන්සේගේ ප්‍රේමයේ ස්ථාවරත්වයයි
```

G
ඔබ ඔබවම අමතක කරලන්න
C
නිවරදි දේ වෙනුවෙන් නැගී සිටින්න
E7
අසරණයයින් ආරක්ෂා කරන්න
Am
උන්වහන්සේගේ බලය මත රැඳීසිටින්න

දෙවියන්වහන්සේගේ වචනය උගන්වන්න
ඔබගේ ක්‍රියාන්හි ධෛර්යයමත් වන්න
උන්වහන්සේගේ මාර්ගය අනුගමනය කරන්න
සතුටට මග පාදන්නේ එයයි සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

පාඩමේ තේමාව සහ කටපාඩම් කිරීම සඳහා වූ උද්ධෘත පාඨය ඉදිරිපත් කිරීමට පහත ප්‍රකාශය ඔබට සහාය වනු ඇත.

ධෛර්යය තිබීම යනු අප විසින් පමණක් එසේ සිදු කළත් හරි දේ වෙනුවෙන් පෙනී සිටීම වන අතර, එය අපට අපහසුතාවයක් ඇති කළත් අපගේ උපකාර අවශ්‍යා අය ආරක්ෂා කිරීම මෙන්ම, එමඟින් අපට දුෂ්කරතා ඇති වන බව අප දන්නාවිට පවා ඇත්ත පැවසීමයි. ජීවිතයේ දුෂ්කරතාවලට සන්සුන්ව හා ශිෂ්ටසම්පන්නව මුහුණ දීමට ධෛර්යය අවශ්‍යයි. අප ධෛර්යය ලබාගන්නේ දෙවියන්වහන්සේට ඇති අපගේ ආදරය සහ අන් සියල්ලටම වඩා උන්වහන්සේව සතුටු කිරීමට ඇති අපගේ ආශාව තුලිනි. ජීවිතයේ සෑම අවස්ථාවකටම ධෛර්යයෙන් මුහුණ දිය යුතු බව මතක තබා ගැනීමට අපට උපකාර කිරීම සඳහා, පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු:

**“දෙවියන්වහන්සේගේ වචනය ප්‍රවර්ධනය කිරීම සහ උන්වහන්සේගේ ප්‍රේමය තුල ස්ථාවරත්වය ධෛර්යයේ සහ බලයේ ප්‍රභවය වේ.”**[119]

*ප්‍රභවය*

1. කියොන්ග්මි මිටියාවකක පිහිටි ගමක ජීවත්වේ. මෙම ගමට ජලය සැපයෙන්නේ කඳු මුදුනේ පිහිටි හිම දියවීමෙන් එන දියපහරෙනි. ගමෙහි ජල ප්‍රභවය වන්නේ කඳු මුදුනේ පිහිටි හිම වේ.

2. පුටර්ස් මහත්මියට ආදරණීය සහ හොඳින් හැසිරෙන දරුවන් තිදෙනෙක් සිටී. ඇගේ දරුවන් ඇයට ප්‍රීතිය හා සතුට ගෙන දෙන උල්පතකි.

*ප්‍රවර්ධනය*

1. ෂඕවාගේ මිතුරන් දෙදෙනෙකු බහින්බස්වීමක් ආරම්භ කර එකිනෙකා සමඟ කෝපයට පත් විය. ෂඕවා එකිනෙකාට අනෙකා පෙන්වා දෙන කරුණු අවබෝධ කරගැනීමට සහ සාමය ඇති කිරීමට උපකාර කළේය. ෂඕවා සෑම විටම ඔහුගේ මිතුරන් අතර සාමය සහ අවබෝධය ප්‍රවර්ධනය කරයි.

2. හෙදියක් පන්ති කාමරයට පැමිණ දරුවන්ගේ සෞඛ්‍යයට හිතකර ආහාර පිළිබඳ ඉගැන්වූවාය. හෙදිය සෞඛ්‍ය සම්පන්න ආහාර ගැනීම ප්‍රවර්ධනය කරයි.

*ස්ථාවරත්වය*

1. ප්‍රොමිලා ඇයට වෛද්‍යවරියක්වමේ අවශ්‍යතාවයක සිටියාය. ඇය නිතරම පාසැල්දී වෙහෙස මහන්සි වී ඉගෙන ගත් අතර වසර ගණනාවක දුෂ්කරව වැඩ කිරීමෙන් පසු ඇය තම ඉලක්කය සපුරා ගත්තාය. ඇය වෛද්‍යවරියක් වීමේ උත්සාහයේ ස්ථාවරව සිටියාය.

2. නව පාසලක් විවෘත කිරීමට උදව් කිරීම සඳහා ස්වෝන්ඩායි ඉතා ඈත ගමකට ගියේය. තම පවුල මගහැර ගොස් දුෂ්කරතා රැසකට මුහුණ දුන් ඔහු වසර ගණනාවක් නොසැලී රැඳී සිටිමින් ගමේ ගුරුවරුන් පුහුණු කරමින් දරුවන් සමඟ කටයුතු කළේය.

## D. කතාන්දරය

*අලි අස්කර් පර්සියාවේ සිටි වෙළෙන්දෙකු විය. ඔහු බහායිවරයෙකු වූපසු, ඔහුට ධර්මයට වූවන් අතින් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය. කෙටි කාලයක් ඇතුළත ඔහු සතුව තිබූ සියල්ල ඔහුට අහිමි විය. එසේ වුවද, අලි අස්කර් අධෛර්යයට පත් නොවීය. ඔහුට තම මව්බිමේ ජීවත් වීමට නොහැකි බව අවබෝධ කරගත් ඔහු අසල්වැසි රටක නගරයක් වන ඇඩ්‍රියනොපල් වෙත යාමට තීරණය කළේය.*

*අඩ්‍රියනෝපල්හිද ඔහුට සුළු මුදල් ප්‍රමාණයක් පමණක් තිබුණද, ඔහු වෙළඳ භාණ්ඩ සුළු ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් විය. කෙසේ වෙතත්, ඔහුට එක භාණ්ඩයක්වත් විකිණීමට පෙර, ඔහු සොරුන්ගේ ප්‍රහාරයට ලක් වූ අතර, සන්තකයේ තිබූ සියල්ල පැහැරගත් පසු ඔහුට නැවත කිසිවක් ඉතිරි නොවීය.*

*වැඩි කල් නොගොස්, සොරුන් අත්අඩංගුවට ගත් අතර, මිනිසුන් බොහෝ පිරිසකගෙන් සොරකම් කිරීමෙන් ඔවුන් ලබාගත් විශාල වස්තුන් ප්‍රමාණයක් ද අල්ලා ගන්නා ලදී. ධනයෙන් මුලා වූ එක් පළාත් පාලන බලධාරියෙකුට ධනය තමන් සතු කරගැනීමේ අදහසක් පහළ විය. ඔහු අලි අස්කර්ව තමන්ගේ කාර්යාලයට කැඳවා එය විස්තර කළේය.*

*"අලි අස්කර්, මේ හොරු ගොඩක් පොහොසත්, ඔබෙන් මංකොල්ල කෑ මුදල විශාල බව රජයට යැවූ කළ වාර්තාවේ මම ලිව්වා. ඒ නිසා ඔබ නඩු විභාගයට පැමිණ මා ලියා ඇති දේ සත්‍ය බවට සාක්ෂි දෙන්න"යනුවෙන් ඔහු පැවසීය. මෙහිදී, නිලධාරියා සිතුවේ, සියලු මුදල් අලි අස්කර් වෙත ආපසු ලබා දෙන අතර, පසුව දෙදෙනාටම එය සමසේ බෙදී යනු ඇති බවයි.*

*එවැනි සැලැස්මකට සහභාගි විය නොහැකි ව අලි අස්කර් හොඳන්ම දැන සිටියේය. "මගේ ගෞරවනීය ඛාන් උතුමනි, ඔවුන් මගෙන් සොරකම් කරන ලද වටිනාකම ඉතාමත් සුළුයි. මම බොරුවක් වාර්තා කරන්නේ කෙසේද? ඔවුන් මගෙන් ප්‍රශ්න කරනවිට මම කරුණු හරියටම කියන්නම්, එය කිරීමට පමණක් මගේ යුතුකම ලෙස මම සලකනවා." යනුවෙන් ඔහු පිළිතුරු දෙන්නට විය.*

*නිලධාරියා නැවතත් අලි අස්කර්ට ඒත්තු ගැන්වීමට උත්සාහ කළේය. "අපට මෙහි ස්වර්ණමය අවස්ථාවක් තියෙනවා. ඔයාටයි මටයි දෙන්නටම ඒකෙන් ප්‍රයෝජන ගන්න පුළුවන්. ජීවිතයේ එක් වරක් ලැබෙන එවැනි අවස්ථාවක් ඔබේ ඇඟිලි හරහා ලිස්සා යාමට ඉඩ දෙනන්න එපා." නිලධාරියා පැවසීය.*

*නමුත් "ඛාන් මහතාණෙනි, මම දෙවියන්ට පිළිතුරු දෙන්නේ කෙසේද? මට සත්‍යය මිස සත්‍යය මිස අන් කිසිවක් නොකියා ඉන්න දෙන්න." යනුවෙන් අලි අස්කර් නැවතත් එය ප්‍රතික්ෂේප කළේය.*

*මෙහිදී නිළධාරීය කෝපයට පත්විය. අලි අස්කර් ඔහුගේ යෝජනාවට අනුව කටයුතු නොකළහොත්, ඔහුගේ සියලු සැලසුම් නිෂ්ඵල වනු ඇති අතර, ඔහුගේ ග්‍රහණයේ ඇති මහා වාසනාව ඔහුට අහිමි වනු ඇත. එබැවින් ඔහුට සහයෝගයෙන් කටයුතු කිරීමට අලි අස්කර්ව බිය ගැන්වීමේ අපේක්ෂාවෙන් ඔහු අලී අස්කර්ට තර්ජනය කිරීමට පටන් ගත්තේ.*

*"මම ඔයාව හිර කරනවා, මම ඔබව පිටුවහල් කරනවා " ඔහු කීවේය. "වධ හිංසාවක් හැර වෙන කිසිදෙයක් මම ඔබට ඉතුරු කරන්නේ නෑ." යනුවෙන් ඔහු අලී අස්කර්ට පැවසූ ඔහු, එකඟ නොවන්නේ නම් ඔහුව නැවත පර්සියාවට යවන බවද පැවසීය.*

*අලි අස්කාර් සිනාසුණා පමණි. "ඛාන්, උතුමාණනි, ඔබ මට කරන්න, මට හරි දේට පිටුපාන්නේ බැහැ." යනුවෙන් ඔහු පැවසුවේය.*

**E. ක්‍රීඩාව "හරි සහ වැරදි"**

ඔබ මැදට සිටින සේ සකස් වෙන් පළල් වෘත්තයකට සිටින ලෙස ළමයින්ගෙන් ඉල්ලා සිටිමින් මෙම ක්‍රීඩාව ආරම්භ කළ හැක. දැන් ඔබ ප්‍රකාශ කිහිපයක් ඉදිරිපත් කිරීමට යන බව ළමයින්ට පැහැදිලි කරන්න. ඒවායින් සමහරක් නිවැරදි වනු ඇති අතර අනෙක් ඒවා වැරදි වනු ඇත. ප්‍රකාශය නිවැරදි නම්, ඔවුන් "හරි" යැයි ශබ්ද නඟා පවසමින් රවුම මැදට පැනිය යුතු බව ඔවුන්ට කියන්න. එසේම, එය වැරදි නම්, ඔවුන් "වැරදි" කියා පවසා රවුමෙන් පසුපසට පැන්න යුතුය.

ඔබ කරන සෑම ප්‍රකාශයක්ම ළමයින්ට පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි දේ මත පදනම් විය යුතුය. "හරි" යන ප්‍රකාශ සඳහා උදාහරණයන් ලෙස "සූර්යයා ආලෝකය ලබා දෙයි.","ගස් බීජ වලින් වර්ධනය වේ." "කඳු උසයි." "සේරා නිල් කමිසයක් ඇඳගෙන ඉන්නවා" වැනි ළමයින් ඇඳගෙන සිටින දේ විස්තර කරන ප්‍රකාශයන් හෝ ඔවුන් අවට අවකාශයේ ඔවුන් දකින දේ, "ඔතන බංකු දෙකක් තියෙනවා" වැනි ප්‍රකාශයන් ද කළ හැකිය.

"වැරදි" යන ප්‍රකාශය සඳහා, උදාහරණයන් ලෙස, "වර්ෂාව ඉහළට ඇද හැලෙයි." "මාළු පියාඹනවා." "ගල් කකුල්වලින් ඇවිදිනවා." වැනි වැරදි ප්‍රකාශ කිරීමට ඔබට ඔබේ වටපිටාව කෙරෙහි අවධානය යොමු කළ හැකිය. එලෙසම, ඔබට වැරදි ප්‍රකාශවලට වඩා නිවැරදි ප්‍රකාශ තිබිය යුතු බව මතක තබා ගන්න, එවිට ක්‍රීඩාව අවසන් වන විට ළමයින් රවුමේ මැදට සිටින ඔබ වෙත ළඟා වේ.

**F. වර්ණ ගැන්වීම : 17 වැනි චිත්‍රය**

**G. අවසන් කිරීමේ යාඥාව**

## 18 වැනි පාඩම

**A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම**

ආරම්භ යාඥාවන් සිදු කිරීමෙන් පසු, අවසාන පාඩමේ හඳුන්වාදුන් යාඥාව කටපාඩමින් ගායනා කිරීමට ළමයින්ට ඉගැනෙ ගැනීම සඳහා කාලය වෙන් කළ හැක.

**B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)**

බලාපොරොත්තු සහගත වන්න

C F
අනාගතය අපට කිසිදා දැක ගත නොහැක

G C
හෙට දිනයේ සිදු වන්නේ කුමක්ද

C F
නමුත් වරප්‍රසාදයන් ගලාඒම කිසිදා නොනනවතී

G C
දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කර ඔබගේ මාවත සකසා ගන්න

සමූහ ගායනය:

F G
බලාපොරොත්තු සහගතවන්න, බලාපොරොත්තු සහගතවන්න

C F
සැමවිට දෙවියන්වහන්සේගේ වරප්‍රසාදයන් සොයන්න

F
හිරු පායනු ඇත

G
අහස පුරා විහිදී යනු ඇත

C F
අපේක්ෂාවේ දෑසින් බලන්න

F G C
බලාපොරොතුතවේ දෑසින් උන්වහන්සේ දෙස බලන්න

සැමවිට බලාපොරොතු සහගතවන්න, වර්ධනයවීමට උත්සාහ කරන්න
ශීත ඍතව වසන්තය මඟ පාදනු ඇත
උන්වහන්සේගේ වරප්‍රසාදයන් කිසිදා නොනවතී
එය සැමටම ජීවය ලබාදේ

සමූහ ගායනය

ප්‍රීතියේ සහ සාමයේ ප්‍රභවයක් වන්න
සේවයෙන් ආත්මය බැබලෙන්නට දෙන්න
වරප්‍රසාදයන් කිසිදා නොනවතිනු ඇත
හෙට ගැන බලාපොරොත්තු සහගත වන්න

සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

පහත දැක්වෙන්නේ ළමයින් විසින් මෙම පන්තියේ කටපාඩම් කරගැනීමට උත්සාහ කරන උද්ධෘතය පාඨය හඳුන්වා දීමට ඔබට භාවිතා කළ හැකි අදහස් කිහිපයකි.

සැමවිටම දෙවියන් වහන්සේගේ ආදරය අප සමඟ ඇත. උන්වහන්සේ කිසි විටෙකත් අපව තනි නොකරන අතර අපගේ ජීවිත කාලය පුරාම අපට උපකාර කිරීමට පොරොන්දු වේ. එක් දිනක සිට ඊළඟ දිනය දක්වා කුමක් සිදුවන්නේ දැයි අපි නොදන්නාමුත් අපි දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා උන්වහන්සේගේ දීමනා සහ වරප්‍රසාද අප වටා ඇති බව මතක තබා ගනිමු. එබැවින් අපි බලාපොරොත්තු සහගත ලෙස අනාගතය දෙස බලන විට උන්වහන්සේගේ අසීමිත ආශිර්වාදයෙන් කොටසක් අපට ලැබෙනු ඇතැයි අපි විශ්වාසයි කරමු. බලාපොරොත්තුවෙන් පිරුණු හදවත් යුතුව, දෙවියන්වහන්සේගේ ත්‍යාගයන් අපට නිරන්තරව

ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු. බලාපොරොත්තු සහගත බවේ වැදගත්කම මතක තබා ගැනීමට අපට උපකාර කිරීම සඳහා, අපි අබ්දුල් බහාතුමාගේ මෙම වචන කටපාඩම් කරගනිමු.

**"කිසිවිටකත් දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඔබගේ විශ්වාසය නැතිකර නොගන්න. මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ නොනවතින වරප්‍රසාදයන් මත ඔබ බලාපොරොත්තු සහගත වන්න."[120]**

*විශ්වාසය*

1. එඩ්වඩ්ට පැවති ගැටළුවකට උදව් ඉල්ලීමට හුන්ග් වෙයි වෙත ගියේය. හුන්ග් වෙයිට හැකි සෑම උපකාරයක්ම කරන බව එඩ්වඩ් දැන සිටියේය. එඩ්වඩ් හුන්ග් වෙයි විශ්වාස කළේය.

2. නිර්මලාට තම නිවසේ වහලය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය නමුත් එය තනිවම කළ නොහැකිවිය. නිර්මලාගේ යහළුවන් ඇයට උදව් කිරීමට පසුදින පැමිණීමට ඉදිරිපත් වූහ. පොරොන්දු වූ පරිදි ඔවුන් පැමිණෙනු ඇතැයි ඇය විශ්වාස කළ අතර සියල්ල සූදානම් කළාය.

*බලාපොරොත්තු සහගත*

1. ඉඹිසෙනිනා හිරු එළිය ඇති ස්ථානයක බීජයක් රෝපණය කර සෑම දිනකම එයට වතුර දැමුවාය. ඇය එය වර්ධනය වන තෙක් බලා සිටී. ඉඹිසෙනිනා බලාපොරොත්තු වන්නේ බීජය යම් දිනක ශක්තිමත් ශාකයක් බවට පත් වනු ඇති බවයි.

2. ඈන්ටෝනියෝගේ හොඳ මිතුරෙකු වන මැටියස් වෙනත් නගරයකට ගියේය. ඈන්ටෝනියෝට ඔහුගේ මිතුරා මඟ හැරුණත්, ඔවුන් ඉක්මනින්ම එකිනෙකා හමුවනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය.

*වරප්‍රසාද*

1. සෑම රාත්‍රියකම ලිලියන් යාඥා කරන විට ඇය තමාට ලැබී ඇති වාසනාවන්ත දේවල් පිළිබඳ සිතුවාය. ඇය තම දෙමාපියන්, මිතුරන්, ගුරුවරුන් සහ ඇය නිදා සිටින ඇඳ ගැන පවා සිතීය. ඇයට ලැබී ඇති ත්‍යාගයන් සඳහා ලිලියන් සැමවිටම ස්තූතිවන්ත විය.

2. රීසාට ඔහුට ආදරය කරන සහ ඔහුගේ දියුණුවට උදව් කරන බොහෝ මිතුරන් සහ ඥාතීන් සිටී. ඔවුන්ගේ ආදරයේ සහ සහයෝගයේ ත්‍යාගය ගැන රීසා කෘතඥශිලී වේ.

*නැවතීම*

1. තාහීර් විසින් ජල කරාමය වැසූ පසු ජලය පිටතය පැමිණීම නතරවිය. ජලය ගලායෑමද නැවතුණි.

2. වළාකුළු පිරි දිනවල පවා සූර්ය කිරණ පෘථිවිය උණුසුම් කරයි. සූර්ය කිරණ කිසි විටෙකත් පෘථිවියට ගලායෑම නතර නොවේ'

## D. කතාන්දරය

*ලන්ඩනයේ තේම්ස් ගං ඉවුරේ නිවසක් නොමැති තනිව ජීවත් වූ මිනිසෙක් සිටියේය. ඔහු ඉතා දුක් වූ අතර ජීවිතයේ සතුට පිළිබඳ සියලු බලාපොරොත්තු අත්හැර සිටියේය. දිනක් ඔහු කඩයක් පසුකර යද්දී පුවත්පතක තිබූ ඡායාරූපයක් ඔහුගේ නෙත ගැටුණි. එය අබ්දුල් බාහාතුමාගේ මුහුණ විය. මිනිහා ගල්ගැසී හිටගෙන මූණ දිහා බලාගෙන හිටියේය. ඔහු මීට පෙර අබ්දුල් බහාතුමාව දැක නොතිබූ අතර එතුමා කවුරුන්දැයි දැන සිටියේ නැත, නමුත් එතුමාව මුණගැසිය යුතු බව ඔහුට තදින් හැඟී ගියේය. පුවත්පතේ නිවසක ලිපිනය සඳහන් කර තිබූ නිසා එම පුද්ගලයා එතුමාව එහිදී මුණගැසීමේ බලාපොරොත්තුවෙන් ඇවිදින්නට විය. එය කිලෝමීටර් පනහකට ආසන්න ඉතා දිගු දුරක් වූ නමුත් ඔහු එම ළඟා වන තුරුම ඇවිද ගියේය.*

*අවසානයේ ඔහු පැමිණෙන විට මිනිසා වෙහෙසට හා කුසගිනන්නට පත්වී සිටි අතර, නිවසේ කාන්තාව ඔහුට කාරුණිකව ආරාධනා කර, ඔහුට කෑම ලබාදී, මදක් විවේක ගැනීමට ඉඩ සලසා දුන්නාය. ඔහු විවේක ගන්නා අතරතුර, ඔහු තමන්ගේ කතාව කාන්තාවට පැවසූ අතර, අබ්දුල් බහාතුමා එහි සිටීදැයි ඇගෙන් විමසීය. එතුමා එහි සිටින බව කාන්තාව ඔහුට සහතික විය.*

*"මට එතුමා මුණගැසිය හැකිද? මා වැනි කෙනෙක් එතුමා මුණගැසේවිද?" ඔහු විමසන්නට විය.*

*අබ්දුල් බහාතුමා ඔහුව මුණගැසෙනු ඇතැයි තමා විශ්වාස කරන බව කාන්තාව පිළිතුරු දෙන විට, ගුරුතුමාණන් විසින්ම දොරකඩ අසලට පැමිණයේය. මිනිසා නැගී සිටි අතර තුර අබ්දුල් බහාතුමා ඔහුට ආචාර කිරීමට දෑත් දිගු කළේය. එය හරියට අබ්දුල් බාහා බොහෝ කලක සිට බලා සිටි පැරණි මිතුරෙකුගේ පැමිණීමක් මෙන්විය. එතුමා ඔහුව ආදරයෙන් හා දයාවෙන් පිළිගෙන තමා අසලින් වාඩි වන ලෙස ඉල්ලා සිටියේය.*

*පසුව, මිනිසුන්ගේ හදවත්වලට අහිමි වූ ප්‍රීතිය නැවත ගෙන එන්නේ කෙසේදැයි සැමවිටම දැන සිටි අබ්දුල් බහාතුමා මිනිසා සමඟ කතා කිරීමට පටන් ගත්තේය. ඔහු දෙවියන්වහන්සේගේ රාජධානියේ පොහොසතෙකු බැවින් ඔහුගේ දුක්කදායක හැඟීම් අමතක කරන ලෙස සිහිපත් කරමින්, අබ්දුල් බහාතුමා විසින් දයානුකම්පාවෙන් ඔහුව වෙළාගත් අතර එතුමාගේ සැනසිලිදායක වචනවලින් ඔහුව සුවපත්වී ශක්තිමත්වීමට පටන් ගත්තේය. ටිකෙන් ටික ඔහුගේ දුක තුරන්විය. ඔහු පිටත්ව යාමට පෙර, මිනිසා අබ්දුල් බහාතුමාට පැවසුවේ ඔහුගේ දුප්පත්කම පිළිබඳ තවදුරටත්ඔහුට දුකක් ගෙන ඒමට ඉඩ නොදෙන බවත් ඒ වෙනුවට ඔහු කුඹුරුවල රැකියාවක් සොයාගෙන තම මුදල් ඉතිරි කර එමඟින් ඔහුට ඉඩමක් මිලදී ගැනීමට හැකි වනු ඇති බවත් ඒහි ඔහු වෙළඳපොළේ විකිණීම සඳහා වයලට් වගා කරන බවත් පැවසීය. ඔහු, දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමට සහ දෙවියන්වහන්සේ තම උත්සාහයන් ස්ථිර කිරීමට ආශීර්වාද කරන බවට විශ්වාසයක් ඇති කර ගැනීමට අබ්දුල් බහාතුමාගෙන් ඉගෙන ගත්තේය. ඔහුගේ බලාපොරොත්තු රහිතභාවය බලාපොරොත්තුවක් බවට පත්විය.*

### E. ක්‍රීඩාව "වැස්ස නිර්මාණය කරන්නා"

පළමුව ළමයින්ට ඔබ වටා රවුමක් ආකාරයෙන් සිටගන්නා ලෙසත්, පසුව ඔවුන් කාන්තාරයේ වැස්සට අපේක්ෂාවෙන් සිටින බව සිතන්නැයි ඉල්ලා සිටිමින් ක්‍රීඩාව හඳුන්වා දිය හැක. ඔබේ අත් දෙක එකට අතුල්ලන්න පටන් ගන්න, ඔබ එකිනෙකා දෙස බලන විට, ඔවුන්ද එසේ කිරීමට පටන් ගත යුතු බව ළමයින්ට පවසන්න. ඔබ සම්පූර්ණ රවුම වටා බැලූ පසු, සියලුම දරුවන් තම අත්ල අතුල්ලමින් සිටින විට, ඔවුන් අනුකරණය කළ යුතු නව චලිතයකින් ඔබ ඔවුන් එකිනෙකා දෙස බලන තෙක් එය ඉදිරියට කරගෙන යන ලෙස ඔවුන්ට පවසන්න. ඊළඟ චලිතය ලෙස ඔබේ ඇඟිලිවලින් ශබ්ද කරන්න, ඊළඟට ඔබ අත්පුඩි ගසන්න, ඉන්පසු ඔබේ කලවාවලට තට්ටුකර ඔබේ පාදවලින් හඬ එනසේ තදින් පය තබන්න. ආරම්භයේ සියලුම ළමයින් එක්ව කරන ශබ්දය පළමු වැස්සට හා අවසානයේ මහා ගිගුරුම් සහිත වැස්සකට සමාන විය යුතුය.

### F. වර්ණ ගැන්වීම : 18 වැනි චිත්‍රය

### G. අවසන් කිරීමේ යාඥාව

## 19 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

සෑම අවස්ථාවකදීම මෙන් මෙවරද පන්තිය යාඥාවන්ගෙන් ආරම්භ කරන්න. පසුව 17 වැනි පාඩමේදී හඳුන්වාදුන් යාඥාව කටපාඩම් කිරීමට ළමයින්ට උපකාර කළ හැක.

## B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

කාර්යබහුල දෑත්

සමූහ ගායනය:

C F
කාර්ය බහුල දෑත් ළමයින් ප්‍රීතිමත් කරයි

C G
ප්‍රීතිමත් ළමයින් විසින්

C F
අනෙකුත් මිනිසුන් සතුටු කරයි

C F G C
සාමය සහ ආදරය සැමතැන විහිදුවයි

C F
නව ලොවක් ගොඩනැගීමට අත්වැල් බැඳගන්න

C G
සැමට යමක් ඇත කරනට

C F
සැම කෙනෙකුට ස්තූතිවන්ත වියහැක
C F G C
ඉක්මනින් අපගේ අරමුණ වෙත යෑම වෙනුවෙන්

සමූහ ගායනය

නවලොවක් තැනීමට වේයන් අපට උපකාර කරනු ඇත
අපි සැමොව සෑ කෙනෙකුටම උපකාර කරන තැනක්
අපි සැවොම අපගේ අසල්වැසියන්ට ආදරය කරන
අපි අපටත් වඩා ආදරය කරන

සමූහ ගායනය (අවසාන පේළිය නැවත කියවන්න)

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම පාඩමේදී, විශ්වාසවන්තභාවය පිළිබඳ උද්ධෘත පාඨයක් ළමයින් කටපාඩම් කරනු ඇති අතර ඔබට මෙම තේමාව පහත ආකාරයෙන් හඳුන්වා දිය හැක.

> විශ්වාසවන්තභාවය දෙවියන් වහන්සේ ඉදිරියෙහි ඇති ශ්‍රේෂ්ඨතම ගුණාංගයකි. විශ්වාසවන්ත පුද්ගලයෙක් සත්‍යවාදී සහ අවංක වන අතර ඔහුගේ හෝ ඇයගේ ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු තැබිය හැකි. අපි එක දෙයක් කියා තවත් දෙයක් නොකළ යුතුයි. අපගේ ක්‍රියාවන් තුළ සැමවිටම අපගේ වචන ප්‍රතිරූපනය විය යුතුය. අප විශ්වාසවන්ත වන විට, අපගේ වගකීම් ඉටු කිරීමට සහ අපගේ යුතුකම් ඉටු කිරීමට අප අපගේ උපරිමයෙන් කටයුතු කරන බව අන් අයට සහතික විය හැකිය. මේ ආකාරයෙන්, සැම කෙනෙකුම තම වගකීම ඉටු කරන බවට වූ දැනුවත් බවින් යුතුව, සහජීවනයෙන් එකට වැඩ කිරීමට හැකි වේ. විශ්වසවන්තභාවයේ

වැදගත්කම මතක තබා ගැනීමට අපට උපකාර කිරීම සඳහා, අපි පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු:

**"මනුෂ්‍ය වර්ගයා ශාන්තභාවයේ සහ ආරක්ෂව වෙතට ඔසවා තවන උසස්තම රාමුව වන්නේ විශ්වාසවන්තභාවයයි."**[121]

*විශ්වාසවන්තභාවය*

1. අතෝස් තම මවට රාත්‍රී ආහාරය පිළියෙළ කිරීමට උදව් කරන බවට පොරොන්දු විය. ඔහුට එළිමහනේ සෙල්ලම් කිරීමට ආරාධනා කිරීමට ඔහුගේ මිතුරන් ඔහුගේ නිවසට පැමිණි විට, අතෝස් තම මවට දුන් පොරොන්දුව සිහිපත්වී ඔවුන් සමඟ වෙනත් වේලාවක සෙල්ලම් කරන බව ඔහුගේ මිතුරන්ට පැවසුවේය. අතෝස් විශ්වාසවන්තභාවයේ ගුණාංගය පෙන්නුම් කළේය.

2. සුනීතා තම පවුලට අවශ්‍ය දේවල් කිහිපයක් රැගෙන යාමට වෙළඳසැලට ගිය නමුත් ඇය රැගෙන ආ මුදල ඔවුන්ට අවශ්‍ය සියල්ලට ගෙවීමට සඳහා ප්‍රමාණවත් නොවන බව ඇයට අවබෝධ විය. ඉතිරි මුදල් ඊළඟ දිනයේදී ගෙවිය හැකිදැයි ඇය වෙළෙඳසලේ හිමිකරුගෙන් විමසුවාය. සුනීතා විශ්වාසවන්ත බව දන්නා නිසාත් පොරොන්දු වූ පරිදි භාණ්ඩ සඳහා මුදල් දෙන නිසාත් හිමිකාරිය එයට කැමැත්ත පළ කළාය.

*ශාන්තභාවය*

1. එමිලියෝ හට වැදගත් තීරණයක් ගැනීමට සිදු වූ සෑම අවස්ථාවකම, ඔහු සිතන්නට සහ භාවනා කිරීමට නිහඬ ස්ථානයක් සොයා ගැනීමට උත්සාහ කරයි. ඔහු අසල පිහිටි නිස්කලංක වත්තකට යයි. එහි සන්සුන් භාවය තුළ, ඔහුගේ මනස සහ හදවත නිදහස් කරගැනීමට ඔහුට හැකි වේ.

2. මහා කුණාටුව පහව ගිය පසු සියල්ල අසාමාන්‍ය ලෙස නිස්කලංක හා නිශ්චල විය. කුණාටුවෙන් පසු නිහඬස් සහ සන්සුන් භාවයක් ඇති විය.

*ආරක්ෂාව*

1. කුඩා සතෙකු බියට පත් වූ විට, බොහෝ විට ආරක්ෂාව සඳහා තම මව වෙත දිව යයි. එම මව තම කුඩා පැටවුන්ට ආරක්ෂාව සපයයි.

2. කඳු නඟින්නෙකු මාර්ගයෙන් ඉවතට ගොස් වනාන්තරයේ අතරමං විය. ඔහු ආපසු නොපැමිණි විට, ගමේ මඟ පෙන්වන්නන් ඔහු සොයා යන්නට විය. ඔවුන් ඔහුව හමු වූ විට, ඔහුව ආරක්ෂිත ස්ථානයකට ගෙන යන බව දැන සිටි ඔහුට ආරක්ෂිත බවක් දැනුනි.

## D. කතාන්දරය

*වසර ගණනාවකට පෙර, ධර්මයේ මුල් දිනවල, රටවල් කිහිපයක් පුරා පැතිරී සිටියේ බහායිවරුන් සුළු පිරිසක් පමණි. ඔවුන් බොහෝ අභියෝගවලට මුහුණ දුන් අතර බොහෝවිට ශුද්ධ භූමියේ අබ්දුල් බහාතුමා වෙත ඔවුන්ගේ තොරතුරු සහ ප්‍රශ්න ලියා යැවීය. ඔවුන්ගේ ලිපි උන්වහන්සේ වෙත ළඟා වීමට පෙර බොහෝ දුර ගමන් කළ අතර, එතුමා ඉතා ආදරයෙන් හා සැලකිල්ලෙන් පිළිතුරු දුන්නේය. එතුමාගේ දිරිගැන්වීමේ වචන ඔවුන්ව ශක්තිමත් කළ අතර ඔවුන්ගේ හදවත් සතුටට පත්කරන ලදි. එබැවින් මෙම සන්නිවේදන මාර්ගයට බාධා ඇති නොවීම ඉතා වැදගත් විය.*

*මේවනවිට එම ප්‍රදේශයේ මුහම්මද් ටකී නම් බහායිවරයෙක් ජීවත් විය. ඔහු මීට වසර ගණනාවකට පෙර තරුණයෙකු ලෙස පර්සියාවේ සිට පැමිණ කුඩා ව්‍යාපාරයක් ආරම්භ කර ඇත. කාලයත් සමඟ ඔහුගේ නොසැලෙන විශ්වසනීයත්වය සඳහා ප්‍රසිද්ධියට පත් විය. ඔහු කෙතරම් විශ්වාසවන්තද යත්, අබ්දුල් බහාතුමා සඳහා ශුද්ධ වූ දේශයට පැමිණෙන සියලුම*

*තැපැල සහ පිටරට යවන ලද ප්‍රතිචාර ලිපි මුහම්මද් ටබීගේ නිවස හරහා සිදුවිය. සෑම ලිපියක්ම කඩිනමින් සහ ආරක්ෂිතව බෙදා හැරීමට ඔහු විශ්වාස කළ හැකි බව සියලු දෙනා දැන සිටියහ.*

*එහෙත්, පසුව, ධර්මයේ විරුද්ධවාදීන් අබ්දුල් බහාතුමාට එරෙහිව නැගී සිටියහ. මිනිසුන් උන්වහන්සේට දක්වන ආදරය හා ගෞරවය ගැන ඔවුන් තුළ ඊර්ෂ්‍යාවක් ඇතිවිය. ඔවුන් එතුමා පිටුවහල් කිරීමට හෝ ඊටත් වඩා එතුමාව මරා දැමීමේ දරුණු බලාපොරොත්තුවක් ඇතිවිය. එතුමාගේ නිවස වටා ඔත්තුකරුවන් සිට අතර එතුමා පිළිබඳ නිරන්තර සෝදිසියෙන් සිටියේය. අබ්දුල් බහාතුමා සහ වෙනත් රටවල සිටින බැතිමත් බහායිවරුන් අතර ඇති ලිපි හුවමාරුව නැවැත්වීම මඟින් එම සම්බන්ධය බිඳ දැමීමටත් හැකි වූයේ නම්, එතුමාගේ සතුරන් කොතරම් සතුටු වනු ඇතිද එසේම බලධාරීන් නොමඟ යැවීමට භාවිතා කළ හැකි යම් ලියවිල්ලක් සොරකම් කිරීමට ඔවුන්ට හැකි වූයේ නම් ඊට වඩා කොපමණ සතුට වනු ඇත්ද!*

*කෙසේ වෙතත්, අබ්දුල් බහාතුමා පසුබට වූයේ නැත. එතුමා බොහෝ විට රාත්‍රිය වන තුරුම එතුමාගේ පහන් එළියෙන් ලිපි ලියන බව දැකගත හැකි වූයේ, ලිපි ලැබීම සහ යැවීම සඳහා එතුමා ආරක්ෂිත මාධ්‍යයක් සහතික කර තිබූ බැවිනි. එතුමා කුමක් කළේ දැයි ඔබ සිතන්නේද?*

*මුහම්මද් ටබී විසින් සිදු කරන ලද වැදගත් කාර්යය පිළිබඳ එතුමාගේ සතුරන් හඳුනාගෙන ඇති බව අබ්දුල් බහාතුමා දැන සිටියේය. ඔහු හරහා යවන ලද තැපෑලට බාධා කිරීමට ඔවුන් උත්සාහ කරන බවට කිසිදු සැකයක් නැත. එබැවින් ඔහු අනතුරෙන් මිදීම සඳහා අබ්දුල් බහාතුමා මුහම්මද් ටබීව අසල්වැසි රටක පිහිටි අසල ස්ථානයකට යැවීය. එවිට එතුමාගේ සතුරන් සැක නොකළ වෙනත් අය, ශුද්ධ භූමිය තුළට සහ එයින් පිටතට යන සියළු ලිපි මුහම්මද් ටබී වෙත රැගෙන ගියහ. තවද, මෙම ආරක්ෂිත ස්ථානයේ සිට, ඔහු විශ්වාසවන්තව ලිපි ලබා ගැනීම සහ යැවීම දිගටම සිදු කරගෙන ගිය අතර, අබ්දුල් බහාතුමා ඔහු කෙරෙහි තැබූ විශ්වාසයට කිසි විටෙකත් හානියක්වීමට ඉඩ නොතැබුවේය. එබැවින්ඉතා දුෂ්කර කාලවලදී පවා, ශුද්ධ භූමිය සමඟ සන්නිවේදනයට කිසි විටෙකත් බාධා සිදු නොවූ අතර ඉතා දුරස්ථ ස්ථානවල ජීවත් වූ මිතුරන් වෙත පවා මඟ පෙන්වීම ළඟා විය.*

### E. ක්‍රීඩාව "මඟපෙන්වීම"

ඔබේ සිසුන් යුගල වශයෙන් බෙදා ඔවුන් එකිනෙකා සමඟ අත් අල්ලා ගෙන සිටින ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න. සෑම යුගලයකම සිටින එක් දරුවෙකුගේ දෑස් බැඳ අනෙක් දරුවාට ඔහුව හෝ ඇය පන්තිය වටා ගෙන යාමට සලස්වන්න, එහිදී ඔහු හෝ ඇය ගමන් කරනවිට යමක ගැටීමක් සිදු නොවන බවට වග බලා ගන්න. ඇස් බැඳ ඇති දරුවාට ගස්, අගල්, ගල් සහ ටයර් වැනි බාධක වටා මඟ පෙන්වීමට යොමු කිරීමෙන් අමතර අභියෝගයක් ඉදිරිපත් කළ හැක. මෙලෙස හවුල්කරුවන් අතර විශ්වාසනීය බැඳීමක් ඇති වූ පසු, ඇස් බැඳ ඇති දරුවාට ගමන් කිරීමට සඳහා වාචික උපදෙස් පමණක් භාවිතා කළ හැකිය. එවැනි අවස්ථාවේ දී, දරුවා යමක ගැටීමෙන් වැළැක්වමින් අල්ලා ගැනීම සඳහා මාර්ගෝපදේශකයා ඉතා ආසන්න පිටුපසින් ගමන් කළ යුතුය.

ඉහත ක්‍රීඩාවට විකල්පයක් ලෙස, ඔබ හෝ එක් සිසුවෙකු විසින් මෙහෙයවනු ලබන සියලුම ළමයින්ගේ ඇස් බැඳ දුම්රියක් සෑදිය හැකිය.

### F. වර්ණ ගැන්වීම : 19 වැනි චිත්‍රය

### G. අවසන් කිරීමේ යාඥාව

## 20 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

ඔබ සහ සිසුන් කිහිප දෙනෙකු විසින් ආරම්භක යාඥාවන් ගායනයෙන් පසු, පසුගිය පාඩම් තුන පුරා ඔවුන් ඉගෙන ගත් යාඥාව ළමයින් සමඟ සමාලෝචනය කරන්න.

**B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)**

දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ගිනිසිළුව දල්වන්න

D
මගේ හදවත තුළ

A
ඇත අවිළිනු ගිනිසිළුවක්

G
දෙවියන්වහන්සේ ලබාදුන්

D
සුවිශේෂී ගිනිසිළුවක්

A
මෙය ගින්නකි

G
ගින්නක් වේ

D
උන්වහන්සේගේ ප්‍රේමයේ

සමූහ ගායනය:

D A
මම යාඥා කරමි
මම යාඥා කරමි (පසුබිම් හඬ)

G
දෙවියන්වහන්සේට

A D A
මගේ හදවත දවාලන ලෙස
මගේ හදවත දවාලන ලෙස (පසුබිම් හඬ )

G
එම ගිනිසිළුව

A D A
උන්වහන්සේගේ ප්‍රේමයේ ගිනිසිළුයව

G
මම උත්සාහ කරමි

A D
එහි ආලෝකය සියළු හදවත් ආලොකමත් කරයි

දවසින් දවස
මම මේ ගිනිසිළුව පෝෂණය කරමි
මාගේ යාඥාවෙන්

අන්අයට යහපතක් කරනවිට
මෙම ගිනිසිළුව වර්ධනය වේ මම යාඥා කරනවිට
මනුෂ්‍යයාට සේවය කරනවිට

මෙම ගිනිසිළුව දැවෙනවිට
එය වර්ධනය වනවිට එය දැනේවි
පැමිණෙන සැමට එයයි මාවත
එය උණුසුම ගෙනේවි සැමටම
එහි ඒන සැමට

සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

දිරිමත් කිරීම මෙම පාඩමේ තේමාව වන අතර මෙම තේමාව සහ කටපාඩම් කිරීම සඳහා වූ උද්ධෘත පාඨය හඳුන්වාදීම සඳහා පහත ප්‍රකාශය ඔබට උපකාරී වනු ඇත.

සෑම මනුෂ්‍යයෙකුම මවා ඇත්තේ දෙවියන්වහන්සේව දැන හඳුනා ගැනීමට සහ උන්වහන්සේට ප්‍රේම කිරීමට වන අතර අප සියළු දෙනාගේ හදවත් තුල උන්වහන්සේගේ ප්‍රේමයේ ගිනි පුපුරු ඇත. දෙවියන්වහන්සේට දිනපතා යාඥා කිරීමෙන් සහ අන් අයට සේවය කිරීමෙන් දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ගිනිදැල් පෝෂණය කිරීම අපට වැදගත් වන අතර එයින් එය තව තවත් ශක්තිමත් වේ.

මෙම දැල්ල අපේ හදවත් තුළ තව තවත් දීප්තිමත් වන විට, එහි උණුසුම අපගේ සමඟ කටයුතු කරන සියල්ලන්ටම දැනෙනු ඇත. ඔවුන්ගේ හදවත් ද ප්‍රබෝධමත් වනු ඇත. අප එසේ දැල්වී සිටින විට, එය අන්අයට ආලෝකය ලබාදීම පමණක් සිදුකරන ඉටිපන්දමක් මෙන් අප අවට සිටින අයට ආලෝකය සහ උණුසුම ලබා දිය යුතුය. අපි පහත උද්ධෘත පාඨය කටපාඩ් කර ගනිමු:

**"එම්බා මිනිසුනි, අන් අයගේ හදවත් ඔබට දැල්විය හැකිවන පරිදි දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් ඔබගේ හදවත් දල්වාගත් අයෙකු වන්න."**[122]

*ගිනිදැල්වීම*

1. නිවස සීතල වූ නිසා ඇක්සෙල්ගේ පියා ගිනි ඇවිළීමට කිරීමට තීරණය කළේය. ඔහු ලොකු දර ලී ලිපට දමා පහළින් කුඩා අතු කිහිපයක් දැල්වීය. ඉක්මනින්ම දරවලට ගිනි දැල්වී එමඟින් කාමරය උණුසුම් විය.

2. විද්‍යාඥයෙක් පාසලට පැමිණ විශ්වයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ රසවත් කරුණු රාශියක් සිසුන්ට පැහැදිලි කළේය. කතාවෙන් පසු ඔවුහු ඇයගෙන් විවිධ ප්‍රශ්න අසන්නට වූහ. ඇය ලෝකය ගැන වැඩි විස්තර දැනගැනීමේ සිසුන් ආශාව දැල්වුවාය.

## D. කතාන්දරය

*තෝමස් බ්‍රේක්වෙල් එක්සත් ජනපදයේ දකුණු ප්‍රදේශයේ කපු කම්හලක වැදගත් තනතුරක් දරමින් සිටින අතර තුර තම නිවාඩු කාලය යුරෝපයේ ගත කළ තරුණයෙකි. 1901 ග්‍රීෂ්ම සෘතුවේදී යුරෝපයට යන අතරමගදී ඔහු ගමන් ගත් වාෂ්ප නෞකාවේ සිටි කාන්තාවක් මුණගැසුණු අතර ඇය සමඟ අධ්‍යාත්මික විෂයයන් පිළිබඳ කතා කිරීමට පටන් ගත්තේය. ඔවුන් පැරිසියට පැමිණි විට, එම කාන්තාව නගරයේ මහල් නිවාසයක ජීවත් වූ ඇය හා සමානවූ අදහස්*

*ඇති ඇයගේ මිතුරියක් හමුවීමට ඔහුව කැටුව ගියාය. එම තරුණ කාන්තාව ඔවුන්ව පිළිගත් අතර තිදෙනාම මඳ වේලාවක් කතා කරන්නට විය. බ්‍රේක්වෙල් පිටත්ව යාමට පෙර, තමන්ට සත්කාර කළ කාන්තාවගෙන් තවදුරටත් කතා කිරීමට නැවත පැමිණිය හැකිදැයි විමසුවේය. පසුදින උදෑසන නැවත පැමිණීමට ඔහුට ආරාධනා කළාය.*

*පසු දින ඔහු පැමිණිවිට ඔහුගේ දෙනෙත් දීප්තිමත්ව බැබළෙන බවත් ඔහුගේ කටහඬ හැඟීම්බර බවක් ඇති බව තරුණිය දුටුවාය. ඔහුට වාඩිවන ලෙස ඇය ඉල්ලා සිටියාය. බ්‍රේක්වෙල් ඇය දෙස මොහොතක් ඉතා ඕනෑකමින් බලා සිට පසුව ඇයට අමුතු අත්දැකීමක් විස්තර කරන්නට විය. පෙර දින ඔහු ඇය නිගේ නිවසින් පිටව ගිය පසු, ඔහු තනිව, උණුසුම් හා අලසගතියෙන් යුතු සවස අහසින් යුතු මාවතක ඇවිද ගියේය. ඔහු අවට කොළයත්වත් සෙලවුණේ නැත. ඒ සමඟම, දෙවියන්වහන්සේගේ නව පණිවිඩයක සතුටුදායක ආරංචියක් පැමිණෙනවා සේ මහා සුළඟක් හමන්නට විය.*

*සන්සුන් වන ලෙස තරුණිය ඔහුගෙන් ඉල්ලා සිටියාය. බ්‍රේක්වෙල් සඳහන් කරන පණිවිඩය ගැන ඇය දැන සිටියාය. ඊළඟ දින තුන තුළ, පැය ගණනාවක් පුරා, ඇය බහායි ධර්මයේ ඉතිහාසය සහ එහි ඉගැන්වීම් මෙන්ම ශුද්ධවූ දේශයේ ඇකා බන්ධනාගර නගරයේ ජීවත්වන එම ඉගැන්වීම්වල පරිපූර්ණ ආදර්ශකයා වන අබ්දුල් බහාතුමා පිළිබඳ වැනි ඇයට හැකි සෑම දෙයක්ම ඔහුට පැවසුවාය.*

*දින තුනක අවසානය වන විට, බ්‍රේක්වෙල්ගේ හදවත ප්‍රීතියෙන් හා බලාපොරොත්තුවෙන් පිරී ගිය අතර ඔහුට ඇකා වෙත ගොස් අබ්දුල් බහාතුමා මුණගැසීම හැර අන් කිසිවක් අවශ්‍ය නොවිනි. මෙවැනිම අදහසකින් ශුද්ධ භූමියට යාමට දැනටමත් සැලසුම් කර තිබූ තවත් තරුණයෙකු සිටි අතර බ්‍රේක්වෙල් තමන් සමඟ කැටුව යැමට වඩාත් කැමති විය. එබැවින්, අබ්දුල් බහාතුමාට පණිවිඩයක් යවා ඔහුගේ පැමිණීමට අවසර ඉල්ලා සිටි අතර, කෙටි කලකින් ඔවුන් ගමන ආරම්භ කළහ.*

*මෙම පුද්ගලයින් දෙදෙනා අබ්දුල් බහාතුමාගේ නිවසට පැමිණි විට, ඔවුන්ව තවත් මිනිසුන් කිහිප දෙනෙකු රැස්ව සිටි කාමරයකට ගෙන යන ලදී. වටපිට බැලූ බ්‍රේක්වෙල් දැඩි ලෙස කලබල පත්විය. ඔහුගේ සිත ඇදී ගිය කිසිවෙක් කාමරයේ නොසිටි අතර, පැමිණ සිටි අය අතර අබ්දුල් බහාතුමා සිටිය යුතුයැයි ඔහු කල්පනා කරමින්, ඔහු විසින් පැරිසියේදී ඉගෙන ගත් එම ස්වර්ගීය තැනැත්තාණන් හඳුනා ගැනීමට අපොහොසත්වීම පිළිබඳ බියට පත්විය. සුන්වීය ගිය බලාපොරොත්තුවෙන් යුතුව ඔහු වාඩි විය. ඒ මොහොතේ දොරක් විවෘත වූ අතර බ්‍රේක්වෙල් එදෙස බැලීය. ඔහුට දීප්තිමත් ආලෝකයක් තුළින් අබ්දුල් බහාතුමාගේ රූපය දැකගත ගත හැකි විය. ඔහුගේ ආදරණීය ආශාව ඉටු වූ බව ඔහු වහාම අවබෝධ කරගත්තේය.*

*බ්‍රේක්වෙල් අබ්දුල් බහාතුමා සමඟ ශ්‍රේෂ්ඨමත් දෙදිනක් ගත කළ අතර, එම කාලය තුළ ඔහුගේ හදවතේ ඇවිළී තිබූ ගින්න තව තවත් ශක්තිමත් විය. ළමයින් කම්කරුවන් ලෙස යොදාගන්නා කපු මෝලේ ඔහුගේ රැකියාව පිළිබඳ බ්‍රේක්වෙල් අබ්දුල් බහාතුමාට පැවසූ විට, අබ්දුල් බහාතුමා ඔහුට තම තනතුරෙන් ඉල්ලා අස්වන ලෙස උපදෙස් දුන් අතර එය ඔහු පැකිලීමකින් තොරව සිදු කළේය. ඔහුගේ සංචාරය අවසානයේදී දීප්තිමත් ආත්මයෙන් යුතුව ඔහු නැවත පැරිසියට පැමිණියේය. ඔහුගේ ජීවිතයේ ඉතිරි කෙටි කාලය තුළ ඔහු දීප්තිමත් ඉටිපන්දමක් මෙන් දැල්වී, තම හදවතේ දැල්වූ ආලෝකය තමාට හමු වූ සියල්ලන් සමඟ ඔහු බෙදා ගත්තේය. ඔහුගේ අභාවයෙන් පසු, පහත පදය ඇතුළත් කරමින් අබ්දුල් බහාතුමා ඔහුට ගෞරවයක් වශයෙන් පත්‍රකයක් අනාවරණය කළේය. “අහෝ බ්‍රේක්වෙල්, මගේ ආදරණීය තැනැත්තණි! ඉහළ සමූහයාගේ පහන් තුළ ඔබ දැල්ලක් බවට පත්ව, අභා රාජ්‍යයට ඔබගේ පය තබමින්, ආශිර්වාදලත් වෘක්ෂයේ සෙවන යට ඔබ ආරක්ෂාව ලබමින්, ස්වර්ගයෙත් ස්වර්ගය තුල උන්වහන්සේ හමුවීම ඔබ එළඹී ඇත. ”*

## E. ක්‍රීඩාව “රෝගීන්ට උපකාර කිරීම”

එක් ළමයෙකු"අසනීප රෝගියා" ලෙස පෙනී සිටීමට තෝරා ගන්න. දැන් "පුටුව" ක් සෑදීම සඳහා දරුවන් දෙදෙනෙකු මුහුණට මුහුණ සිටගෙන, ඔවුන්ගේ දෑත් එකිනෙකාගේ අත් වටා බැඳ තබා

ගන්න. දරුවන්ගේ ප්‍රමාණය සහ දක්ෂතාවය අනුව, ඔබට වෙනත් ආකාරයකින් පුටුවක් සාදා ගත හැකිය. එවැනි අවස්ථාවක, දරුවන් දෙදෙනාම තම වම් අතින් තම දකුණු මැණික් කටුව අල්ලාගෙන, දකුණු අතින් එකිනෙකාගේ වම් මැණික් කටුව අල්ලා ගන්න.

දැන් අනෙක් පන්තියේ මිතුරන් "අසනීප මිතුරා" පුටුවේ වාඩිවීමට උදව් කළ යුතුය. ‘‘සෞඛ්‍ය මධ්‍යස්ථානය’’ ලෙස ගසක් හෝ වෙනත් ස්ථානයක් තෝරාගෙන ‘‘අසනීප’’ ළමයා එහි රැගෙන යන ලෙස පුටුව සකස් කළ ළමයින් දෙදෙනාගෙන් ඉල්ලා සිටින්න.

විශාල කණ්ඩායමක් සමඟ, පුටුවක් වෙනුවට "ගිලන් මැස්සක්" සෑදීමට එකිනෙකා මුහුණලා පේළි දෙකක සිටගෙන සිටින ලෙස ළමයින්ගෙන් ඉල්ලා සිටිය හැකිය. සෑම ළමයෙකුම ඔහුට හෝ ඇයට ඉදිරිපසින් සිටින කෙනාගේ දැත් අල්ලා ගැනීම සඳහා ඔවුන් තම දැත් වැලමිටට නමා ගත යුතුය. එවිට "අසනීප" ළමයා "සෞඛ්‍ය මධ්‍යස්ථානයට" ගෙන යාමට ගිලන් මැස්ස මත වැතිරය යුතුය. "රෝගියා" ආරක්ෂිතව සෞඛ්‍ය මධ්‍යස්ථානයට ගෙන යාමට නම් සියළු දෙනාම එකමුතුව කටයුතු කළ යුතු බව ළමයින්ට මතක් කර දෙන්න. ‘‘අපි ලෙඩා වැටෙන්න ඉඩ දුන්නොත් ඔහුට හෝ ඇයට එය මහත් වේදනාවක් බවත් එයින් අපි හැමෝටම දුක්වීමට සිදුවෙනවා. නමුත් අපි කිසිදු ගැටළුවක් නොමැතිව සෞඛ්‍ය මධ්‍යස්ථානයට පැමිණියහොත්, අපි අපගේ මිතුරාට උදව් කළ හැකි බැවින් අපට සතුටක් හා තෘප්තියක් දැනෙනු ඇත. "

**F.** **වර්ණ ගැන්වීම : 20 වැනි චිත්‍රය**

**G.** **අවසන් කිරීමේ යාඥාව**

## 21 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

සෑම පන්ති කාලපරිච්ඡේදයක්ම ඔබ කටපාඩමින් දන්නා යාඥාවක් ගායනා  කිරීමෙන් ආරම්භ කළ හැකි අතර එහිදී මේ පාඩම සහ ඊළඟ පාඩම් තුන සඳහා 19 වැනි කොටසේදී යෝජනා කර ඇති යාඥාව වැනි එකක් භාවිතා කළ හැක. ඔබ සහ ළමයින් කිහිප දෙනෙකු ආරම්භක යාඥා පැවසීමෙන් පසු, ඔබට මෙම ශ්‍රේණියේ ඔවුන් කටපාඩම් කරන අවසාන යාඥාව වන පහත යාඥාව ඔවුන්ට ඉදිරිපත් කළ හැකිය.

> **‘‘අනේ කාරුණික ස්වාමීනි! මම කුඩා ළමයෙක්මි, රාජධානියට ඇතුළත් කරගැනීමෙන් මා උසස් තත්වයට පතකරන්න. මම භෞමික වෙමි මා ස්වර්ගීය කරන්න; මම ලෝකයටත් වඩා පහළට වැටී ඇති අතර මට ඉහළ රාජධානියට ඇතුළ්වීමට ඉඩ ලබාදෙන්න, අන්ධකාරයේ සිටින මට දීප්තිමත්වීමට ඉඩ ලබාදෙන්න; භෞතික වන මා ආධ්‍යාත්මික කර ඔබවහන්සේගේ අසීමිත වරප්‍රසාදයන් මට පිළිබිඹු කිරීමට ඉඩ ලබාදෙන්න.**
>
> **ඔබවහන්සේ බලවත් සේක. සර්ව ප්‍රේමණීය වන සේක.’’[123]**

### B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

දීප්තිමත්බව

E          A
අපට ඉහළින් ලැබෙන දීප්තිය පරාවර්තනය කරනවිට

B          E
අපගේ හදවත් කරුණාවෙන් සහ ආදරයෙන් බැබළෙයි

E A
අප ප්‍රීතිමත්, ආලෝකමත් මෙන්ම දීප්තිමත් වනවිට
B E
අවට සිටින සියළුදෙනාට උන්වහන්සේගේ ආලෝකයේ උණුසුම දැනේ

සමූහ ගායනය:
E A
එම්බා පුත්‍රය! ඒම්බා මනුෂ්‍ය පුත්‍රය!
B E
ඔබ මාගේ පහන සේම මාගේ ආලෝකයත් ඔබ තුළ පවතී!
E A
එම්බා පුත්‍රය! ඒම්බා මනුෂ්‍ය පුත්‍රය!
B E
ඔබ මාගේ පහන සේම මාගේ ආලෝකයත් ඔබ තුළ පවතී !

දෙවියන්වහන්සේගේ ප්‍රේමය කිසිදා නොනවතී
අප සේවය කරනවිට එයින් නැගෙන දීප්තිය වර්ධනය වේ
පසුබවට නොවන්න! දීප්තිමත් වන්න! ඔබගේ මුළු ශක්තියෙන්
සැම හදවතක්ම උන්වහන්සේගේ ආලෝකයෙන් පිරී යන තුරු

සමූහ ගායනය (අවසන් පේළිය නැවත ගායනා කරන්න)

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම පාඩමේ දී ළමයින් දීප්තිමත් භාවයේ ගුණාංගයට අදළ උද්ධෘත පාඨයක් කටපාඩම් කරනු ඇත. ඔබට පහත ආකාරයෙන් එය හඳුන්වා දිය හැකිය.

දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ආලෝකයෙන් අපගේ හදවත් දීප්තිමත් කිරීම කිසිදාක නතර නොවේ. මෙම ආලෝකය වඩ වඩාත් දීප්තිමත් වන විට අපගේ හදවත් උන්වහන්සේගේ ප්‍රේමයෙන් බබළනු ඇත. දෙවියන්වහන්සේ පිළිබඳ දැනුවත් භාවයේ ආලෝකය, උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය සහ උන්වහන්සේගේ මහිමය පිළිබඳ දැනුම අපගේ ඇස් දීප්තිමත් කරයි. එසේම, අපගේ ත්‍යාගශීලී ක්‍රියාවන් සහ කාරුණික වචන ආදරයේ සහ දැනුමේ ආලෝකය බැබළීමට සලස්වයි. අපගේ ප්‍රීතියේ දීප්තියෙන් අප අවට සිටින අය ආකර්ෂනය කරගනී. දීප්තිමත්භාවයේ ගුණාංගයේ වැදගත්කම මතක තබා ගැනීමට අපට උපකාර කිරීම සඳහා, අපි පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු:

**“එම්බා සත්ව පුත්‍රය! ඔබ මාගේ පවහන වනසේම මාගේ ආලෝකය ඔබ තුල පවතී. ඔබගේ දීප්තිය එයින් ලබාගෙන මා හැර අන්කිසි කෙනෙකු නොසොයන්න.”**[124]

*දීප්තිය*

1. ටයිරෙල් අවදිවනවිට කාමරය හිරු අලෝකයෙන් පිරී තිබුණි. හිරුගේ දීප්තියෙන් ඔහු පිළිගැනීමට පිළිබඳ ඔහු සතුටු විය.

2. සැන්ටොස් මහත්මිය තමන්ගේ පවුලේ අයට මෙන්ම සැම කෙනෙකුට ආදරය කළාය. ඇය සැමවිටම අන් අයට ත්‍යාගශීලී, කරුණාවන්ත සහ උපකාර කළාය. ඇගේ හදවතේ ඇති ආදරය ඇයට මුණගැසෙන සියලුම මිනිසුන්ට දැනුනු අතර ඔවුන්ට සතුටක් ගෙන දෙන ලදි. සැම කෙනෙකුම ඇයගේ දීප්තියෙන් ආකර්ෂනය විය.

*සොයන්න*

1. කුරුළු පැටවෙකු බිහි වූ පසු, මව පෝෂණය පැටවා කිරීමට ආහාර සෙවීය. කුරුළු මව විසින් අලුත් පැටවාට ආහාර සොයයි.

2. විශේෂ විනෝද චාරිකාවක් සඳහා පාසලේ සියලුම සිසුන්ට ආරාධනා කරන ලදී. එයට සහභාගිවීමට නම් ඔවුන්ට ඔවුන්ගේ දෙමාපියන්ගේ අවසරය අවශ්‍ය විය. සියලුම සිසුන්ට විනෝද චාරිකාව යාමට දෙමාපියන්ගෙන් අනුමැතිය ලබාගන්නා ලෙස ඉල්ලා සිටියේය.

## D. කතාන්දරය

*තරුණ ගැහැණු ළමයෙකු ලෙස සිටි අවධියේදී අබ්දුල් බහාතුමා හමුවීමේ ගෞරවය හිමිවූ ඩොරති බේකර් පිළිබඳ ඔබ බොහෝ විට යම් දිනක වැඩි විස්තර ඉගෙන ගනු ඇත. අබ්දුල් බහාතුමා බටහිර සංචාරය කරනවිට ඩොරතිගේ ආච්චි එතුමා මුණගැසීමට ඇයව රැගෙන යනලදී. ඇය කිසිදා නොගිය නිවසකට පැමිණි ඩොරති ජනතාවගෙන් පිරි කාමරයකට ඇතුළු වූවාය.*

*අබ්දුල් බහාතුමා කතා කිරීමට පටන් ගත් විට, වාඩිවී දෑස් පහත් කළ ඩොරති ඇගේ කළු සපත්තු දෙස බලා සිටියාය. එතුමා දෙස බැලීමට තරම් ධෛර්යයක් ඇයට නොතිබුණි. නමුත් ඉක්මනින්ම ඇගේ බිය පහව ගියේය. අබ්දුල් බහාතුමාගේ ආදරවන්ත අභිමුඛයේ උණුසුමට ඇය ආකර්ෂණය වූවාය. උන්වහන්සේගේ දීප්තිය කාන්දමක් මෙන්විය. ඇය සිටි තැනින් හැරී එතුමා දෙසට හැරී ඇති බවවක් නොදැන සිටි ඩොරති ඇයගේ වැලමිට දණහිස් මත තබා ඇගේ දෙඅත් නිකට අල්වාගෙන අබ්දුල් බහාතුමාගේ දීප්තිමත් මුහුණ දෙස බලා සිටියාය.*

*එදා අබ්දුල් බහාතුමා කතා කළ කිසිදු දෙයක් ඩොරතිට මතක නැත. ඇයට මතක තබා ගත හැකි වූයේ එතුමාගේ කාරුණික මුහුණ, එතුමාගේ මිහිරි කටහඬ සහ එතුමා අභියස සිටීමේ උණුසුම පමණි. උන්වහන්සේගේ ආදරණීය දෑසින් ඇයට දෙවියන්වහන්සේගේ අධ්‍යාත්මික ලෝකය ගැන පවසන බවක් පෙනෙන්නට තිබුණි. කාලයත් සමඟ, ඇගේ හදවතේ දැල්වූ දෙවියන්වහන්සේගේ ප්‍රේමය කෙතරම් ශක්තිමත්ද යත්, ඇය අබ්දුල් බහාතුමාට ලිපියක් ලිවීමට තීරණය කළාය. එතුමාට සහ එතුමාගේ පියා වන බහා'උ'ල්ලා තුමාට සේවය කිරීමට ඉඩ දෙන ලෙස ඇය උන්වහන්සේගෙන් අයැද සිටියාය. එතුමා ඩොරතිට යැවූ පිළිතුරෙහිදී, අබ්දුල් බහාතුමා විසින් ඇගේ අරමුණට ප්‍රශංසා කර, දෙවියන්වහන්සේගේ වරප්‍රසාද ගැන ඇයට සහතිකවෙමින් ඇය ඇගේ ආශාව සාර්ථක ගනු ඇතැයි යන බලාපොරොත්තුව පළ කළේය. ඇත්ත වශයෙන්ම, ඩොරති ඇගේ මුළු ජීවිතයම කැප කළේ දෙවියන්වහන්සේට සහ මනුෂ්‍යත්වයට සේවය කිරීම සඳහාය.*

## E. ක්‍රීඩාව "ද්වීමාර්ග පිටපත"

සෑම ළමයෙකුම තම හවුල්කරුට මුහුණ ලා සිටින සේ ළමයින් යුගල වශයෙන් බෙදන්න. දැන් සෑම යුගලයකින්ම එක් ළමයෙකුට සරල ශාරීරික චලනයක් ආරම්භ කරන ලෙසත් අනෙක් ළමයා එය ප්‍රතිරූපණය කිරීමට උත්සාහ කළ යුතු බවත් ඉල්ලා සිටින්න. මිනිත්තු කිහිපයකට පසු, හවුල්කරුවන්ට භූමිකාවන් මාරු කළ හැකිය. ඔබට මෙම ශාරීරික චලනයන්ට වඩා මුහුණේ ඉරියව් ප්‍රකාශ කිරීමටද ඔවුන්ව යොමු කළ හැකිය. ඉන්පසු, සෑම යුගලයකම එක් ළමයෙකු අනෙකාට පිටුපසින් සිටගැනීමට සලස්වන්න. ඉදිරියෙන් සිටින තැනැත්තා චලනයන් සිදු කරනවිට, පිටුපසින් සිටින තැනැත්තා ඔහුගේ හෝ ඇයගේ චලනයන් අනුරූපණය කළ යුතුය.

## F. වර්ණ ගැන්වීම : 21 වැනි චිත්‍රය

## G. අවසන් කිරීමේ යාඥාව

## 22 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

ආරම්භ යාඥාවන් ගායනයෙන් පසුව, ළමයින්ට අවසාන පාඩමේ හඳුන්වා දුන් යාඥාව කටපාඩම් කිරීමට දිගටම කරගෙන යා කළ හැකිය.

### B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

මට සතුටින සිටීමට අවශ්‍යයි

Am
ඔබ දැනගත යුතු දෙයක් ඇත

Am E7
මෙම ධර්මය තුල අප පෙන්විය යුතු

Dm
අප වචනයේ නොව ක්‍රියාවෙන් යුත් මිනිසුන් වෙමු

Am E7 Am
අපගේ සම්පූර්ණ ජීවිතය තුළ මිතුරන් සහ සතුරන්ට ධර්මට පෙන්විය යුතුය

සමූහ ගායනය:

Am
මට ප්‍රීති වන්න අවශ්‍යයි

Am
මට ශක්තිමත් වෙන්න අවශ්‍යයි

Am
උන්වහන්සේගේ සෙවකයෙකු වන්න

Am
මාගේ සම්පූර්ණ ජීවිතය පුරා

Dm Am
එබැවින් මම දෙවියන්වහන්සේගේ නීතිවලට කීකරු විය යුතුයි

E7 Am
ඔව් මම දෙවියන්වහන්සේට කීකරු වෙමි

ඔබ දැනගත යුතු දෙයක් ඇත
මෙම අලංකාරවත් සහ විභූතිමත් ලොකයේ
මිනිසුන් නිශ්ඵල කතාවලින් වෙහෙසී ඇත
ඔබ උගන්වන දේ ඔබ ප්‍රගුණ කරනවා දැකීමට ඔවුන් කැමති

සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම පාඩමේදී විශ්වාසවන්ත භාවය යන තේමාව කෙරෙහි අවධානය යොමු කර ඇති පහත උද්ධෘතය පාඨය කටපාඩම් කිරීමට ළමයින් ඉගෙන ගනු ඇත. එය හඳුන්වාදීම සඳහා ප්‍රයෝජනවත් වන සමහර අදහස් කිහිපයක් පහත දක්වා ඇත.

> විශ්වාසවන්ත ආත්මයක් දෙවියන්වහන්සේ විසින් තමාට ලබා දී ඇති සියලු වරප්‍රසාද කිසිදා අමතක නොකරන අතර එය කිසිදිනක දෙවියන්වහන්සේට ආදරය කිරීම නොනවත්වයි. උන්වහන්සේ කෙරෙහි ඇති අපගේ විශ්වාසවන්තභාවය නිසා දුෂ්කර අවස්ථාවන්ද ඇතළුව සැමවිටම අප උත්සාහ කරන්නේ උන්වහන්සේගේ ඉගැන්වීම් පිළිපැදීමට සහ උන්වහන්සේගේ නීතිවලට කීකරු වීමයි.
>
> ඒ නිසා උන්වහන්සේගේ සතුට ලබා ගැනීම හැර වෙනත් සිතුවිල්ලක් නොමැති බැවින් අපි අන් අයට සේවය කිරීමටත්, යහපත් ක්‍රියා කිරීම සඳහාත් වෙහෙස මහන්සි වී කටයුතු කරමු. භක්තිමත් ආත්මයක් දෙවියන්වහන්සේව සතුටු කිරීමට උත්සාහ කරනවා වඩා වැඩි සතුටක් නැත. අප බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු.
>
> **"උසස් උත්සාහයන්ගේ වස්ත්‍රාභරණයෙන් සැරසෙන සහ මෙම ධර්මය සඳහා සේවය කිරීමට නැඟී සිටින විශ්වාසවන්ත තැනැත්තා ප්‍රීතියට පත්වේ."**[125]

*සැරසෙනවා*

1. මයේට විශේෂ අවස්ථාවලදී පමණක් අඳින ලස්සන ඇඳුමක් ඇත. ඇය ප්‍රජා රැස්වීම සඳහා ඇගේ ඇඳුම ඇඳ සිටියාය. මයේ ඇගේ විශේෂ ඇඳුමෙන් සැරසී සිටියාය.
2. නටාලියා සැම කෙනෙකුටම කරුණාවන්තයි. දෙවියන්වහන්සේ ඇගේ ආත්මය කරුණාවෙන් සැරසා ඇත.

*ඇඳුම් පැළඳුම්*

1. සමහර තැන්වල විනිසුරුවරුන්හට සුදු පැහැති ප්‍රතිශීර්ෂකයක් සහ දිගු කළු කබායක් උසාවියක් තුළ පැළඳිය යුතු වේ. ඔවුන් විනිසුරුවන්ගේ සම්පූර්ණ ඇඳුම පැළඳිය යුතුය.
2. මාලිගාවෙන් පිටව යාමට පෙර, කුමාරයා තම සළුව සහ ඔටුන්න පැළඳ සිටී. ඔහු තම රාජකීය ඇඳුම පැළඳ සිටී.
3. ජෙකොබ් සෑම උදෑසනකම නිවසින් පිටවීමට පෙර යාඥා කරයි. යාඥාව ඔහුගේ ආත්මය පැළඳ සිටින ඇඳුමක් වැනිය. එය දවස පුරා ඔහුව ශක්තිමත් කර ආරක්ෂා කරයි.

*උත්සාහය*

1. පාසල අවට පැල සිටුවීමට සිසුන්වීමට තීරණය කරන ලදි. ඔවුන්ගේ උත්සාහයට ප්‍රජාව බීජ පැල සහ පස් ලබා දෙමින් සහයෝගය දැක්වීය.
2. ඔවුන් කන්ද මුදුනට නැඟිය යුතුයැයි පියරේ සහ ආර්ලීන් තීරණය කරන්නට විය. මෙම උත්සාහය දුෂ්කර බව ඔවුන් දැන සිටියත් එම අධිෂ්ඨාය අත්හදා බැලීමට ඔවුන් තීරණය කළහ.

## D. කතාන්දරය

*අබ්දුල් බහාතුමාගේ පවුල පර්සියාවේ වංශවත් පිරිසක් වූ අතර එතුමා කුඩා පිරිමි ළමයෙකුව සිටියදී එම පවුලට ඉස්ෆන්ඩියාර් නම් සේවකයෙක් සිටියේය. ඔහු පවුලට ඉතා පක්ෂපාතී වූ අතර ඔවුන් ඔහුව දැඩි ලෙස විශ්වාස කළහ. බලධාරීන්, ඊර්ෂ්‍යාව සහ නොදැනුවත්කම නිසා, අබ්දුල් බහාතුමාගේ ආදරණීය පියා වන බහා'උ'ල්ලා තුමා අත්අඩංගුවට ගෙන, පවුලේ සියලු දේපළ පැහැර ගන්නා ලදී. ඔවුන්ට කිසිවක් ඉතිරි නොවූ අතර බහා'උ'ල්ලා තුමාට සමීප සෑම අයෙකුම අනතුරුදායක තත්වයට පත් විය. එසේ වුවත් ඉස්ෆන්ඩියාර් දිගටම පවුල රැක බලාගන්නා ලදී. බොහෝ නිලධාරීන් ඉස්ෆන්ඩියාර් සොයන බව දැනගත් අබ්දුල් බහාතුමාගේ මව ඔහුට නගරයෙන් පිටව යන ලෙස ඉල්ලා සිටියාය. නමුත් ඉස්ෆන්ඩියාර් පිටව ගියේ නැත.*

*ඔහු මිලදී ගත් භාණ්ඩ සඳහා බොහෝ සාප්පු හිමියන්ට මුදල් ණය වී ඇති බැවින් “මට යන්න බැහැ,” යනුවෙන් ඔහු පැවසුවේය. "මම කොහොමද යන්නෙ?" බහා‘උ’ල්ලා තුමාගේ සේවකයා ගබඩා සාප්පු හිමියන්ගේ භාණ්ඩ හා සැපයුම්වලට නොගෙවා ඒවා මිල දී ගෙන පරිභෝජනය කර ඇති බව ඔවුන් කියනු ඇත. මම මේ සියලු පොරොන්දු වගකීම් නොගවා මට යන්න බැහැ. නමුත් ඔවුන් මා අල්ලා ගත්තොත්, ඒක කමක් නැහැ. ඔවුන් මට දඬුවම් කළොත් එයින් හානියක් නැහැ. ඔවුන් මාව මරා දානව නම්, දුක් වෙන්න එපා. නමුත් මට පැන යන්න බැහැ. මම ගෙවිය යුතු සියල්ල ගෙවන තුරු මම සිටිය යුතුයි." ඔහු පැවසුවේය.*

*මාසයක් පුරාවට ඉස්ෆන්ඩියාර් තමා සතු කුඩා දේවල් විකුණමින් වීදිවල සහ කඩසාප්පුවල ඇවිද ගියේය. අන්තිම ණය ගෙවා අවසන් වූ පසු, ඔහු පවුල වෙත ගොස් ඔවුන්ට සමුදුන්නේ ඔහුට ඔවුන් සමඟ තවදුරටත් සිටිය නොහැකි බව ඔහු දන්නා බැවිනි. මේ භයානක කාලය තුළ ඔහුව රඳවාගෙන ආරක්‍ෂා කිරීමට සහ රැකවරණය ලබා දීමට රජයේ ඇමැතිවරයකු එකඟ විය.*

*මාස ගණනාවකට පසු, බහාඋල්ලා සිරෙන් නිදහස් වූ පසු, බලධාරීන් විසින් එතුමා සහ එතුමාගේ පවුලේ අය පර්සියාවෙන් පිටුවහල් කරන ලදී. ඔවුන් අසල්වැසි රටෙහි බැග්ඩෑඩ් නගරයට පිටත්ව යන ලදි. සැමවිටම බහා‘උ’ල්ලා තුමාට විශ්වාසවන්තව සිටි ඉස්ෆන්ඩියාර්, බැග්ඩෑඩ් වෙත ගොස් නැවත වරක් එතුමාගේ නිවසේ සේවය කළ හැකිද යන්න විමසීය. “ඔබ අපෙන් වෙන් වූ විට, ඔබට රැකවරණය ලබා දීමට කිසිවෙකුට නොහැකි වූ විට ඔබට නවතින්නට තැනක් දුන් පර්සියානු ඇමතිවරයෙක් සිටියේය. ඔහු ඔබට රැකවරණය දී ඔබව ආරක්ෂා කළ නිසා, ඔබ ඔහුට විශ්වාසවන්ත විය යුතුයි. ඔබ අප වෙත පැමිණීමෙන් ඔහු සෑහීමට පත්වන්නේ නම් අප වෙත එන්න, නමුත් ඔහු ඔබ යනවාට අකමැති නම් ඔබ ඔහු අත්නොහැරිය යුතුයි.” බහා‘උ’ල්ලා තුමා පැවසීය.*

*ඇත්ත වශයෙන්ම, ඉස්ෆන්ඩියාර් කෙතරම් අවංකද, කොතරම් විශ්වාසවන්තද සහ පක්ෂපාතීද යත්, ඇමතිවරයා ඔහුගේ පිටවීමට අකමැත්ත පළ කළේය. "අනේ ඉස්ෆන්ඩියාර්!" "ඔබ යනවාට මම කැමති නැහැ, නමුත් ඔබට යාමට අවශ්‍ය නම්, එය ඔබගේම කැමැත්තෙන් සිදුවිය යුතුය" ඔහු පැවසූ අතර එහිදී ඉස්ෆන්ඩියාර්ට බහා‘උ’ල්ලා තුමාගේ වචන මතක් විය. ටික කලකට පසු අමාත්‍යවරයා අභාවප්‍රාප්ත වන තෙක් ඔහු අමාත්‍යවරයාගේ සේවයේ රැඳී සිටි අතර පසුව ඉස්ෆන්ඩියාර් නැවත වරත් ඔහු බෙහෙවින් ආදරය කළ පවුල වෙත ආපසු පැමිණ, ඔහුගේ ජීවිතය අවසන් වනතෙක් අබ්දුල් බහාතුමාට සේවය කළේය.*

## E. ක්‍රීඩාව “මගේ දොරට තට්ටු කරන්නේ කවුද”

පන්තියේ එක් සිසුවෙකු තෝරාගෙන ඔහුගේ හෝ ඇයගේ ඇස් වසා සෙසු අයට පිටු පාමින් බංකුවක අසුන් ගැනීමට සලස්වන්න. දැන් තවත් සිසුවෙකුට පැමිණෙන ලෙස පවසන්න. ඔහු හෝ ඇය ඇස් බැඳ සිටින දරුවා වෙත ගොස් බංකුවට තට්ටු කළ යුතුය. වාඩි වී සිටින දරුවා “මගේ දොරට තට්ටු කරන්නේ කවුද?” දැයි ඇසිය යුතුය. අනෙක් සිසුවා, ඔහුගේ හෝ ඇයගේ කටහඬ වෙනස් කිරීමට උත්සාහ කරමින්, "මේ මම!" යයි පිළිතුරු දුන්විට වාඩි වී සිටින ළමයා තට්ටු කරන්නේ කවුදැයි අනුමාන කිරීමට උත්සාහ කළ යුතුය. ඔහුට හෝ ඇයට තුන් වතාවක් අනුමාන කළ හැකි අතර, ඉන්පසු තවත් ළමයෙකුට අවස්ථාව ලබා දිය යුතුය. ඇස් බැඳ සිටින ළමයාට හොඳින් සවන් දීමට නම්, පන්තියේ සෙසු අය ඉතා නිහඬව සිටිය යුතු බව ළමයින්ට සඳහන් කිරීමට ඔබ කැමතිවනවා ඇත.

## F. වර්ණ ගැන්වීම : 22 වැනි චිත්‍රය

## G. අවසන් කිරීමේ යාඥාව

# 23 වැනි පාඩම

## A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

ඔබට යාඥාවන් සමඟින් පන්තිය ආරම්භ කළ හැකි අතර, පසුව 21 වන පාඩමේ හඳුන්වා දී ඇති යාඥාව කටපාඩම් කිරීමට ළමයින් ගන්නා ඔවුන්ගේ උත්සාහයන් ඉදිරියට ගෙන යාමට උපකාර කළ හැකිය.

**B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)**

ඉවසිලිවන්ත බව

D A
ඔබගේ දෙපා වෙහෙසට පත්වේ

A D
මාවත ඉතා බොහෝ දුරයි

D A
ඔබ උත්සාහ කිරීම අවශ්‍ය වේ

A D
හිරු රශ්මිය බොහෝ බලවත් වේ

G D
නොඉවසිලිමත්වීම ඵලක් නැත

G D
ඔබ ඇඩුවත් ඵලක් නොවේ

G D
ඔබ පියවරෙන් පියවර තැබුවොත්

A D
කාලය වේගයෙන් ගෙවී යයි

සමූහ ගායනය:

G D
ඉවසීමයි පිළිතුර

G D
ඔබ ශෝකයෙන් සහ දුකින් සිටිනවිට

G D
ඉවසීමේ ප්‍රතිපල ලැබේ

A D
එය ඔබට ප්‍රීතිය ගෙන එයි

ඔබගේ සහෝදරියන්ට අවබෝධ නොවේ
නමුත් ඔබ එය දෙවරකට වඩා පැහැදිලි කල යුතුය
ඔබ ඇත්තෙන්ම නැවත උත්සාහ කරන්න
උපරිම හොඳින් කටයුතු කරන්න
නොඉවසිලිවන්තවීම ඵලක් නැත
දැඩි බවින් ඵලක් නැත
ඔබ ඔහුට කාරුණික වුවහොත්
ඔහුට ඉගෙනගත හැකි මාර්ගය එයයි

සමූහ ගායනය

ඔබ වඩා හොඳ දෙයක් කළ යුතුව ඇත
නමුත් තවමත් ඔබ සාර්ථක නොවීනම්
උත්සාහ ගන්නෙ ඇයිදැයි සිතයි
සියල්ල මඟපෙන්වන්නේ කොතැනටද
නොඉවසිලිවන්තවීම ඵලක් නැත
අල්පයක් කිරීම මොඩකමකි
ඔබ නිරතුරු උත්සාහ කළහොත්
අවසානයේදී ඔබ සාර්ථක වනු ඇත

සමූහ ගායනය

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම පාඩමේදී, ඉවසිලිවන්ත බව හා සම්බන්ධ උද්ධෘත පාඨයක් ළමයින් විසින් කටපාඩම් කරනු ඇති අතර එය ඔබට පහත ආකාරයෙන් ඉදිරිපත් කළ හැකිය:

අප සතුවිය හැකි වැදගත්ම ගුණාංගයක් වන්නේ ඉවසීමයි. ඉවසීමෙන් තොරව අපට මේ ජීවිතයේ සුළු දෙයක් හෝ සාර්ථක කරගත නොහැකිය. අපගේ අධ්‍යයන කටයුතුවලදී, අපගේ රැකියාවේදී, අපගේ පවුල තුළ, අන් අය සමඟ අපගේ මිත්‍රත්වයේදී, ආධ්‍යාත්මිකව වර්ධනයවීමට දරන උත්සාහයේදී ඉවසීම අවශ්‍ය වේ. ජීවිතයේ සෑම දෙයක්ම ඉක්මනින් කළ නොහැක. ටික ටික දවසින් දවස බොහෝ දේවල් කළ හැකි වේ. අපි ඉවසීමෙන් කටයුතු කරන විට, කාලය අවශ්‍ය දේවල් ඉක්මන් කිරීමට අපි උත්සාහ නොකරමු. අප සියල්ලන්ම ඉගෙන ගනිමින් වැඩෙන නිසා අපි අන් අය සමඟ මෙන්ම අප අප සමඟත් ඉවසිලිවන්ත විය යුතුය. ඉවසීම ඇති කර ගැනීමේ අපගේ උත්සාහයේදී අපට උපකාරීවීම සඳහා, අපි පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු:

**"නියතවශයෙන්ම උන්වහන්සේ ඉවසීමෙන් විඳදරාගන්නා අයගේ ත්‍යාගයන් ඉහළ නංවනු ඇත."[126]**

*ත්‍යාග*

1. ඇන්ඩර්සන් මහත්මිය තම පන්තියේ සිසුන් විසින් සකස් කරන ලද විශිෂ්ට විද්‍යා ව්‍යාපෘති පිළිබඳ බොහෝ සතුටට පත්වූවාය. ත්‍යාගයක් ලෙස ඇය ඔවුන්ව අසල පිහිටි මින්මැදුරක් නැරඹීමට රැගෙන යන ලදි.

2. ඇලේනා ගිටාරය වාදනය කරන ආකාරය ඉගෙන ගැනීමට දිනපතා කාලය ගත කළාය. ඇය තම බාල සොහොයුරා වෙනුවෙන් මිහිරි ගීතයක් වාදනය කළ පසු, ඔහුගේ මුහුණේ ඇතිවූ ප්‍රීතිය ඇගේ උත්සාහය සඳහා වූ සම්පූර්ණ ත්‍යාගය විය.

*ඉවසීම*

1. ආලියා සහ ඇගේ පවුලේ අය දුර පළාතකට මාරුවී යන ලදි. මුල් මාස කිහිපය තුළ ඔවුන්ට බොහෝ දුෂ්කරතා ඇති විය. එහෙත්, ඔවුන්ගේ කාරුණික අසල්වාසීන්ගේ උපකාරය ඇතිව, මෙම දුෂ්කරතා විඳදරාගැනීමට හැකි වූ අතර, දැන් ඔවුන්ගේ නව නිවසේ ඉතා සතුටින් සිටිති.

2. හියු අසනීපයට පත්විය. ඔහු දැඩි වේදනාවකින් සිටියද පැමිණිලි කළේ නැත. ඔහු තම දුක් වේදනා ඉවසීමෙන් විඳදරාගත්තේය.

**D.** කතාන්දරය

*ලී ෂින් පීච්වලට බෙහෙවින් ප්‍රියා කළේය. සෑම දිනකම පාසල් යනවිට පීච් ගෙඩියක් ගෙන ගොස් දීලා දිවා විවේක කාලයේදී ආහාරයට ගත්තේය. ඔහු සෑම කොටසකින්ම සතුටට පත් වූ නමුත් ඔහු සෑමවිටම එහි බීජය සහිත කොටස ඉවතට විසි කළේය.*

*දිනක් ලී ෂින් ඔහුගේ පන්තියේදී බීජ පිළිබඳ ඉගෙන ගත්තේය. මෙමගින් ලී ෂින්ට අදහසක් පහළ විය. ඔහු තම පීච් වලින් බීජයක් සිටුවා එය ගසක් ලෙස වැඩීමට උපකාර කරන්නට සිතීය! දිවා ආහාර වේලෙහි ඔහු තම පීච් ගෙඩියෙන් බීජ කවය ගෙන එය කඩදාසි කැබැල්ලක ඔතා ගත්තේය. පාසල අවසන් වූ පසු, ඔහු නිවසට දිව ගොස් තම ගස වැවීම ආරම්භ කිරීමට ස්ථානයක් සොයා ගැනීමට උදව් කරන ලෙස තම පියාගෙන් ඉල්ලා සිටියේය. ඔහුගේ පියා ඔහුට මතක් කර දුන්නේ බීජය ලබා ගැනීමට පෙර බීජ කවය වියළී යන තෙක් බලා සිටිය යුතු බවයි. එසේ වුවත්, ලී ෂින්ට බීජ කවය වහාම සිටුවීමට අවශ්‍ය විය. "ලී ෂින්" "ඔබට බීජ කවය වියළෙන තෙක් ඉවසීමක් නොමැති නම්, බීජ පැළ වන තෙක් බලා සිටීමට ඔබ ඉවසන්නේ කෙසේද?" ඔහුගේ පියා පැවසූ අතර පසුව ලී ෂින් බීජ කවය වියළීමට තබන ලදී.*

*දින කිහිපයකට පසු, අවසානයේදී ලී ෂින්ට බීජ කවය කඩා බීජය පිටතට ගැනීමට හැකි විය. ඔහුගේ මව විසින් ගස විශාල වී උසට වැඩිය හැකි ස්ථානයක් ලෙස මිදුලේ කොනක් ඔහුට පෙන්වූවාය. ලී ෂින් කුඩා සිදුරක් හාරා බීජය එතුළට දමා, පසුව තෙත් පස් ගොඩකින් එය ආවරණය කළේය. ඔහු උද්වේගයෙන් සිනාසුණේය. අවසානයේදී ඔහුගේ ගස එහි ගමන ආරම්භ කරයි!*

*බීජය පැළ වී ඇති බවට යම් සලකුණක් දැකීමේ බලාපොරොත්තුවෙන් සෑම දිනකම, ලී ෂින් පස් ගොඩැල්ලට පැමිණ පරීක්ෂා කළේය. නමුත් සති ගණනාවක් තිස්සේ පැළයක් නොපෙනී ගිය අතර ලී ෂින් අධෛර්යයට පත් විය. ෂින් කනස්සල්ලෙන් සිටිනු දුටු ඔහුගේ මව ඔහුගේ ප්‍රශ්නය කුමක්දැයි ඇසුවාය. "මගේ බීජය පැළවෙන්නේ නැහැ," ලී ෂින් පැවසීය. "යම් දවසක මට ගසක් තිබේදැයි මම කල්පනා කරනවා." යනුවෙන් ඔහු පැවසූ පසු "ඔව්, මේ බීජයට වැඩීමට බොහෝ දේ තියෙනවා. ඒ ආකාරයෙන් බලනවිට එය ඔබට බොහෝ සෙයින් සමානයි. ඔබ ඉපදෙන විට, ඔබ කුඩා අයෙක් පමණක් වූ අතර ඔබ කළේ ආහාර ගැනීම සහ නිදා ගැනීම පමණයි. දැන් ඔබ දෙස බලන්න! ඔබ තරුණ පිරිමි ළමයෙක්, ඇවිදිනවා, කතා කරනවා සහ ඔබ ඔබ ගැනත් සිතනවා! මෙම ගස වැඩීමට වසර ගණනාවක් ගත විය හැකි නමුත්, ඔබ එය හොඳින් රැකබලා ගන්නේ නම්, කවදා හෝ ඔබට එහි සෙවණෙහි වාඩි වී එහි පල භුක්ති විඳීමට හැකි වනු ඇත." යනුවෙන් ඔහුගේ මව පැවසුවාය. මේ පිළිබඳ සිතූ ලී ෂින්ට නැවතත් බලාපොරොත්තුවක් ඇති විය. බීජයක් පැළ වීමටත් පෙර බොහෝ වෙනස්කම් වලට භාජනය විය යුතු බව ඔහු තම පන්තියේදී ඉගෙන ගත්තේය.*

*ඉන්පසුව, සෑම විටම මෙන් එක් වසන්ත දිනක, ලී ෂින් ඔහුගේ පස් ගොඩැල්ල නැරඹීමට පිටත්ව ගිය අතර, ඔහුට මහත් උද්‍යෝගයක් ඇති කරමින් කුඩා කොළ පැහැති පැළයක් පෘථිවිය හරහා නැගී එන ආකාරය ඔහු දුටුවේය! ඔහුගේ ගස වැඩෙමින් තිබුණි! ගොවියෙකු වූ තම අසල්වැසියා වෙත දිව ගොස් සිත්ගන්නාසුළු පුවත ඔහු ඇයට කීවේය. ගස ඉතා ළපටි හා අවදානම් තත්වයේ තිබියදී එය රැකබලා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ඇය ඔහුට උපදෙස් දුන් අතර, ඔහු හැකි උපරිමයෙන් එය පෝෂණය කිරීමේ උනන්දුවෙන් ඇගේ සෑම වචනයකටම ඔහු සවන් දුන්නේය. "ඔබේ හොඳ උපදෙස් සඳහා ස්තුති කර පීච් ගොඩක් ඔයාට දෙන්න ඉක්මනින් හැකි වෙයි." ලී ෂින් පැවසීය. නමුත් අසල්වැසියා සිනාසුණා පමණි. "ලී ෂින්, බීජ කවය වියළෙන් තෙක් ඔබ ඉවසීමෙන් සිටි ආකාරය ඔබට මතකද?" ෂින් හිස වැනුවේය. "ඔබේ බීජය පැළ වන තෙක් ඔබ බලා සිටියදී ඔබට ඊටත් වඩා ඉවසීමක් අවශ්‍ය වූ ආකාරය ඔබට මතකද?" ලී ෂින්ටත් එයත් මතකයට නැගුණි. "ඒ වගේම" "ඔබේ අංකුරය ගසක් වීමටත්, ඉන් පසුව එය ඵල ලබා දීමටත් ඊටත් වඩා වැඩි කාලයක් ගතවනු ඇත. ඔබට භුක්ති විඳීම සඳහා එක්දු හෝ පීච් ගෙඩියක් සෑදීමට මෙම ගස සූදානම් වීමට වසර ගණනාවක් ගත විය හැකිය." අසල්වැසියා පැවසුවේය.*

*එබැවින් ලී ෂින් ගස රැකබලා ගත් අතර එය අංකුරයකින් පැළයක් දක්වාත් පැළයකින් ගසක් දක්වාත් වැඩෙන විට එහි අවශ්‍යතා ඉටු කළේය. ඔහු මෙන්ම ගස ටිකෙන් ටික උසින් පුළුල් වර්ධනය විය. ඉන්පසු එක් දිනක්, ලී ෂින් පාසලෙන් ආපසු එන විට, ගසේ මුලින් පීච් මල් පමණක් පිපුණු තැනින් පීච් මතුවීමට පටන් ගන්නා බව ඔහු දුටුවේය. නැවත වරක්, බීජය මුලින්ම පැළ කළවිට ඔහුගේ හදවත පිරී ගිය සතුට ඔහුට දැනුනි. ඒ වගේම තමන් ඉවසීමෙන් ක්‍රියා කළ යුතු බව නැවත*

*වරක් ඔහුට අවබෝධ විය. මක්නිසාද යත්, පීචි පැසී සහ කෑමට සූදානම්වන තෙක් තවත් කාලයක් ගතවනු ඇති බැවිනි.*

### E. ක්‍රීඩාව “ආරම්භකයා සොයා ගන්න”

එක් ළමයෙකුගේ ඇස් බැඳ ඔහු හෝ ඇය කණ්ඩායමේ සෙසු අයගෙන් ඉවතට හරවන්න. පසුව "ආරම්භකයා" වන සිසුවා කවුරුන්දැයි නිශ්ශබ්දව පෙන්වන්න. පළමු ළමයා කණ්ඩායමට නැවත එක්වන ලෙස ඉල්ලා සිටීමට පෙර, "ආරම්භකයා" විසින් ලබා දී ඇති ක්‍රියාවන් අනුගමනය කිරීමට අනෙක් අයට උදව් කරන්න. නිදසුනක් වශයෙන්, ඔහු හෝ ඇය අත්පුඩි ගසන්නේ නම්, අනෙක් සියල්ලන්ම එසේ කළ යුතුය. ඔහු හෝ ඇය සමුගැනීම පෙන්වන ලෙස අත්වැනීම පටන් ගන්නේ නම්, අනෙක් සියල්ලන්ම එසේ කළ යුතුය. දැන් පළමු දරුවාගේ ඇස් බැන්දුම ඉවත් කිරීමෙන් පසු නැවත කණ්ඩායමට එකතු විය හැක. ඔහු හෝ ඇය හොඳින් සොයා බලා "ආරම්භකයා" ලෙස ක්‍රියා කරන්නේ කවුරුන්ද යන්න සොයා ගැනීමට උත්සාහ කළ යුතුය. ඒ අතරම, අනෙක් අය ක්‍රියාවන් මෙහෙයවන ළමයා දෙස සමීපව හෝ නිතර නොබැලීමට උත්සාහ කළ යුතු අතර නොඑසේ නම් ඔහුව හෝ ඇයට පහසුවෙන් හඳුනා ගත හැකිවනු ඇත. ළමයින්ට මාරුවෙන් මාරුවට "ආරම්භකයා" හෝ අනුමාන කරන්නා විය හැකිය.

### F. වර්ණ ගැන්වීම : 23 වැනි චිත්‍රය

### G. අවසන් කිරීමේ යාඥාව

## 24 වැනි පාඩම

### A. යාඥා ගායනය සහ කටපාඩම් කිරීම

සෑම විටම මෙන්, යාඥාවන්ගෙන් පන්තිය ආරම්භ කර, පසුගිය පාඩම් කිහිපය පුරාවට ඔවුන් කටපාඩමින් කීමට ඉගෙන ගත් යාඥා දරුවන් සමඟ සමාලෝචනය කරන්න.

### B. ගීත ගායනය (පෙර ගීතයේ සමාලෝචනය ඇතුළත් කරන්න)

දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ස්ථාවරවීම

G C
අප ඇවිද යමු, අප ඇවිද යමු

D G
අප දෙවියන්වහන්සේගේ මාවතේ ඇවිද යමු

G C
අප ස්ථිරයි, අප ස්ථිරයි

D G
දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ අප ස්ථාවරයි

G C
දෙවියන්වහන්සේගේ මාවතේ ගමන් කරමු

D G
අපගේ මාවතේ ගැටළු ඇතිවූ විට

G C
අප දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ස්ථාවර වෙමු

D G
අප උන්වහන්සේගේ මාවතේ රැදෙමු

අප සේවය කරමු, අප සේවය කරමු
අප දෙවියන්වහන්සේගේ ධර්මයේ සේවය කරමු
අප ස්ථාවරයි, අප ස්ථාවරයි
දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ අප ස්ථාවරයි
අප දෙවියන්වහන්සේගේ ධර්මයේ සේවය කරමු
අප සැමවිට අපගේ කොටස සිදුකරමු
දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ අප ස්ථාවරයි
ප්‍රීතිමත් හදවතින් සේවය කරමු

අප නැගී සිටිමු, අප නැගී සිටිමු
අප නැගී සිට දෙවියන්වහන්සේ වෙත අපගේ හදවත් යොමු කරමු
අප ස්ථාවරයි, අප ස්ථාවරයි
දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ අප ස්ථාවරයි
අප නැගී සිට දෙවියන්වහන්සේ වෙත අපගේ හදවත් යොමු කරමු
උන්වහන්සේගේ උපකාරයන් සැක නොකරමු
දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ අප ස්ථාවරයි
අපගේ සැම දුකක්ම දුරුවී යනු ඇත

## C. උද්ධෘත පාඨ කටපාඩම් කිරීම

මෙම අවසාන පාඩමේදී ස්ථිරභාවය යන තේමාව මත අවධානය යොමු කර ඇති ළමයින් කටපාඩම් කිරීමට යොමුවන උද්ධෘත පාඨය හඳුන්වා දීමට පහත අදහස් ඔබට උපකාරී වනු ඇත.

> දෙවියන් වහන්සේට සැබවින්ම ආදරය කරන පුද්ගලයෙකුගේ වැදගත්ම ගුණාංගයක් වන්නේ ස්ථිරසාර භාවයයි. ජීවිතයේ කුමක් සිදු වුවද, අපි සැම විටම දෙවියන්වහන්සේ සහ උන්වහන්සේ කෙරෙහි අපගේ ආදරය සිහිපත් කරමු. එමනිසා, උන්වහන්සේ කෙරෙහි අපගේ ඇති භක්තියට බලපාන කිසිවක් අන් අයට පැවසීමට හෝ අපට කියාපෑමට නොහැක. අපි උන්වහන්සේට ආදරය කරන අතර උන්වහන්සේගේ නීති සහ ඉගැන්වීම්වලට කීකරු වන්නෙමු. සැම විටම අපට ස්ථිරසාර භාවයෙන් සිටිය යුතු බව මතක් කර දීම සඳහා, අපි බහා'උ'ල්ලා තුමාගේ පහත උද්ධෘත පාඨය කටපාඩම් කරගනිමු:
>
> **"ඔබ ඔබගේ ස්වාමීන් වහන්සේගේ ධර්මයේ ස්ථිරසාර භාවයෙන් සිටින්නේ නම් ඔබගේ තත්වය ශ්‍රේෂ්ඨ උදාර වනු ඇත."[127]**

*ශ්‍රේෂ්ඨ*

1. කිසිදු ෂැවියර් කෙනෙකු දැක නැතිතරම් උද්‍යානය ලස්සන විය. උද්‍යානයේ වූ ශ්‍රේෂ්ඨ අලංකාරවත් බව ඔහුට අදහා ගත නොහැකි විය.
2. කෙලෙට්සෝගේ මව පවුලේ අය සඳහා ඉතා සුවිශේෂී කේක් එකක් සාදන ලදි. ඔවුන් ඉතා සතුටින් එය අනුභව කළ අතර, සියල්ලෝම එය විශිෂ්ඨ රසයකින් යුත් බව පැවසූහ.

*උදාර*

1. සැම රාත්‍රියකම නින්දට යාමට පෙර මාර්තා යාඥා කරන අතර දෙවියන්වහන්සේට සමීප බවක් ඇයට දැනේ. ඇය නින්දට යන විට ඇයගේ ආත්මය උසස් තත්වයක පවතී.

2. මෙම රූස්වීමේදී කුමාර් විසින් ලෝක සාමය සහ මනුෂ්‍යත්වයේ යහපත්කම පිළිබඳව දේශනයක් පවත්වන ලදී. කුමාර් උසස් අදහස් ගැන කතා කළේය.

*ස්ථිරසාරභාවයෙන් සිටීම*

1. තරු යනු අහසේ පාවෙන කුඩා පහන් බව රෝස්මරීගේ මිතුරිය ඇයට දිගින් දිගටම කියයි. නමුත් රෝස්මරී පන්තියේදී ඉගෙන ගන්නා ලද්දේ සෑම තරුවක්ම ඇත්තටම ඇත සූර්යයන් බවයි. රෝස්මරී ඇගේ අදහස වෙනස් නොකරයි. ඇය සත්‍ය යැයි දන්නා දෙයෙහි ස්ථිරව සිටියි.

2. සෑම දිනකම යාඥා කිරීමට වැදගත් නොවන බව මෝනාට යම්කිසි අයෙක් පවසා ඇති නමුත් ඇය දිගටම යාඥා කළේ යාඥා කිරීම දෙවියන්වහන්සේගේ නීතියක් බව ඇය දන්නා බැවිනි. මෝනා යාඥා කිරීමේ නීතිය පිළිපැදීමේදී ස්ථිරව සිටියාය.

## D. කතාන්දරය

*බාහියා ඛානුම්තුමිය යනු අබ්දුල් බහාතුමාගේ බාල සොහොයුරිය බව අතැම්විට ඔබ දන්නවා ඇත. ඔවුන්ගේ පියා බහා'උ'ල්ලා තුමා අසාධාරණ රජයක් විසින් අත්අඩංගුවට ගෙන සිරගත කරන විට ඇයට වයස අවුරුදු හයක් පමණ විය. ඇගේ පවුල වංශවත් පරම්පරාවකට අයත් බව ඔබට මීට පෙර කතාවකින් ඉගෙන ගත්බව ඔබට මතක ඇත. නමුත් ඇගේ පියා අත්අඩංගුවට ගැනීමත් සමඟ පවුලේ සියලු දේපළ පැහැරගන්නා ලදී. ඔවුන්ගේ ඉඩම්, ඔවුන්ගේ නිවාස, ඔවුන්ගේ ගෘහ භාණ්ඩ, ඔවුන්ගේ බඩු බාහිරාදිය මේ සියල්ල නැති වී ගියේය. පවුලේ අයට සියල්ල නැතිවී අවසානයේ ආහාර පවා නැති තරම් විය. ඇය සහ ඇගේ ආදරණීය වැඩිමහල් සොහොයුරා වන අබ්දුල් බහාතුමාට බඩගිනි වූ විට ඔවුන්ට කෑමට දීම සඳහා පාන් නොමැති වූ විට, ඔවුන්ගේ මව ඔවුන්ට කෑමට පිටි ස්වල්පයක් අත්ලට වත් කළාය.*

*කාලයකට පසු, ඔවුන්ගේ පියා නිදහස් කරන ලද අතර ඔවුන්ගේ මව්බිම හැර යාමට රජය විසින් බල කරන ලදී. බහියා ඛානුම් තුමිය සහ ඇගේ පවුලේ අය සීත ඍතුවේ කටුක සීතලේ අසල්වැසි රටක බැග්ඩෑඩ් නගරය බලා පිටත් විය. නගරයට ළඟාවීම සඳහා ඔවුන්ට හිමෙන් වැසී ගිය විශාල කඳු තරණය කිරීමට සිදු විය. ගමන අනතුරුදායක වූ අතර ගමන සඳහා ඔවුන් සතුව තිබූ පහසුකම් ප්‍රමාණවත් නොවීය. හිමෙන් සහ සීතලෙන් ආරක්ෂාවීම සඳහා ඔවුන්ට සතුවූ ඇඳුම් පැළඳුම් ප්‍රමාණවත් නොවීය. ඔවුන් සතුවූ කොටළු පැටවුන් කිහිපයකගේ උපකාරයෙන් ඔවුන් සෙමෙන් කඳු මුදුන් දිගේ ගමන් කළහ. බොහෝ විට ඔවුන්ට ඝන වනාන්තරයේ තුල රාත්‍රිය කාලය සඳහා කඳවුරු බැඳීමට සිදු විය. නමුත් දෙවියන්වහන්සේ ඔවුන්ව ආරක්ෂා කළ අතර, උන්වහන්සේගේ නොසැලෙන උපකාරයෙන් ඔවුන් මාස තුනකට පසු ආරක්ෂිතව බැග්ඩෑඩ් වෙත පැමිණියහ. බහියා ඛානුම්තුමියට නැවත කිසි දිනෙක තම උපන් දේශයට ආපසු පැමිණීමට නොහැකි විය.*

*බාහියි ඛානුම්තුමිය ඇගේ ජීවිතයේ ඉතිරි කාලය තුළ, ඇගේ පියාගේ දුක් වේදනා සහ පිටුවහල් කිරීම් සිදුවනවිට එතුමා සමඟ එක්ව සිටියාය. අවසානයේදී, රජය බහා'උ'ල්ලා තුමා ඇකා බන්ධනාගාර නගරයට පිටුවහල් කරන ලද අතර එහිදී ඇය සහ ඇගේ පවුලේ අය වඩාත් දරුණු අපරාධකරුවන් අතර ජීවත් වූහ. ඇය බොහෝ සෙයින් ආදරය කළ තම පියාණන් මෙලොව හැර ගිය විට, බාහියි ඛානුම්තුමිය තම පියාගේ ධර්මයේ ප්‍රධාන තැනැත්තාණන් ලෙස පත් කරන ලද ඇගේ ආදරණීය සහෝදරයා වන අබ්දුල් බහාතුමාට විශ්වාසවන්තව සහයෝගය දුන්නාය.*
*වසර ගණනාවකට පසු, අබ්දුල් බහාතුමාද මෙලොව හැර ඊළඟ ලෝකයට ගිය විට, අබ්දුල් බහාතුමා විසින් එතුමාගේ මුනුපුරා වන තරුණ ෂෝගි එෆෙන්ඩි තුමා ධර්මයේ ආරක්ෂක වරයා ලෙස නම් කරනු ලැබීමෙන් පසු බහියි ඛානුම්තුමිය ඔහුගේ ශ්‍රේෂ්ඨතම ආධාරකරු සහ දැඩි ආරක්ෂකයා බවට පත්විය.*


*කාලයත් සමඟ බහියා ඛානුම් තුමිය මහලු කාන්තාවක් බවට පත්විය. ඇයගේ ජීවිතය කැලඹීම් සහ ආරවුල් වලින් පිරී තිබුණි. එය දුෂ්කරතාවයන්ගෙන් දුෂ්කරතාවයටත්, විපත්තිවලින් විපත්වලටත් ගමන් කළ නමුත් ඇගේ ආත්මය ස්ථිරසාරව පැවති අතර, ඇයගේ හදවත සෑමවිටම දෙවියන්වහන්සේගේ කෙරෙහි වූ ආදරයෙන් පිරී තිබුණි. ඇයගේ ජීවිතයේ අවසාන දිනවලදී ඇය නොසැලී සහ ස්ථිරසාරව සිටියාය.*

**E. ක්‍රීඩාව "උපකාර දෑත්"**

යුගල ලෙස සකස් වී ඔවුන්ගේ හවුල්කරු සමඟ අත් අල්ලා ගන්නා ලෙස ළමයින්ට පවසන්න. පළමුව ඔවුන් විවෘත දෙනෙතින් යුතුව යුගල වශයෙන් එම ප්‍රදේශය වටා ඇවිදීමට සලස්වන්න. ඔවුන් කුඩා පියවරවලින් ආරම්භ කළ යුතු අතර, ඔවුන්ගේ පියවර ක්‍රමක් ක්‍රමයෙන් දිගු හා දීර්ඝ විය යුතුය. සෑම යුගලයක්ම වෙනත් කිසිවෙකු සමඟ ගැටීමෙන් වැළකී සිටීමට වගබලා ගත යුතුය. ඉන්පසුව, එක් එක් යුගලයේ එක් හවුල්කරුවෙකු ඔහුගේ හෝ ඇයගේ ඇස් වසා ගත යුතු අතර, ඔවුන් ඇවිදීමේ ක්‍රියාකාරකම නැවත සිදු කළ යුතුය.

**F. වර්ණ ගැන්වීම : 24 වැනි චිත්‍රය**

**G. අවසන් කිරීමේ යාඥාව**



**"එම්බා මනුෂ්‍ය පුත්‍රය! මාගේ ප්‍රථම උපදේශය මෙයයි: පවිත්‍ර, කාරුණික හා දීප්තිමත් හදවතක් ඔබ සතු කරගන්න...."**




**“ඇත්ත වශයනේම, ඔබ දෙවියන්වහන්සේගේ යුක්තියේ මාර්ගයේ ගමන් කරන්න, සෘජු මාවත එයයි.”**



**“එම්බා මිත්‍රය! ඔබගේ හදවත් නමැති උද්‍යානය තුල ආදරයේ රෝස මල් හැර අන්කිසිවක් නොසිටවන්න.”**



“සත්‍යවාදී බව සියළුම මානුෂීය ගුණාංගයන්ගේ පදනමයි.”




**“දීම සහ පරිත්‍යාගශීලි භාවය මාගේ ගුණාංගයන් වන අතර මාගේ ගුණාංගයන්ගෙන් සැරසෙන්නාට යහපතක්ම වේ.”**



"තමාට ඉහළින් තම සහෝදරයා සලකා තැනැත්තා ආශීර්වාදලත් වෙති."



**"එම්බා මනුෂ්‍ය පුත්‍රය! ඔබට මා මුණගැසීමට සහ මාගේ සුන්දරත්වය පිළිබිඹු කිරීමටත් හැකිවීමට යෝග්‍ය පරිදි ඔබගේ හදවතේ ප්‍රීතියෙන් සන්තොෂයට පත්වන්න."**



**“අපි සෑම අවස්ථාවකදීම අපගේ සත්‍යවාදී බව සහ අවංකත්වය ප්‍රකාශයට පත් කළ යුතුය....”**



"එම්බා මනුෂ්‍ය පුත්‍රය! මාහට ඔබ වෙත කරුණාවෙන් පැමිණිය හැකිවනු සඳහා ඔබ මා ඉදිරියේ නිහතමානී වන්න."



“ඔබ ප්‍රීතියට පත්වන්න. ඔබ කෘතඥශීලී වන්න. වරප්‍රසාදයන් වර්ධනයවීමට උපකාරීවීම සඳහා ඔබගේ ස්තූතිවන්ත බව හේතුවන බැවින් දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම වෙනුවෙන් නැගී සිටින්න.”



**“දෙවියන්වහන්සේගේ මනා ප්‍රියතමයින්ගේ හදවත් සතුටට පත් කරනු සඳහා ක්ෂමායුක්තබව සහ අනුකම්පාව ඔබගේ අලංකාරයවීමට ඉඩ දෙන්න.”**



“එම්බා මිනිසුනි, සත්‍යවාදී බවෙන් ඔබගේ දිව අලංකාරවත් කර අවංකත්වයේ ආභරණයෙන් ඔබගේ ආත්මය සරසං ගන්න.”



**“දෙවියන්වහන්සේගේ රාජධානිය ප්‍රතිස්ථාපිත වී ඇත්තේ සාධාරණත්වය සහ යුක්තිය මත මෙන්ම සෑම ජීවමාන ආත්මයකටම දක්වන දයාව, අනුකම්පාව සහ කරුණාව මතයි.”**



“ඔබගේ සත්‍ය ආභරණය සමන්විත වන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රේමය සහ උන්වහන්සේ හැර අන් සියල්ලේන්ම වෙන්වීම තුල බව ඔබ දැන්ගන්න...”




"ස්වාමීන්වහන්සේ විසින් ප්‍රදානය කරනලද ඕනෑම දෙයක් පිළිගැනීම සහ දෙවියන්වහන්සේ විසින් නියම කරන ලද දෙයින් තෘප්තිමත්වීම සෑම මහිමයකම උල්පත වේ."



**"සියළුම මිනිසුන් සමඟ උපරිම කරුණාවෙන් සහ ආදරයෙන් ඇසුරු කරන තැනැත්තා ආශිර්වාදලත් අයෙකු වේ."**



**“දෙවියන්වහන්සේගේ වචනය ප්‍රවර්ධනය කිරීම සහ උන්වහන්සේගේ ප්‍රේමය තුල ස්ථාවරත්වය ධෛර්යයේ සහ බලයේ ප්‍රභවය වේ.”**




**"කිසිවිටකත් දෙවියන්වහන්සේ කෙරෙහි ඇති ඔබගේ විශ්වාසය නැතිකර නොගන්න. මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ නොනවතින වරප්‍රසාදයන් මත ඔබ බලාපොරොත්තු සහගත වන්න."**



**“මනුෂ්‍ය වර්ගයා ශාන්තභාවයේ සහ ආරක්ෂව වෙතට ඔසවා තවන උසස්තම රාමුව වන්නේ විශ්වාසවන්තභාවයයි.”**



**“එම්බා මිනිසුනි, අන් අයගේ හදවත් ඔබට දැල්විය හැකිවන පරිදි දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් ඔබගේ හදවත් දල්වාගත් අයෙකු වන්න.”**




**“එම්බා සත්ව පුත්‍රය! ඔබ මාගේ පවහන වනසේම මාගේ ආලෝකය ඔබ තුල පවතී. ඔබගේ දීප්තිය එයින් ලබාගෙන මා හැර අන්කිසි කෙනෙකු නොසොයන්න.”**



**"උසස් උත්සාහයන්ගේ වස්ත්‍රාභරණයෙන් සැරසෙන සහ මෙම ධර්මය සඳහා සේවය කිරීමට නැඟී සිටින විශ්වාසවන්ත තැනැත්තා ප්‍රීතියට පත්වේ."**



**“නියතවශයෙන්ම උන්වහන්සේ ඉවසීමෙන් විඳදරාගන්නා අයගේ ත්‍යාගයන් ඉහළ නංවනු ඇත.”**



**“ඔබ ඔබගේ ස්වාමීන් වහන්සේගේ ධර්මයේ ස්ථිරසාර භාවයෙන් සිටින්නේ නම් ඔබගේ තත්වය ශ්‍රේෂ්ඨ උදාර වනු ඇත.”**

## REFERENCES


1. ‘Abdu’l-Bahá, in *Bahá’í Prayers: A Selection of Prayers Revealed by Bahá’u’lláh, the Báb, and ‘Abdu’l-Bahá* (Wilmette: Bahá’í Publishing Trust, 2002, 2017 printing), p. 28.

2. Ibid., p. 29.

3. *Tablets of Bahá’u’lláh Revealed after the Kitáb-i-Aqdas* (Wilmette: Bahá’í Publishing Trust, 1988, 2005 printing), no. 6.25, pp. 66–67.

4. Bahá’u’lláh, cited by Shoghi Effendi, *The Advent of Divine Justice* (Wilmette: Bahá’í Publishing Trust, 2006, 2018 printing), par. 42, p. 41.

5. *Tablets of Bahá’u’lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 3.23, p. 27.

6. Bahá’u’lláh, *The Hidden Words* (Wilmette: Bahá’í Publishing Trust, 2003, 2012 printing), Arabic no. 2, pp. 3–4.

7. *Tablets of Bahá’u’lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 10.5, p. 155.

8. From a Tablet of ‘Abdu’l-Bahá. (authorized translation)

9. Ibid.

10. *Selections from the Writings of ‘Abdu’l-Bahá* (Wilmette: Bahá’í Publishing, 2010, 2015 printing), no. 12.1, p. 42.

11. *Gleanings from the Writings of Bahá’u’lláh* (Wilmette: Bahá’í Publishing Trust, 1983, 2017 printing), CXXXIX, par. 8, p. 345.

12. ‘Abdu’l-Bahá, cited by Shoghi Effendi, *The Advent of Divine Justice*, par. 40, p. 39.

13. ‘Abdu’l-Bahá, in “Trustworthiness: A Cardinal Bahá’í Virtue”, compiled by the Research Department of the Universal House of Justice, published in *The Compilation of Compilations* (Maryborough: Bahá’í Publications Australia, 1991), vol. 2, no. 2053, p. 338.

14. ‘Abdu’l-Bahá, in *Bahá’í Prayers*, p. 28.

15. Ibid., p. 29.

16. *Tablets of Bahá’u’lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 9.4, p. 138.

17. Ibid., no. 10.15, p. 156.

18. *Selections from the Writings of ‘Abdu’l-Bahá*, no. 206.13, p. 357.

19. Ibid., no. 199.6, pp. 334–35.

20. From a talk given on 1 July 1912, published in *The Promulgation of Universal Peace: Talks Delivered by ‘Abdu’l-Bahá during His Visit to the United States and Canada in 1912* (Wilmette: Bahá’í Publishing, 2012), par. 1, p. 304.

21. *Selections from the Writings of ‘Abdu’l-Bahá*, no. 237.5, p. 442; also in *Bahá’í Prayers*, p. 328.

22. From a talk given by ‘Abdu’l-Bahá on 3 September 1912, published in *The Promulgation of Universal Peace*, par. 29, p. 441.

23. *The Tabernacle of Unity: Bahá’u’lláh’s Responses to Mánikchí Ṣáḥ ib and Other Writings* (Haifa: Bahá’í World Centre, 2006), no. 5.7, p. 74.

24. *Days of Remembrance: Selections from the Writings of Bahá’u’lláh for Bahá’í Holy Days* (Haifa: Bahá’í World Centre, 2016), no. 42.8, pp. 209–10.

25. From a talk given on 22 November 1911, published in *Paris Talks: Addresses Given by ‘Abdu’l-Bahá in 1911* (Wilmette: Bahá’í Publishing, 2006, 2016 printing), no. 35.2, p. 135.

26. *Selections from the Writings of ‘Abdu’l-Bahá*, no. 16.5, pp. 51–52.

27. *The Summons of the Lord of Hosts: Tablets of Bahá’u’lláh* (Wilmette: Bahá’í Publishing, 2006), no. 5.51, p. 301.

28. *Tablets of Bahá’u’lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 4.23, p. 39.

29. *The Summons of the Lord of Hosts*, no. 3.17, p. 249.

30. From a talk given by ‘Abdu’l-Bahá on 5 May 1912, published in *The Promulgation of Universal Peace*, par. 3, p. 127.

31. Bahá’u’lláh, in *Bahá’í Prayers*, p. 164.

32. Ibid., p. i.

33. *Tablets of Bahá’u’lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 6.19, p. 64.

34. *Gleanings from the Writings of Bahá’u’lláh*, LXXXII, par. 3, pp. 180–81.

35. Ibid., V, par. 2, pp. 6–7.

36. ‘Abdu’l-Bahá, *The Secret of Divine Civilization* (Wilmette: Bahá’í Publishing, 2007, 2016 printing), par. 130, p. 93.

37. *The Hidden Words*, Arabic no. 70, p. 21.

38. *Gleanings from the Writings of Bahá’u’lláh*, CXXIX, par. 2, p. 316.

39. Ibid., CXXXIX, par. 4, p. 343.

40. From a talk given by ‘Abdu’l-Bahá on 23 April 1912, published in *The Promulgation of Universal Peace*, par. 5, p. 69.

41. *Gleanings from the Writings of Bahá’u’lláh*, CXXV, par. 3, pp. 300–1.

42. Ibid., XV, par. 1, p. 39.

43. From a talk given by ‘Abdu’l-Bahá on 5 May 1912, published in *The Promulgation of Universal Peace*, par. 4, p. 128.

44. From a talk given by ‘Abdu’l-Bahá on 2 December 1912, ibid., par. 2, pp. 638–39.

45. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 6.3, p. 57.

46. Bahá'u'lláh, *Epistle to the Son of the Wolf* (Wilmette: Bahá'í Publishing Trust, 1988, 2016 printing), p. 23.

47. Bahá'u'lláh, in "Trustworthiness", published in *The Compilation of Compilations*, vol. 2, no. 2037, p. 334.

48. 'Abdu'l-Bahá, in "Bahá'í Prayers and Tablets for Children: A Compilation Prepared by the Research Department of the Universal House of Justice", no. 11.

49. Ibid., no. 10.

50. From a talk given by 'Abdu'l-Bahá on 14 April 1912, published in *The Promulgation of Universal Peace*, par. 9, p. 17.

51. *Abdul Baha on Divine Philosophy* (Boston: The Tudor Press, 1918), pp. 41–42.

52. *Selections from the Writings of 'Abdu'l-Bahá*, no. 35.8, p. 104.

53. Ibid., no. 7.4, p. 33.

54. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXXI, par. 6, p. 291.

55. Ibid., LXVI, par. 6, p. 144.

56. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 10.8, p. 155.

57. Bahá'u'lláh, in *The Bahá'í World: Volume One, 1925–1926* (Wilmette: Bahá'í Publishing Trust, 1926, 1980 printing), p. 42.

58. *The Hidden Words*, Arabic no. 40, p. 13.

59. Ibid., Persian no. 50, p. 39.

60. From a Tablet of 'Abdu'l-Bahá. (authorized translation)

61. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXLVI, par. 1, p. 357.

62. *Selections from the Writings of 'Abdu'l-Bahá*, no. 1.7, p. 8.

63. From a talk given by 'Abdu'l-Bahá on 12 May 1912, published in *The Promulgation of Universal Peace*, par. 8, p. 166.

64. From a talk given by 'Abdu'l-Bahá on 16 and 17 October 1911, published in *Paris Talks*, no. 1.7, p. 6.

65. 'Abdu'l-Bahá, in *Bahá'í Prayers*, p. 173.

66. Bahá'u'lláh, ibid., p. 94.

67. *Selections from the Writings of 'Abdu'l-Bahá*, no. 179.1, p. 285.

68. From a talk given by ‘Abdu’l-Bahá on 10 November 1912, published in *The Promulgation of Universal Peace*, par. 8, p. 599.

69. *Gleanings from the Writings of Bahá’u’lláh*, CLIII, par. 1, pp. 366–67.

70. *The Hidden Words*, Persian no. 21, p. 29.

71. *Selections from the Writings of ‘Abdu’l-Bahá*, no. 178.1, p. 284.

72. From a talk given by ‘Abdu’l-Bahá on 21 November 1911, published in *Paris Talks*, no. 34.8, p. 133.

73. Bahá’u’lláh, in “Trustworthiness”, published in *The Compilation of Compilations*, vol. 2, no. 2013, p. 327.

74. Ibid., no. 2024, p. 330.

75. Ibid., no. 2027, p. 330.

76. Bahá’u’lláh, in “Guidelines for Teaching”, compiled by the Research Department of the Universal House of Justice, published in *The Compilation of Compilations*, vol. 2, no. 1898, p. 293.

77. *Gleanings from the Writings of Bahá’u’lláh*, XV, par. 6, p. 41.

78. *The Summons of the Lord of Hosts*, no. 1.145, pp. 114–15.

79. *The Call of the Divine Beloved: Selected Mystical Works of Bahá’u’lláh* (Haifa: Bahá’í World Centre, 2018), no. 2.22, p. 21.

80. Bahá’u’lláh, in *Bahá’í Prayers*, p. 162.

81. ‘Abdu’l-Bahá, ibid., p. 29.

82. From a Tablet of ‘Abdu’l-Bahá. (authorized translation) Lessons for Children’s Classes, Grade 1 – 191

83. Bahá’u’lláh, in *The Kitáb-i-Aqdas: The Most Holy Book* (Wilmette: Bahá’í Publishing Trust, 1993, 2013 printing), par. 70, p. 45.

84. From a talk given by ‘Abdu’l-Bahá on 23 November 1911, published in *Paris Talks*, no. 36.9, p. 140.

85. From a talk given by ‘Abdu’l-Bahá on 12 April 1912, published in *The Promulgation of Universal Peace*, par. 2, p. 10.

86. *The Tabernacle of Unity*, no. 3.16, p. 64.

87. *Selections from the Writings of ‘Abdu’l-Bahá*, no. 141.4, p. 228.

88. Ibid., no. 1.4, p. 6.

89. *The Hidden Words*, Arabic no. 48, p. 15.

90. *Gleanings from the Writings of Bahá’u’lláh*, LXVI, par. 11, p. 146.

91. *The Summons of the Lord of Hosts*, no. 2.30, p. 229.

92. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas*, no. 14.11, p. 212.

93. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXXXIV, par. 1, p. 328.

94. Ibid., CLXI, par. 1, p. 384.

95. Ibid., CXLIII, par. 1, pp. 353–54.

96. Bahá'u'lláh, *The Kitáb-i-Íqán: The Book of Certitude* (Wilmette: Bahá'í Publishing Trust, 2003, 2018 printing), par. 146, pp. 123–24.

97. From a talk given by 'Abdu'l-Bahá on 23 November 1912, published in *The Promulgation of Universal Peace*, par. 4, p. 632.

98. 'Abdu'l-Bahá, in *Bahá'í Prayers*, p. 29.

99. *The Hidden Words*, Arabic no. 1, p. 3.

100. *Gleanings from the Writings of Bahá'u'lláh*, CXVIII, par. 1, p. 283.

101. *The Hidden Words*, Persian no. 3, p. 23.

102. 'Abdu'l-Bahá, cited by Shoghi Effendi, *The Advent of Divine Justice*, par. 40, p. 39.

103. 'Abdu'l-Bahá, in *Bahá'í Prayers*, p. 29.

104. *The Hidden Words*, Persian no. 49, p. 39.

105. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas, no. 6.37, p. 71.*

106. *The Hidden Words, Arabic no. 36, p. 12.*

107. *Selections from the Writings of 'Abdu'l-Bahá, no. 225.30, p. 407.*

108. *Bahá'u'lláh, in Bahá'í Prayers, p. i.*

109. *The Hidden Words, Arabic no. 42, p. 13.*

110. *Tablets of Abdul-Baha Abbas (New York: Bahá'í Publishing Committee, 1915, 1940 printing), vol. 2, p. 483. (authorized translation)*

111. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas, no. 9.5, p. 139.*

112. *Gleanings from the Writings of Bahá'u'lláh, CXXXVI, par. 6, p. 336.*

113. *'Abdu'l-Bahá, in "Bahá'í Prayers and Tablets for Children", no. 10.*

114. *Selections from the Writings of 'Abdu'l-Bahá, no. 138.1, p. 220.*

115. *The Summons of the Lord of Hosts, no. 1.119, p. 93.*

116. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas, no. 10.4, p. 155.*

117. *Gleanings from the Writings of Bahá'u'lláh, CLVI, par. 1, p. 378.*

118. *Bahá'u'lláh, in Bahá'í Prayers, p. 94.*

119. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas, no. 10.10, p. 156.*

120. *Selections from the Writings of 'Abdu'l-Bahá, no. 178.1, p. 284.*

121. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas, no. 4.16, p. 37.*

122. *From a Tablet of Bahá'u'lláh. (authorized translation)*

123. *'Abdu'l-Bahá, in Bahá'í Prayers, p. 29.*

124. *The Hidden Words, Arabic no. 11, p. 6.*

125. *Tablets of Bahá'u'lláh Revealed after the Kitáb-i-Aqdas, no. 17, p. 257.*

126. *Gleanings from the Writings of Bahá'u'lláh, LXVI, par. 10, p. 146.*

127. *Ibid., CXV, par. 13, p. 278.*